324 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 324 - இல. 04
Volume 324 - No. 04

2026 ජනවාරි 09 වන සිකුරාදා
2026 சனவரி 09, வெள்ளிக்கிழமை
Friday, 09th January, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

අධිකරණ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතල පරීක්ෂා කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස 2025.11.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ තීරණය [තීරුව 609]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 628]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 628]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 630-671]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

එක්සත් රාජධානිය විසින් ශ්‍රී ලාංකිකයින් කිහිපදෙනෙකුට එරෙහිව පනවන ලද සංචාරක තහනම [තීරුව 671]

මුලතිව්, සිලාවත්ත ප්‍රදේශයේ කුගනේෂන් ඩිනෝජා දැරියගේ මරණය [තීරුව 673]

**නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේදී මතුවී ඇති ගැටලු:**

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 675]

**ස්වාධීන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරියක් පිහිටුවීම:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 682]

**අපනයන ඉපැයීම් වැඩිදියුණු කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 687]

**සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත:**

නියෝගය [තීරු 691–749]

**ආනයන හා අපනයන (පාලන) පනත:**

රෙගුලාසි [තීරු 749-788]

**කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 789-794]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

நீதித்துறை அலுவலர்களின் நியமனம், பதவி உயர்வு, இடமாற்றம், பதவி நீக்கம் மற்றும் ஒழுக்காற்றுக் கட்டுப்பாடு தொடர்பில் நீதிச் சேவை ஆணைக் குழுவால் பிரயோகிக்கப்படும் அதிகாரங்களை ஆராய்வதற்குத் தெரிகுழுவொன்றை நியமிக்குமாறு 2025.11.21ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட முன்மொழிவு தொடர்பான தீர்மானம் [ப: 609]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 628]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 628]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 630-671]

**தனி அறிவித்தல் மூல வினா:**

ஐக்கிய இராச்சியத்தால் இலங்கையர்கள் சிலருக்கு எதிராக விதிக்கப்பட்ட சுற்றுலாத் தடை [ப: 671]

முல்லைத்தீவு, சிலாவத்தைப் பகுதியைச் சேர்ந்த குகனேசன் டினோஜா என்ற சிறுமியின் இறப்பு [ப: 673]

**புதிய கல்விச் சீர்திருத்தங்களை அறிமுகப்படுத்துவதால் எழுகின்ற சிக்கல்கள்:**

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 675]

**சுயாதீன ஊழியர் சேமலாப நிதிய அதிகாரசபை யொன்றைத் தாபித்தல்:**

தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சருமானவரினது கூற்று [ப: 682]

**ஏற்றுமதி வருமானங்களை மேம்படுத்தலும் முதலீடுகளை ஈர்த்தலும்:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 687]

**கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) சட்டம்:**

ஒழுங்குவிதி [ப: 691–749]

**இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 749-788]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 789-794]

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Ruling on the Motion to Appoint a Select Committee to Examine Powers Exercised by Judicial Service Commission in relation to Appointment, Promotion, Transfer, Dismissal and Disciplinary Control of Judicial Officers Submitted on 21.11. 2025 [Col. 609]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 628]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 628]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 630-671]

QUESTION BY PRIVATE NOTICE:

Travel Bans Imposed on Some Sri Lankans by United Kingdom [Col. 671]

Death of Girl Named Kuganeshan Dinoja from Silawatta, Mullaitivu [Col. 673]

ISSUES ARISEN IN INTRODUCING NEW EDUCATION REFORMS:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 675]

ESTABLISHMENT OF AN INDEPENDENT EMPLOYEES' PROVIDENT FUND AUTHORITY:
Statement by Deputy Minister of Finance and Planning [Col. 682]

IMPROVING EXPORT EARNINGS AND ATTRACTING INVESTMENTS:
Statement by Deputy Minister of Finance and Planning [Col. 687]

SHOP AND OFFICE EMPLOYEES (REGULATION OF EMPLOYMENT AND REMUNERATION) ACT:
Regulation [Cols. 691–749]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Cols. 749-788]

ADJOURNMENT QUESTIONS [Cols. 789-794]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජනවාරි 09වන සිකුරාදා***
*2026 சனவரி 09, வெள்ளிக்கிழமை*
*Friday, 09th January, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### අධිකරණ නිලධාරින් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන බලතල පරීක්ෂා කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස 2025.11.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ තීරණය

நீதித்துறை அலுவலர்களின் நியமனம், பதவி உயர்வு, இடமாற்றம், பதவி நீக்கம் மற்றும் ஒழுக்காற்றுக் கட்டுப்பாடு தொடர்பில் நீதிச் சேவை ஆணைக்குழுவால் பிரயோகிக்கப்படும் அதிகாரங்களை ஆராய்வதற்குத் தெரிகுழுவொன்றை நியமிக்குமாறு 2025.11.21ஆம் திகதி சமர்ப்பிக்கப்பட்ட முன்மொழிவு தொடர்பான தீர்மானம்

RULING ON THE MOTION TO APPOINT A SELECT COMMITTEE TO EXAMINE POWERS EXERCISED BY JUDICIAL SERVICE COMMISSION IN RELATION TO APPOINTMENT, PROMOTION, TRANSFER, DISMISSAL AND DISCIPLINARY CONTROL OF JUDICIAL OFFICERS SUBMITTED ON 21.11.2025

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Members, by the mandate vested in me under Standing Order No. 27(3) of Parliament in determining whether a notice in respect of any motion by a Member of Parliament be included in the Order Book for answer, I hereby make a Statement concerning a Motion submitted by 31 Members of Parliament including the Hon. Sajith Premadasa, the Hon. R.M. Ranjith Madduma Bandara, the Hon. Dayasiri Jayasekara, the Hon. Gayantha Karunathilleka, the Hon. Ajith P. Perera, the Hon. D.V. Chanaka, the Hon Dilith Jayaweera, the Hon Rishad Bathiudeen, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam and the Hon. Chamara Sampath Dasanayake on 21st of November, 2025 (Hereinafter "the Motion").

The Motion thus submitted calls for an appointment of a Select Committee of Parliament to examine the powers exercised by the Judicial Service Commission in relation to the appointment, promotion, transfer, dismissal and disciplinary control of judicial officers.

Given the serious legal and doctrinal issues raised by the Motion and the potential implications therein, I wish to make a Statement detailing reasons for my determination under Standing Order No. 27(3).

At the outset, it needs to be noted that a similar Ruling was issued for the first time in Parliamentary history on 20th of June, 2001 by the then Speaker of Parliament, the Hon. Anura Bandaranaike. The Ruling in 2001 concerned an Order issued by the Supreme Court restraining the Speaker from appointing a Select Committee of Parliament regarding a Motion for the Impeachment of the then Chief Justice. While the factual circumstances evaluated in the 2001 Ruling are not comparable to the facts of the instant occasion, I believe the Motion submitted by some Hon. Members of Parliament on 21st of November, 2025 presents an equally momentous opportunity to reassert the commitment of this House to the doctrine of separation of powers.

While the 2001 Ruling concerned the Speaker's role in facilitating the appointment of a Parliamentary Select Committee and raised the issue of whether the Judiciary could control such an exercise, the present Motion raises the opposite question: should the Speaker and, by extension, Parliament be permitted to control the Judiciary's powers by creating an oversight mechanism for the Judicial Service Commission - the JSC?

Before embarking on answering this question, I wish to outline the contents of the Motion submitted on 21st of November, 2025.

The Motion calls for the appointment of a Select Committee of Parliament to inquire into the powers of appointment, promotion, transfer, dismissal and disciplinary control of judicial officers, exercised by the Judicial Service Commission and to compile a report assessing the following issues:

I. The exercise of powers by the JSC in relation to all appointments, promotions, transfers, dismissals and disciplinary control of judicial officers during the period beginning from 01st of January, 2025 to the present;

II. Whether such appointments, promotions, transfers, dismissals and disciplinary control have been conducted according to the Constitution, principles of natural justice and other such relevant laws or guidelines of the JSC

[ගරු කථානායකතුමා]

III. Whether reasons have been recorded and intimated to the judicial officers concerned within the means of law and without bias;

IV. Whether, prior to a decision on the transfer, dismissal or disciplinary control of judicial officers, discussions with such judicial officers were facilitated;

V. Whether, in making decisions on appointments, promotions, transfers, dismissals and disciplinary control of judicial officers, the Judicial Service Commission took into account extraneous considerations.

VI. If so, the impact of such considerations on judicial independence, the administration of justice, and public confidence in the Judiciary.

VII. Recommendations for Constitutional and statutory amendments, administrative guidelines, appeal mechanisms to counter irregular appointments, promotion, transfers, dismissals and disciplinary control through the JSC.

A cursory glance over the said objectives of the Motion reveals that the proposed Select Committee of Parliament is exercising what is essentially an oversight function of the JSC and its operations. By scrutinizing the JSC's decisions on appointments, promotions, transfers, dismissals and disciplinary control, the proposed Committee would be intruding onto the operational sphere of the Judiciary, which is the very essence of an oversight function.

A role of oversight structurally presupposes a hierarchical relationship - a regulator possessing the power to review, direct or correct the actions of another. This gives rise to two integral questions: what is the nature and character of the mechanism - in this case the JSC - sought to be regulated and is such regulation in compliance with the law and spirit of the Constitution of the Republic?

In answering the first question, first, I would like to refer to the introduction of the JSC by the Seventeenth Amendment to the Constitution and the Nineteenth Amendment to the Constitution and its character.

CHAPTER XV A of the Constitution titled the "JUDICIAL SERVICE COMMISSION" was first introduced by the Seventeenth Amendment to the Constitution. The same Chapter was later substituted by the Nineteenth and the Twenty First Amendments to the Constitution. As it stands today, Article 111D of the Constitution provides for the establishment of the JSC consisting of the Chief Justice, the Chairman of JSC, and the two most senior Judges of the Supreme Court appointed by the President, subject to the approval of the Constitutional Council

Article 111H sets out the powers of the JSC to include the power to appoint, promote, transfer, exercise disciplinary control and dismiss judicial officers. Article 111K further sets out the JSC's immunity from legal proceedings and Article 111L explicitly makes interference with the decisions of the JSC an offence.

From both its composition and its conferred functions, it is my opinion that the operations of the JSC are attributable to and exercise of judicial power of the People, as envisioned under Article 4(c) read with Article 3 of the Constitution.

The JSC forms an integral part of the judicial branch of government and is not an administrative body subordinate to either the Executive or the Legislature. Entrusted with authority over appointments, promotion, transfer, disciplinary control and dismissal of all judicial officers of the Republic, the JSC functions as an institutional extension of the Judiciary itself. The JSC's powers, exercised through the highest judicial leadership i.e. through the Chief Justice, affirm that the Commission's role is properly attributable to the judicial arm of government.

By careful consideration of Articles 111D, 111H, 111K, 111L of the Constitution, it is clear that the establishment and functioning of the JSC constitutes a part of the judicial arm of government and is an exercise of the judicial power of the People.

Additionally, under CHAPTER VII A - titled "The Constitutional Council", Article 41C sets out that no person shall be appointed to the JSC by the President without the approval of the Constitutional Council recommendation. The Chapter further refers to other Commissions whose appointments are made upon the recommendations of the Constitutional Council. Article 41B explicitly refers to a list of such Commissions which are answerable to Parliament. However, the JSC has not been mentioned therein. This omission underscores that the JSC, as an extension of the People's judicial power, stands independent of the Executive and the Legislature.

Therefore, in answer to the first question, what the Motion seeks to regulate is an exercise of judicial power of the People.

The next issue for determination is whether Parliament, through a Select Committee, can exercise oversight over the JSC and its operations, namely the exercise of the judicial power of the People. The guiding principle in answering this question is the doctrine of separation of powers.

The doctrine of separation of powers states that the State's principal organs (the Executive, the Legislature, and the Judiciary) are to be constituted as separate and autonomous entities. One of the earliest and clearest statements on the separation of powers was given by Montesquieu in 1748 (The Spirit of Laws): *When the legislative and executive powers are united in the same person, or in the same body of magistrates, there can be no liberty... there is no liberty if the powers of judging is not separated from the legislative and executive... there would be an end to everything, if the same man or the same body... were to exercise those three powers*.

The doctrine of separation of powers is enshrined in the Constitution of Sri Lanka vis-à-vis Article 3 and Article 4. Article 3 of the Constitution provides "In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Sovereignty includes the powers of government, fundamental rights and the franchise." The manner in exercising such power is expressed in Article 4:

"The Sovereignty of the People shall be exercised and enjoyed in the following manner:

(a) the legislative power of the People shall be exercised by Parliament, consisting of elected representatives of the People and by the People at a Referendum;

(b) the executive power of the People, including the defence of Sri Lanka, shall be exercised by the President of the Republic elected by the People;

(c) the judicial power of the People shall be exercised by Parliament through courts, tribunals and institutions created and established, or recognized, by the Constitution, or created and established by law, except in regard to matters relating to the privileges, immunities and powers of Parliament and of its Members, wherein the judicial power of the People may be exercised directly by Parliament according to law;

(d) the fundamental rights which are by the Constitution declared and recognized shall be respected, secured and advanced by all the organs of government and shall not be abridged, restricted or denied, save in the manner and to the extent hereinafter provided; and

(e) the franchise shall be exercisable at the election of the President of the Republic and of the Members of Parliament and at every Referendum by every citizen who has attained the age of eighteen years and who, being qualified to be an elector as hereinafter provided, has his name entered in the register of electors."

To that end, the Supreme Court in Jathika Sevaka Sangamaya v Sri Lanka Hadabima Authority (2015) 1 SLR 258 spoke of the doctrine of separation of powers as follows:

> *"There are three distinct functions involved in a Government of a State - legislative, executive and judicial functions. Those three organs are constitutionally of equal status and also independent from one another. One organ should not control or interfere with the powers and functions of another branch of Government and should not be in a position to dominate the others.*
>
> *The Doctrine of separation of powers is enshrined in Article 4 read with Article 3 of the Constitution - Article 3 is linked with article 4."*

In the same Judgment, the Supreme Court refers to Article 116 of the Constitution as a recognition of the "*independence of the judiciary, certain safeguards which enable judicial officers to perform their powers and functions without any interference*". Speaking on Article 111C, the Judgment goes onto quote "*Article 111 C of the Constitution is a manifest intention to ensure the judiciary is free from interferences whatsoever.*"

At this juncture, it is pertinent to pause and reflect on the framing of Article 4(c) of the Constitution which provides "the judicial power of the People shall be exercised by Parliament through courts…" In fact, the Motion from the Consolidated Fund to facilitate the operatirefers to the responsibility of Parliament to allocate funds ons of the JSC and the ensuing requirement of ensuring the transparent and accountable expenditure of such an allocation.

However, it is my opinion that Parliament's custody of the public purse, entrusted by the People in trust, confers fiduciary responsibility but not hierarchical supremacy, and cannot justify an automatic encroachment on the constitutional separation of powers and form a derogation of the independence of the Judiciary.

In fact, the Constitution provides only one permissible avenue for review of JSC decisions - resorting to the Fundamental Rights Jurisdiction under Article 126 of the Constitution read with Article 17 of the Constitution.

Moreover, in the House of Commons, it is a well-established constitutional convention that judicial independence prohibits any form of political accountability being imposed on judges. Consistent with the constitutional principles set out in Erskine May: Parliamentary Practice, and grounded in the doctrines of judicial independence and the separation of powers, the legal position is unequivocal: the establishment of such a committee would be unconstitutional and contrary to long -standing parliamentary practice. Erskine May, further states that judicial independence is a fundamental constitutional convention, and parliamentary actions must not "impair judicial independence."

Placing the Judiciary before a Select Committee - a political body - would subject judges or judicial administrators to political scrutiny, thereby undermining the essential independence required of the judicial branch.

Erskine May states that the courts and Parliament are "separate and independent" organs of government. Neither House may exercise judicial power, nor may they review, supervise, or control judicial acts. The administration of the Judiciary - including appointments, discipline, case assignment, and internal governance - is an inherent part of judicial independence.

Therefore, it abundantly shows that the parliamentary scrutiny into administrative decisions of the Judiciary would breach the constitutional separation of powers.

This proposition is further supported by authoritative English decisions; notably, M v Home Office [1994] 1 AC 377 and Duport Steels Ltd. v Sirs [1980] 1 WLR 142,

[ගරු කථානායකතුමා]

which unequivocally reaffirm the doctrine of separation of powers and the constitutional imperative of preserving judicial independence.

Even in the Sri Lankan Constitution, unlike in the United Kingdom, the principle of the separation of powers is expressly and unequivocally recognized as a foundational constitutional doctrine. The Apex Courts of Sri Lanka have repeatedly affirmed this position. In Premachandra v Major Montague Jayawickrama (1994) 2 SLR 90, the Supreme Court underscored that the separation of powers embodied in Articles 3 and 4 constitutes a fundamental feature of the Constitution, and that neither the Executive nor the Legislature may usurp or encroach upon judicial power; Chief Justice Sharvananda emphasized that each organ of government must function strictly *"within the bounds set by the Constitution,"* rendering any form of parliamentary supervision over judicial administration unconstitutional. Similarly, in Visuvalingam v Liyanage (1983) 1 SLR 203, although the issue concerned contempt, the Court reiterated that judicial independence is an indispensable constitutional postulate and that the Judiciary cannot be subjected to pressure, influence, or control by the other branches of government. This principle was reaffirmed in *many reported cases*, where the Supreme Court held that the Judiciary must remain entirely free from any form of investigation or interference by the Executive or Legislature, noting that the protection of judicial independence is essential for safeguarding the sovereignty of the People. This is further reinforced by *in many reported Supreme Court Cases,* where the Court held that the JSC enjoys exclusive constitutional authority over judicial administration.

The following passages of recently concluded Judicial Officers' Tax Case (CA Writ 35/2023-36/2023, and 73/2023 C.A minutes 27th November, 2023) explain that sovereignty belongs to the people under the Constitution, and its exercise through the Executive, Legislature, and Judiciary must operate within a strict separation of powers - ensuring strong legislative and executive authority while preserving judicial independence - so that each branch uses its powers responsibly, without overreach, for the well-being of society.

It is stated that -

*"...The Constitution is the supreme law of the land and as per Article 3 of the Constitution, sovereignty lies in the people and is inalienable. Sovereignty includes the government; thus, the power of the people is exercised through the three pillars of the government, namely the executive, legislature and the judiciary. Therefore, the judiciary is only one such pillar of the government which exercises the judicial power of the people...*

*...The regulation of taxation by laws passed and implemented by the three pillars of government serves the best interest of society. However, the efficacy of fulfilling such a task lies in the principle of separation of powers enshrined within the Constitution. As the learned DSG states in his submission 'the legislature has the purse, the executive has its sword, and the judiciary has the public confidence': though akin to a slogan, it aptly describes the separation of powers within a government system. Accordingly, the three branches of the government are to operate independently from one another, and there shall be no interference of one in the other. There shall only be checks and balances between these three branches. This principle, which is provided by the Constitution, safeguards the independence of the judiciary in a delicate balance.*

*...Contemporary society is constantly changing, with new social upheavals and challenges arising every day. To effectively solve these problems and guarantee positive change, those in power must be equipped with the necessary tools and authority to do so. This means that the legislative and executive power of the government must have adequate and far-reaching powers, free from unnecessary obstruction or interference. It is important to remember that these powers are given to them by the people, and with this trust comes the expectation that they will use their powers responsibly with a sense of justice and for the betterment of people...*

*........the independence of the judiciary should be preserved without any obstruction, hindrance or interference. The judiciary plays a vital role in ensuring that justice is served fairly and impartially, and any interference with their independence could compromise the integrity of the judicial system. A delicate balance ought to be struck between both these points for the adequate functioning of society."*

*While exercising their powers, all three branches of the government may experience a sense of satisfaction, but they must also remember that using their powers excessively or unjustly is not acceptable. The saying, "It is excellent to have a giant's strength; but it is tyrannous to use it like a giant" ( William Shakespeare, in his play Measure for Measure, Act 2, Scene 2.) serves as a reminder that those in power must be mindful of the impact of their actions on society and use their powers for the greater good, rather than for personal gain or to oppress others…". (@ -94-96 pp)*

Building on the jurisprudence outlined above, it is evident that the independence of the Judiciary is firmly established and safeguarded under the doctrine of separation of powers. Accordingly, the JSC, whose functions reflect the exercise of the People's judicial power, enjoys the same protection against encroachment by the Legislature or the Executive.

Having examined the JSC as an extension of the People's judicial power and the limits imposed by the doctrine of separation of powers for the protection of such exercise, I now turn to my duty under Standing Order No. 27(3).

The Motion before me seeks a Resolution of Parliament to appoint a Select Committee to oversee the JSC's functionality and operations. Under Standing Order No. 27(3), I, as Speaker, hold the discretion to decide whether such a Motion should be placed on the Order Paper and to rule it either in order or out of order. In exercising this discretion, I must determine whether the objectives of the Motion align with the Constitution of the Republic.

In my opinion, any motion, in the exercise of the legislative power, that encroaches on the exercise of the People's judicial power threatening the doctrine of separation of powers is an affront to the Constitution of the Republic.

As such, for the following reasons, I find the Motion submitted on 21st of November, 2025 to appoint a Select Committee of Parliament to examine the powers of the Judicial Service Commission in relation to the appointment, promotion, transfer, dismissals and disciplinary control of judicial officers out of order:

1. The functions and purpose of the Judicial Service Commission embody the exercise of the people's judicial power and therefore, enjoy the constitutional protection of judicial independence; and
2. The Constitution does not permit Parliament to encroach upon that power by exercising oversight over the Judicial Service Commission's operations; this prohibition is reinforced by the doctrine of separation of powers enshrined in Article 3, read with Article 4 of the Constitution; and
3. The custody of the public purse, entrusted to Parliament by the People in trust, confers fiduciary responsibility but not hierarchical supremacy and cannot justify encroachment upon the constitutional separation of powers; and
4. The Constitution does not provide Parliament the authority to inquire into, supervise or review the functions or decisions of the Judicial Service Commission.

The appointment of a Select Committee of Parliament to examine matters pertaining to the Judicial Service Commission would be a derogation of the independence of the Judiciary and thereby, a derogation of the judicial power of the people.

I extend my sincere appreciation to all Hon. Members of this House for their patient and attentive hearing of this lengthy Ruling, which I believe will stand as a landmark in the Parliamentary history of Sri Lanka, strengthening our Parliamentary tradition and the dignity of this august Assembly.

Thank you.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, මට විනාඩි කිහිපයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩි කිහිපයක් දෙන්න, විපක්ෂය විධියට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඉස්සෙල්ලාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මම Ruling එක ලබා දී ඇත.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම. *[බාධා කිරීම්]* ඔබතුමාට මම Ruling එක ලබා දීලා තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපට අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.*[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Ruling එකක් දුන්නාට පස්සේ නැවත ඒ සම්බන්ධයෙන් කථා කිරීමට නොහැකියි. *[බාධා කිරීම්]* නැවත කථා කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මුලින්ම, මේ ඉදිරිපත් වෙච්ච ඉතාම වැදගත් ප්‍රශ්නය පිළිබඳව පුළුල් අධ්‍යයනයකින් ඔබතුමා නියෝගයක්, ඔබතුමාගේ නියමයක් ලබා දීම අපි අගය කරනවා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි සාමාන්‍යයෙන් - *[බාධා කිරීම්]* මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේකට ඇහුම්කන් දෙන්න කියලා. ගරු කථානායකතුමනි, එක කාරණයක් තමයි, ස්ථාවර නියෝග අනුව ඔබතුමා Ruling එකක් දුන්නාට පස්සේ ඒක ගැන විවාදයක් කරන්න බැහැ. *[බාධා කිරීම්]* මම කියන්න කැමැතියි, සාමාන්‍යයෙන් ඉතිහාසයේ අධිකරණයට බලපෑම් කරන්න වැඩිපුර උත්සාහ කරලා තිබුණේ ආණ්ඩු පක්ෂ බව. නමුත් අද මෙතැන මොකක්ද වෙලා තිබෙන්නේ? *[බාධා කිරීම්]* අද අධිකරණය ගැන හොයන්න බලපෑම් කරන්නේ මෙතුමා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඔබතුමා Ruling එකක් දුන්නාට පස්සේ ඒ ගැන විවාදයක් කරන්න බැහැ; විවාදයක් කරන්න බැහැ. ඒ නිසා එතැන point of Order එකක් නැහැ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ඔබතුමා සඳහන් කළා, 2001 වසරේදී ගරු අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමා පාර්ලිමේන්තුව සතු උත්තරීතරභාවය සහ එහි අයිතිය ස්ථාවර කිරීම ගැන. ඇත්තවශයෙන්ම ඔබතුමා අද ඉදිරිපත් කරපු මේ නියෝගය ඉතාම විස්තරාත්මකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට තමයි අධිකරණ බලය තිබෙන්නේ. පාර්ලිමේන්තුව මේ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නේ අධිකරණය හරහා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා Ruling එක හොඳට කියවන්න. දීර්ඝ අධ්‍යයනයකින් පසුව තමයි, - *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ඔබතුමා කරන්නේ ඒ බලය යටපත් කිරීමක්; අනුර බණ්ඩාරනායක මැතිතුමා දීපු බලය යටපත් කිරීමක්. ගරු කථානායකතුමනි, ඔබතුමා කරන්නේ වැරදි වැඩක්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා වැරදියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I am on a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඉස්සෙල්ලා අනුර බණ්ඩාරනායක මහත්තයා දීලා තිබෙන Ruling එක කියවන්න කියලා. මොකද, මම මේක කියවලා ලකුණු කරලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මහතා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාට විනාඩියක් ලබා දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

කෝ, විනාඩියක් නැහැ නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විනාඩියක් ලබා දුන්නා නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මට මගේ විනාඩිය දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කියන්න, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මට මගේ විනාඩිය දෙන්න. අතරමඟදී මගේ විනාඩියක කාලය කඩන්න එපා.

ගරු කථානායකතුමනි, අධිකරණයට, පාර්ලිමේන්තුවට සහ විධායකයට දීලා තිබෙන්නේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය. මේ තුනේ මොකක් හරි ගැටලුවක් තිබෙනවා නම් ඊට මැදිහත් වන්න තමයි මහජනතාව ජනතා නියෝජිතයින් හැටියට අපව පත් කර එවා තිබෙන්නේ. ඒ මහජන යුතුකම ඉටු කරන්න තමයි අපි මේ කමිටුව ඉල්ලුවේ. ඔබතුමා ඒක ප්‍රතික්ෂේප කරනවා කියන්නේ ජනතා පරමාධිපත්‍යයට එරෙහිවීමක්, ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම්වලට විරුද්ධවීමක්. ඒකේ වගකීම ඔබතුමා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ඒ මතය දැරිය හැකියි. නමුත්, මගේ Ruling එක ඒක.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. ස්ථාවර නියෝග 92 (2) යටතේයි මම කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) අනුව බොහොම පැහැදිලියි, මේ ක්‍රියාවලිය තුළ අපට කථා කරන්න තිබෙන කාරණය පිළිබඳව. මම ඒකයි මේ රීති ප්‍රශ්නය මතු කළේ, ගරු කථානායකතුමනි. පළමුවෙනි කාරණය විධියට ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා කිව්වා, ජනතාවගේ පරමාධිපත්‍ය බලය පිළිබඳව තිබෙන තත්ත්වය. මම Erskine May: Parliamentary Practiceහි පිටු අංක 183 පෙන්වන්න කැමැතියි. මේ ගැන අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* මට මේ ගැන කථා කරන්න දෙන්න. It states, I quote:

> "EXTENT OF LEGISLATIVE AUTHORITY OF PARLIAMENT"

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point of Order එකක් අරගෙන කථා කරද්දී ඔය ගැන කථා කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිසාම් කාර්යප්පර් මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, just give me half a minute. My point of Order, Hon. Speaker, is this. - [Interruption] මට පොඩ්ඩක් කථා කරන්න දෙන්න, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
The last sentence of the Hon. Speaker's Ruling is a violation of the basic standing order. Separation of powers does not exclude Parliament from setting out criteria for judicial officers. That is all I want to say.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Totally wrong, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ රටේ පාර්ලිමේන්තුවේ බලය ඔබතුමා තමන්ගේ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමාට mike එක දීලා තිබෙන්නේ. ඔබතුමා කථා කරන්නේ නැත්නම් මම ඔබතුමාගෙන් mike එක off කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Speaker, I would not, in any way, try to challenge the substance of your Ruling. But, I would like to reiterate certain principles that we uphold in a democracy. Those principles involve the separation of powers of the three major branches of government. In addition to that, each of those three branches are bestowed with powers to promote checks and balances within those three branches. Those three branches assume their powers through people's sovereignty. The Constitution specifically states that the Executive, the Legislature and the Judiciary, the three major branches of power which constitute the main elements of a democratic society, shall exercise power through people's sovereignty. So, people's sovereignty has provided, through our Constitutional provisions, that judicial power, executive power, legislative power shall be carried out -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කරුණු දැක්වීම අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා. I have given you a minute.

**සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Please! I said I am not challenging your Ruling. So, please listen.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Let him finish.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I must congratulate you on the Ruling you made. Of course, the author may be somebody else. - *[Interruption.]* I am happy at the way you had basically read out a Ruling authored by a third party. Anyway, be that as it may, it is very important to understand that the primacy is people's sovereignty. We are provided with the three branches of the Judiciary, the Legislature and the Executive. The Legislature, which comprises of 225 Members, we derive from people's sovereignty. The checks and balances are also a very important component of this process. So, all I am trying to tell you, Hon. Speaker, is, that the establishment - Sir, I would like you to pay your fullest attention.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, I am paying attention.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Why was the Constitutional Council established? The Constitutional Council was established to ensure that you have additional checks and balances, to check the other branches of government. Similarly, Parliament, this Chamber, and all of its Members are bestowed with the responsibility to ensure that the people's sovereignty is protected. So, our request to have a Select Committee is to promote and protect the independence of the Judiciary, we are trying to promote the independence of the Judiciary.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition, now, you have to finish.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I am going to finish, please.

You mentioned about Montesquieu and various other authorities, but the basic fact is,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes. The fundamental rights jurisdiction and its exercise come under Article 126 of the Constitution read with Article 17 of the Constitution.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
With great respect, Hon. Speaker, let me finish.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition, now, I will have to stop you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I will finish soon; just give me a few seconds, please, a few seconds of our time.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will give you 30 seconds.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
What I am trying to say is, your Ruling is a derogation of people's sovereignty; it is a violation of people's sovereignty; it is a violation of the Constitution.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is your opinion, Hon. Leader of the Opposition. Now, we will move on to the -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Speaker, could I finish?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, you may finish. I have given you 30 seconds.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Okay, I will finish.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, you finish.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Yes, I will finish within 60 seconds, please.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, I have given you only 30 seconds.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I want to assert and specifically state that your Ruling, your utterance or your reading out of a memo sent by a third party is a complete and fundamental violation of the Sri Lankan Constitution, a violation of people's sovereignty, a violation of the fundamental and human rights of the people!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I totally disagree with you. - *[Interruption.]* The Hon. Leader of the House.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම මේ පිළිබඳව කථා කරන්නේ ඔබතුමා ලබා දුන් තීරණය පිළිබඳව විවාදයක් ඇති කර ගැනීමට නොවෙයි. නමුත්, මූලික වශයෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. තමන්ට කථා ලියන්න පඩි ගෙවලා තියාගෙන ඉන්න උදවිය ඒ කථාව ලියාගන්න. පඩි ගෙවලා කථා ලියන්න තියාගෙන ඉන්න උදවිය මෙවැනි ඉතාම බරපතළ ව්‍යවස්ථාදායක කරුණක් පිළිබඳව නීති උපදේශකයන්ගේ සහ නීති විශාරදයන්ගේ උපදෙස් ගන්නේ නැතිව මෙතැනට කරුණු ඉදිරිපත් කිරීම හැල්ලුවට ලක් කරන එක මම හිතන විධියට දෛවයේ සරදමක්. හරියට script එකක් දුන්නේ නැත්නම් කථාවක් කරගන්න බැහැ. නමුත් මේ වාගේ විශේෂ දෙයකදී අනිවාර්යයෙන්,- *[බාධා කිරීම්]* අනුර බණ්ඩාරනායක මැතිතුමා ඒ තීරණය දෙනකොටත් මම අහගෙන හිටියා. එතුමා ඒක ඉදිරිපත් කළේත් නීති විශාරදයන්ගේ උපදෙස් මත තමයි. මම හිතන ආකාරයට ඔබතුමා ගරු කථානායකතුමා වශයෙන් විවිධ නීති විශාරදයන්ගෙන් උපදෙස් අරගෙන, ඔබතුමාගේත් අත්දැකීම් මත තමයි ඒක ඉදිරිපත් කරන්න ඕනෑ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඒ නිසා - *[බාධා කිරීම්]* නැහැ, නැහැ. මට ඒකට අයිතියක් තිබෙනවා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා කථා කළා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, shall we debate this?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, it is not a debate. He was given a chance.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ නිසා පාර්ලිමේන්තුවේ කථානායකතුමා වශයෙන් ඔබතුමා යම් අධ්‍යයනයක් කරලා කරුණු ඉදිරිපත් කිරීම ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අපි කියන්න කැමැතියි, පාර්ලිමේන්තුව සතු බලය පොඩ්ඩක්වත් හැල්ලු කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැති බව. නමුත්, පාර්ලිමේන්තු බලය අනෙක් ඒවාට යොමු කරන්න අපි ඉඩ දෙන්නේත් නැහැ. අද පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන්ම අවුල් කිරීමේ අරමුණ තමයි මෙතුමන්ලාට තිබෙන්නේ. *[බාධා කිරීම්]*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

Order made by the Minister of Finance, Planning and Economic Development under Section 19A of the Customs Ordinance (Chapter 235) as amended by the Customs (Amendment) Law No. 35 of 1974 and the Customs (Amendment) Act, No. 83 of 1988 relating to Customs Import Duty and published in Gazette Extraordinary No. 2462/09 of 11th November, 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සංචාරක අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 සහ 2022 වර්ෂ සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා සී/ස ලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iv) 2024 වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද (129 අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ 66 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් 2025 දෙසැම්බර් 12 දින සාදන ලද නියෝගය සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 හා 2023 වර්ෂ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා;

(ii) 2020/2021 හා 2022/2023 වර්ෂ සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තා;

(iii) 2020/2021 හා 2021/2022 වර්ෂ සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තා;

(iv) 2023 හා 2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2023 හා 2024 වර්ෂ සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(vi) 2023 හා 2024 වර්ෂ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vii) 2021, 2022 හා 2023 වර්ෂ සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තා; සහ

(viii) 2021 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ சபாநாயகர் அவர்களே, பொருளாதார அபிவிருத்தி மற்றும் சர்வதேச உறவுகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்ட -

(i) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான முகாமைத் துவ சேவைகள் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(ii) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(iii) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான முகாமைத் துவ கணக்காய்வுத் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(iv) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான தகவல் தொழில்நுட்ப முகாமைத்துவ திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(v) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான அரச கணக்குகள் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(vi) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான சட்ட அலுவல்கள் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(vii) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான கொம்ப் ரோலர் ஜெனரல் அலுவலகத்தின் செயலாற்றுகை அறிக்கைகள்;

(viii) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான திறைசேரிச் செயற்பாடுகள் திணைக்களத்தின் வருடாந்த செயலாற் றுகை அறிக்கைகள்;

(ix) 2023 மற்றும் 2024 ஆம் ஆண்டுகளுக்கான தேசிய வரவு செலவுத் திட்டத் திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்; மற்றும்

(x) 2023 மற்றும் 2024ஆம் ஆண்டுகளுக்கான கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக் களத்தின் வருடாந்த செயலாற்றுகை அறிக்கைகள்

தொடர்பிலான அக்குழுவின் அறிக்கையை அக்குழுவின் தவிசாளர் சார்பாக நான் சமர்ப்பிக்கின்றேன்.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ சபாநாயகர் அவர்களே, பதன, ஜயசிறிபுர, இல. 64 என்ற முகவரியில் வசிக்கும் எஸ்.ஏ. கந்தசாமி நாயுடு அவர்களிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) පොරුවදණ්ඩ, පැල්පිටිගොඩ, අංක 32/ඒ 2 යන ලිපිනයෙහි පදිංචි ජේ.ඩී. නෙලූකා දිල්ශානි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) වලගෙදර, ගල්මත්ත, මැටියමුල්ල, අංක 274 යන ලිපිනයෙහි පදිංචි කේ.වී. රිද්මා සඳරුවනි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) ඉංගිරිය, මහ ඉංගිරිය, ඉමගිර ජනපදය, අංක 1002 යන ලිපිනයෙහි පදිංචි එම්.එච්. අනූෂා ප්‍රියංගනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) වැල්මිල්ල හන්දිය, වැල්මිල්ල, මෛත්‍රී මාවත, පළමු පටුමඟ, අංක 151 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ආර්. නිසංසලා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු කථානායකතුමනි, ගනේමුල්ල, කටුවාමුල්ල, අංක 64/2 යන ලිපිනයෙහි පදිංචි එච්.ආර්. චාන්දනී පීරිස් මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -206/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -219/2024- (2), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2019-2024 දක්වා CIABOC සහ නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කර ගත් සහ නැවත පවරන ලද නඩු: විස්තර

2019-2024 வரை CIABOC, சட்டத்துறை தலைமை அதிபதியால் மீளப் பெறப்பட்ட மற்றும் மீளத் தாக்கல் செய்யப்பட்ட வழக்குகள்: விபரம்

CASES WITHDRAWN AND REFILED BY CIABOC AND ATTORNEY-GENERAL FROM 2019-2024 : DETAILS

229/2024

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ නීතිපතිවරයා විසින් ඉල්ලා අස් කර ගන්නා ලද නඩු සමාලෝචනය කර සුදුසු නඩු නැවත පැවරීමට 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් පොරොන්දු වී තිබේද;

(ii) වර්ෂ 2019 සිට 2024 දක්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉල්ලා අස් කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු අතරින් සමාලෝචනය කිරීමෙන් පසු නැවත පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல் களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு வாலும் சட்டத்துறை தலைமை அதிபதியாலும் மீளப் பெறப்பட்ட வழக்குகளை மீண்டும் மீளாய்வு செய்து அதற்கமைவாகத் தகுந்த வழக்கு களை மீளத் தாக்கல் செய்வதற்கு 'வளமான நாடு - அழகான வாழ்க்கை' கொள்கைப் பிரகட னத்தின் மூலம் வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) 2019 தொடக்கம் 2024ஆம் ஆண்டு வரை, இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல் களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு வால் மீளப் பெறப்பட்ட வழக்குகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி வழக்குகளில் மீண்டும் மீளாய்வு செய்யப்பட்டதன் பின்னர், மீளத் தாக்கல் செய்யப்பட்டுள்ள வழக்குகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether it is promised in the policy statement "A Thriving Nation, A Beautiful Life" that the cases withdrawn by the Commission to Investigate Allegations of Bribery or Corruption as well as those by the Attorney-General will be reviewed and suitable cases be re-filed;

(ii) the number of cases withdrawn by the Commission to Investigate Allegations of Bribery or Corruption from 2019 to 2024; and

(iii) the number of cases that have been re-filed after review, out of those cases?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

ගරු ජනාධිපතිතුමන් විසින් 2024 ජනාධිපතිවරණයේ ජාතික ජන බලවේගයේ ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් කරන ලද "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ "නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක්" පරිච්ඡේදය යටතේ පහත පරිදි ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇත.

"අල්ලස් කොමිසම හා නීතිපති මඟින් ඉල්ලා අස්කර ගන්නා ලද නඩු සමාලෝචනයකට ලක් කර සුදුසු නඩුකර නැවත පැවරීමට කටයුතු කිරීම."

(ii) 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ඉල්ලා අස්කර ගත් මුළු නඩු සංඛ්‍යාව 102කි.

(iii) ඉහත නඩු 102 අතරින්,

| | |
|---|---|
| නැවත පැවරූ නඩු සංඛ්‍යාව | 65 |
| නැවත නොපැවරීමට තීරණය කළ නඩු සංඛ්‍යාව | 34 |
| නැවත පැවරීමට සලකා බලමින් සිටින නඩු සංඛ්‍යාව | 03 |

(ආ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, පසුගිය රජය සමයේ, බලගතු ධනවත් පුද්ගලයන් පිළිබඳ නඩු, ඒ වාගේම දේශපාලන බලය තිබෙන පුද්ගලයන් පිළිබඳ නඩු තාක්ෂණික හේතු බව කියමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසිනුත් ඇතැම් අවස්ථාවලදී නීතිපතිවරයා විසිනුත් ඉල්ලා අස්කර ගත්තා. සමහර තාක්ෂණික හේතු බැලූ බැල්මටම ඒ අදාළ සැකකරුවන්ට, විත්තිකරුවන්ට වාසිය ලබා ගැනීම උදෙසා ඉදිරිපත් කළ ඒවාද කියලා සැකයක් මතු වුණා. ඒ වාගේම අසාමාන්‍ය ලෙස ඉල්ලා අස්කර ගැනීම් සිද්ධ වුණා. ඒ වාගේම ඒවා නැවත පැවරුවේ නැහැ, ඒ පූර්ණ කාලය පුරාම. අධිකරණයෙන් නැවත නඩු

පැවරීමේ අයිතිය රඳවාගෙන ඉල්ලා අස්කර ගැනීම් කළත් ඒවා සිදු වුණේ නැහැ. මෙම තත්ත්වයන් තුළ බරපතළ දේශපාලන පොරොන්දුවක් පසුගිය ජනාධිපතිවරණයේ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා විසින්ම ලබා දුන්නා, නැවත නඩු පවරන්න. අද මේ ඉදිරිපත් කරපු සංඛ්‍යා තුළ සංඛ්‍යාත්මක වශයෙන් නැවත පැවරූ නඩු සංඛ්‍යාව විධියට 65ක් තිබුණත්, දේශපාලනය හා සම්බන්ධ ඉතාම බරපතළ, ඒ වාගේම විශාල මුදල් ප්‍රමාණයන් හා සම්බන්ධ නඩු එකක්වත් මේ වනතෙක් නැවත පවරා නැහැ. ඇත්තටම ගැටලු තිබෙන බැරෑරුම් නඩු නැවත පවරා නැහැ, ගරු අගමැතිතුමියනි. ඔබතුමියට පැහැදිලි කරන්න පුළුවන්ද, ඒ ගැන? මේ සභාවේත් ඉන්නවා, සමහර සැකකරුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අපේ නලින්ද ඇමතිතුමා ඒ ගැන හොඳට දන්නවා, එතුමාට ඒ පිළිබඳ අවබෝධයකුත් තිබෙනවා. බරපතළ දූෂණ හා සම්බන්ධ, බරපතළ වැරදි හා සම්බන්ධ නඩු නැවත නොපැවරීමට හේතුව ගැන -එක එක නඩුව ඇයි නැවත නොපැවරුවේ කියලා- ඔබතුමියට පැහැදිලි කරන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, නඩු 102ක් තිබෙනවා. ඒ නඩු 102 පිළිබඳවම විස්තර මට නැහැ. එතුමා ප්‍රශ්නය අහලා තිබුණේ නැවත නඩු කීයක් පවරනවාද කියලා. ඒකට තමයි මම පිළිතුර සපයාගෙන තිබෙන්නේ. ඒ නඩු 102න් 65ක් මේ වනකොට නැවත පවරා තිබෙනවා. තව 3ක් සලකා බලමින් සිටින්නේ. මේ කාලය තුළ විමර්ශනය වන නඩු දිහා බැලුවොත්, නැවත අත්අඩංගුවට ගන්න ඒ නඩු ක්‍රියාවලිය ගැන යම් අදහසක් තිබෙනවා නම්, කාවවත් ආරක්ෂා කරන්නේ නැහැ කියන එක ඉතාම පැහැදිලියි. මේ පාර්ලිමේන්තුවෙත් ඉන්න සහ මේ පාර්ලිමේන්තුවේ හිටපු බොහෝ බලවත් අයට එරෙහිව ඒ ක්‍රියාමාර්ග නැවත ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමා හොඳින් දන්නවා, සමහර නඩු ඉතාම පරණ බව. අවුරුදු 15ක්, 20ක් විතර පරණ සිද්ධීන් පිළිබඳ විමර්ශන කරමින් තමයි නැවත නඩු පවරන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකට යම් කාලයක් ගත වනවා. නමුත්, නඩු 102න් 65ක් නැවත අපි පවරලා තිබෙන්නේ. තව නඩු 3ක් පිළිබඳ සලකා බලමින් සිටින්නේ. මේ වනකොට ගත්ත ප්‍රගතිය දිහා බැලුවොත්, එතුමා කියන ඒ කථාව සාධාරණ නැහැ කියලායි මම හිතන්නේ. අපි තරාතිරම බලලා නොවෙයි මේවා තීරණය කර තිබෙන්නේ කියන එක ඉතාම පැහැදිලියි. තිබෙන සාක්ෂි අනුව අපට ගන්න පුළුවන් පියවර සියල්ලම අපි අරගනිමින් ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවන අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, තරාතිරම පිළිබඳ ප්‍රශ්නය මතු කළ නිසා මා මේ කාරණය කියන්න කැමැතියි. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට එරෙහිව අල්ලස් හා දූෂණ විරෝධී ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරියේ පවරා තිබුණු නඩුව ඔහු ජනාධිපති වෙලා දින 2ක් ඇතුළත ඔහුට ඇති මුක්තිය නිසා අස්කර ගත්තා. ඔහුට දැන් මුක්තිය නැහැ. ඒ නිසා නැවත නඩුව පවරන්න පුළුවන්. ඒක හොඳට සාක්ෂි තිබුණු නඩුවක්. ඒ වාගේම නඩු විභාගය ආරම්භ කර තිබුණු නඩුවක්. නමුත්, අද වනතුරු නැවත ඒ නඩුව පැවරුවේ නැහැ. ඒක කවුරුත් දන්නවා. තරාතිරම අනුව ඉහළයි, සිද්ධිය බරපතළයි, අස්කර ගත්තේ මුක්තිය නිසා. දැන් මුක්තිය නැහැ, නීතිය අනුව. මොකද, ජනාධිපති ධුරයෙන් අයින් වුණාම මුක්තිය පිළිබඳ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. ඔබතුමා හොඳින් දන්නවා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම බොහොම කෙටියෙන් කියන්නම්. තරාතිරම ගැන නේ මතු කළේ.

ඊළඟට, හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා හා සම්බන්ධ ග්‍රීක බැඳුම්කර නඩුව ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ අස්කර ගත්තා. "මම වරද පිළිගන්නේත් නැහැ, ගෙවන්නේත් නැහැ" කියලා ඔහු කියද්දී මේ ආණ්ඩුව යටතේ ඒ නඩුව අස් කර ගත්තා. ඒ කියන්නේ මේ ඉල්ලා අස් කර ගැනීමේ ක්‍රීඩාව තවම සිද්ධ වෙනවා. ඒ වාගේම නැවත නඩු පැවරීමේදී තෝරා-තෝරා තරාතිරම අනුව තමයි ඒවා සිද්ධ වෙන්නේ. ඒකයි, අගමැතිතුමියනි තිබෙන ප්‍රශ්නය. කරුණාකරලා ආණ්ඩුව වශයෙන් ඔබතුමිය මේ ගැන සොයා බලන්න. මේ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්න.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කරපු ඒ ප්‍රකාශය අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. ඒ විධියට අපි තරාතිරම බලලා කවුරු හෝ කෙනෙක්ව ආරක්ෂා කරනවා නම්, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාට එරෙහිව කරන නඩු කටයුතු අපි කරගෙන යන්නේ නැහැ. එම නිසා ඒ විධියේ කිසිම දෙයක් නැහැ. අපි ඒ නීති කටයුතුවලට අවශ්‍ය සාක්ෂි සහ තත්ත්වයන් තුළ කාවවත් ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම මේ ගැන පුදුම වෙනවා. ආණ්ඩු බලයේ හිටපු කාලය තුළ එකිනෙකාව ආරක්ෂා කරපු අයම, අපි මේ කටයුතු හරියට, පිළිවෙළට කරගෙන යනකොට අපි ඒ අයව ආරක්ෂා කරනවාද කියලා අහන එකම විහිළුවක්. අපි කිසිසේත්ම ඔවුන්ව ආරක්ෂා කරන්නේ නැහැ. පවරන නඩුත් අපි ඒ විධියටම කරගෙන යනවා, කාවවත් ආරක්ෂා කරන්නේත් නැහැ, ඉදිරියටත් අපි ඒ කටයුත්තේ ඍජුවම නියැළී ඉන්නවාය කියන එක මම නැවත වතාවක් අවධාරණය කරනවා.

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව: විස්තර
அரசாங்கத் தகவல் திணைக்களம்: விபரம்
DEPARTMENT OF GOVERNMENT INFORMATION: DETAILS

263/2024

**4. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද දිනය කවරේද;

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

(ii) එම දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන කවරේද;

(iii) මේ වනවිට එම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරය කවරේද;

(v) එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නම කවරේද;

(vi) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத் தகவல் திணைக்களம் ஆரம்பிக்கப் பட்ட திகதி யாது என்பதையும்;

(ii) அத்திணைக்களத்தின் கீழுள்ள நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) இன்றளவில் அத்திணைக்களத்தில் கடமை யாற்றும் அலுவலர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி திணைக்களத்தின் தற்போதைய பணிப் பொறுப்பு யாது என்பதையும்;

(v) மேற்படி திணைக்களத்தின் பணிப்பாளர் நாயகத் தின் பெயர் என்ன என்பதையும்;

(vi) அவருடைய கல்வித் தகைமைகள் யாவை என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) date on which the Department of Government Information was established;

(ii) names of the institutions coming under the purview of the Department concerned;

(iii) number of employees currently employed in the Department;

(iv) present role of the Department;

(v) name of the Director General of the Department; and

(vi) educational qualifications of the Director General concerned?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ අනුව 1948 ජූලි මස 31වන දින කොළඹ ගාලු මුවදොර පිහිටි මහලේකම් කාර්යාලයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

(ii) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ ආයතන කිසිවක් නොපවතී. එහෙත්, මෙරට පරිපාලන දිස්ත්‍රික්ක 25හිම දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් දිස්ත්‍රික් මාධ්‍ය ඒකක පිහිටුවා ඇත.

(iii) 301කි.

(iv) ඉහළ සංවර්ධන මට්ටමක් සහ තිරසර ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන සහභාගි කර ගනිමින් සන්නිවේදනයෙන් දායක වීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේය.

- අමාත්‍යාංශයන්හි අදාළ තොරතුරු ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම.
- රජයේ සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන් සහ හදිසි තත්ත්වයන් පිළිබඳව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන ප්‍රගතිය පිළිබඳ චිත්‍රපට හා වීඩියෝ දර්ශන මාර්ගයෙන් මහජනතාව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන තොරතුරු, ඓතිහාසික තොරතුරු හා අනෙකුත් කාලයේ වැදගත්කමක් ඇති තොරතුරු පිළිබඳ ප්‍රවෘත්ති හා වාර්තා වීඩියෝ චිත්‍රපට නිෂ්පාදනය කිරීම.
- පර්යේෂණාත්මක වාර්තා චිත්‍රපට නිෂ්පාදනය.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා දේශීය තොරතුරු විදේශවලටත්, විදේශ තොරතුරු මෙරටට ගෙන්වාගෙන ජනතාවට ලබා දීමට කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවේ සමාජ මාධ්‍ය ජාලා හා νε ωσ.λκ වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම පවත්වාගෙන යෑම.
- දෙසතිය සහරාව, රජයේ සංදේශය හා විමර්ශන සහරා යාවත්කාලීනව පවත්වාගෙන යෑම.
- රජයේ ප්‍රකාශන කාර්යාංශය ක්‍රියාකාරීව පවත්වාගෙන යෑම.
- දේශීය හා විදේශීය මාධ්‍යවේදීන් ජාතික මෙහෙවර සහ රාජතාන්ත්‍රික උත්සව සඳහා සම්බන්ධීකරණය.
- ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්න සහ අමාත්‍යාංශයන්හි නව වැඩ පිළිවෙළ ජනතාව අතරට ගෙනයෑම සඳහා මාධ්‍ය චාරිකා සංවිධානය කිරීම.
- ජාතික වශයෙන් වැදගත් උත්සවවල ප්‍රධාන මාධ්‍ය සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.
- වෘත්තීය ප්‍රාදේශීය හා විදේශ මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම් පත් නිකුත් කිරීම.
- රේඛීය අමාතයාංශයන්හි මාධ්‍ය ඒකක සමඟ සමීප සම්බන්ධීකරණය පවත්වාගෙන යෑම.

- කාලීන හා ජාතික වශයෙන් වැදගත් වන සිදුවීම්වලට අදාළ පොත් මුද්‍රණය කිරීම.
- ජනාධිපතිවරයාගේ දේශීය හා විදේශීය නිල උත්සවයන්හි මාධ්‍ය ආවරණය මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තා වශයෙන් රැස් කර තැබීම.
- දෛනිකව භාෂාත්‍රයෙන්ම පළවන පුවත්පත් වාර්තා විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීම.

(v) හර්ෂ ශ්‍රී ක්‍රිෂ්මල් ජයරත්න බණ්ඩාර (එච්.එස්.කේ.ජේ. බණ්ඩාර)

(vi)
- ව්‍යාපාර පරිපාලනපති උපාධිය - Master of Business Administration: 2017.12.15 - රජරට විශ්වවිද්‍යාලය.
- පරිසර විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - Postgraduate Diploma in Environmental Science: 2009.01.16 - පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
- ජීව විද්‍යා උපාධිය - Bachelor of Scienc: 2007.06.05 - පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, එතුමා හොඳ නිලධාරියෙක්. අපි ඒ බව දන්නවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ ඔබතුමාගේ යාළුකම හැර එතුමා ජනමාධ්‍ය පිළිබඳ කිසිම පාඨමාලාවක් හදාරා නොතිබීමයි. ඒක පළමුවැනි කාරණය. ඒ නිසාම තමයි එතුමා ගිය සතියේ කිව්වේ, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි අග්‍රාමාත්‍යතුමිය මෙහෙම ප්‍රවෘත්ති පත්‍ර සාකච්ඡාවකට සම්බන්ධ වෙන්නේ කියලා. ඒ අනුව ඔබතුමාට තේරෙනවා ඇති, එහි තිබෙන අර්බුදය මොකක්ද කියලා. ඒ කාරණය මතු කරන ගමන්, දෙවනුව මම ඔබතුමාගෙන් තවත් කාරණයක් ගැන අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඒ ආයතනය සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය ගැන අපි කමිටු ගණනාවක සාකච්ඡා කළා. එහි සිටින තුන්සිය ගණනක නිලධාරි මණ්ඩලය ස්ථාපිත වෙලා ඉන්නේ කොහොමද කියන එක පිළිබඳව, ඔවුන්ගේ දීමනා පිළිබඳව, ඔවුන්ගේ උසස්වීම් පිළිබඳව අපි සාකච්ඡා කළා. ඒ නිලධාරින් උසස්වීම් නැතිව අවුරුදු ගණනක් හිර වෙලා සිටින තත්ත්වයක් තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, කරුණාකර මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. අධ්‍යක්ෂ ජනරාල්තුමාටත් අපි මේ ගැන කිව්වා. මේ සම්බන්ධව සොයා බලා විධිමත් ක්‍රමවේදයක් හදන්න වැඩ කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, අවුරුදු ගණනක් තිස්සේ ඒ 300දෙනා විශාල අර්බුදයක ඉන්නවා. ඒගොල්ලන්ට වැඩ කරන්න බැරි තැනකට එය තල්ලු වෙලා තිබෙනවා. ඒ නිසා system එකක් හදන්න වෙයි. ඒ අයගේ උසස්වීම් ටික හදලා, ඒ හැම කෙනෙකුටම ස්ථාවරව අඩියක් ඉදිරියට යන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදන්න අවශ්‍ය කරන කටයුතු ටික කරන්න කියලා මම ඔබතුමාගේ ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, හර්ෂ ශ්‍රී බණ්ඩාර මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක්. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් තමයි ඉතිහාසයේත් පත් කරලා තිබෙන්නේ. එතුමා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් හැටියට කාලයක් තිස්සේ වැඩ කරපු දක්ෂ නිලධාරියෙක්. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාත් එතුමාව හොඳට දන්නවා. එම තනතුර, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින්ගෙන් පත් කරන තනතුරක්. එහිදී මාධ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් උපාධියක් තිබුණාද, පශ්චාත් උපාධියක් තිබුණාද කියන එක කවදාවත් අදාළ කරගෙන නැහැ. ඒ ගැන කියන්න තිබෙන්නේ එයයි.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු දෙවැනි කාරණය ඇත්ත. ඔබතුමාම දන්නවා ඇති, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව දශක ගණනාවක් තිස්සේ වැඩි අවධානයකට ලක් නොවුණු ආයතනයක් බව. මොකද, ජනමාධ්‍යවල වැඩ ඉතිරි ඔක්කොම අමාත්‍යාංශවලින් පවරාගෙන කරපු තත්ත්වයක් තමයි තිබුණේ. ඒ නිසා එහි උසස්වීම් සම්බන්ධව ප්‍රශ්න කිහිපයක් පැන නැඟිලා තිබෙනවා. දැන් ඒවා නිරාකරණය කරගෙන යනවා. එය, ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සහ රජයේ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී තීරණාත්මක ආයතනය බවට පත් විය යුතු තැනයි. අපි ඒකට පසුගිය අවුරුද්දේත් ප්‍රතිපාදන වෙන් කළා. බඳවා ගැනීම් කිහිපයකුත් කරලා තිබෙනවා. ඔබතුමා කියපු කාරණය හරි. අපි ඒ ගැන අවධානය යොමු කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියන්නේ සමහර කාරණා ගැන බොහොම සානුකම්පිකව බලන කෙනෙක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා බරපතළ කාරණයක් මතු කළා. ප්‍රශ්නය වී තිබෙන්නේ එයයි. ඒ කාරණය ලංකාව පුරාම විශාල වශයෙන් සාකච්ඡාවට බඳුන් වුණා. යම් යම් කරුණු හේතුවෙන් මාධ්‍ය ආයතනවල බලපත්‍ර අහෝසි කරන්න ඔබතුමා කටයුතු කරනවා කියලා කිව්වා. ඇත්තටම මාධ්‍ය ආයතනවල අය තමන්ගේ මාධ්‍යවල ප්‍රවෘත්ති පළ කරන කොට විශාල වගකීමක් ඇතිව කටයුතු කරන අයයි. හැබැයි, සමහර වෙලාවට ඔබතුමන්ලාට ඒක විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඉතිහාසයේ රාජ්‍ය ආරක්ෂක ඇමතිවරුන් ඔය කථාව කිව්වාට, මාධ්‍ය ඇමතිවරයෙක් මාධ්‍ය ආයතනවල බලපත්‍ර අහෝසි කරන්න කටයුතු කරනවා කියන කාරණය, බලපත්‍ර ආපහු පවරා ගන්න කටයුතු කරනවා කියන කාරණය කිසි දවසක කියලා නැහැ. මා හිතන විධියට, මේ ආණ්ඩුවේ විවිධ කරුණු ජනමාධ්‍ය හරහා හෙළිදරව් වීමත් එක්ක ඇති වුණු ප්‍රශ්නයක් මේ තිබෙන්නේ. ඒ නිසා මම අහන්න කැමැතියි, ඔබතුමා තවදුරටත් ඒ මතයේම ඉන්නවාද, මේ දීලා තිබෙන බලපත්‍ර අහෝසි කරන්න කටයුතු කරන්න ඔබතුමා පියවර ගන්නවාද කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය ඇමතිවරයා හැටියට මට වගකීමක් තිබෙනවා, ජනතාවට සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම තහවුරු කිරීමට. ඒ වාගේම රූපවාහිනී ආයතනවලට විකාශන බලපත්‍ර ලබා දීමේදී, ඒ සියල්ල ලබා දී තිබෙන්නේ තාවකාලික බලපත්‍ර හැටියටයි. ඒ අය කොන්දේසිවලින් බැඳෙනවා, විශේෂයෙන් ජාතික ආරක්ෂාව, සෞඛ්‍ය වැනි කාරණාවලදී ජනතාවට සත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න. ජාතික ආරක්ෂාව පැත්තකින් තියලා මගේ විෂය පැත්තෙන් බැලුවොත්, සෞඛ්‍ය සම්බන්ධයෙන් අසත්‍ය, විකෘති තොරතුරු ඉදිරිපත් කරපු අවස්ථා කිහිපයක් පසුගිය කාලයේ අපි දැක්කා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

උදාහරණයක් හැටියට ගන්න පුළුවන්, එක්තරා රූපවාහිනී නාළිකාවක් human immunoglobulin ඖෂධය සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු ප්‍රවෘත්තිය. ඒක ඉතාම සාවද්‍ය ප්‍රවෘත්තියක්. ඒක හිතාමතා කරපු විකෘති කිරීමක්. Human immunoglobulin ඖෂධය ගෙන්වීමේ වැරැදි ක්‍රමවේදය නිසා කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාට නඩු පවරා තිබෙනවා. හැබැයි එහෙමයි කියලා දැන් ගෙන්වන human immunoglobulin ඖෂධය කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාට නඩු පවරපු එකත් එක්ක සම්බන්ධ කිරීමේ අරමුණ මොකක්ද? ඒක තමයි, මේ ඖෂධය සම්බන්ධයෙන් ජනතාව තුළ බලවත් අවිශ්වාසයක් ගොඩනගන එක. එහෙම දේවල් කරන්න ජනමාධ්‍යයට අයිතියක් නැහැ. ඒගොල්ලෝ විශේෂයෙන් සෞඛ්‍ය සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට බැඳිලා ඉන්නවා. ඒගොල්ලෝ licence එක ලබා ගන්න කොට, එහි information detrimental to the interest of public health යන්න දක්වා තිබෙනවා. මම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා. කවුරු හරි සෞඛ්‍ය සම්බන්ධයෙන් වැරැදි තොරතුරක් ඉදිරිපත් කරලා; රජයේ රෝහල් පද්ධතිය ගැන, මේ ඖෂධ ගැන, පරීක්ෂණ ගැන, සෞඛ්‍ය ක්‍රමවේද ගැන විකෘතිසහගතව අසත්‍ය තොරතුරු පළ කරලා ජනතාව විද්‍යානුකූල ක්‍රමවේදයකින්, සෞඛ්‍ය පද්ධතියෙන් අයින් කරන්න කටයුතු කරනවා නම් ඒකට එරෙහිව මතයක් ප්‍රකාශ කිරීමට අයිතියක් මට තිබෙනවා. ඒක තමයි මම කිව්වේ.

අනෙක් කාරණය මේකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කලබල වෙන්න එපා. ඒ වැරැද්ද කරපු මාධ්‍ය ආයතනයම ඊට පස්සේ ඒක නිවැරැදි කළා. මෙතැන තිබෙන්නේ ආණ්ඩුව විවේචනය කිරීම සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමන්ලා ආණ්ඩුව ඕනෑ තරම් විවේචනය කරනවා නේ. පාර්ලිමේන්තුවේදී විවේචනය කරනවා, මාධ්‍ය ඉස්සරහාත් විවේචනය කරනවා නේ. විවේචනය කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත් විශේෂයෙන් ජනතාවගේ සෞඛ්‍යට බලපාන අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන්න එපා, එවැනි අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන අයට උඩගෙඩි දෙන්න එපා කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

## මඩකලපුව, පෙරිය පෝරතිව් සහ පලුකාමම් සම්බන්ධ කරන පාලම: ප්‍රතිසංස්කරණය
## மட்டக்களப்பு, பெரிய போரதீவையும் பழுகாமத்தையும் இணைக்கும் பாலம்: புனரமைத்தல்
## BRIDGE CONNECTING PERIYA PORATIVU AND PALUKAMAM IN BATTICALOA: RECONSTRUCTION

340/2024

**5. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, පෝරතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පෙරිය පෝරතිව් සහ පලුකාමම් යන ප්‍රදේශ සම්බන්ධ කරමින් ඉදිකර ඇති පාලම ප්‍රතිසංස්කරණය කළ යුතු බවත්;

(ii) එම පාලමෙන් ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම ජනතාවට දැඩි දුෂ්කර කාර්යයක් බවත්; එතුමා පිළිගන්නේද?

(ආ) එසේ නම්, ඉහත පාලම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின், போரதீவுப்பற்று பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பெரிய போரதீவு மற்றும் பழுகாமம் ஆகிய பிரதேசங் களை இணைக்கும் வகையில் அமைக்கப் பட்டுள்ள பாலம் புனரமைக்கப்பட வேண்டும் என்பதையும்;

(ii) குறித்த பாலத்தின் ஊடான போக்குவரத்து வசதிகளை மேற்கொள்வது பொது மக்களுக்குப் பெரும் நெருக்கடியாக உள்ளது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ஆமெனில், மேற்படி பாலத்தைப் புனரமைப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he accept that the -

(i) bridge connecting Periya Porativu and Palukamam areas within the Porativupattu Divisional Secretary's Division of Batticaloa District requires to be reconstructed; and

(ii) people face significant difficulties in using this bridge for transportation?

(b) If so, will he inform this House whether steps will be taken to reconstruct the aforementioned bridge?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i), (ii) ඔව්.

(ආ) ඔව්.

පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 120ක ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) මඟින් දැනටමත් මූලික ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 40ක ප්‍රතිපාදනයක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, மிக முக்கியமாக பிரதேச சபைகளுக்குச் சொந்தமான பாதைகள் மற்றும் மாகாண சபைகளுக்குச் சொந்தமான பாதைகளின் அபிவிருத்தி சம்பந்த மாக எங்களுடைய மாவட்டத்தில் பாரிய சிக்கல்கள் தொடர்ச்சியாகக் காணப்படுகின்றன. பெரிய போரதீவு - பழுகாமம் பாலத்தின் புனரமைப்புக்காக RDA ஊடாக 40 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கியிருப்பதாகவும், இப்பாலத்தின் புனரமைப்புப் பணிகளை Transport and Highways Ministry உடன் இணைந்து மேற்கொள்ளப்போவதாகவும் கௌரவ அமைச்சர் அவர்கள் சொல்லியிருந்தார்.

கௌரவ அமைச்சர் அவர்களே, எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் படுவான்கரைப் பிரதேசத்தையும் எழுவான்கரைப் பிரதேசத்தையும் இணைக்கக்கூடிய வகையில் பல பாலங்கள் இருக்கின்றன. 2024ஆம் ஆண்டு டிசம்பர் மாதத்தில் நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்தபொழுதுகூட, இப்பாலங்களைப் புனரமைப்பது பற்றி பேசினோம். இதுதவிர, இன்னும் பல தடவை பேசியிருக் கிறோம். கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் மட்டக்களப்பு மாவட்டத்துக்கு வருகைதந்த பொழுதுகூட, நாங்கள் சில பாலங்களை அமைப்பதற்கான வேண்டுகோளை நேரடியாகவே முன்வைத்தோம். எங்களுடைய பிரதேச அபிவிருத்திக் குழுத் தலைவரும் இச்சபையில் இருக்கிறார்.

கௌரவ அமைச்சர் அவர்களே, பட்டிருப்புப் பாலத்தின் அபிவிருத்தி சம்பந்தமாக நாங்கள் கோரிக்கை முன்வைத்திருக்கிறோம். எனினும், இதுவரை அதற்கான வேலைகள் நடந்ததாகத் தெரியவில்லை. அதேபோல், மண்டூர் - குருமன்வெளி பாலம், அம்பிளாந்துறை - குருக்கள்மடம் பாலம், நரிப்புல் தோட்டத்துக்குச் செல்வதற்கான பாலம் என்பன சம்பந்தமாகவும் எந்த நடவடிக்கையும் எடுத்ததாக எங்களுக்குத் தெரியவில்லை. மகிழவெட்டுவான் பாலம் கடந்த வெள்ள அனர்த்தத்தால் பாதிக்கப்பட்டது. எனினும், இதுவரை புனரமைக்கப்பட்டதாகத் தெரியவில்லை. அதேபோல்தான் கிரான் பாலமும். கௌரவ அமைச்சர் அவர்களே, நான் சொல்லவருகின்ற விடயம் என்னவென்றால், படுவான்கரை யையும் எழுவான்கரையையும் இணைத்து, எங்களுடைய மக்களுடைய வாழ்க்கையை efficient ஆக்குவதற்கு -நேரத்தை வீணடிக்காத முறையில் செய்வதற்கு- உங்களுடைய மாகாண அமைச்சினூடாக இந்த அதிகாரங்களைப் பயன்படுத்த வேண்டும் என்பதைத்தான். நீங்கள் உங்களுடைய பதிலில் குறிப்பிட்டிருந்தீர்கள், Transport and Highways Ministry உடன் பேசி -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, could you shorten your Supplementary Question?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, I am trying to explain it to the Hon. Minister because, otherwise, there is no point.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

No, you limit it to two minutes. Now, you have taken almost two minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

It is okay, Sir, because we only get to ask Questions once in four months. We have discussed this at the Parliamentary Business Committee as well.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Please, shorten your Question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

I was just concluding my Question. Please, do not interrupt me.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon Member, you have already taken the two minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Okay.

கௌரவ அமைச்சர் அவர்களே, RDAயுடன் இணைந்து இந்தப் பாலங்களைப் புனரமைப்பதற்கு ஏதாவது வேலைத் திட்டமொன்றை நீங்கள் வைத்திருக்கின்றீர்களா? எப்படி இதற்கான நிதி ஒதுக்கீட்டைச் செய்யப் போகின்றீர்கள்? என்பது சம்பந்தமான விளக்கத்தை நான் உங்களிடம் எதிர்பார்க்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මුලික ප්‍රශ්නයට අදාළව තමයි මම පිළිතුර ලබා දුන්නේ. නමුත් එතුමා තවත් මාර්ග, පාලම් කිහිපයක් ගැන තොරතුරු ඉදිරිපත් කළා. මේක, මඩකලපුවේ වාගේම රටේ අනෙකුත් ප්‍රදේශවලත් අඩු වැඩි වශයෙන් දකින්න පුළුවන් තත්ත්වයක්. ඒ නිසා රජය හැටියට අපි 2026 අය වැයේදී මාර්ග සංවර්ධනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ප්‍රතිපාදනය කර තිබෙනවා. ඒවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කරලා ඒ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල නිර්දේශ සහිතව ඉදිරිපත් වුණොත් ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඒවා ප්‍රතිසංස්කරණය කරන්න අපට පුළුවන්. එහෙම කළොත් අප ඒ වෙනුවෙන් කටයුතු කරනවා කියන එක මා සඳහන් කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்டதுபோல, ஏனைய மாவட்டங்களை மட்டக்களப்பு மாவட்டத்துடன் ஒப்பிட முடியாது. ஏனெனில், மட்டக்களப்பு மாவட்டமானது, 6 வாவிகளால் படுவான்கரை, எழுவான்கரை எனப் பிரிக்கப்பட்டு இருக்கின்றது. எனவே, ஏனைய மாவட்டங்களில் இருக்கின்ற பாலங்களையும் அங்குள்ள பாலங்களையும் நீங்கள் ஒன்றாகக் கருத முடியாது.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் பிரதேச அபிவிருத்திக் குழுவின் தீர்மானம், மாவட்ட அபிவிருத்திக் குழுவின் தீர்மானம் பற்றி சொன்னீர்கள். இது சம்பந்தமாக ஏற்கனவே தீர்மானங்கள் எடுக்கப்பட்டு, அமைச்சரவைக்கும் வழங்கப்பட்டு இருக்கின்றது. நீங்கள் பிரதேச அபிவிருத்திக் குழுவின் தீர்மானம் பற்றி சொன்னதன் காரணமாக, நான் ஒரு விடயத்தைக் குறிப்பிடுகின்றேன். மட்டக்களப்பு மாவட்டத்தின் போரதீவுப்பற்றிலுள்ள சமலையடிவெட்டை என்ற பாதை 2024ஆம் ஆண்டு வெள்ளத்தால் பாதிக்கப்பட்டது. அந்தப் பாதையைப் புனரமைக்க வேண்டுமென்ற கோரிக்கையை நான் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்தில் முன்வைத்தேன். அப்போது, அங்கிருந்த அதிகாரிகள் அந்தப் பாதைக்கு ஏற்கெனவே நிதி ஒதுக்கப்பட்டு இருப்பதாகச் சொன்னார்கள். எனினும், இன்றுவரை அந்தப் பாதை புனரமைக்கப் படவில்லை. அந்தப் பாதை 2025ஆம் ஆண்டு ஏற்பட்ட வெள்ளத்தாலும் சேதமடைந்தது. இது பற்றி எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்கள் பல தடவை பேசி இருக்கிறார்கள்.

நாங்கள் பேசி, காக்காச்சிவட்டையில் இருந்து ஆனைகட்டியவெளி வரைக்குமான வீதியை அபிவிருத்தி செய்வதற்கு குறிப்பிட்டளவு நிதியைப் பெற்றுக்கொடுத்தும், உங்களுடைய செயற்றிறன் இல்லாத செயற்பாடுகளால் அந்த நிதியில் குறிப்பிட்டளவு தொகை மீண்டும் மத்திய அரசாங்கத்துக்குத் திரும்பிப் போயிருப்பதாக பிரதேச செயலாளர் சொல்கின்றார். பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களில் தீர்மானங்களை எடுத்து, அவற்றைச் சமர்ப் பித்து, நாங்கள் அமைச்சர்களுடன் பேசியும், அபிவிருத்திக் குழுக் கூட்டங்களில் சண்டைபிடித்தும் இன்றுவரை போரதீவுப் பற்று, சமலையடிவெட்டை பிரதேசத்தில் இருக்கின்ற மக்கள் அந்தப் பாதையைப் பயன்படுத்த முடியாத நிலையில் இருக்கிறார்கள். பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்தின் தீர்மானம் வேண்டும் என்றும் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தின் தீர்மானம் வேண்டும் என்றும் நீங்கள் சொல்கின்றீர்கள். இவற்றின் தீர்மானங்களை எடுத்து உங்களுக்கு வழங்கிய பிற்பாடு, அனுப்பிய நிதியைவைத்து வேலைத்திட்டத்தை முடிக்க முடியாத, செயற்றிறன் இல்லாத நபர்கள்தான் நீங்கள் என்பதை ஏற்றுக்கொள்வீர்கள் என்றால், அதற்கு அப்பால் கேள்வியே இல்லை. நன்றி!

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් මාර්ග සම්බන්ධව ඉදිරිපත් කළ ඒ තොරතුරු මට ලැබී නැහැ. මොකද, එතුමා ඒ පිළිබඳව කලින් සඳහන් කර තිබුණේ නැහැ. නමුත් එතුමා සඳහන් කරන ආකාරයට යම් කිසි ගැටලුසහගත තත්ත්වයක් තිබෙනවා නම්, ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරන්න සූදානම්. මාර්ග සියල්ලම ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑය කියන ස්ථාවරයේ අපි ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳව සොයා බලා, ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -472/2025- (1), ගරු රවී කරුණානායක මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, අපේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ මහපොළ ශිෂ්‍යත්ව අරමුදල ගැනයි. එම ප්‍රශ්නයේ I වන කොටසට කඩිනමින් උත්තර ලබා දෙන්න එම ආයතනයට හැකියාවක් තිබුණා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම ප්‍රශ්නයේ II වන කොටසින් අසා තිබෙන ප්‍රශ්නවලට අදාළව පිළිතුරු සැපයීමේදී ඔවුන්ට යම් සංකීර්ණතාවක් මතු වුණා, ඒ අයට තව වාර්තා ටිකක් හදා ගන්න අවශ්‍ය නිසා. මොකද, අලුතින් තමයි එම කාර්ය මණ්ඩලය බඳවා ගත්තේ.

ඒ නිසා ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේක අපි පුරුද්දක් විධියට අසා තිබෙන පිළිතුරක්. මෙහෙම වෙන්න ගියොත්, අපට ප්‍රශ්න 4යි, 5යි අවුරුද්දකට අහන්න සිද්ධ වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර වැඩ කටයුතු කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ ප්‍රශ්නයට සුමානයකින් පිළිතුරු ලබා දෙන්න බැහැ නේ.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ආපදා කළමනාකරණය: ක්‍රියාමාර්ග
## அனர்த்த முகாமைத்துவம்: நடவடிக்கை
## DISASTER MANAGEMENT: MEASURES TAKEN

622/2025

**7. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තා වූ ආපදා සිද්ධි සංඛ්‍යාව, එම සිද්ධිවලදී ආපදාවට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ එම පුද්ගලයන්ට ගෙවන ලද වන්දි මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ආපදා කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ලෝකයේ බොහෝ රටවල් ආපදා කළමනාකරණය සඳහා සුවිශේෂ අවධානයක් යොමු කරන බව දන්නේද;

(iv) ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கையில் அறிக்கையிடப்பட்டுள்ள அனர்த்தங்களின் எண்ணிக்கை, அந்தச் சம்பவங்களால் அனர்த்தங்களுக்குள்ளான ஆட்களின் எண்ணிக்கை மற்றும் குறித்த ஆட்களுக்கு வழங்கப்பட்ட நட்டஈட்டுத் தொகை ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை அனர்த்த முகாமைத்துவத்துக்குச் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) உலகில் பெரும்பாலான நாடுகள் அனர்த்த முகாமைத்துவம் தொடர்பில் விசேட கவனம் செலுத்துவதை அறிவாரா என்பதையும்;

(iv) அனர்த்த முகாமைத்துவம் தொடர்பில் இலங்கை மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the number of disaster incidents reported in Sri Lanka, the number of individuals affected by the disasters and the amount of compensation paid to the individuals so affected in each year from the year 2015 up to now, separately;

(ii) the amount of money spent on disaster management from the year 2015 up to now;

(iii) whether he is aware that many countries around the world pay special attention to disaster management; and

(iv) the measures that have been taken by Sri Lanka regarding disaster management?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය යොමු කර තිබුණේ, ඇත්තටම "දිට්වා" සුළි කුණාටුව එන්න කලින්. ඊට අදාළ statistics ගොඩක් තිබෙනවා. අද තත්ත්වය ගත්තාම, ඒ statistics ගොඩක් වෙනස්. ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට තිබෙන පිළිතුර දීර්ඝ එකක් නිසා, ගරු මන්ත්‍රීතුමාගේ පහසුව පිණිස මම ඒ පිළිතුර සභාගත කරන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | ආපදා සිද්ධීන් සංඛ්‍යාව (ගංවතුර, නාය යාම්, සුළි සුළං, නියඟය, අකුණු අනතුරු) | බලපෑමට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව | ආයතනය | වන්දි මුදල (රුපියල්) (ආ.ස.සේ.ම. වාර්තා අනුව) |
|---|---|---|---|---|
| 2015 | 496 | 502,861 | ආ.ක.ම. | 739,013,345.17 |
| 2016 | 535 | 1,548,834 | ආ.ක.ම. | 5,738,192,406.99 |
| 2017 | 736 | 3,801,555 | ආ.ක.ම. | 10,652,257,212.94 |
| 2018 | 1,287 | 1,421,306 | ආ.ක.ම. | 13,669,862,484.97 |
| 2019 | 1,755 | 1,619,876 | ආ.ක.ම. | 2,737,162,087.21 |
| 2020 | 1,887 | 784,405 | ආ.ක.ම. | 1,351,419,675.94 |
| 2021 | 6,860 | 931,722 | ආ.ස.සේ.ම. | 1,319,545,453.37 |
| 2022 | 6,642 | 287,171 | ආ.ස.සේ.ම. | 790,091,189.53 |
| 2023 | 8,605 | 380,332 | ආ.ස.සේ.ම. | 922,975,381.22 |
| 2024 | 9,216 | 1,476,790 | ආ.ස.සේ.ම. | 1,781,843,020.88 |
| 2025.10.31 දක්වා | 6,398 | 216,998 | ආ.ස.සේ.ම. | 665,398,282.07 |

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

(ii) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - කාලගුණ අනාවැකිකරණය හා ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ බදු හා තීරු බදු වියදම් ප්‍රතිපූරණය සඳහා දරන ලද වියදම් (රුපියල්)

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාලගුණ අනාවැකිකරණය සඳහා වැය කරන ලද මුදල (රු.) | 6842134 | 4244910 | 3974120 | 6742111 | 7935577 | 10091141 | 20827969 | 23372925 | 24242039 | 20779149 | 24988372 |
| ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළ බදු හා තීරු බදු වියදම් ප්‍රතිපූරණය (රු.) | | | | | | | | | | | 95066879 |
| එකතුව (රු.) | 6842134 | 4244910 | 3974120 | 6742111 | 7935577 | 10091141 | 20827969 | 23372925 | 24242039 | 20779149 | 120055251 |

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් යටතේ වන අයිතමයන් 2015 - 2025.11 මස දක්වා

| | වැය ශීර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1. පුනරාවර්තන වියදම් (රුපියල් මිලියන)** | | | | | | | | | | | | |
| පුද්ගල පඩිනඩි | 1503 | 124.58 | 129.56 | 152.60 | 180.36 | 193.28 | 198.9 | 191.00 | 204.85 | 196.02 | 224.94 | 241.200 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 1509 | 42.92 | 64.69 | 109.53 | 102.21 | 91.64 | 70.10 | 69.00 | 76.20 | 79.48 | 89.34 | 88.700 |
| මුළු පුනරාවර්ථන වියදම් | | **167.50** | **194.25** | **262.13** | **282.57** | **284.92** | **269.00** | **260.00** | **281.05** | **275.50** | **314.28** | **329.900** |
| **2. ප්‍රාග්ධන වියදම් (රුපියල් මිලියන)** | | | | | | | | | | | | |
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සේවක ධාරිතා වර්ධනය ) හා වත්කම් අත්පත් කර ගැනීම( | 01-2201 | 2.115 | 2.473 | 5.170 | 8.000 | 6.940 | 7.520 | 6.380 | 3.240 | 5.420 | 9.950 | 3.330 |
| ආපදා බලපෑම් අවම කිරීම සඳහා වන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 02-2509 | 611.506 | 421.584 | 437.570 | 360.840 | 131.230 | 67.500 | 156.160 | 70.420 | 119.100 | 157.190 | 34.670 |
| ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම හා සූදානම් කිරීම | 03-2059 | 19.049 | 22.790 | 44.170 | 48.960 | 36.900 | 10.750 | 5.300 | 12.110 | 2.780 | 9.430 | 5.360 |
| ශ්‍රී ලංකාව සඳහා බහුවිධ අවධානම් පැතිකඩක් සංවර්ධනය කිරීම | 04-2509 | - | 10.090 | 0.264 | 20.370 | 9.720 | | 15.690 | 0.640 | | 0.030 | 0.220 |
| ගංවතුර සහ නායයාම් ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයේ ධාරිතාවය ශක්තිමත් කිරීම | 05-2509 | 45.529 | 71.790 | 70.000 | 75.371 | 13.720 | 16.580 | 0.200 | 4.110 | 4.930 | 6.490 | - - |
| ආපදා අවදානම් අඩු කිරීම සංවර්ධනය සමඟ ප්‍රධාන ප්‍රවාහ ගත කිරීම | 06-2509 | | 0 | 0.00 | 13.000 | 7.170 | 1.940 | 48.870 | | 0.180 | 0.301 | 0.800 |
| ප්‍රාදේශිය ආපදා අවදානම් අවම කිරීම් සැලසුම් සකස්කිරීමෙ වැඩසටහන | 07-2509 | | | | | | | 1.660 | 4.630 | 11.980 | 7.150 | - |
| නියගයට මුහුණදීම සඳහා ට්‍රැක්ටර් මවුන්ටඩ් පානීය ජල බවුසර් සහ බෝට්ටු මිලදී ගැනීම | 09-2501 | | | 117.287 | 20.000 | | | | | | | 0.120 |
| | | | | | | | | | | | | |
| මුළු ප්‍රාග්ධන වියදම් | | **678.199** | **528.727** | **674.461** | **546.541** | **205.680** | **104.290** | **234.260** | **95.150** | **144.390** | **190.550** | **44.500** |

ආපදා සහන සේවා මධ්‍යස්ථානය 2015 - 2025.10.31 දක්වා දරන ලද වියදම් (රුපියල්)

| ප්‍රතිපාදන වැය කරන ලද ශීර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 (.00) | 2024 (.00) | 2025.07.31 දක්වා වියදම (.00) | 2025.07.31 සිට 2025.08.31 දක්වා වියදම (.00) | 2025.09.01 සිට 2025.10.31 දක්වා වියදම (.00) | සහන සේවා සඳහා සිදුකර ඇති මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිවාස හානි | | 3359790095.00 | 2031604623.00 | 998423157.13 | 1084761640.48 | 213106271.43 | 349376912.43 | 228214979.62 | 350219724.54 | 805962198.91 | 159305420.00 | 61931056.71 | 122460052.38 | 765156131.63 |
| නැවත පදිංචි කිරීම | | | 467617525.00 | 1578837848.68 | 993773782.19 | 777082750.02 | 651596451.60 | 478632516.24 | 452640607.84 | 271115185.71 | 149523627.39 | 47402718.00 | 52480162.00 | 5920703237.67 |
| කඩිනම් සහන | 270815100.83 | 131987395.19 | 5853791366.19 | 5278532331.97 | 374835905.32 | 235292705.13 | 302872741.14 | 83243693.67 | 120115048.84 | 704765636.26 | 32796396.27 | 8296803.20 | 15337302.72 | 412682426.73 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සුරක්ෂිත මධ්‍යස්ථාන | | | | 92514601.41 | 78261000.94 | 56087140.84 | | | | | 6982414.98 | 514283.24 | 8367982.18 | 242727423.59 |
| කෑගල්ල සාමස්සර කන්ද නායයාම | | 90512594.03 | 1529314912.83 | 385883013.81 | 37981757.02 | 21679169.95 | | | | | | | | 206537144.64 |
| මීතොටමුල්ල නායයයාම | | | | | | | | | | | | | | |
| 2017-106-2-4-3-2509 වැය ශීර්ෂය | | | 18000000.00 | | | | | | | | | | | 18000000.00 |
| 06-2-4-9-1501 වැය ශීර්ෂය | | | 41150000.00 | 29253500.00 | 12956700.50 | | | | | | | | | 199970500.50 |
| 09-2-10-3-1508 වැය ශීර්ෂය | | | | | | | 2028048.20 | | | | | | | 2028048.20 |
| චීන මිත්‍රත්ව ගම්මානය – අරණායක නායයාම | | | 228000000.00 | | | | | | | | | | | 228000000.00 |
| කෑගල්ල සහ සාලාව ආපදා සඳහා | | | 387897535.92 | 5278532331.97 | | | | | | | | | | 5666429867.89 |
| ගංවතුර,නායයාම් සඳහා රු.7500/- දීමනා ගෙවීම වැය ශීර්ෂය 106-2-4-8-1508 | | | 94881250.00 | | | | | | | | | | | 94881250.00 |
| නිවාස කුලී දීමනා ගෙවීම වැය ශීර්ෂ106-2-4-8-1508 | | | | 3587100.00 | | | | | | | | | | 3587100.00 |
| විශේෂ නිවාස ව්‍යාපෘතිය - කෑගල්ල වැයශීර්ෂය - 409-2-10-3-2104/409-2-10-5-2202 | | | | 24298600.00 | 37981000.76 | 48171638.57 | 13671300.00 | | | | | | | 124122539.33 |
| ආහාර සහ නියඟ සහන (2-2502) | 7997071.99 | 10941045.00 | | | | | | | | | | | | 18938116.99 |
| ආපදා සහන පුනරුත්ථාපනය (5-3-2104) | 416466579.44 | | | | | | | | | | | | | 416466579.44 |
| ගංවතුරට ගොදුරු විය හැකි ප්‍රදේශවල ගංවතුරට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීම. (ඔමාන රාජ්‍ය ආධාර) (4-2104) | 43734592.91 | | | | | | | | | | | | | 43734592.91 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් ) ආපදා සහ පුනරුත්ථාපනය. 106-02-4-2104-3 | | 2144961277.77 | | | | | | | | | | | | 2144961277.77 |
| මුළු ප්‍රාග්ධන වියදම | 739013345.17 | 5738192406.99 | 10652257212.94 | 13669862484.97 | 2737162087.21 | 1351419675.94 | 1319545453.37 | 790091189.53 | 922975381.22 | 1781843020.88 | 348607858.64 | 118144924.15 | 198144924.15 | 40367760540.29 |

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - ආපදා කළමනාකරණයට අදාළ ව්‍යාපෘති/වැඩසටහන් යටතේ 2015 වර්ෂයේ සිට 2025 නොවැම්බර් මස දක්වා සිදු කරන ලද වියදම්

| ව්‍යාපෘතිය/වැඩසටහන | වියදම් කරන ලද මුදල (රු.මිලියන) |
|---|---|
| නාය යෑම් විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු | 1,081.88 |
| ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලය පුළුල් කිරීම තුළින් තථ්‍ය කාලීනව නාය යෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ශක්‍යතාවය වැඩිදියුණු කිරීම | 84.34 |
| නායයෑම් අවම කිරීමේ වැඩසටහන | 1,427.66 |
| ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (AIIB) | 11,170.80 |
| අධි අවදානම් කලාපවල ජීවත් වන මහජනතාව සුදුසු ස්ථානවල නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික නිර්දේශ සහ මාර්ගෝපදේශ සැපයීම | 57.59 |
| ගොඩනැගිලි තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තාකරණය | 169.50 |
| නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීමේ ක්‍රියාවලිය (LRAR) | 392.83 |
| වර්ෂාපතනය නිසා සිදුවන වේගවත් හා දිගු දුර නාය යෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම - (තාක්ෂණික සහයෝගිතා වැඩසටහන - SATREPS/JICA - JST) | 598 |

| ආයතනය | වැය කරන ලද මුදල |
|---|---|
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (2015 - 2025) | රු.243,037,326.00 |
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (2015 - 2025 නොවැම්බර් මස | රු.මි.3,446.748 |
| ආපදා සහන සේවා මධ්‍යස්ථානය (2015 - 2025.10.31 දක්වා) | රු.40,367,760,540.29 |
| ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (2025 - 2025 නොවැම්බර් මස දක්වා | රු.මි.14,982.6 |

(iii) ඔව්.

(iv) ප්‍රතිපත්තිමය සැලැස්ම හා උපායික ක්‍රමවේදය

- 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතට අනුව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- මෝසම් ආපදාවලට සූදානම් වීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් මෝසම් ආපදා පෙර සූදානම් කමිටු ස්ථාපනය කර පාර්ශ්වකාර ආයතන සම්බන්ධීකරණය කිරීම.
- එක්සත් ජාතීන්ගේ මූල්‍ය සහාය යටතේ CDLG ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව පාසල් විෂය නිර්දේශයට ආපදා කළමනාකරණය ඇතුළත් කර පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශගුණික විපර්යාස හා ඒවාට අනුව අනුගත වීමේ වැඩසටහන් රජයේ පාර්ශ්ව සමඟ සම්බන්ධ වී ක්‍රියාත්මක කිරීම.
- 2025.01.11 දින නිකුත් කළ 1/2025 චක්‍රලේඛය යටතේ ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන මරණ සඳහා වන්දි මුදල රු. 250,000 සිට රු.1,000,000 දක්වා වැඩි කර ඇති අතර සහනාධාර ලබා දීමේ ක්‍රමවේදය යාවත්කාලීන කර ඇත.
- නාය යෑම් අධි අවදානම් කලාපවල පදිංචි පවුල් 5025ක් සඳහා නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- ආපදා ප්‍රත්‍යය ස්ථිතික සුරක්ෂිත පරිසරයක් උදෙසා ගොඩනැගිලි කේත සංග්‍රහයක් - Building Codes - සැකසීමේ කටයුතු ආරම්භ කර ඇත.
- නාය යෑම් අවදානම් කලාපවල ඉදිකිරීම් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ ලබා ගැනීම අනිවාර්ය කර ඇත.
- නාය යෑම් අවදානම් කලාප සිතියම්ගත කරමින් මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ක්‍රියාකාරී සැලැස්ම - ව්‍යුහාත්මකව

- දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආපදා සූදානම් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර ඇත.
- ජාතික මට්ටමේ විභාග සහ මැතිවරණ සඳහා 117 ඇමතුම් මධ්‍යස්ථානය සහ ජාතික හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (24x7) ක්‍රියාත්මක වේ.
- ජලාශ වේලි ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව වැඩි කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
- ප්‍රථමාධාර, සෙවීම් හා මුදාගැනීම්, කඳවුරු කළමනාකරණය සහ ආපදා අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ක්‍රියාත්මක වේ.
- රෝහල් සඳහා හදිසි ආපදා සූදානම් සැලසුම් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි.
- ජාත්‍යන්තර උපදේශකයන්ගේ මාර්ගෝපදේශය යටතේ සෙවීම් සහ මුදාගැනීමේ පුහුණු වැඩසටහන් ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා ස්වේච්ඡා කණ්ඩායම් සමඟ සිදු කරයි.
- ආපදාකාලීන ප්‍රතිචාරය සඳහා හමුදාව හා පොලිසිය සමඟ පැය 24 පුරා ක්‍රියාත්මක සහයෝගීතාවක් පවත්වාගෙන යයි.
- ආපදා ප්‍රතිචාර සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගනිමින් ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් වෙත ලබාදීම සිදු කරයි.
- රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික ආදිය වූ CBRN-E ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා විශේෂ යන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇත.
- කැලණි ගඟ ආශ්‍රිත ප්‍රදේශවල ගංවතුර අවදානම අවම කිරීම සඳහා තාක්ෂණික ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ.
- ආපදාවලින් පසුව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍යතා තක්සේරු කිරීම සහ සම්බන්ධීකරණය සිදු කරයි.
- නාය යෑම් වැනි අවදානම් අවම කිරීම සඳහා ඉංජිනේරුමය ඉදිකිරීම් සහ අධි අවදානම් ප්‍රදේශවල ජනතාව වෙනත් ස්ථානවල නැවත පදිංචි කිරීම සිදු කරයි.
- ආරක්ෂිත ස්ථාන හඳුනාගෙන පහසුකම් සංවර්ධනය සඳහා වසර 2025 සඳහා රු. මිලියන 50ක් වෙන් කර ඇත.
- ආපදාවලින් පීඩාවට පත් ජනතාවට උපකරණ සහ සම්පත් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබා දීමට කටයුතු කිරීම.
- නාය යෑම් විශේෂ විමර්ශන සිදු කර අවදානම අවම කිරීම සඳහා පෙර සහ පසුව ක්‍රියාමාර්ග ගනී.
- ආන්තික කාලගුණික තත්ත්වයන්ට පෙර අනතුරු ඇඟවීම් ලබා දී ජනතාව අවදානම් ප්‍රදේශවලින් ඉවත් කිරීම සිදු කරයි.

සාරාංශය

- නීතිමය සහ සැලසුම් පදනම - 2005 අංක 13 ව්‍යසන කළමනාකරණ පනතට අනුව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම හා ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කර ඇත.
- පෙර සූදානම් ක්‍රියාමාර්ග - දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ආපදා සූදානම් සැලසුම්, මෝසම් ආපදා කමිටු හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වේ.
- ප්‍රජා දැනුවත් කිරීම හා අධ්‍යාපනය - පාසල් විෂය නිර්දේශයට ආපදා කළමනාකරණය ඇතුළත් කර පාසල් ආරක්ෂණ වැඩසටහන්, මහජන දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.
- ප්‍රතිචාර හා මුදා ගැනීම - ජාතික හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය හා 117 ඇමතුම් මධ්‍යස්ථානය (24x7) ක්‍රියාත්මක වන අතර හමුදා, පොලිසිය හා ස්වේච්ඡා කණ්ඩායම් සමඟ සෙවීම් හා මුදා ගැනීමේ මෙහෙයුම් සිදු කෙරේ.
- අවදානම් අවම කිරීම - නාය යෑම්, ගංවතුර සහ අනෙකුත් ආපදා සඳහා අනතුරු හැඟවීම්, ඉංජිනේරුමය විසඳුම්, සහන පහසුකම් සැපයීම හා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.
- සහනාධාර සහ ආධාර - වන්දි මුදල් වැඩි කිරීම, ආහාර සහ නිවස ප්‍රතිසංස්කරණ සඳහා සහනාධාර ලබා දීම සිදු කෙරේ.
- තොරතුරු හා පර්යේෂණ - ආපදා අවදානම් කලාප සිතියම්ගත කිරීම, නාය යෑම් විමර්ශන සහ ගොඩනැඟිලි කේත - Building Codes - සකස් කිරීම ආරම්භ කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය නොවැම්බර් 28වැනි දා ඇති වුණු "දිට්වා" සුළි කුණාටුව නිසා විශේෂයෙන්ම වී ගොවියා ඉතා දැඩි අපහසුතාවකට පත් වුණා. එම ව්‍යසනයෙන් ගොවීන් 106,080ක් පමණ විපතට පත් වුණා. ඒ වාගේම කුඹුරු හෙක්ටෙයාර 56,116ක් පමණ එම සුළි කුණාටුවෙන් විනාශ වුණා. ඒ, ඇතැම් කුඹුරු කන්න 2කින්, 3කින්වත් ගොඩගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, විනාශ වූ හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් ලබා දෙනවා කියලා. එම මුදල පිරිසකට ලැබී තිබෙනවා. ඒ වාගේම මේ මුදල නොලැබුණු විශාල පිරිසක් ඉන්නවා. සම්පූර්ණයෙන්ම විනාශ වූ කුඹුරු තිබෙනවා. ගොවීන්ට 150,000ක මුදලක් දුන්නත් ඒ කුඹුරු නැවත වගා කරන්න බැරි තත්ත්වයක පවතිනවා. එම ගොවීන්ට මාසිකව ගණනක් දෙනවා කිව්වා, ඒ අයගේ ජීවිතය ගොඩ නගා ගන්න. ඒකට විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා මා අහන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, එම ව්‍යසනයෙන් විපතට පත් පවුල්වල පාසල් දරුවන්ගේ පොත් පත් සම්පූර්ණයෙන්ම විනාශ වුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එක වරකදී එක අතුරු ප්‍රශ්නයක් අහන්න. පාසල් දරුවන් සම්බන්ධ අතුරු ප්‍රශ්නය දෙවනුව අහන්න. කුඹුරු ඉඩම් ගැනයි, පාසල් දරුවන් ගැනයි ඔබතුමා එකම අතුරු ප්‍රශ්නයකින් අහනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
එකම ප්‍රශ්නය තමයි, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකම ප්‍රශ්නයක් නොවෙයි, එතැන ප්‍රශ්න 2ක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුරු - *[බාධා කිරීම්]*

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මේ එකම පවුලේ ප්‍රශ්නයක් ගැන අහන්නේ. ඒ ගොවීන්ගේ දරුවෝ ගැන අහන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එකම පවුලේ ප්‍රශ්න කියලා - *[බාධා කිරීම්]* අර මැක්කාගේ කථාව වාගේ නැතුව වැඩ කළා නම් හොඳයි. *[බාධා කිරීම්]*

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ඔබතුමා කාලය දෙන්නේත් නැහැ නේ, මේ ප්‍රශ්න ඉක්මනින් අහලා ඉවරයක් කරගන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමා ඇහුවේ අර වී ගොවීන්ගේ ප්‍රශ්නය - *[බාධා කිරීම්]*

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මේ අහන්නේ ඒ ගොවීන්ගේ දරුවන්ගේ ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක අර මැක්කාගේ කථාව වාගේ නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
එකම ගෙදරක ඉන්න අයට ඇති වුණු ප්‍රශ්නයක් ගැන අහන්නේ. රුපියල් 150,000ක් දෙනවා කිව්වේ, ආපදාවට පත් ගොවීන්ට. ඒ ගොවීන්ගේ දරුවන්ට තමයි රුපියල් 20,000 දෙනවා කිව්වේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ඒ, ප්‍රශ්න දෙකක් ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්නය හරිම පැහැදිලියි. ඔබතුමා පළමුවන අතුරු ප්‍රශ්නයෙන් ඇසුවේ, හානියට පත් කුඹුරු ගැන. පසුගියදාත් ජනාධිපතිතුමාත්, අපේ කාර්ය මණ්ඩලයත් ඒ අදාළ අමාත්‍යාංශ සමඟ ඒ සම්බන්ධ විශේෂ සාකච්ඡාවකුත් කළා. ඔය ප්‍රශ්නය පොළොන්නරුවට විතරක් තිබෙන එකක් නොවෙයි.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

සමහර ගොවි ඉඩම් තිබෙනවා, ඒවා දැනට තිබෙන ප්‍රශ්නය අනුව වගා කරන්න බැහැ. ඒ නිසා evaluation එකක් කරගෙන යනවා. ඉතාම කඩිනමින් ඒ ටික ඉවර කරන්න කියලා ගරු ජනාධිපතිතුමාත් උපදෙස් දුන්නා. ඒ ටික සිද්ධ වෙනවා.

පාසල් ළමුන්ගේ දීමනාව ලබා දීමේදී නම් අපි ලොකු අඩුපාඩුවක් දකින්නේ නැහැ. සෑහෙන ප්‍රතිශතයකට දීලා තිබෙනවා, මට හරියට මතක නැහැ. ඒ මුදල් අපි ඉතාම කඩිනමින්, විධිමත්ව දෙන්න කටයුතු කරලා තිබෙනවා, ඒ අදාළ චක්‍රලේඛය අනුව.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු විපක්ෂ නායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔය තුන්වැනි අතුරු ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම මේ දේශගුණික, කාලගුණික විපර්යාස සිදු වන මොහොතේ අපි විශ්වාස කරනවා, මේ ආපදා කළමනාකරණ යන්ත්‍රණය සම්පූර්ණයෙන්ම වෙනස් විය යුතුයි කියලා. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ තවත් අලුත් ආයතන ඇතුළුව ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට වෙනමම අමාත්‍යාංශයක් අලුතින් බිහි වීම ඉතාම අවශ්‍යයි. ඒ වාගේම ඒ ආයතන ශක්තිමත් වෙන්න ඕනෑ. ඒවායේ භෞතික සම්පත්, මානව සම්පත් ශක්තිමත් වෙන්න ඕනෑ. ඒ වාගේම අලුත් ව්‍යසන කළමනාකරණ පනතකුත් එන්න ඕනෑ. ඒක තමයි ඇත්ත කථාව. දැන් රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක් පමණ ඉන්නවා. ඒ අයට කාලගුණ විපර්යාස, ව්‍යසන කළමනාකරණය සම්බන්ධව නිසි පුහුණුවක් ලබා දීලා වෙනම කාර්ය සාධක බලකායක් පිහිටුවන්න කටයුතු කරන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා. ඉන්දියාවේ එහෙම වෙනමම කාර්ය සාධක බලකායක් - task force එකක් - පිහිටුවා තිබෙනවා, මධ්‍යම ආණ්ඩුවෙනුත්, ප්‍රාන්ත මට්ටමිනුත්. අන්න ඒ වාගේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත්.

ඒ වාගේම මම ඔබතුමාට තවත් වැදගත් කාරණාවක් කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Monash University එක වර්ෂ 2000-2019 අතර කාලයේ සුළි කුණාටු පිළිබඳව -රටවල් 9ක සුළි කුණාටු 217ක් පිළිබඳව- study එකක් කරලා තිබෙනවා. ඒ පිළිබඳව British Medical Journal එකේත් තිබෙනවා. මරණ ලක්ෂ 150ක් පිළිබඳව -ඒ කියන්නේ කුණාටුවලින් සිදු වුණු මරණම නොවෙයි- හොඳ පරීක්ෂණයක් කරලා, ඒගොල්ලන් ඇවිල්ලා තිබෙනවා නිගමනයකට. ඒ නිගමනය තමයි, සුළි කුණාටුවලින් සිදු වන මරණවලට වඩා පශ්චාත් සුළි කුණාටු සමයේ - in the immediate aftermath of the cyclone - සිදු වන මරණ සංඛ්‍යාව, ඒ කෙටි කාලය තුළ සිදු වන මරණ සංඛ්‍යාව වැඩියි කියන එක. ඒක විද්‍යාත්මක study එකක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ප්‍රශ්නය අහලා අවසන් කරන්න. ඔබතුමා විනාඩි 3ක් අරගෙන තිබෙනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා දැන් විනාඩි 3ක් අරගෙන තිබෙනවා, අතුරු ප්‍රශ්නයට.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි, මම අහනවා ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අහලා ඉවර වෙන්න ඕනෑ, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමන්ලා ඒ විද්‍යාත්මක study එකත් study කරලා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය අහනවා වෙනුවට විද්‍යාත්මක study එකක් ගැන කථා කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම දන්නවා, සමහර විට "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වීමත් සමඟ මේකට අගයක් නොදෙන්න පුළුවන් කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නමුත් මේකත් study කරලා, අලුත් ආපදා කළමනාකරණ වැඩ පිළිවෙළකට මුල පුරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
"දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වෙච්ච සියලු ජනතාව පිළිබඳවත්, ඒ වාගේම ඒ ආපදාව පිළිබඳවත් අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙන බව මුළු රටම දන්නවා. පසුගිය දා පැවැති ජාතික ආපදා කළමනාකරණ කවුන්සලයේදීත් මේ සම්බන්ධයෙන් විශේෂයෙන් සාකච්ඡා කළා. ඔබතුමාත් එතැන

හිටියා. අපි කමිටුවකුත් පත් කළා, පනත සහ ඒ ආයතන ප්‍රතිව්‍යුහගත කරලා, ජාතික සැලැස්මක් ප්‍රතිස්ථාපනය කරන්න. ඒ සඳහා අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ කටයුතු සිද්ධ වෙනවා. ඔබතුමාගේ යෝජනාවත් ඉතාම හොඳයි. අපි ඒකත් විශේෂ සැලකිල්ලට භාජන කරන්නම්. ඒ වාගේම Monash University එකේ findings ගැනත් මම සොයා බලන්නම්. ඒකත් අපේ ඉදිරි කටයුතුවලට යොදා ගන්න කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -726/2025- (2), ගරු චාමර සම්පත් දසනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ප්‍රශ්න අංක 9. ගරු එස්.එම්. මරික්කාර් මහතා. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහනවාද? *[බාධා කිරීමක්]*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
පොඩ්ඩක් ඉන්න. පසුගිය කාලයේ හදිසි මිලදී ගැනීම් මුවාවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවට පටහැනිව ගෑස් ගෙන්වීම පිළිබඳ ප්‍රශ්නය මම අහනවා. *[බාධා කිරීමක්]* ප්‍රශ්නය ඇහුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, විනය තිබෙන්න ඕනෑ.

## ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම: 2022-2024 දක්වා ගෑස් ආනයනය සහ හදිසි මිලදී ගැනීම්
### வ/ப லிட்ரோ கேஸ் லங்கா கம்பனி: 2022 - 2024 வரையான எரிவாயு இறக்குமதியும் அவசரக் கொள்வனவும்
### LITRO GAS LANKA LIMITED: IMPORT AND EMERGENCY PURCHASE OF GAS FROM 2022-2024

827/2025

**9. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම විසින් ආනයනය කරන ලද ගෑස් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෑස් ආනයනය කිරීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඉහත කාලය තුළදී හදිසි මිලදී ගැනීම් ලෙස මිලදී ගෙන ඇති ගෑස් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) හදිසි මිලදී ගැනීමකදී හා සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් සිදු කරන මිලදී ගැනීමකදී පවතින මූල්‍යමය වෙනස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை வரையறுக்கப்பட்ட லிட்ரோ கேஸ் லங்கா கம்பனியால் இறக்குமதி செய்யப்பட்ட எரிவாயு வின் அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி எரிவாயுவை இறக்குமதி செய்யும்போது முறையான பெறுகை நடைமுறை பின்பற்றப் பட்டுள்ளதா;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

(iv) மேற்படி காலப்பகுதிக்குள் அவசரக் கொள்வனவு என்ற வகையில் கொள்வனவு செய்யப்பட்டுள்ள எரிவாயுவின் அளவு ஆண்டுவாரியாக மெற்றிக் தொன்களில் வெவ்வேறாக யாது;

(v) அவசரக் கொள்வனவு மற்றும் சாதாரண பெறுகை நடைமுறைக் கொள்வனவு ஆகியவற் றுக்கிடையில் காணப்படுகின்ற நிதிசார் வித்தியாசம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the volume of gas that was imported by Litro Gas Lanka Limited from 2022 to 2024, separately for each year;

(ii) whether the proper procurement procedure was followed in importing the said volume of gas;

(iii) if not, the reasons for that;

(iv) the volume of gas that was purchased as emergency purchases during the said period, separately for each year in metric tons; and

(v) the financial difference between an emergency purchase and a purchase that is made following the normal procurement procedure?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම මුදා හරින ලද නැව් භාණ්ඩ - ආනයනික - තොගය මෙට්‍රික් ටොන්වලින්,

| වර්ෂය | එකතුව (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2022 | 251,181 |
| 2023 | 300,159 |
| 2024 | 330,696 |

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

(ii) සමාගමේ සමස්ත ප්‍රසම්පාදන පරිපාටිය ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ පූර්ණ පාලනය යටතේ සිදු වන අතර, අවසාන අනුමැතිය කැබිනට් මණ්ඩලයෙන් ලබා ගනී.

ප්‍රසම්පාදන පරිපාටිය හරහා පිරිනමන ලද සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද වසර දෙකක කොන්ත්‍රාත්තුව 2020 මාර්තු 01 සිට 2022 පෙබරවාරි 28 දක්වා ක්‍රියාත්මක විය. එම කොන්ත්‍රාත්තුව යටතේ 2022 වසරේ පෙබරවාරි මාසයේ ඇණවුම් කරන ලද ඉතිරි තොගය, 2022 මාර්තු මාසයේදී ලැබිණි.

2022 අප්‍රේල් සිට ජුනි දක්වා, ජාතික ආපදා තත්ත්වය සහ විදේශ විනියම හිඟය හේතුවෙන්, දින 30ක ණය සහන කාල සීමාවක් සහිතව පොරොත්තු ණයවර ලිපියක් - Standby Letter of Credit - නිකුත් කිරීමට නොහැකි විය. එබැවින්, අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේ මෙරට ඩොලර් සංචිතයට අනුව එතෙක් පැවති සැපයුම්කරුගෙන්ම මාසික අවම තොගය ලබා ගැනිණි.

2022 මැයි මාසයේදී වර්තමාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරන ලද අතර, තායිලන්තයේ සියාම් ගෑස් ට්‍රේඩින් පුද්ගලික සමාගම සමඟ මෙට්‍රික් ටොන් එකකට කොන්ත්‍රාත් මිල සහ ධන ඩොලර් 96ක මිලකට ඉදිරියට යාමට කැබිනට් අනුමැතිය ලබා දී තිබෙනවා. කෙසේ වෙතත්, විදේශ විනිමය සීමා සහ ඒ අවස්ථාවේදී පැවැති අර්බුදය හේතුවෙන් ප්‍රසම්පාදන කොන්දේසි යටතේ අවශ්‍ය පරිදි පොරොත්තු ණයවර ලිපි පහසුකම් ලබා දීමට ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමට නොහැකි වී තිබෙනවා. ඊට අමතරව සැපයුම්කරු ටෙන්ඩර් අවශ්‍යතාවට අනුකූලව යාත්‍රා විස්තර ද ඉදිරිපත් කර නැහැ. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත් අත්සන් කිරීම ප්‍රමාද වූ අතර, ගිවිසුම ඉදිරියට ගෙන යාමට අවශ්‍ය යාත්‍රා ඉදිරිපත් කිරීම සඳහා සැපයුම්කරු පොරොත්තු ණයවර ලිපි නිකුත් කරන ලෙස නැවත නැවතත් ඉල්ලා සිටින ලදී. ඒ අනුව 2022 ජූලි සහ දෙසැම්බර් කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි 2022 කොන්ත්‍රාත්තුව අවසන් කර හෝ සක්‍රිය කර නොතිබීම හේතුවෙන් ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම ජුනි මාසයේ මාසිකව මෙට්‍රික් ටොන් 15,000ක ප්‍රමාණයකට සැලසුම් ලබා ගැනීමට OQ ට්‍රේඩින් සමාගමටත්, සියාම් ගෑස් ට්‍රේඩින් පුද්ගලික සමාගම කියන සමාගමටත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පාර්ශ්ව දෙකෙන් පමණක් මිලදී ගැනීම් ඉල්ලා සිටිනවා. නමුත්, සැපයුම්කරුට මාසික අවශ්‍යතාව අනුව ලබා දීමට නොහැකි බව සඳහන් කරලා තිබෙනවා. ඒ අනුව, සියාම් ගෑස් ට්‍රේඩින් පුද්ගලික සමාගම 15,000ක් ඉල්ලපු එක වෙනුවට 6,600ක් ඩොලර් 112ක මිලකට දෙන්න පුළුවන් කියලා තිබෙනවා. OQ Trading සමාගම ඩොලර් 129 මිලකට මෙට්‍රික් ටොන් 100,000ක් දෙන්න පුළුවන් කියලා තිබෙනවා. ඒ දෙකම නොගැළපෙනවා වුවත් පැවැති තත්ත්වය සැලකිල්ලට අරගෙන අවශ්‍ය කොන්දේසි සපුරා නොමැති බැවින් පවතින අර්බුදකාරි තත්ත්වය සහ නිෂ්පාදනය සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශය, අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළු බලධාරින් වෙත එය යොමු කර තිබෙනවා.

ඒ අනුව ජුනි 08වන දින ඉහත ප්‍රසම්පාදන ප්‍රදානය කිරීම සඳහා Siam Gas Trading Pte. Limited තෝරා ගෙන ඇතත් එය තවමත් විධිමත් ලෙස ප්‍රදානය කර නොමැති බවත් රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්තුව නියමයන් හා කොන්දේසි අනුව ශ්‍රී ලංකා රජයට ස්ථාවර ණයවර ලිපියක් නිකුත් කිරීමට හැකියාව නොමැති බවත්, ශ්‍රී ලංකා මහ බැංකුවට සහ භාණ්ඩාගාරයට ඒ සම්බන්ධයෙන් පහසුකම් සැලසීමට නොහැකි බවත්, ඉහත ප්‍රසම්පාදනය අවලංගු කිරීමට කල් දැමූ ගෙවීම් නැවත නැවගත කිරීම මඟින් ගෙවීම සහ ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම ඇතුළු කළමනාකරණය කර ගත හැකි ගෙවීම් නියමයන් සහිතව නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සුදුසු බව සඳහන් කරලා කැබිනට් අනු කාරක කමිටුවකට යොමු කරලා තිබෙනවා. ඒ අනුව, 2022 ජුනි 14 වන දින කැබිනට් තීරණයේ, විශේෂයෙන්ම ජුනි 08වන දින කැබිනට් සන්දේශයේ සඳහන් කරලා තිබෙනවා, "කළමනාකරණය කළ හැකි ගෙවීම් විකල්ප සමඟ පවතින කාලීන ටෙන්ඩරය අවසන් කළ හැකි වන තෙක් 'එල්පී ගෑස්' සැපයීම අඛණ්ඩව සහතික කිරීම සඳහා පහත සඳහන් පියවර සලකා බලන්න" කියලා.

ඒ අනුව, OQ Trading සමාගමට මෙට්‍රික්ටොන් ලක්ෂයක් දීලා තිබෙනවා, ඩොලර් 129 යටතේ.

2023 ජනවාරි සහ දෙසැම්බර් ඒ සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් පවත්වන ලද අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ කැබිනට් මණ්ඩලයෙන් ලබාගත් අවසන් අනුමැතියට අනුකූලව මෙට්‍රික්ටොන් එකකට කොන්ත්‍රාත් මිල සහ ඩොලර් 118.68ක මිලකට OQ ට්‍රේඩින් සමාගමට දීලා තිබෙනවා. 2024 ජනවාරි සිට 2025 දක්වා රජය සතු ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් 2023 කොන්ත්‍රාත්තුව මාස 6ක කාලයක් සඳහා දෙවරක් දීර්ඝ කරන ලද අතර, ඒ යටතේ ලිට්‍රෝ ගෑස් සමාගම රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය යටතේ තබාගෙන තිබෙනවා. ඒ නිසා එම ඒකකයේ නියෝගය මත පදනම්ව මෙම දීර්ඝ කිරීම කැබිනට් අනුමැතිය ලබාගෙන තිබෙනවා. 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් සිදු කළ අතර, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව රජයේ ප්‍රසම්පාදන මාර්ගවලට අනුව මෙට්‍රික්ටොන් එකකට ඩොලර් 118.18ක මිලකට නැවතත් OQ Trading සමාගමට දීලා තිබෙනවා. 2026 ජනවාරි සිට දෙසැම්බර් වෙනකොට ජාත්‍යන්තර ලංසු තැබීමේ ක්‍රියාවලිය පවත්වන ලද අතර, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගත් පසු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙට්‍රික්ටොන් එකකට ඩොලර් 137ක මිලකට Geogas Trading SA සමාගමට ලබා දී තිබෙනවා.

(iii) පසුගිය සෑම වසරකදීම එල්පී ගෑස් පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, ඒ පිළිබඳ අවසාන බලය ඇත්තේ කැබිනට් මණ්ඩලයටය.

(iv) ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සඳහන් කර තිබෙනවා. හදිසි ප්‍රසම්පාදන පටිපාටිය යටතේ සමාගම මිලදී ගැනීම් සිදු කර නැහැ.

(v) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, දීර්ඝ පැහැදිලි කිරීමක් සිදු කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාගේ පිළිතුරෙන්ම පෙනෙනවා, 2025 වර්ෂය වෙනකොට ආර්ථික අර්බුදයක් තිබුණේ නැහැ කියලා. නමුත්, ඊට පෙර අවුරුද්දේ ගත්ත එකම තමයි continue කර තිබෙන්නේ. COPE එකේදීත් මම මේ පිළිබඳ විමසුවාම එවකට හිටපු සභාපතිතුමා කිව්වා මට මතකයි, සියාම් ගෑස් ට්‍රේඩින් පුද්ගලික සමාගමේ මිල අඩු වුණාට ඒගොල්ලන්ගේ ගෑස් ටික ලංකාවට එන්න දින 40ක් යනවා කියලා. එවකට තිබුණු හදිසි තත්ත්වය අනුව පෝලිම් නිර්මාණය කරන්න බැරි නිසා තමයි OQ Trading සමාගමට වැඩි මිලදී ගැනීමකට දුන්නේ. දැන් OQ Trading සමාගමට පෝලිම් තිබෙනකොට වැඩි ගණනකට දුන් එක අඛණ්ඩව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව දිගටම ගෙන යෑමෙන් පාඩුවක් වෙලා තිබෙනවා කියන එක ඔබතුමා පිළිගන්නවාද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව නොවෙයි, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දීලා තිබෙන ප්‍රතිපාදන ඇතුළේ ගත් ක්‍රියාමාර්ගයක්. එතකොට මූල්‍යමය වශයෙන් ගත්තාම අපට පෙනෙනවා, ඒ වෙලාවේදී ඉදිරිපත් කර තිබුණු පළමු ටෙන්ඩරයට අනුව ඩොලර් 129කට දෙන්න වුණාම එතැන වෙනසක් සිද්ධ වෙලා තිබෙන බව. අනික් පැත්තෙන්, ඒ මොහොතේදී ඒගොල්ලන් සැලකිල්ලට භාජන කර තිබෙන්නේ ගෑස් හිඟයක් ඇති වීමෙන් සිදුවිය හැකි අනෙකුත් පාඩුව පිළිබඳ තත්ත්වයයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අඛණ්ඩව ඒ තත්ත්වයත් එක්ක, -

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඔව්, ඒ පිළිබඳ තිබෙන බලතල කැබිනට් මණ්ඩලයෙන් තමයි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ තිබෙන නීති-රීති රාමුවේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එහෙම ප්‍රතිපාදනයක් ලබා දී තිබෙනවා. නමුත්, අපට මූල්‍යමය වශයෙන් ගණනය කර බලන්න පුළුවන්, එතැන යම් අලාභයක් සිදු වුණා නම් මොන වාගේද කියලා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. දැන් කැබිනට් මණ්ඩලයට තිබෙන බලතල පවරාගෙන කළාට, කෘෂිකර්ම අමාත්‍යාංශයට බිල්ඩිමක් ගත්තා කියලා එවකට හිටපු කැබිනට් මණ්ඩලයේ ඔක්කොම ගෙන්නුවා නේ. මේ අග්‍රාමාත්‍යවරයා හෝ ඒ පත් කරපු කමිටුව තීරණය කරලා නේ මේක දමන්නේ. පෝලිම තිබෙන වෙලාවේ පෝලිම් නැති කරන්න ගත්ත ගාණම දිගටම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළේ ඉඳගෙන හෝ ගෙනගිය එකෙන් මූල්‍යමය පාඩුවක් වෙලා තිබෙනවා කියන එකයි මම ඔබතුමාට කියන්නේ. එතකොට පැහැදිලිවම මේ සම්බන්ධව ජනාධිපති කාර්යාලයේ බහිරවයෙක් සිටියා. ගරු රවී කරුණානායක මැතිතුමාගේ වචනයෙන් කියනවා නම්, භූතයෙක්. ඒ භූතයා කවුද කියන එක සොයා ගන්නත්, ඒ භූතයා මේ හරහා කර තිබෙන මූල්‍යමය පාඩුව ගණනය කිරීම සඳහාත් අවශ්‍ය පරීක්ෂණයක් ඔබතුමා කරනවාද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මේ පිළිබඳව විමසා තවත් තොරතුරු ඒක රාශි කරගෙන, අක්‍රමිකතා, වැරදි, වංචා, දූෂණ සිදු කර තිබෙනවා නම්, එහෙම ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙනවා නම්, පැහැදිලිව සඳහන් කළා වාගේ තොරතුරු එක්රැස් කර ගනිමින් අනිවාර්යයෙන් පරීක්ෂණයක් කරන්න අපි සූදානම්, ගරු කථානායකතුමනි.

## බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ, හාලිඇල සහ වැලිමඩ: පානීය ජල ගැටලුව
பண்டாரவளை, தியத்தலாவ, அப்புத்தளை, ஹாலிஎல மற்றும் வெலிமடை: குடிநீர் பிரச்சினை
BANDARAWELA, DIYATALAWA, HAPUTALE, HALI-ELA AND WELIMADA: DRINKING WATER PROBLEM

1575/2025

**10.ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බණ්ඩාරවෙල නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවලට පානීය ජලය ලබා දෙන්නේ දින හතක පමණ කාලයකට වරක් බව දන්නේද;

(ii) දියතලාව, හපුතලේ, මීරහවත්ත, කුරුකුඳේ, ඩයරබා ප්‍රදේශ ආශ්‍රිතවද එවැනි ජල ගැටලු පවතින බව දන්නේද;

(iii) බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ, හාලිඇල සහ වැලිමඩ යන ප්‍රදේශවල ජල ගැටලුව විසඳීමට වත්මන් රජය මඟින් ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, එම ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(v) එම ව්‍යාපෘතියේ සැලසුම් කර ඇති අදියර සංඛ්‍යාව කොපමණද;

(vi) මුල් අදියර මඟින් ආවරණය වන ප්‍රදේශ කවරේද;

(vii) මුල් අදියර සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(viii) මෙම ව්‍යාපෘතිය මඟින් බණ්ඩාරවෙල ආශ්‍රිත ප්‍රදේශවලට පැය 24 පුරා ජලය ලබාදීමට හැකිවේ යැයි අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டாரவளை நகரத்துக்கும் அதனை அண்டிய பிரதேசங்களுக்கும் ஏழு நாட்களுக்கு ஒரு தடவை மாத்திரமே குடிநீர் விநியோகிப்படுகின்றது என்பதை அவர் அறிவாரா;

(ii) தியத்தலாவ, அப்புத்தளை, மிரஹவத்த, குருகுதே, டயரபா ஆகிய பிரதேசங்களிலும் இவ்வாறு குடிநீர் பிரச்சினை காணப்படுகின்றதா என்பதையும்;

(iii) பண்டாரவளை, தியத்தலாவ, அப்புத்தளை, ஹாலிஎல, வெலிமடை ஆகிய பிரதேசங்களில் குடிநீர் பிரச்சினையைத் தீர்ப்பதற்கு தற்போதைய அரசாங்கத்தால் கருத்திட்டமொன்று ஆரம்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அக்கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(v) மேற்படி கருத்திட்டமானது எத்தனை கட்டங்களாகத் திட்டமிடப்பட்டுள்ளது என்பதையும்;

(vi) முதல் கட்டத்தின்கீழ் குடிநீர் விநியோகிக்கப் படவுள்ள பிரதேசங்கள் யாவை என்பதையும்;

(vii) முதல் கட்டத்துக்காக மதிப்பிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(viii) மேற்படி கருத்திட்டம்மூலம் பண்டாரவளையை அண்டிய பிரதேசங்களுக்கு 24 மணி நேர குடிநீர் விநியோகத்தை மேற்கொள்ள எதிர்ப்பார்க் கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether he is aware that drinking water is supplied to Bandarawela Town and its surrounding areas once in seven days;

(ii) whether he is aware that similar water problems exist also in the Diyatalawa, Haputale, Mirahawatte, Kurukunde and Dayaraba areas;

(iii) whether the present Government has initiated a project to solve the water problem in the Bandarawela, Diyatalawa, Haputale, Hali-Ela and Welimada areas;

(iv) if so, the date on which the said project was initiated;

(v) the number of phases planned for the said project;

(vi) the areas covered by the first phase;

(vii) the estimated cost for the first phase; and

(viii) the expected date by which the said project will provide 24-hour water supply to the areas surrounding Bandarawela?

(b) If not, why?

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්, දැනට ක්‍රියාත්මක බණ්ඩාරවෙල ජල සම්පාදන ක්‍රමය ඝන මීටර් 3,000ක පමණ ධාරිතාවකින් යුතු අතර, එම ප්‍රදේශයේ ලබා දී ඇති ජල සම්බන්ධතා 14,000 සඳහා එය ප්‍රමාණවත් නොවේ. මේ නිසා දියතලාව, ඇටම්පිටිය ජල සම්පාදන ක්‍රමවලින්ද ජලය ලබාගෙන මීන් පෙර දින 14කට එක් වරක් ජලය ලබා දුන් බණ්ඩාරවෙල ප්‍රදේශයට දැනට අවම දින 7කට වතාවක් ජලය ලබා දීම තෙක් ජල කළමනාකරණය කර ඇත.

(ii) ඔව්, දියතලාව ජල සම්පාදන ක්‍රමය මඟින් දැනට ඝන මීටර් 6,000ක පමණ ප්‍රමාණයක් බණ්ඩාරවෙල ප්‍රදේශයට ලබා දෙන බැවින් දියතලාව සහ හපුතලේ ප්‍රදේශ ආශ්‍රිතව යම්තාක්දුරට ජල ගැටලු පවතී.

එසේම මිරහවත්ත, ඩයරබා සහ කුරුකුදේ යන ප්‍රදේශවලට මේ වන විට ජල සම්පාදන මණ්ඩලය මඟින් ජල නල පද්ධති දීර්ඝ කර නොමැති අතර, ඉදිරියේදී බණ්ඩාරවෙල, දියතලාව සහ හපුතලේ ඒකාබද්ධ ජල ව්‍යාපෘතිය මඟින් මෙම ප්‍රදේශ ආවරණය කිරීමට නියමිතය.

(iii) ඔව්, බණ්ඩාරවෙල, දියතලාව සහ හපුතලේ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර I හා II, ජල සම්පාදන මණ්ඩලය මඟින් දැනටමත් ආරම්භ කර ඇත. දැනට ඩයරබා ජලාශයේ ජල තුළුමඟ ඉදිකිරීම් කටයුතු සියයට 80ක් පමණ අවසන් වී තිබේ. මෙහිදී ව්‍යාපෘතියේ අදියර I හා II යටතේ ඝන මීටර 10,000ක ජල පිරිපහදු ඒකකයක් ඉදිකිරීම් කටයුතු 2025.02.16 දින වත්මන් රජයේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලදී.

(iv) 2025.02.16

(v) මෙම ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ සිදු කරයි.

අදියර I හා IIදී - ඝන මීටර් 10,000ක ජල පිරිපහදු ඒකකයක් ඉදිකර පනංගල, දියබිබිල, මාරබැද්ද හා ඩයරබා ප්‍රදේශවල ජල ගබඩා ටැංකි ඉදිකර සම්ප්‍රේෂණ නල හා බෙදා හැරීම් නල එළා, නව සම්බන්ධතා 9,000ක් පමණ ලබා දීමට හා පවතින ජල සම්බන්ධතාවල සේවා මට්ටම වැඩි කිරීමටද අපේක්ෂා කරයි.

(vi) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (වසම් 22)

- මාතැටිල්ල
- කොන්තෙහෙල
- අයිස්ලැබි
- කිරිඔරුව

- ඇත්තලපිටිය
- දිගනතැන්න
- අඹේගොඩ
- වැවතැන්න
- වටගමුව
- බිඳුණුවැව
- උ/කැබිල්ලේවෙල
- ගෙඩියාරොද
- බ/බටහිර
- බ/නැඟෙනහිර
- තන්තිරිය
- උඩපේරුව
- එගොඩගම
- වෙහෙරගලතැන්න
- ඉණිකම්බැද්ද
- ඕබඩැල්ල
- ද/කැබිල්ලේවෙල
- කිණිගම

හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (වසම් 4)

- කුරුකුදේ
- පෙරහෙට්ටිය
- වරකාදණ්ඩ
- මහතැන්න

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (වසම් 12)

- පුහුල්පොල
- දික්කාපිටිය
- කොස්කණුවේ ගම
- ඩයරබා වත්ත
- කැටකැල්ල
- පහළයල්කුඹුර
- වැලිකඩගම
- මිරහවත්ත
- උඩපීල්ල
- කොටකිතුල
- මල්පොත
- උඩකැන්දගොල්ල

ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (වසම් 4)

- දෝව
- පල්ලෙපේරුව
- හීල්ඔය
- කිතල්ඇල්ල

(vii) අදියර I හා II සඳහා රුපියල් මිලියන 9,350යි.

(viii) 2028 වසරේ ජනවාරි, අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර අවශ්‍ය අවම කාර්ය මණ්ඩලයක් කඩිනමින් ලබා දී 2028 වසරේ ජනවාරි සිට ජලය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

බණ්ඩාරවෙල ආරම්භ කර ඇති ජල ව්‍යාපෘතිය වාගේම මීට ඉහත රජයන් මඟින් යෝජනා වුණු තවත් ව්‍යාපෘතියක් තිබුණා, බඹරකන්ද, හපුතලේ, හල්දුම්මුල්ල ප්‍රදේශ සංචාරක කලාපයක් වන නිසා එම ප්‍රදේශ ආශ්‍රිතව. විශේෂයෙන්ම හල්දුම්මුල්ල, හරන්කාව, කළුපහන කියන ප්‍රදේශවල ජල ප්‍රශ්නය උග්‍රව පවතිනවා. සංචාරක ක්ෂේත්‍රයටත් ඒක වැදගත් වනවා. බඹරකන්ද ආශ්‍රිත ඒ ජල ව්‍යාපෘතිය වත්මන් රජය යටතේ මේ වන විට ආරම්භ කරලා තිබෙනවාද, එහෙම නැත්නම් මේ වසරේදී ආරම්භ කිරීමට නියමිතද කියලා මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

බඹරකන්ද ප්‍රාදේශීය ජල ව්‍යාපෘතිය මේ වන විටත් ආරම්භ කරලා තිබෙන්නේ. ඉදිරියේදී එහි වැඩ කටයුතු අවසන් කරලා ජනතා අයිතියට පත් කරන්න මේ ආණ්ඩුව යටතේ අවශ්‍ය කටයුතු සූදානම් කරමින් සිටිනවා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

"දිට්වා" සුළි කුණාටුවත් එක්ක බදුල්ල දිස්ත්‍රික්කයට ජලය ලබා දීම සම්පූර්ණයෙන්ම වාගේ, ඒ කියන්නේ සියයට 100ක්ම වාගේ අවහිර වුණා.

කියන්න සතුටුයි, අද වන විට එම ප්‍රදේශවලට සියයට සියයක් ජලය ලැබෙන තත්ත්වය ළඟා කරගෙන තිබෙනවා. ඒ සඳහා ගොඩක් ස්ථානවලට තාවකාලික පිළියම් තමයි යෙදුවේ. ඒවාට ස්ථිර පිළියම් යොදමින්, බදුල්ල දිස්ත්‍රික්කයේ ජල සැපයුම යථාවත් කිරීම ගැන තිබෙන අදහස මොකක්ද, එම කටයුතු ආරම්භ කරලා තිබෙනවාද, එය සැලසුම් කරලා තිබෙනවාද, ඒකට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුවත් එක්ක ඒ ප්‍රදේශවල ජල සැපයුම සියයට 90කටත් වඩා විසන්ධි වෙලා, සම්පූර්ණයෙන්ම වාගේ එම පද්ධති බිඳ වැටිලා තිබුණා. ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු දින 14ක් වාගේ කෙටි කාලයක් ඇතුළත අවසන් කරලා, දැනට අපට ලබා දිය හැකි හැම ප්‍රදේශයකටම ජල පහසුකම් ලබා දීලා තිබෙනවා. එම ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරන්න අවශ්‍ය මුදල් රජයෙන් වෙන්කර තිබෙනවා. ඒ සඳහා අපි දැන් කටයුතු කරමින් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## 2024 නොවැම්බර් මාසයේ ඇති වූ අයහපත් කාලගුණය හේතුවෙන් විනාශ වූ වී වගාවන්: විස්තර

## 2024 நவம்பர் மாதத்தில் நிலவிய மோசமான காலநிலை காரணமாக பாதிக்கப்பட்ட வயல்கள்: விபரம்

## PADDY FIELDS DESTROYED DUE TO ADVERSE WEATHER IN NOVEMBER, 2024: DETAILS

219/2024

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Rohana Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ ශ්‍රී ලංකාවේ පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් විනාශ වූ කුඹුරු ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ හේතුවෙන් අපේක්ෂිත වී අස්වැන්නේ සිදු වූ අඩු වීම කොපමණද;

(iii) විනාශ වූ කුඹුරු අතරින් නැවත වගා කරන ලද ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) විනාශ වූ කුඹුරු සඳහා වන්දි ලබා දී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024ஆம் ஆண்டு நவம்பர் மாதத்தில் இலங்கையில் நிலவிய மோசமான காலநிலை காரணமாக பாதிக்கப்பட்ட வயல்களின் அளவு ஒவ்வொரு மாவட்டத்துக்கு ஏற்ப வெவ்வேறாக எத்தனை ஏக்கர் என்பதையும்;

(ii) அதன் காரணமாக எதிர்பார்க்கப்பட்ட நெல் விளைச்சலில் ஏற்பட்ட வீழ்ச்சி யாது என்பதையும்;

(iii) பாதிக்கப்பட்ட வயல்களில் மீள்பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்ட வயல்களின் அளவு எத்தனை ஏக்கர் என்பதையும்;

(iv) பாதிக்கப்பட்ட வயல்களுக்கு இழப்பீடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அது குறித்த விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of paddy fields that were destroyed due to adverse weather conditions that prevailed in Sri Lanka in November, 2024, in acres in each district, separately;

(ii) the reduction in the expected paddy harvest because of this;

(ii) the extent of paddy fields that have been replanted, out of those destroyed, in acres;

(iv) whether compensation has been provided for the destroyed paddy fields; and

(v) if so, the details thereof?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i)

| අනු අංකය | දිස්ත්‍රික්කය | විනාශ වූ කුඹුරු ප්‍රමාණය (අක්කර) |
|---|---|---|
| 01 | අම්පාර | 13,909.46 |
| 02 | අනුරාධපුර | 10,099.41 |
| 03 | බදුල්ල | 1,681.66 |
| 04 | මඩකලපුව | 11,981.94 |
| 05 | ගාල්ල | 37.04 |
| 06 | ගම්පහ | 188.70 |
| 07 | හම්බන්තොට | 1,091.22 |
| 08 | යාපනය | 1,121.75 |
| 09 | කළුතර | 43.53 |
| 10 | මහනුවර | 98.23 |
| 11 | කෑගල්ල | 34.10 |
| 12 | කිලිනොච්චිය | 444.40 |
| 13 | කුරුණෑගල | 1,526.85 |
| 14 | මන්නාරම | 9,698.45 |
| 15 | මාතලේ | 474.02 |
| 16 | මාතර | 550.93 |
| 17 | මොනරාගල | 947.45 |
| 18 | මුලතිව් | 3,553.81 |
| 19 | පොළොන්නරුව | 14,088.53 |
| 20 | පුත්තලම | 959.65 |
| 21 | රත්නපුර | 185.84 |
| 22 | ත්‍රිකුණාමලය | 11,690.62 |
| 23 | වවුනියාව | 1,865.03 |
| 24 | නුවරඑළිය | 610.55 |
| 25 | කොළඹ | 45.86 |
| | එකතුව | 86,929.03 |

(ii) අස්වැන්නේ අඩුවීම මෙට්‍රික් ටොන් 178,433ක් බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත.

(iii) අක්කර 25,673යි, රූඩ් 3යි, පර්චස් 3යි.

(iv) ඔව්.

(v) වන්දි ගෙවූ අක්කර ප්‍රමාණය, ගොවීන් ප්‍රමාණය හා වන්දි මුදල පහත පරිදි වේ.

| 2024-25 මහ - වන්දි ගෙවීම් | | |
|---|---|---|
| ගොවීන් ප්‍රමාණය | හානි වූ අක්කර ප්‍රමාණය (වන්දි ගෙවූ අක්කර ප්‍රමාණය) | වන්දි මුදල |
| 73,988 | 86,929.03 | රු.1,516,458,181.50 |

(ආ) අදාළ නොවේ.

## අර්තාපල් ආනයනය: විස්තර
## உருளைக்கிழங்கு இறக்குமதி: விபரம்
## IMPORT OF POTATOES: DETAILS

726/2025

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Chamara Sampath Dasanayake)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මෙරටට වර්ෂයකට ආනයනය කරනු ලබන අර්තාපල් ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරනු ලබන අර්තාපල් සඳහා අය කරනු ලබන බද්ද කොපමණද;

(iii) මේ දිනවල නුවරඑළිය, වැලිමඩ, ඌවපරණගම සහ හපුතලේ යන ප්‍රදේශවල අර්තාපල් අස්වැන්න නෙළන බව දන්නේද;

(iv) එබැවින් ශ්‍රී ලංකාවේ අර්තාපල් අස්වැන්න නෙළන කාල වකවානුවේදී ශ්‍රී ලංකාවට අර්තාපල් ආනයනය නතර කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இந்நாட்டுக்கு ஒரு வருடத்துக்கு இறக்குமதி செய்யப்படுகின்ற உருளைக்கிழங்கின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) இறக்குமதி செய்யப்படுகின்ற உருளைக் கிழங்குக்கு அறவிடப்படுகின்ற வரி எவ்வளவு என்பதையும்;

(iii) இந்நாட்களில் நுவரெலியா, வெலிமடை, ஊவ பரணகம மற்றும் அப்புத்தளை பிரதேசங்களில் உருளைக்கிழங்கு அறுவடை செய்யப்படுகின்றது என்பதை அறிவாரா என்பதையும்;

(iv) எனவே, இலங்கையில் உருளைக்கிழங்கு அறுவடை செய்யப்படுகின்ற காலப்பகுதியில் இலங்கைக்கான உருளைக்கிழங்கு இறக்கு மதியை நிறுத்துவதற்கு நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House-

(i) the quantity of potatoes imported into Sri Lanka annually;

(ii) the duty levied on imported potatoes;

(iii) whether he is aware that potato harvesting is currently taking place in Nuwara Eliya, Welimada, Uva Paranagama and Haputale areas; and

(iv) therefore, whether measures will be taken to suspend the importation of potatoes into Sri Lanka during the potato harvest season?

(b) If not, why?

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) සාමාන්‍ය වාර්ෂික අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 210,000ක් පමණ වන අතර, 2019-2024 දක්වා ආනයනය කරන ලද අර්තාපල් ප්‍රමාණය පහත වගුවෙන් දක්වා ඇත.

| වර්ෂය | දේශීය නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) සහ එහි ප්‍රතිශත (%) | | | ආනයනය (මෙට්‍රික් ටොන් සහ එහි ප්‍රතිශත (%) | මුළු සැපයුම (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|---|
| | යල කන්නය | මහ කන්නය | මුළු දේශීය නිෂ්පාදනය | | |
| 2024 | 20,916 (49.6) | 21,291 (50.4) | 42,207 (19.0) | 180,104 (81.0) | 222,311 |
| 2023 | 21,026 (51.6) | 19,723 (48.4) | 40,749 (19.5) | 168,185 (80.5) | 208,934 |
| 2022 | 27,764 (58.3) | 19,850 (41.7) | 47,614 (23.6) | 153,823 (76.4) | 201,437 |
| 2021 | 35,903 (47.3) | 40,008 (52.7) | 75,911 (39.4) | 116,719 (60.6) | 192,630 |
| 2020 | 30,115 (46.3) | 34,970 (53.7) | 65,085 (33.9) | 126,741 (66.1) | 191,826 |
| 2019 | 59,581 (58.6) | 42,061 (41.4) | 101,642 (41.7) | 142,086 (58.3) | 243,728 |

(ii) ආනයනික අර්තාපල් කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 80ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් 2025.08.25 දිනැති, අංක 2451/10 ගැසට් පත්‍රය මඟින් පනවා ඇත.

(iii) ඔව්.
නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් විසින් අප වෙත යොමු කර ඇති අර්තාපල් සඳහා වූ භෝග පුරෝකථන පහත පරිදි වේ.

| Monthly Expected Harvest - 2025 (mt) | |
|---|---|
| July | 4400 |
| August | 1040 |
| September | 640 |
| October | 700 |
| November | 1200 |
| December | 1600 |

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

(iv) නැත.

(ආ) සාමාන්‍ය වාර්ෂික ආර්තාපල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 210,000ක් පමණ වේ. මින් මෙට්‍රික් ටොන් 168,000ක් පමණ ප්‍රමාණයක් වාර්ෂිකව ආනයනය කරනු ලබයි. එනම්, සියයට 80ක ප්‍රමාණයක් ආනයනයෙන් සපුරා ගනු ලබන අතර සියයට 20ක අවශ්‍යතාව පමණක් දේශීය නිෂ්පාදනයෙන් සපුරා ගනු ලබන බව නිරීක්ෂණය වේ.

ඉහත සංඛ්‍යාලේඛන විශ්ලේෂණයෙන් පෙනී යන්නේ, දේශීය නිෂ්පාදනය මඟින් සමස්ත ඉල්ලුම සපුරාගත නොහැකි බවයි. එබැවින්, දේශීය අර්තාපල් අස්වැන්න ලැබෙන කාලපරිච්ඡේදයේදී ආනයනය නතර කිරීමක් සිදු නොකෙරේ.

මීට අමතරව දේශීය වෙළෙඳ පොළ තුළ ආනයනික අර්තාපල් සඳහා මෙන්ම, දේශීය අර්තාපල් සඳහා ද එකිනෙකට වෙනස් වූ වෙළෙඳ පොළ තත්ත්වයන් - niche market - පාරිභෝගික තෝරා ගැනීම මත දක්නට ලැබෙන බව ද සඳහන් කළ හැකි අතර ඒ අනුව, අදාළ වෙළෙඳ පොළවලට ආවේණික වූ පාරිභෝගිකයින් විසින් ඔවුන්ගේ රුචිකත්වය මත ආනයනික හෝ දේශීය අර්තාපල් මිලදී ගැනීම සිදු කරනු ලබන බවද දක්නට ලැබේ. එම නිසා පාරිභෝගික රුචිකත්වය සපුරාලීම කෙරෙහි ද රජයේ අවධානය යොමු කරනු ලබන බවද සඳහන් කළ යුතුය.

එමෙන්ම, දේශීය අස්වැන්න නෙළා ගනු ලබන කාලයේදී, මෙම රුපියල් 80ක් වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පැනවීම දේශීය ගොවීන්ගේ අර්තාපල් අස්වනු සඳහා නිසි මිලක් ලබා දීම පිණිස ගනු ලබන කෙටි කාලීන ක්‍රියා මාර්ගයක් වුවද, අස්වනු ලැබෙන කාලය තුළ මේ මඟින් පමණක් ආනයනික අර්තාපල් සමඟ තරගකාරී වීම අපේක්ෂා කළ නොහැකි බැව් නිරීක්ෂණය වේ. ඒ අනුව දේශීය අර්තාපල් සඳහා වන නිෂ්පාදන වියදම අඩු කර ගැනීමෙන් අර්තාපල් වගාවේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වන දිගු කාලීන ක්‍රියා මාර්ග ගැනීම අත්‍යවශ්‍ය බවද වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### එක්සත් රාජධානිය විසින් ශ්‍රී ලාංකිකයින් කිහිපදෙනෙකුට එරෙහිව පනවන ලද සංචාරක තහනම
### ஐக்கிய இராச்சியத்தால் இலங்கையர்கள் சிலருக்கு எதிராக விதிக்கப்பட்ட சுற்றுலாத் தடை
### TRAVEL BANS IMPOSED ON SOME SRI LANKANS BY THE UNITED KINGDOM

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I seek an urgent explanation from the Prime Minister on this Question under Standing Order No. 27(2) relating to a matter of grave national importance affecting Sri Lanka's sovereignty, the credibility of the Foreign Policy, our international standing and Parliamentary oversight and reported in "The Island" of 29th December, 2025.

The Government of the United Kingdom has imposed unilateral travel bans and asset freezes on several Sri Lankan nationals, including former senior military officers, outside any UN Security Council mandate, international judicial determination or bilateral legal process. The Government of Sri Lanka itself described these actions as unilateral, and appointed a ministerial committee to examine the matter. Yet, no clear Cabinet decision, official policy position or a disclosure to Parliament has followed in, creating uncertainty, domestically and internationally.

This issue transcends individual cases; it concerns sovereign equality, due process, non-interference and Parliament's constitutional role in oversight of foreign policy.

Accordingly, I seek clarification from the Hon. Prime Minister on the following:

1. Does the Government affirm that Sri Lanka is a plural and democratic society, in which Sinhalese, Tamils, Muslims and all other communities coexist, following the defeat of terrorism by the armed forces and the Police?
2. Has the Cabinet-appointed ministerial committee submitted its report, on what date were its recommendations placed before Cabinet, what decisions, if any, were taken and why had they not been formally communicated to Parliament?
3. What legal, diplomatic or multilateral options were considered, including recourse to international law or international forums, and which were accepted or rejected, with reasons?
4. Did the Cabinet assess the implications of these unilateral measures on Sri Lanka's sovereignty, civil-military relations and institutional integrity and what conclusions were reached?
5. What representations have been made to the UK Government since the imposition of these sanctions and what outcomes, if any, have resulted?
6. Has the Government evaluated the precedent this sets for the States imposing extra-territorial measures against Sri Lankan nationals without due process and what safeguards are now in place?
7. What is the Government's definitive Foreign Policy position and forward strategy when Sri Lankan citizens are subject to unilateral sanctions outside internationally recognized legal frameworks?

Finally, should we not, as a nation, reaffirm our loyalty to our disciplined armed forces and the Police and formally acknowledge their services and the sacrifices, whose commitment ensured the unity and security of our plural, democratic society?

Thank you.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, the Answer -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

He asked for time.

Question No. 02, the Hon. (Dr.) Ramanathan Archchuna.

## II

## මුලතිව්, සිලාවත්ත ප්‍රදේශයේ කුගනේෂන් ඩිනෝජා දැරියගේ මරණය

## முல்லைத்தீவு, சிலாவத்தைப் பகுதியைச் சேர்ந்த குகனேசன் டினோஜா என்ற சிறுமியின் இறப்பு

## DEATH OF GIRL NAMED KUGANESHAN DINOJA FROM SILAWATTA, MULLAITIVU

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Good Morning, Hon. Speaker! Let me read the Question in Tamil.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கௌரவ சுகாதார அமைச்சர் அவர்களிடம் முல்லைத்தீவு - சிலாவத்தைப் பகுதியில் உணவு ஒவ்வாமை காரணமாக வைத்தியசாலையில் அனுமதிக்கப்பட்ட 12 வயதுடைய சிறுமி உயிரிழந்தமை தொடர்பாக கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி!

முல்லைத்தீவு - சிலாவத்தைப் பகுதியில் வசித்துவந்த 12 வயதுடைய குகனேசன் டினோஜா என்ற சிறுமி அண்மையில் உயிரிழந்த சம்பவம் பொதுமக்கள் அறிந்தது. இந்தக் கொலை தொடர்பில் நியாயமான விசாரணை கேட்டு, முல்லைத்தீவு மக்கள் வைத்தியசாலைக்கு முன்னால் ஆர்ப்பாட்டங்களைச் செய்திருந்தமையும் குறிப்பிடத்தக்கது. இந்த விடயம் தொடர்பாக முல்லைத்தீவு மக்கள் சார்பாக பின்வரும் வினாக்களைக் கேட்க விரும்புகின்றேன்.

1. மேற்படி சிறுமி முல்லைத்தீவு, மாஞ்சோலை வைத்தியசாலையில் அனுமதிக்கப்பட்ட திகதியையும் நேரத்தையும் குறிப்பிட முடியுமா?
2. மேற்படி சிறுமி வைத்தியசாலையில் அனுமதிக்கப் பட்டபோது, வெளிநோயாளர் பிரிவில் அவரைப் பார்வையிட்ட வைத்தியரின் பெயர் என்ன? அவர் குறித்த சிறுமியைப் பார்வையிட்ட பின்னர், குழந்தைகள் பிரிவுக்கு மாற்றம் செய்த நேரம் என்ன?
3. மேற்படி வைத்தியசாலையில் குழந்தைகள் தொடர் பான சிறப்பு வைத்தியநிபுணர் - consultant - கடமையாற்றுகின்றாரா? ஆமெனில், அவருடைய பெயர் என்ன?
4. சிறப்பு வைத்தியநிபுணர் ஒருவர் இல்லை என்றால், இந்த வைத்தியசாலையில் குழந்தைகள் தொடர்பாக சேவையில் இருக்கின்ற மூத்த வைத்திய அதிகாரியின் பெயர் என்ன? அவர் அன்றைய தினம் கடமையில் இருந்தாரா? Senior MO ගැන අහන්නේ.
5. மேற்படி வைத்தியசாலை எந்தப் பிரிவு வைத்திய சாலைக்குள் அடங்குகின்றது? மேற்படி வைத்திய சாலையின் வைத்திய அத்தியட்சகரின் பெயர் என்ன, அவருடைய வதிவிடம் எது?
6. இந்த வைத்தியசாலையில் கடைசியாக செய்யப்பட்ட cadre revisionஇன்படி, வேலை செய்யவேண்டிய வைத்தியர்கள் எத்தனை பேர்? வேலை செய்ய வேண்டிய சிறப்பு வைத்தியர்கள் எத்தனை பேர்? தற்போது இருக்கின்ற நிலைமை என்ன?
7. மேற்படி வைத்தியசாலையின் அத்தியட்சகர் சம்பவம் நடந்த தினமன்று வைத்தியசாலையில் இருக்கவில்லை எனவும், அன்றைய தினம் அவர் கொழும்பில் இருந்த தாகவும் முறைப்பாடு செய்யப்பட்டிருக்கிறது. அது தொடர்பாகத் தாங்கள் அறிந்திருக்கின்றீர்களா?
8. மேற்படி சிறுமி குழந்தைகளுடைய பிரிவுக்கு அனுமதிக்கப்பட்ட நேரத்தையும், அதன்பின்னர் வைத்திய அதிகாரி அந்தச் சிறுமியைப் பார்வையிட்ட நேரத்தையும் சொல்ல முடியுமா?
9. மேற்படி சிறுமியைப் பார்வையிட்டபோது உணவு ஒவ்வாமைக்கான அறிகுறிகள் இருந்ததா? அவ்வாறு இருந்ததாயின், அந்தச் சிறுமிக்கு வழங்கப்பட்ட சிகிச்சை பற்றி சபைக்குத் தெரிவிக்க முடியுமா?
10. மேற்படி சிறுமிக்கு வழங்கப்பட்ட மருந்து, சாதாரண வைத்தியர் ஒருவரால் சிறப்பு வைத்தியநிபுணர் இல்லாத நேரத்தில் வழங்கக்கூடிய ஒரு மருந்தா?
11. குறித்த சிறுமிக்கு வழங்கப்பட்ட மருந்துகள் தொடர் பாகப் பெற்றோருக்கு அறிவுறுத்தல் வழங்கப்பட்டதா? அவ்வாறு வழங்கப்பட்டு இருந்தால், அவை முறை யாக BPHDஇல் பதிவுசெய்யப்பட்டு இருக்கிறதா? அவர்களுடைய signature இருக்கின்றதா? சிறுமியின் பெற்றோர் அம்மருந்துகளுக்கான சம்மதத்தை வழங்கி யிருந் தார்களா?
12. குறித்த சிறுமியின் மரணம் தொடர்பாகப் பெற்றோருக்குத் தெளிவுபடுத்தப்பட்டதா?
13. மேற்படி சிறுமியின் உயிரிழப்பானது, மருத்துவ அசண்டையீனம் என்ற பகுதிக்குள் அடக்கப் படவேண்டிய ஒன்று என்பதில் எந்தச் சந்தேகமும் இல்லை. ஆயினும், மேற்படி சிறுமியின் இறப்புத் தொடர்பான சம்பவத்தை வைத்திய அத்தியட்சகர் முறையாக சட்டரீதியாக நடவடிக்கை எடுத்து பொலிசாருக்கு அறிவித்தாரா?
14. மேற்படி சிறுமியின் இறப்புத் தொடர்பாகத் தங்களுடைய அமைச்சினால் ஆரம்பிக்கப்பட்ட முதற்கட்ட விசாரணை மற்றும் அதன் அறிக்கையைப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடியுமா?
15. மேற்படி சிறுமி இறந்தமை தொடர்பாக முதற்கட்ட விசாரணையின்போது, குற்றம் அடையாளம் காணப் பட்டதா? அவ்வாறாயின், அந்தச் சிறுமிக்கு மருந்து வழங்கிய வைத்தியர் தற்காலிகமாகச் சேவையிலிருந்து நீக்கப்பட்டு இருக்கின்றாரா?
16. மேற்படி சிறுமிக்கு மரணத்தின் பின்னரான post-mortem செய்யப்பட்டதா? அந்த post-mortem reportஇல் குறிப்பிடப்பட்டுள்ள இறப்புக்குரிய காரணம் என்ன?

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

17. மேற்படி வைத்தியரைப் பாதுகாப்பதற்குரிய நடவடிக் கைகளையும் பொதுமக்களை ஏமாற்றும் நடவடிக்கை களையும் வைத்தியசாலை நிருவாகம் செய்கின்றது என்ற குற்றச்சாட்டைப் பொதுமக்கள் முன்வைக்கின் றார்கள். அது தொடர்பாகத் தாங்கள் சொல்லிக் கொள்ள விரும்புவது என்ன?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2025 දෙසැම්බර් මාසයේ 21වැනි දා රාත්‍රී 7.20ට පමණ මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලට ඇතුළත් වුණු කුගනේෂන් ඩිනෝජා කියන 12 හැවිරිදි දැරිය මරණයට පත්වීම පිළිබඳ සිදුවීම වාර්තා වෙලා තිබෙනවා. ඇත්තටම මම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අර්චුනා මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයේ තිබෙන්නේ "ඝාතනයට සාධාරණ පරීක්ෂණයක්..." කියලා. මරණයක් සිදු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ ගැන අපි කවුරුත් කනගාටු වෙනවා. ඒ සම්බන්ධයෙන් දැනට අපි රෝහල් මට්ටමින් සහ පළාත් මට්ටමින් මූලික පරීක්ෂණයක් කරලා තිබෙනවා. ඒ වාර්තාව සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. ඒ මත පදනම් වෙමින් අපි ඉදිරි විමර්ශන කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම ඒ මරණය සිදු වුණේ රෝහල් කාර්ය මණ්ඩලයෙන් සිදු වුණු අතපසුවීමකින්ද කියන එක සම්බන්ධයෙන් සොයන්න තමයි, අපි පරීක්ෂණය කරගෙන යන්නේ. පරීක්ෂණයක් සිදු කරන නිසා පරීක්ෂණයට බාධාවක් නොවන ලෙසට මම ඉදිරියේදී කරුණු වාර්තා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

## නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේදී මතුවී ඇති ගැටලු: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

## புதிய கல்விச் சீர்திருத்தங்களை அறிமுகப்படுத்துவதால் எழுகின்ற சிக்கல்கள்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

## ISSUES ARISEN IN INTRODUCING NEW EDUCATION REFORMS: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2026.01.08වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. නැත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ මෙතෙක් භාවිත කළ පෙළ පොත් වෙනුවට මොඩියුල හඳුන්වා දීම සිදු කරන අතර, ඒ අනුව 2026 වසරේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට යෝජිත 1 සහ 6 ශ්‍රේණි සඳහා යොදා ගත යුතු මොඩියුල 106ක් භාෂා ත්‍රිත්වයෙන්ම මේ වනවිට පිළියෙළ කර මුද්‍රණය අවසන් කර ඇත. එම මොඩියුල 106 අතරින් එක් මොඩියුලයක් වන ඉංග්‍රීසි භාෂා 1, 2, 3 මොඩියුලයේ නුසුදුසු වෙබ් නාමයක් ලෙස හඳුනා ගත හැකි යෙදුමක් අන්තර්ගත වී ඇති බවට හඳුනා ගනු ලැබිණි. ඒ අනුව එම නුසුදුසු යෙදුම ඇතුළත් පාඩම් කොටස අදාළ මොඩියුලයෙන් ඉවත් කිරීමට මේ වනවිට කටයුතු කර ඇත.

ඒ අනුව, ඉහත මොඩියුල 106ම 2026 ජනවාරි 21 දින වන විට සියලුම පාසල් වෙත බෙදා හැරීමට කටයුතු කරනු ඇත. 1 ශ්‍රේණිය සඳහා නව විෂය නිර්දේශය 2026 ජනවාරි 29 වන දින සිට ක්‍රියාත්මක කරන අතර 6 ශ්‍රේණියට අදාළ නව විෂය නිර්දේශය 2026 ජනවාරි 21 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ වන්නේ 2018 වර්ෂයේදී වන අතර එම අවස්ථාවේදී ද ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු වී ඇත්තේ විෂය මාලා සංවර්ධනය කෙරෙහි වේ. මෙම නව විෂය මාලාව පදනම් කරගනිමින් 2023 වර්ෂයේදී සහ 2024 වර්ෂයේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට එවකට පැවති රජයන් විසින් සැලසුම් කර තිබුණද එය විවිධ හේතු මත කල් දැමීමට සිදු වී ඇත. මෙහිදී සැලකිය යුතු කරුණක් වන්නේ, මේ වන විට විෂයමාලාව සංශෝධනය කිරීම වසර 10කින් පමණ ප්‍රමාද වී තිබීමයි. 2024 වසරේදී නව රජය බලයට පත් වීමත් සමඟ ජාතික අධ්‍යාපන කොමිසම විසින් පිළියෙල කර තිබූ සාමාන්‍ය අධ්‍යාපනය සම්බන්ධයෙන් 2022 වර්ෂයේ එළිදක්වන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ ජාතික අධ්‍යාපන ආයතනය විසින් පිළියෙල කර තිබූ නව විෂය නිර්දේශයට අදාළ මොඩියුල සමාලෝචනය කරන ලදී. නව රජයේ ප්‍රවේශය වූයේ හුදු විෂයමාලා වෙනසකට වඩා සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළ සිදු කරන පරිවර්තනීය වෙනසකි. මෙහිදී විෂයමාලා සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් සහ පරිපාලන ප්‍රතිසංස්කරණ, ඇගයුම් ක්‍රියාවලිය සහ මහ ජනතාව දැනුවත් කිරීම යන පස්වැදෑරුම් ප්‍රවේශයක් යෝජනා කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර එම සමස්ත සංකල්පය "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් 2025" ලෙස ඇමුණුම 01 වශයෙන් ඉදිරිපත් කරමි.

මෙම රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සහ මානව හිමිකම් උල්ලංඝනයක් කිසිදු ලෙසකින් සිදු නොවේ. දරුවන්ගේ මානව අයිතිවාසිකම් සැබැවින්ම උල්ලංඝනය වනු ලබන්නේ මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීම ප්‍රමාද කිරීම තුළිනි.

2. මෙම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය 2019 වර්ෂයේදී ආරම්භ වී ඇති අතර විෂය නිර්දේශ සකස් කිරීම, විෂය මාලා රාමුව (Grid Framework) සකස් කිරීම, මොඩියුල සකස් කිරීම ආදී වූ සියලු කාර්යයන් සිදු කිරීමට 2021 වසරේදී ජාතික අධ්‍යාපන ආයතනය වෙත පවරා ඇත.

2020 වර්ෂයේ සිට ඇති වූ ගෝලීය වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් රාජ්‍ය ආයතනවලට බඳවාගැනීම් සීමා කරමින් හා රාජ්‍ය වියදම් සීමා කරමින් පනවා තිබූ

වක්‍රලේඛ හේතුවෙන් නිලධාරීන් විශ්‍රාම ගැනීම හා ඉවත්ව යාම මඟින් ඇති වූ පුරප්පාඩුවලට නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි වීම ආදී වූ කරුණු හේතුවෙන් සිදු වූ බලපෑම හැර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මොඩියුල සකස් කිරීමට සෘජු බාධාවක් ජාතික අධ්‍යාපන ආයතනය වෙත එල්ල වූ බවක් නිරීක්ෂණය නොවේ.

මෙම විෂය මාලා සංකල්පමය රාමුව හා සැලසුම සඳහා ලෝකයේ විවිධ විෂය මාලා ක්‍රම සහිත සිංගප්පූරුව, දකුණු කොරියාව, ඕස්ට්‍රේලියාව, ෆින්ලන්තය, ඉන්දියාව, ජපානය ආදී රටවල විෂයමාලා පරිවර්තන ක්‍රියාවලීන් ජාතික අධ්‍යාපන ආයතනය විසින් අධ්‍යයනය කර ඇත. එසේම ශ්‍රී ලංකා අධ්‍යාපනය පිළිබඳව කරනු ලැබ ඇති පර්යේෂණද මේ සඳහා මූලාශ්‍ර වශයෙන් යොදාගෙන ඇත. තවද, මෙම මොඩියුල 2020 වර්ෂයේ සිට යම් යම් සංශෝධනයන්ට ලක් කරමින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර ඇති අතර, එම මොඩියුලවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන්ද පසුගිය කාලසීමාව තුළ විවිධ අධ්‍යයනයන් සහ නියමු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව සියලුම පළාත් ආවරණය වන ලෙස තෝරා ගත් පාසල් 103ක මෙම මොඩියුල සම්බන්ධ නියමු ව්‍යාපෘතියක් 2024 වර්ෂයේ ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ක්‍රියාත්මක කර ඇති අතර එකී නියමු ව්‍යාපෘතිය මඟින් හඳුනාගත් යම් යම් කරුණු සංශෝධනයන්ට ලක් කරමින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් මෙම මොඩියුල සකස් කර ඇත.

ජාතික අධ්‍යාපන ආයතනය විසින් සිදු කරන ලද නියමු වැඩසටහන් හා සමීක්ෂණ කිහිපයක් පහතින් දක්වා ඇත.

- අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරාවල ක්‍රියාත්මක ස්වභාවය සම්බන්ධව ගුරු-සිසු සංජානන පිළිබඳ සමීක්ෂණය (ඇමුණුම 02)
- 6 සහ 10 ශ්‍රේණිවල යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පාසල් තලයේ ගුරුවරුන්ගේ අත්දැකීම් ක්‍රියාමූලික පර්යේෂණ වාර්තා (ඇමුණුම 03)
- පළමුවන ශ්‍රේණියේ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පාසල් තලයේ ගුරුවරුන්ගේ අත්දැකීම් ක්‍රියාමූලික පර්යේෂණ වාර්තා (ඇමුණුම 04)
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ ද්විතීයික ශ්‍රේණි සඳහා යෝජිත විෂයමාලාවේ "යහපුරවැසිභාවය" සංකල්පය ඉදිරිපත් වී ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනය (ඇමුණුම 05)
- යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයෙන් නිර්දේශිත මොඩියුල පාදක ඉගෙනුම් ප්‍රවේශය සහ සිසු සාමාන්‍ය කුසලතා වර්ධනය (ඇමුණුම 06)
- "1st Interim Report on Piloting of the Curriculum Transformation" (ඇමුණුම 07)

තවද, පෙළ පොත් හා මොඩියුල සම්පාදනය කිරීමේදී ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදයක් පවතින අතර එයද මේ සමඟ මා ඉදිරිපත් කරනවා. (ඇමුණුම 08)

ඇමුණුම් 01, 02, 03, 04, 05, 06, 07 සහ 08 මා **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

3. මෙම මොඩියුල සකස් කිරීමේ මුල් සැකසුම අනුව වෙබ් සබැඳි (web links)/ QR කේත ජාතික අධ්‍යාපන ආයතනය විසින් මොඩියුලයන්ට ඇතුළත් කිරීම සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. නමුත් නව රජය විසින් මෙම මොඩියුල සමාලෝචනය කිරීම සඳහා යොමු කිරීමේදී මෙම වෙබ් සබැඳි - web links - යෙදීමෙන් වළකින ලෙසට ජාතික අධ්‍යාපන ආයතනය වෙත උපදෙස් ලබා දී ඇත.

   එසේම, දෙවන හා තෙවන වාරවලට අදාළ මොඩියුල පිළියෙළ කිරීමේදී මින් ඉදිරියට කිසිදු ශ්‍රේණියකට වෙබ් සබැඳි - web links - ඇතුළු කිරීම සම්පූර්ණයෙන්ම නතර කළ යුතු බවට මේ වන විට ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇත.

   දැනට මෙම මොඩියුල සඳහා ඇතුළත් කර ඇති වෙබ් අඩවි සහ අනෙකුත් මූලාශ්‍ර බොහෝ විට Creative Commons යටතේ ගැනෙන මුදල් ගෙවීමක් අවශ්‍ය නොවන වෙබ් අඩවි හෝ රාජ්‍ය වෙබ් අඩවි වන බැවින් මෙම වෙබ් අඩවි භාවිත කිරීමේදි විනිවිදභාවය, වගකීම සහ ප්‍රසම්පාදන ක්‍රමවේද පිළිබඳ ගැටලුවක් මතු නොවේ.

   තවද, අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සඳහා වූ කාර්ය සාධක බලකාය විසින් මේ වන විට ඩිජිටල් භාවිතය පිළිබඳ ළමා ආරක්ෂණ පැතිකඩ තුළින් අධ්‍යයනයක් කරලා ඒ සඳහා ප්‍රතිපත්තියක් සහ මාර්ගෝපදේශයක්, educational technology පිළිබඳ මාර්ගෝපදේශයක් පිළියෙළ කර තිබෙනවා. ඒක අපි ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

4. ඉහත 3හි පිළිතුර අනුව කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ජාතික අධ්‍යාපන ආයතනයට නොලැබේ.

5. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම යටතේ 1 හා 6 ශ්‍රේණිවල ගුරුවරුන් දළ වශයෙන් 138,000ක් පමණ සිටින අතර මේ අතරින් 127,000ක් පමණ, එනම් 1 හා 6 ශ්‍රේණිවල ගුරුවරුන්ගෙන් දළ වශයෙන් සියයට 92ක් පමණ ප්‍රමාණයකට අවශ්‍ය ගුරු පුහුණුව ලබා දී අවසන් කර ඇත. පසුගිය කාලයේ ඇති වූ ආපදා තත්ත්වය හේතුවෙන් යම් යම් පළාත්වල යෝජිත පරිදි ගුරු පුහුණුව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර එම පළාත්වල පුහුණු වීම් නොලද ගුරුවරුන්ට 1 හා 6 ශ්‍රේණි ආරම්භ වීමට ප්‍රථම එම පුහුණුව ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

   මෙම 1 හා 6 ශ්‍රේණි සඳහා වූ නව මොඩියුල යටතේ ඉගැන්වීම් කිරීමේදී අන්තර්ජාල භාවිතය අත්‍යවශ්‍ය නොවන අතර, එය ඉගෙනුම් ආධාරකයක් ලෙස පමණක් භාවිත කිරීමට ගුරුවරුන්ට අවකාශ සලසා ඇත. මෙම මොඩියුලයට අදාළ සියලු කරුණු ගුරු අත් පොතේ සඳහන් කර ඇති අතර අන්තර්ජාල යෙදවුම් භාවිතාවෙන් තොරව කටයුතු සිදු කිරීමට ගුරුවරයාට හැකියාව ඇත. තවද සිසු ඇගයීම් සිදු කිරීමේදී දැනට ගුරුවරයා විසින් එම තොරතුරු ඇගයීම් පොතෙහි සඳහන් කළ යුතු අතර ඉදිරියේදී පරිගණක යෙදවුමක් මඟින් ඉහත ඇගයීම් තොරතුරු වාර්තා කිරීම සිදු කරනු ඇත.

   එසේම මේ සම්බන්ධයෙන් ගුරුවරුන් 2,400ක් වෙත අන්තර්ජාල හා තොරතුරු තාක්ෂණ පුහුණු කිරීමේ වැඩසටහන් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇති අතර ගුරුවරුන්ගේ පරිගණක, අන්තර්ජාල භාවිතාව හා තාක්ෂණික දැනුම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී සිදු කරනු ඇත.

6. ඉහත අංක 5හි පිළිතුරු පරිදි 1 හා 6 ශ්‍රේණිවල මොඩියුල ක්‍රියාත්මක කිරීමේදී අන්තර්ජාල භාවිතය අත්‍යවශ්‍ය නොවන අතර ගුරු අත් පොතෙහි ඇති තොරතුරු අනුව ඉගැන්වීම් කටයුතු සිදු කළ හැකිය.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය සඳහා වූ කාර්ය සාධක බලකාය මඟින් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු නවයක් වෙත රුපියල් මිලියන 1,600ක ප්‍රතිපාදන ලබා දී කිසිදු ඩිජිටල් උපාංගයන් නොමැති පාසල් සඳහා සුහුරු පුවරු හෝ පරිගණක යන්ත්‍ර ලබා දීමට කටයුතු කරමින් පවතී.

මෙහිදී පාසල් 2,498ක් සඳහා සුහුරු පුවරු ලැබෙන අතර, එම සුහුරු පුවරු පළාත් මට්ටමින් ප්‍රසම්පාදනය කර 2026 පෙබරවාරි මාසය වන විට පාසල්වලට බෙදා දීමට නියමිතය.

තවද, දිවයිනේ පවතින සියලු ද්විතීයික පාසල් 6,236න් 4,363ක් සඳහා කුමන හෝ අන්තර්ජාල සබඳතාවක් පවතී. දැනට කිසිදු අන්තර්ජාල සබඳතාවක් නොමැති ද්විතීයික පාසල් 1,873 සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම සමඟ සාකච්ඡා කර ඇති අතර, 2026 මාර්තු වන විට කුමන හෝ අන්තර්ජාල පහසුකම් මෙම පාසල් සඳහා ලබා දීමට කටයුතු කරනු ඇත.

ඒ අනුව 1 හා 6 ශ්‍රේණි සඳහා වන නව අධ්‍යාපන ප්‍රතිපත්ති 2026 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට පරිගණක, අන්තර්ජාල, විදුලිය වැනි භෞතික හා යටිතල පහසුකම් සැලකිය යුතු බාධාවක් නොවන අතර, 2027 වර්ෂයේදී 2 හා 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේදී 3, 8 හා 10 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේදී 4, 9 හා 11 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේදී 5 සහ 12 ශ්‍රේණි සඳහාත්, 2031 වර්ෂයේදී 13 ශ්‍රේණිය සඳහාත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරෙනු ඇත.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය පිළිගන්නවා, මොඩියුල සකස් කිරීමේදී අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා කියලා. ඒ පිළිබඳව ඔබතුමිය විමර්ශනයක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ විමර්ශන කටයුතු අවසන් වන තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය තාවකාලිකව ඒ රාජකාරි කටයුතුවලින් ඉවත් වෙලා කටයුතු කරන මොහොතක, ඔබතුමිය අපොහොසත් වෙලා තිබෙන කාරණයක් ගැන කිව යුතුයි. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා, ඒ වාගේම ඉංග්‍රීසි දෙපාර්තමේන්තුවේ academic වැඩ පිළිබඳ වගකීම දරන නිලධාරියා සහ මේ ප්‍රශ්නගත lesson එක, එහෙම නැත්නම් මොඩියුලය සකස් කරපු නිලධාරින් පිළිබඳව කිසිවක් සඳහන් වෙන්නේ නැහැ.

ලෝකයේ සමහර රටවල් දැන් වයස් සීමාවක් පනවනවා, අන්තර්ජාල සබඳතා පැවැත්වීම පිළිබඳව. විශේෂයෙන්ම ඒ අදාළ මොඩියුලයේ අඩංගු නොවිය යුතු දේවල් අඩංගු වීම කියන කාරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරිය විතරක් නොවෙයි, තවත් නිලධාරින් ගණනාවක් සම්බන්ධයි. හැබැයි, ඒ අය පිළිබඳව කිසිම සඳහනක් නැහැ. ඒ වාගේම ඔබතුමිය දුන්නු උත්තරයෙන් ප්‍රකාශයට පත් වෙනවා, දැන් ඔක්කොම නිවැරැදියි, සිදු වුණු තත්ත්වයන් නිවැරැදි කරන්න යම්කිසි පියවරක් අරගෙන තිබෙනවා කියන කාරණය. හැබැයි මම ඔබතුමියට කියන්න කැමැතියි, තවදුරටත් වැරැදි තිබෙන බව; තවදුරටත් අඩුපාඩු තිබෙන බව. අපේ ගරු රෝහිණී කවිරත්න මැතිනියගේ කථාවේදී කියැවුණා ඒවායේ අඩුපාඩු රාශියක් තිබෙන බව. තව එක අඩුපාඩුවක් මම ඔබතුමියට පෙන්වා දෙන්නම්. ඒක බරපතළ අඩුපාඩුවක්. "ආගම් හා සාරධර්ම අධ්‍යාපනය, බුද්ධ ධර්මය" මොඩියුලයට ධර්ම චක්‍රය කියලා ඔබතුමියලා ඇතුළු කර තිබෙන්නේ, අශෝක චක්‍රයයි. ඒක ඉතාම පැහැදිලියි. මම මේ සාක්ෂි සහිතවයි ඉදිරිපත් කරන්නේ. ධර්ම චක්‍රය වෙනුවට අශෝක චක්‍රය ඇතුළත් කිරීම බරපතළ ගැටලුවක්; බරපතළ ප්‍රශ්නයක්. මා ළඟ තිබෙන මේ පිටපත් සියල්ල මම **සභාගත*** කරනවා.

මේ වැරැදි දේත්, මේ අඩුපාඩුකමත් නිවැරැදි කරන්න. මම අහන්න කැමැතියි, මේක යම්කිසි ආගමික කටයුතු පිළිබඳ උපදේශක සභාවකින් අනුමත වුණාද කියලා. රාජ්‍ය ලාංඡනයේ තිබෙන ධර්ම චක්‍රය නොවෙයි නේ මෙතැන තිබෙන්නේ, මේ බලන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කෙටියෙන් කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ වාගේ නිවැරැදි කිරීම් ඇතුළුව තවත් නිවැරැදි කිරීම් රාශියක් තිබෙනවා, කරන්න. මම මේ අවස්ථාවේ ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් සාකච්ඡාවකට, සංවාදයකට, අදහස් හුවමාරු කිරීමකට ලක් කරලා මේ කරන දේ නිවැරැදිව කරන්න කියලා. මොකද, ප්‍රතිසංස්කරණ සිදු විය යුතුයි කියන මතයේ අපිත් ඉන්නවා. අපි නූතනවාදී වෙන්න ඕනෑ, නව තාක්ෂණය ගෙන එන්න ඕනෑ. ඒ වාගේම අනිවාර්ය විෂයවලින් ඉතිහාසය විෂය ඉවත් කිරීම පිළිබඳව අපේ එකඟතාවක් නැහැ. මේ කරුණු කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න. මේ වැරැදි නිවැරැදි කර ගන්න ගමන්ම ධර්ම චක්‍රය වෙනුවට අශෝක චක්‍රය ඇතුළු කිරීමේ කාරණයත් නිවැරැදි කරන්න. ඒ කොළ ටිකත් ඉවත් කරලා නිවැරැදි කොළ ටික දමන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න දෙකක් මතු වුණා. ඒ දෙකට මම උත්තර දෙන්නම්. එකක්, මේ සිද්ධියට සම්බන්ධ අනික් අය පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳවයි. ගරු කථානායකතුමනි, ජාතික අධ්‍යාපන ආයතනය කියන්නේ වෙනම පනතකින් පිහිටුවූ ආයතනයක්. ඒ ආයතනයේ විනය කටයුතු සිදු කරන්නේ එතැන Council එක විසින්. එතකොට අමාත්‍යාංශයට ඒකේ සේවකයන්ට සෘජුවම කිසිම ක්‍රියාමාර්ගයක් ගන්න බැහැ. පනත අනුව, ක්‍රියාමාර්ග ගත යුත්තේ ඒ Council එක විසින්. ඒ නිසා තමයි අපි මූලික විමර්ශනය සඳහා Council එකේ අනුමැතිය අරගෙන රංජිත් ආරියරත්න හිටපු ලේකම්තුමා පත් කරලා තිබෙන්නේ. ඒ ක්‍රියාවලිය දැන් සිද්ධ වෙමින් යනවා. එතකොට ඒ Council එක

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දැන් ඒ කටයුත්ත භාර අරගෙන තිබෙනවා. ඒ විමර්ශන අනුව ක්‍රියාමාර්ග ගනියි. ඒක නවත්වන්න කිසිම අවශ්‍යතාවක් අපට නැහැ. Council එකත් එක්ක අපි සාකච්ඡා කළා, මෙහි බරපතළකම. ඒ නිසා මේක බැරෑරුම් ලෙස භාර අරගෙන විමර්ශනය කරලා ඒ අදාළ නිලධාරින්ට දඬුවම් කළ යුතු විධිය ගැන ඒ කවුන්සලය තීරණය කරනවා. අපි ඒක අධීක්ෂණය කරනවා.

ගරු කථානායකතුමනි, දෙවන කරුණ තමයි ගරු විපක්ෂ නායකතුමා මතු කරපු ධර්ම චක්‍රය සහ අශෝක චක්‍රය පිළිබඳ පටලැවිල්ල. පොතේ ඇතුළත් වෙලා තිබෙන්නේ ඇත්ත වශයෙන්ම බෞද්ධ කටයුතු අමාත්‍යාංශය විසින් අනුමත කර තිබෙන සංකේතයයි. මේක අමාත්‍යාංශයේ බුද්ධාගම පිළිබඳ උපදේශක සභාව විසිනුත් අනුමත කරපු එක. ඊයේ මම අපේ අතිපූජ්‍ය අස්ගිරිය සහ මල්වතු මහා නායක හිමිපාණන් වහන්සේලා බැහැදැක්කා. ඒ අවස්ථාවේ මම උන්වහන්සේලා සමඟත් මේ ගැන කථා කළාම, අනුමත වෙලා තිබෙන symbol එක මේක තමයි කියලා උන්වහන්සේලාත් තහවුරු කළා. ඉතින් මේක නිවැරැදියි. මේක අශෝක චක්‍රය වාගේ තමයි. නමුත් මේක තමයි අනුමත වෙලා තිබෙන නිල symbol එක. හැබැයි, අපේ රටේ අනෙක් එකත් පාවිච්චි වෙනවා. ඒක පාවිච්චි නොවෙනවා නොවෙයි. නමුත් නිල වශයෙන් අනුමැතිය ලැබිලා තිබෙන්නේ මේකට. අපේ බෞද්ධ කටයුතු විෂය භාර අමාත්‍යවරයා මේ වෙලාවේ සභාවේ නැහැ. එතැනිනුත් අපි අනුමැතිය ලබා ගත්තා. ඒ විතරක් නොවෙයි, අපේ බුද්ධශාසන අමාත්‍යාංශයේ බුද්ධාගම පිළිබඳ උපදේශක සභාවෙනුත් මේකට අනුමැතිය ලැබුණා.

මම ඊයේ මේ ගැන අපේ ගරුතර මහානායක හිමිවරුන් එක්කත් කථා කළාම මේක අනුමැතිය ලබා තිබෙන සංකේතයක්ය කියන එක උන්වහන්සේලාත් ප්‍රකාශ කළා, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order,

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද point of Order එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ ඉදිරිපත් කරපු කරුණුවල යම් යම් අඩුපාඩුකම් තිබෙන කොට අපටත් අවස්ථාව තිබෙන්න ඕනෑ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. මේක බුදු දහම පිළිබඳ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, 2025.08.21වන දින සහ 2025.11.27වන දින ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order. - *[Interruption.]* මට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කිරීමක් කරන්න ඔබතුමාට අවස්ථාව දුන්නා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමා වැදගත් කාරණාවක් ඒ අහන්නේ. පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සියලුම මන්ත්‍රීවරු කරුණාකර අසුන් ගන්න. [බාධා කිරීම්] මේක විවාදයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමන්ලා.

ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා.

## ස්වාධීන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරියක් පිහිටුවීම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சுயாதீன ஊழியர் சேமலாப நிதிய அதிகாரசபையொன்றைத் தாபித்தல்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## ESTABLISHMENT OF AN INDEPENDENT EMPLOYEES' PROVIDENT FUND AUTHORITY: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
Hon. Speaker, first, I will answer the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27 (2) on 27th November, 2025.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

01. During the year 2025, the process of handing over of issuance of Treasury Bills and Treasury Bonds from the Central Bank of Sri Lanka to the Ministry of Finance was commenced in accordance with the Finance Act and the PDMO Act. Therefore, this issue would be addressed, upon the completion of the takeover process, from 01st January, 2026.

02. If a policy decision would be taken and finalized in this regard, we would keep the House informed in the future.

03. a. The total asset value of the Fund as at 31st October, 2025 was Rs. 4,894 billion.

b. The composition of the EPF's Investment Portfolio as at 31st October, 2025 is given in the table below.

| Instrument | Book Value (Rs '000) | Composition |
|---|---|---|
| Government Securities | 4,616,977,889 | 94.34 % |
| Corporate Debt Instruments | 22,135,467 | 0.45 % |
| Listed Equities | 191,160,756 | 3.91 % |
| Unlisted Equities | 45,171,692 | 0.92% |
| Other | 18,650,000 | 0.38% |
| **Total** | **4,894,095,804** | |

a. The investment composition of the Employees' Provident Fund - EPF - is primarily driven by available domestic market opportunities. Given the substantial size of the fund, market opportunities remain limited. As a superannuation fund, investment in fixed-income securities is prioritized to ensure consistent, long-term returns. Government securities are considered as the lowest-risk investment instrument and the most practical major investment option, given the size of the Fund.

b. The details of returns paid by EPF on member balances prevailed at end of each year from 2020-2024 after paying 14 per cent Income Tax, with the comparison of other market indicators, are given in the table below.

| Year | Rate of Return on EPF Member Balances (%) | Rate of Return offered by Employees Trust Fund (%) | 1 Year Fixed Deposits rate of a Major Savings Bank (%) | Commercial Banks' Average Weighted Deposits Rate (AWDR) (%) | Annual Average Inflation CCPI (2021=100) (%) |
|---|---|---|---|---|---|
| 2020 | 9.00 | 8.00 | 5.25 | 5.80 | 4.60 |
| 2021 | 9.00 | 7.50 | 5.50 | 4.94 | 6.00 |
| 2022 | 9.00 | 8.75 | 12.00 | 14.06 | 46.40 |
| 2023 | 13.00 | 10.00 | 8.00 | 11.64 | 17.40 |
| 2024 | 11.00 | 10.00 | 7.00 | 7.53 | 1.20 |

In all the years, except in the year 2022, the yield or the rate of return given by the EPF to its members had been higher.

04. The Answer given in No. 02 above applies.

05. As a long-term fund, EPF follows a passive investment approach. Further, as indicated, a defined Governance Framework that includes firewalls between EPF investment activities and the Central Bank of Sri Lanka functions to prevent and avoid possible conflicts of interest is established.

06. (a) The Annual Report of the Fund, which includes the financial statements, the Auditor-General's report and other relevant information, is submitted to the Ministry of Labour for subsequent presentation to Parliament.

(b) Requirement of actuarial valuation does not arise since EPF is a defined benefit plan that accrues member balances based solely on earned income.

07. Approval of the Cabinet of Ministers had been obtained for procuring an IT solution for EPF. Accordingly, arrangements are in place to design a comprehensive IT solution collaboratively by the Department of Labour and the Central Bank of Sri Lanka. Also note that some facilities such as online access to EPF monthly contribution payments and accounts are available in the current IT system.

08. The Code of Conduct applicable to all staff of the Central Bank of Sri Lanka is published on its website. For that, refer to https://www.cbsl.gov.lk/en/about/organisational-structure/governance-codes-and-policies.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, it is not there on the website. I am asking a specific question. I would like an answer for that, for it is being evaded all over.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

First, let me finish the Answer. Actually, the Code of Conduct is a detailed and a lengthy one. Therefore, I cannot read it out. So, that is on the website.

09. No policy decision has been taken on this until now.

Thank you.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහන්නේ කොටස් 3ක් අඩංගු කරලා. එහෙම නැතිව මේ ප්‍රශ්නය අහන්න බැහැ. මොකද, මේ ප්‍රශ්නයට උත්තරය අංගසම්පූර්ණව ලැබුණේ නැහැ. මම බොහොම සෘජුව අසා තිබෙනවා, කවදාද මේක වෙන්නේ

කියලා. නමුත්, ඒක වෙලා නැහැ. අපි අර්ථසාධක අරමුදල ගැන කථා කරද්දී ඔබතුමාත් ජනාධිපතිතුමාගේ මූල්‍ය කාරක සභාවට ඇවිල්ලා හිටියා. ඒ කාරක සභාවෙන් ලැබුණු උත්තරයයි, මේ පාර්ලිමේන්තුවේදී මීට පෙර මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කියපු දෙයයි අතර ලොකු පරස්පරයක් තිබෙනවා. ඒ නිසා මම රජයෙන් කාරුණිකව ඉල්ලනවා, මේකට බොහොම සෘජු පිළිතුරක් දෙන්න කියලා. මොකද, අද ලක්ෂ 50ක් විතර ඉන්න EPF සාමාජිකයන් බොහොම බියට පත්වෙලා තිබෙනවා, මොකක්ද මේ අර්ථසාධක අරමුදලත් එක්ක කරන්න යන්නේ, ඒකට ඉදිරියේදී වෙන්න යන්නේ මොකක්ද කියලා. මහ බැංකුව තුළ මේ කරන ඒකාබද්ධ වීම සහ ඔබතුමා ලබා දුන්නු දෙවැනි උත්තරය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ තිබෙන administrative agreement එකත් එක්ක පරස්පරයක් තිබෙනවා. අපි මේ ප්‍රශ්නය අහන්නේ අපේ රටේ අභිවෘද්ධියට මිසක්, එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ තෘප්තිය වෙනුවෙන් නොවෙයි. ඒ නිසා කරුණාකරලා අපට ඒ සම්බන්ධයෙන් අංගසම්පූර්ණ උත්තරයක් ලබා දෙන්න. මේ ප්‍රශ්නය අහන එක පිට පැන්න හැටියේම ගරු කථානායකතුමා කියයි, "ඔන්න පළමුවැනි අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි, තවත් අහන්න බැහැ" කියලා. ඒකයි මම ඒ ඔක්කෝම අඩංගු කරලා අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එක පැහැදිලි කර ගැනීමක් විතරයි තිබෙන්නේ. ඒක තමයි අපි එකඟතාවට පත් වෙච්ච දේ. ඒක ගරු මන්ත්‍රීතුමා තේරුම් ගන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ මේ තිබෙන දේවල් තනිවම භුක්ති විඳින්න නොවෙයි. අපේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන් මේ ප්‍රශ්නයට අපි උත්තරයක් ලබා දෙන්න ඕනෑ. ඒ ජනතාව දන්නේ නැහැ, ඔබතුමා මේ සභාවේදී අප කොන් කරනවා කියලා. අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් එකයි කියලා ඒ ජනතාව දන්නේ නැහැ. ජනතාව හිතනවා, අපි අංගසම්පූර්ණ වැඩක් කරන්නේ නැහැ කියලා. ඒ නිසා තමයි මම මේ ගැන අහන්නේ. එම නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් අප දැනුවත් කරන්න, සැබෑ තත්ත්වය මොකක්ද කියලා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අසා තිබුණු ප්‍රශ්නවලට තමයි මම පිළිතුරු ඉදිරිපත් කළේ. නමුත්, මේ පැහැදිලි කර ගැනීමේදී ඉදිරිපත් කරනවා, ඉන් එහාට ගිය කරුණක් පිළිබඳව. මේක සේවකයන්ගේ අරමුදලක් බව සැබෑව. එය මහ බැංකුව යටතේ පවතිනවා. නමුත්, අපි යම් සාකච්ඡාවක් පවත්වමින් තිබෙනවා. මේක එක පාර කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේකේ database systems දෙකක් දැනට තිබෙනවා. මහ බැංකුව යටතේ අරමුදල පාලනය වෙනවා. කම්කරු අමාත්‍යාංශයෙන් පරිපාලනය සිද්ධ වෙනවා. එම නිසා මේ කරුණු සාකච්ඡා වෙමින් තිබෙනවා. අපි කලබල විය යුතු නැහැ. අපි මේක කරන්නට ඕනෑ ඉතාම නිවැරදි ක්‍රමයකට ඒ අරමුදලට හානියක් නොවන විධියට. අපි ඒ අදාළ නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු ගත්තාම තමයි කියන්න සිද්ධ වෙන්නේ, මේ මේ විධියට අදාළ ක්‍රියාමාර්ග ගන්නවා කියලා.

ඊළඟට ගරු කථානායකතුමනි, තවත් අතුරු කාරණයක් හැටියට වරද්දනවා මේ EPF එක ගැන අපි කියපු නැති කාරණයක් ගැන. සමාජයේ මතු කළා, EPF එකේ සේවකයන්ගේ අරමුදල විශ්‍රාම වැටුපකට පරිවර්තනය කරනවා, මින් ඉදිරියට ගෙවන්නේ නැහැ කියලා. ඒක "Daily Mirror" පත්තරේ වාර්තා කරලා තිබෙනවා. නමුත් එහෙම එකක් නොවෙයි කිව්වේ. අපි කිව්වේ සේවකයන්ගේ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් අපි මේ රටේම පුළුල් සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් පිළිබඳව සාකච්ඡා පවත්වමින් තිබෙනවා කියලා. සේවකයන්ගේ පැත්තෙනුත් මතු කළා, ඒගොල්ලන්ට හිමි වන විශ්‍රාම වැටුපක් වාගේ දේකුත් සාකච්ඡා කරන්න කියලා. සමාජයේ එවැනි සාකච්ඡාවක් තිබෙනවා මිසක්, EPF එකේ අරමුදල විශ්‍රාම වැටුපකට පරිවර්තනය කරනවා කියලා නැහැ. ඒ නිසා ඒක වැරදි අවබෝධයක්. එවැනි එකක් ප්‍රකාශ වෙලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා අවසන් කරනවා ද? *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Then, the Answer to your second Question raised on 21.08.2025 is also a detailed one. Shall I table it or do you want me to read it out?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

මේ අරමුදලේ එදා රුපියල් ට්‍රිලියන 4ක් තිබුණා. අද රුපියල් ට්‍රිලියන 6ක් තිබෙනවා. ඒක පාවිච්චි කරන ආකාරය තමයි අපි මේ අහන්නේ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, එතැන රුපියල් ට්‍රිලියන 6ක් නැහැ. ඒකත් වැරදි තොරතුරක්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒක කිව්වා. එතුමා ඒක කියන්න ඇත්තේ ඒ unionsවලින් දැනුවත් වෙලා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මේ තිබෙන්නේ Central Bank එකෙන් ඉදිරිපත් කරපු දේවල් නේ, ගරු මන්ත්‍රීතුමා. කෙසේ හෝ ඒ තිබෙන මුදල පාලනය කිරීම, කළමනාකරණය කිරීම දැනට Central Bank එකේ අදාළ මණ්ඩල විසින් සිදු කරන්නේ. ඒකේ කිසිම ගැටලුවක් පැන නැඟිලා නැහැ. මොනවා හරි අක්‍රමිකතාවක් හෝ ගැටලුවක් තිබෙනවා නම් ඒ මත ඉඳගෙන තමයි අපට කටයුතු කරන්න වෙන්නේ. එහෙම නැතිව, උපකල්පන මත මෙහෙම වෙයි, මෙහෙම වෙයි කියලා අපට නිගමනවලට එන්න බැහැ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, පිළිතුරු දීම අවසන් ද?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ඔව්.

## අපනයන ඉපැයීම් වැඩිදියුණු කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## ஏற்றுமதி வருமானங்களை மேம்படுத்தலும் முதலீடுகளை ஈர்த்தலும்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## IMPROVING EXPORT EARNINGS AND ATTRACTING INVESTMENTS: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

Hon. Speaker, the Answer to the Question raised by Hon. Ravi Karunanayake on 21.08.2025 is as follows:

01. A detailed Answer is given in Annex 01. I will just read out key figures. In 2026, the target is US Dollars 23.6 billion, In 2027, the target is US Dollars 28.3 billion. Likewise, it goes up to US Dollars 36 billion.

02. All relevant sectors are expected to grow in line with the projected growth up to 2030. Depending on global market dynamics and volatility, the growth strategies will be tailored.

03. The impact of the newly imposed Trump tariff on Sri Lanka's export earnings would be the net effect of the behaviour of market forces in all the countries in the medium to long-term. The Government of Sri Lanka has made successful bilateral negotiations to reduce the increased tariff and further, proceedings are underway towards bringing a positive impact on the country. Overall, the impact will be dependent upon the conclusion of tariff negotiations by other countries, particularly the ones in the region.

04. With the view to facilitate the export target of the Government, all possibilities are being explored to access new markets through the set of policy tools, including entering into new free trade or preferential trade agreements with countries in which trade creation is positive. Among the key factors of the criteria are, the market potential, possibility to enhance the already signed agreements and emerging opportunities.

05. In line with the changing global dynamics, strategies are implemented to export high-value-added products to promote best use of resources.

06. Again, a detailed Answer is given in Annexes 02 and 03. I can outline some of the key factors. One is, investment facilitation through the BoI and even through the recently passed Colombo Port City Economic Commission (Amendment) Bill.

07. The Government supports the Micro, Small and Medium Enterprises - MSMEs - through several concessional credit schemes to enhance access to finance, through which the export-oriented MSMEs can also meet their financing needs.

Accordingly,

1. the Small and medium-sized Enterprises Line of Credit Project - SMELoC - sponsored by the Asian Development Bank was funded up to Rs. 7 billion last year and for 2026, another Rs. 6.1 billion has been assigned.

2. For the stimulating package for re-energizing the micro, small, and medium-sized enterprises sector in Sri Lanka - that is, the Re-MSME package - Rs. 20 billion has been allocated annually for both 2025 and 2026.

3. The Agriculture Value Chain Sector Development Programme, an ADB-funded Programme for US Dollars 70 million, will commence in 2026.

4. Another SME sector development programme funded by the ADB amounting to US Dollars 120 million will also commence in 2026.

So, including these SME packages and other financing packages, the Government has set aside Rs. 96 billion altogether in the Budget.

To address collateral-related challenges in conventional lending, the National Credit Guarantee Institution Limited - NCGIL - was established with ADB support and operationalized in February, 2025. During the period, NCGIL has issued 458 guarantees worth Rs. 1.7 billion for loans worth of Rs. 2.5 billion, including nine guarantees of Rs. 59 billion for export-oriented businesses.

08. Upon conclusion of the facilitative regulation, it is envisaged that approximately 2 per cent of GDP would be realized as FDIs through the BoI, the Port City and other investments to non-BoI entities as well.

09. There are three incentive schemes available to investors:

1. Under the Inland Revenue Act, No. 24 of 2017

2. Under the Strategic Development Projects Act, No. 14 of 2008, which is being reviewed; and

3. Under the Colombo Port City Economic Commission Act, No. 11 of 2021, which was amended recently.

Those incentives are rules-based rather than discretionary.

Details relating to these incentives are available in the respective institutions and organizations.

10. Yes. It is expected to build sufficient reserves to ensure that debt servicing is managed, as planned.

    It is a very clear fact that from the very beginning, there was fear and scepticism that the Government would not be able to reach the Gross Official Foreign Reserves somewhere around US Dollars 7 billion. It was just hanging around US Dollars 6 billion. But, we managed to do this while allowing all these importations and continuing debt repayment. So, I am happy to announce that by the end of 2025, the Gross Official Foreign Reserves amounted to US Dollars 6.82 billion.

    Sir, I **table*** Annnexes 01, 02 and 03.

Thank you.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ සවිස්තර උත්තරය තුළින් පැන නඟින ප්‍රශ්න දෙකක් මම එක් ප්‍රශ්නයකට ඒකාබද්ධ කරන්නම්. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා නිල විදේශ සංචිත ප්‍රමාණය 6.8යි කියලා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඇමෙරිකානු ඩොලර් බිලියන 6.82යි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි, මොන සංචිතය වුණත් කමක් නැහැ. නමුත්, අද ඩොලරය ගැනීමේ මිල ප්‍රමාණය 315යි. ඉතින් ඒ සම්බන්ධයෙන් ගත්තොත්, ණය තොගය වැඩි වෙලා තිබෙනවා, බිලියන 900ක්. මේ කථා කරන මොහොතේ අප ආනයනය කරන්න තිබෙන ගණන වැඩි වෙනවා වාගේම, රුපියලේ දෙදරීමක් ඇති වෙලා තිබෙනවා. අපි 2028දී ඇමෙරිකානු ඩොලර් මිලියන 6,500ක් ගෙවන්න පටන් ගන්න අවශ්‍යයි. ඒ ගෙවීමට අපේ Reserves අඩුම ගණනේ ඇමෙරිකානු ඩොලර් මිලියන 14,000ක් තිබිය යුතුයි කියලා ඔබතුමන්ලා පිළිගෙන තිබෙනවා. ඒ සම්බන්ධව බලනකොට අපේ අපනයන ක්ෂේත්‍රය සංවර්ධනය වීම සහ ආයෝජන එකතු වීම තරමක් භයානක තත්ත්වයක තමයි තිබෙන්නේ කියන එක ඔබ සියලු දෙනා පිළිගන්නවා ඇති. ඒ නිසා මේ සම්බන්ධයෙන් මොනවාද කරන්න පුළුවන් වන්නේ? ආයෝජකයෝ වැඩි කරලා අපේ අපනයන ක්ෂේත්‍රය තවත් සංවර්ධනය කරන්න කටයුතු කරන්න. නැත්නම් වෙන්නේ මොකක්ද? කනගාටුයි, කියන්න. පිට රටවල ආයෝජනය තුළින් අපනයන මුදල් අපට ලැබුණේ නැත්නම්, අපේ ණය ගෙවීමට තිබෙන හැකියාව අඩු වෙනවා. ඒ නිසා තමයි අපි මේ ප්‍රශ්නය ඉදිරි දැක්මක් සහිතව අද ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම ඒක අපට තිබෙන වගකීමක් තමයි. අපි අනිවාර්යයෙන්ම සංචිත ගොඩනඟා ගැනීමේ - reserve building - වැඩකටයුත්ත කරනවා. එහිදී ප්‍රමුඛතාව දිය යුතු වෙනවා. අපනයන ප්‍රවර්ධනය කිරීම විවිධාංගීකරණය වෙච්ච strategic framework එක දැනට ඉදිරිපත් කරමින් තිබෙනවා. එහිදී සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛතාව, - දැන් අපට ප්‍රේෂණවලින් ලැබෙන දේ - විශාල හයියක් බවට පත් වෙලා තිබෙනවා. අප උපාය මාර්ගිකව මේ සඳහා මැදිහත් වෙනවා. හැබැයි, දැන් ඩොලරය අවප්‍රමාණය වීමේ කාරණයේ දී එය දෙදරීමක් විධියට අපට ගන්න බැහැ. දෙදරීමක් කියන්නේ අපට පාලනය කර ගන්න බැරි සීමාවෙන් එහාට යාමක්; high volatility එකක්. මේකට high volatility එකක් ඇත්තේ නැහැ. අපි මේ අවුරුද්ද ගත්තොත්, සියයට 5.1ක් වාගේ ප්‍රමාණයක් තිබෙන්නේ. ඇත්තටම අපි ඉන්නේ flexible exchange rate regime එකක. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි. අපි ඒක fix කරලා peg කරලා නැති නිසා අපිට යන්න වෙන්නේ එතැනදීයි. ඇත්තටම මහ බැංකුව සමහර ඒවාට අදාළ උපාය මාර්ග ගන්නවා.

ඒවා මොනවාද කියලා ඒගොල්ලන්ට කියන්න බැරි වෙනවා. මොකද ඒ උපාය මාර්ග කලින් කිව්වොත් market එකේ එන reaction එක - කොහොමද ඒගොල්ලන් reserves build කරන්නේ, release කරන්නේ කියන කාරණය - හෙමින් හෙමින් එළියට යනවා. කෙසේ වෙතත්, මෙය පාලනය වෙමින් තිබෙන තත්ත්වයක්. දෙදරීමක් නොවෙයි, එකවර බිඳවැටීමක්. එවැනි තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. ඒ වාගේම ඒකට සම්බන්ධ වෙනවා, පොලී අනුපාත තත්ත්වය. කෙසේ වෙතත්, ඔබතුමා ඉදිරිපත් කරපු අදහස් සැලකිල්ලට භාජන කරමින් ඒ සංචිත ගොඩනැඟීමේ කාර්යයට අපි මැදිහත් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 79 ඉදිරිපත් කිරීම, කම්කරු අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මැතිතුමා.

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

## සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත: නියෝගය
## கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) சட்டம்: ஒழுங்குவிதி
## SHOP AND OFFICE EMPLOYEES (REGULATION OF EMPLOYMENT AND REMUNERATION) ACT: REGULATION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මා පහත යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(129 අධිකාරය වූ) සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ 66 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් 2025 දෙසැම්බර් 12 දින සාදන ලදුව, 2025.12.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

To start the Debate, the Hon. Mahinda Jayasinghe. You have 13 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mahinda Jayasinghe, you may start your speech.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, what is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

It is about a matter of national importance that has come up at this moment.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, we are already short of time.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I know that. But, this is about a matter of national importance that has come up.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, I will give you a minute.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Okay, one minute.

ඊයේ හැන්දෑවේ 2ත්, 3ත් අතර උඩුදුම්බර භූකම්පනයක් සිදු වෙලා තිබෙනවා. කරුණාකරලා ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න. ඒ වාගේම අද බදුල්ලේ 11.02ට පාසල් වහන්න කියලා දැනුවත් කරලා තිබෙනවා. මඩකලපුව, අම්පාර, බදුල්ල, පොළොන්නරුව ප්‍රදේශවලට cyclone එකක් ඇති වීමේ අවදානමක් තිබෙනවා. ඒ බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් දැනුවත් කරලා තිබෙනවා. අපට ඒ තත්ත්වය දැන ගන්න පුළුවන්ද? නොවැම්බර් 28වැනි දා සිදු වුණු දේ නිසා අපි සූදානමින් සිටිනවාද, නැද්ද කියලා ආණ්ඩුව ප්‍රකාශ කළොත් හොඳයි කියලා හිතනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The matter is over to you, Hon. Deputy Minister of Defence.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළි සුළඟක් දක්වා වර්ධනය වන තත්ත්වයක් කොහෙත්ම නැති බවයි අනාවැකිය පළ වෙන්නේ. දැනට ඒක ත්‍රිකුණාමලය ප්‍රදේශයට ගමන් කරමින් තිබෙනවා කියලා තමයි කියන්නේ. අද හවස වෙනකොට වර්ෂාපතනයක් බලාපොරොත්තු වෙනවා. ඒ අනුව අවදානම් කලාපවලට රතු නිවේදන නිකුත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව රජයක් හැටියටත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හැටියටත් විශේෂයෙන් අපි ක්‍රියාමාර්ගයක් අරගෙන තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mahinda Jayasinghe, you have 13 minutes and your time starts now

[අ.භා. 12.04]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ නියෝග අංක 3 යටතේ මේ සංශෝධනය කරන්න තමයි අද දවසේ අපි යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1954 අංක 19 දරන පනත, එහි නියෝග අංක 3 යටතේ කලින් සඳහන් වුණේ "කිසියම් නේවාසික හෝටලයක අමුත්තන් පිළිගන්නියන්, කාන්තා ඇඳුම් කාමර සේවිකාවන්, කාන්තා රෙදි පිළි ගබඩා සේවිකාවන් හෝ කාන්තා වැසිකිළි සේවිකාවන් වශයෙන් අවුරුදු 18ට එළඹ සිටින කවර ස්ත්‍රියක් වුවද පෙරවරු 6.00ට හෝ පස්වරු 6.00න් පසුව සේවයේ යෙදවිය හැකිය" කියලා. ඒ වෙනුවට අපි අද දවසේ ඒකට එකතු කිරීමක් කරනවා "නේවාසික හෝටල්වල සේවයෙහි යෙදී සිටින ආහාර සහ පාන පිළිගන්වන්නියන් - food and beverage stewardesses - ද මේ විධියට සේවයේ යොදවන්න පුළුවන්" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙවැනි සංශෝධන ගෙනෙන්න හේතුවුණු කාරණාවන් තිබෙනවා. මේ වෙනකොට මුළු ජනගහයෙන් සියයට 51ක් අපේ රටේ කාන්තාවන් ඉන්නවා. නමුත් මේ සියයට 51ක් වෙච්ච මුළු ජනහගනයෙන් සියයට 34ක් වාගේ තමයි -කලින් සියයට 30ක් වාගේ - සේවයේ යෙදිලා, එහෙම නැත්නම් ශ්‍රම බලකාය නියෝජනය කරන්නේ. ඒක නිසා තවදුරටත් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවිය හැකි ලෙස මේ නීති යම් ප්‍රමාණයකට සංශෝධනය කරන්න අපට අවශ්‍ය වෙලා තිබෙනවා.

ඒ අනුව තමයි නේවාසික හෝටල්වල සේවයේ යෙදී සිටින ආහාර පාන පිළිගන්වන්නියන් - food and beverage stewardesses - සඳහාත් මේ පහසුකම ලබා දෙන්න අවශ්‍ය සංශෝධනයක් අද දවසේ එකතු කරන්නේ.

අපි දන්නවා, කාලයක් තිස්සේ එක පැත්තකින් අපේ රටේ ආර්ථිකය ඉතා නරක ලෙස බිඳ වට්ටලා තිබුණු බව. ඒ කාලයේ අපේ රටේ ආර්ථිකය පණ අදිමින් තිබුණේ. හිර වෙලා තිබුණු රට, හිර වෙලා තිබුණු ආර්ථිකය ප්‍රකෘතිමත් කරන්න, නඟාසිටුවන්න ගිය වසරේදී අපි සමත් වුණා. ඒ සංඛ්‍යාලේඛන, දත්ත මම මේ වෙලාවේ ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. මොකද, අපි රටක් ලෙස මේ පාර්ලිමේන්තුව තුළත් ඇති තරම් මේ පිළිබඳව සංවාද කර තිබෙනවා. ආර්ථිකය ඉදිරියට එසවෙද්දී - ගොඩ නැඟෙද්දී - රටක් ලෙස අපි හුස්ම ගනිමින් ඉදිරියට යද්දී අපට අවශ්‍ය වනවා, ඒ සඳහා වූ නීති, අණ පනත් සංශෝධනය කරන්න.

අපේ රටේ හෝටල් කර්මාන්තය අද වේගයෙන් වර්ධනය වෙමින් තිබෙනවා. හෝටල් ක්ෂේත්‍රයට වේගයෙන් ආයෝජකයෝ ඇදී එමින් තිබෙනවා. ඔවුන් හෝටල් ක්ෂේත්‍රයේ ආයෝජනය කරන්න ඉදිරිපත් වෙමින් තිබෙනවා. එවැනි වෙලාවක මෙවැනි සංශෝධනයක් හරහා අපි බලාපොරොත්තු වනවා, සේවිකාවන්ටත් රාත්‍රී සේවයේ යෙදෙන්න අවශ්‍ය පහසුකම් හදන්න. මේ නියෝගය ඇතුළේ ඉතාම පැහැදිලිව සඳහන් වනවා, ඒක එහෙම කළ යුත්තේ කෙසේද කියන එක. ඔවුන්ගේ සුපුරුදු වාසස්ථානය වෙත ප්‍රවාහන පහසුකම් සපයන්න ඕනෑ. එහිදී සවස 6ත්, පෙර වරු 6ත් අතර වෙලාවකදී හදිසියේ -අතරමඟදී- මේ සේවය අවසන් වුණොත්, ඔවුන්ගේ සුපුරුදු නවාතැන දක්වා ප්‍රවාහන පහසුකම් - transport - ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම්, ඔවුන්ට සුදුසු නවාතැන් පහසුකම් - accommodation - ලබා දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව, සුබසාධනය පිළිබඳවත් අදාළ ආයතන වගබලාගත යුතුව තිබෙනවා.

මෙතෙක් කල් අපේ රටේ වැඩ කරන ජනතාව, එහෙම නැත්නම් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවුණා. 2024 වසර තුළ කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දී තිබෙනවා, ආයතන 751කට. ඒක අලුත් දෙයක් නොවෙයි. 2025.09.30වැනි දා දක්වා ආයතන 554කට අනුමැතිය ලබා දී තිබෙනවා, කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා. ඒ වාගේම 2024දී කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමේදී පැමිණිලි 9ක් ලැබිලා තිබෙනවා. එම පැමිණිලි 9ම 2024දීම විසඳා තිබෙනවා. 2025දී පැමිණිලි 2ක් ලැබී තිබෙනවා. එම පැමිණිලි 2ම 2025දීම විසඳා තිබෙනවා. එවැනි තත්ත්වයක් තමයි කාන්තාවන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වැඩ කරන ජනතාවගේ පැත්තෙන් ගත්තාම ආණ්ඩුවක් විධියට අපි ඊයේ දවසේ අපේ රටේ ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කළා. ඒ තමයි, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ Convention No.190 එහෙම නැත්නම්, සම්මුති 190 අපේ රට තුළ අපරානුමත කරන්න කටයුතු කිරීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්මුතිය අපේ රටේ සම්මත වෙලා තිබෙන්නේ 2019 වසරේදීයි. 2019 ජූනි මාසයේ තමයි ILO එකේ මේක සම්මත වෙලා තිබුණේ. හැබැයි, වසර 6ක් ගත වනතුරු මේ සම්මුති 190 අපේ රට තුළ අපරානුමත කරන්න - ratify කරන්න - කටයුතු කර තිබුණේ නැහැ. ඒ අනුව අපි කැබිනට් තීරණයක් අරගෙන C 190, එහෙම නැත්නම්, සම්මුති 190 අපේ රට තුළ අපරානුමත කරන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම ඊයේ දවස තුළ ඒ පිළිබඳ නිල ලේඛන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අපේ රටේ නිත්‍ය නියෝජිත ජොනී සිම්ප්සන් මහත්මිය වෙත ප්‍රදානය කරන්නට අපි කටයුතු කළා. ඒ අනුව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙම සම්මුතිය අපරානුමත කරන ලද දකුණු ආසියාවේ දෙවැනි රට බවට අපේ රට පත් වුණා. මේ දක්වා බංග්ලාදේශය තමයි ඒ කටයුත්ත සිදු කර තිබුණේ. ඊයේ දවසේ අපි ඒ ඓතිහාසික සන්ධිස්ථානයත් සනිටුහන් කරන්න සමත් වුණා.

විශේෂයෙන්ම රැකියා ස්ථානවල සිදු වන සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ හිරිහැර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන අවසන් කිරීම සහ සැමට ගෞරවනීය සේවා පරිසරයක් සෑදීම තමයි C 190හි - Convention No.190හි - මූලික පරමාර්ථය හා මූලික අරමුණ වන්නේ. අන්න ඒ අරමුණ අපේ රට තුළ තහවුරු කරන්න අවශ්‍ය මැදිහත් වීම සිදු කරන්නටත් ඊයේ දවසේ අපි කටයුතු කළා.

ඒ වාගේම මෙවැනි නීති ගෙන එමින් මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ආණ්ඩුවක් ලෙස අපි කටයුතු කරනවාය කියන කාරණයත් මේ වෙලාවේ මම සඳහන් කරන්න ඕනෑ. මේ රටේ ජනතාව පසුගිය මැතිවරණ තුනේදීම අප කෙරෙහි විශ්වාසය තබමින් කටයුතු කළා. අන්න ඒ විශ්වාසය ඒ අයුරින්ම ආරක්ෂා කරමින් ඉදිරියට කටයුතු කරන්න ඕනෑ කරන මැදිහත් වීම සිදු කරන්න අපි කටයුතු කරලා තිබෙනවා.

පසුගිය කාලයේ පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ වැටුප රුපියල් 27,000 දක්වාත්, ඉන් අනතුරුව මේ ජනවාරි සිට එය රුපියල් 30,000 දක්වාත් වැඩි කරන්න අපි කටයුතු කළා. ඒ වාගේම වතු ක්ෂේත්‍රයේ ජනතාවගේ වැටුප් වැඩි කරන්නටත් අපි කටයුතු කළා. අපි මේ හැම කටයුත්තක්ම කරද්දී විශේෂයෙන්ම

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ජාතික කම්කරු උපදේශක සභාවත් රැස් වුණා. අපි බලයට එන්න පෙර අවුරුදු එකහමාරකට වැඩි කාලයක් තිස්සේ එම උපදේශක සභාව කැඳවා තිබුණේ නැහැ. හැබැයි, අපි ආණ්ඩුව ගත්තාට පස්සේ ජාතික කම්කරු උපදේශක සභාව හත් වතාවක් කැඳවා තිබෙනවා. එක පැත්තකින් වෘත්තීය සමිති, අනෙක් පැත්තෙන් හාම්පුතුන්, තවත් පැත්තකින් ආණ්ඩුව කියන මේ ත්‍රෛපාර්ශ්වයම එකතු වෙලා සාකච්ඡා කරමින්, ඉතාම හොඳින් අදහස් හුවමාරු කර ගනිමින්, සමහර අවස්ථාවල අදහස් හා මත ගැටුම් ඉදිරියට ගෙන එමින්, ඉතාම නිවැරදිව මේ කටයුත්ත ඉටු කරමින් ඉදිරියට යමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත යටතේ ගෙන එන නියෝගය අනුමත කරන්න අපි මැදිහත් වෙමු, කටයුතු කරමු කියන යෝජනාව සහ ඉල්ලීම විශේෂයෙන් මා මේ මොහොතේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය සතිය තුළත්, ඒ වාගේම පසුගිය දින කිහිපය තිස්සේත් විවිධ මාතෘකා මේ පාර්ලිමේන්තුව ඇතුළේ සෑහෙනදුරට සාකච්ඡා වෙමින් තිබුණා. අපි දැක්කා, මාධ්‍ය මර්දනය පිළිබඳව අදත් ආණ්ඩුවට විවිධ විධියට ඇඟිල්ල දිගු කරන්න කටයුතු කරමින් ඉන්නවා, ජනමාධ්‍ය ඇමතිවරයාට ඇඟිල්ල දිගු කරන්න කටයුතු කරමින් ඉන්නවා. හැබැයි, අපි එක කාරණයක් කියන්න ඕනෑ. අපට මතකයි, ගරු විපක්ෂ නායකතුමාගේ වේදිකාවේදී ඒ දවස්වල එක් ස්වාමීන් වහන්සේනමක් මාධ්‍ය නාළිකා දෙකක නම් කියමින් -එකක් "නයි" නාළිකාව, අනික"සියල්ලටම උඩින්" ඉන්නවාය කියන නාළිකාව- එම නාළිකා විපක්ෂ නායකතුමාට අපහාස කරනවාය කියලා චෝදනා කළා. හැබැයි අද ඒ නාළිකාම අපට අපහාස කළත්, අපි ඒ අපහාස නම් තඹ සතයකට මායිම් කරන්නේ නැහැ. මොකද, අපි දන්නවා නේ ඔය පැත්තේත් ගොඩක් අය අපට විවිධ අපහාස කරන හැටි. මේ ආණ්ඩුවේ ජනාධිපතිතුමාවත්, අපේ ගරු අගමැතිතුමියවත්, ගරු ඇමතිවරුන්වත්, ගරු මන්ත්‍රීවරුන් කිසිවෙකුවත් ඒ අපහාස නම් තඹ සතයකට මායිම් කරන්නේ නැහැ. හැබැයි වැරදි ප්‍රවෘත්ති කියනවා නම්, වැරදි තොරතුරු සමාජගත කරනවා නම්, රටේ ජනතාව වෙනුවෙන් ඒ පිළිබඳව මාධ්‍ය ආයතනවලට ඇඟිල්ල දිගු කරන්න අපට වගකීමක් තිබෙනවා. ඒක අපි නොබියව කරනවාය කියන කාරණයත් අපි මේ වෙලාවේ සඳහන් කරනවා.

මොකද, "සියල්ලට උඩින්" ඉන්නවාය කියන නාළිකාව පසුගිය දවසක අපේ ගරු අගමැතිතුමිය පිළිබඳව ඉතාම වැරදි සහගත ප්‍රවෘත්තියක් සඳහන් කරනවා මම දැක්කා. මොකක්ද, ඒ ප්‍රවෘත්තිය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "හරිනිගේ මේ තුප්පහි වැඩ පිළිවෙළට එරෙහිව රටේ ජනතාව පෙළගස්වනවා" කියලා අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අනුනායක හිමි කිව්වා කියලා තමයි ඒ ප්‍රවෘත්තියේ සඳහන් කරලා තිබුණේ. මම ඒ ප්‍රවෘත්තිය බැලුවා. ගරු අනුනායක හිමියන් හරිනි සහෝදරිය ගැන එක වචනයක් කියන්නේ නැහැ. කවුද ඒ? අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ අනුනායක අතිපූජ්‍ය වෙඩරුවේ ශ්‍රී උපාලි ස්වාමීන් වහන්සේගේ ප්‍රකාශයක් තමයි වැරදි විධියට අර්ථ කථනය කරලා තිබෙන්නේ. ඒ වාගේම තමයි, සෞඛ්‍ය සම්බන්ධයෙනුත් වැරදි ප්‍රවෘත්ති පළ කළේ. ඇත්තටම ගත්තොත්, මේක මහානායක හාමුදුරුවන්ටත්, බෞද්ධාගමටත් කරපු අපහාසයක්. ඒ නාළිකා එවැනි අපහාස කරනවා. ඉතින්, ඒ වැරදි ප්‍රවෘත්ති හා බොරු ප්‍රචාර පිළිබඳව තමයි අපි අවධානය යොමු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ මහත්වරුන්ට තවත් දෙයක් කියලා දෙන්න කැමැතියි. එතුමන්ලා අද මේ වෙලාවේ සභාවේ සිටියා නම් හොඳයි. මම දැක්කා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් මාධ්‍ය නිදහස ගැන කථා කරනවා. ජනවාරි මාසය කියන්නේ අතිවිශේෂ මාසයක්. 2009 ජනවාරි 8වැනි දා තමයි ලසන්ත වික්‍රමතුංගව ඝාතනය කළේ. ඝාතනය කළා විතරක් නොවෙයි, සාක්ෂිත් හැංගුවා. ඔහුව මරා දැමුවා විතරක් නොවෙයි, සාක්ෂිත් මරා දැමුවා.

ඒ විතරක් නොවෙයි, "සිරස" ආයතනයට 2009 ජනවාරි 06වැනි දා බෝම්බ ගැහුවා. ඒ වාගේම අපට මතකයි, "සිරස" ආයතනයට 2010 මාර්තු 10 ගල් ගැහුවා. ඒ අය තමයි අද මාධ්‍ය නිදහස ගැන පාරම්බාමින් ඉන්නේ. ඒ නිසා අපි ඒගොල්ලන්ට කියන්න ඕනෑකම තිබෙනවා, කවුද මාධ්‍ය නිදහස වළ දැම්මේ, කවුද මේ රටේ මාධ්‍යවේදීන් අමු අමුවේ ඝාතනය කළේ කියලා ඒගොල්ලන්ගේ අතීතය දිහා ආපසු හැරිලා බලන්න කියලා. එහෙම කරපු මහත්වරු අද මාධ්‍ය නිදහස ගැන මහ ලොකුවට උදන් අනමින් සිටිනවා. ඒවා අපි දැක්කා. දැන් ඒ අය රට වටේ ගිහිල්ලා බොරු වපුරනවා. ඒ අයගේ බොරුවලට රැවටෙන අතළොස්සක් තවමත් ගම්වල ඉන්නවා. ඒ පිරිසත් ඉදිරියේදී මේ කාරණය තේරුම් ගනීවි.

ඒ වාගේම පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා ඒ අය බොරු වපුරනවා. නාමල්ලාට, මේ අනෙක් මහත්වරු ඔක්කෝටම අපි කියන්න ඕනෑ, මේ රටේ ජනතාව නැවත ඔයගොල්ලන්ට නම් බලයට එන්න ඉඩ තියන්නේ නැහැ කියන එක. ඔයගොල්ලන් ඒක හොඳට මතක තියා ගන්න. මම හැම දාම කිව්වා වාගේ නැවත බලයට එනවා නම් එන්නේ ජාතික ජන බලවේගයට වඩා නූතනත්වය අත්පත් කර ගත්ත, මීට වඩා දියුණු දේශපාලන බලවේගයක් මිසක් මේ යල් පැන ගිය දේශපාලන බලවේග නොවෙයි කියන කාරණයත් මේ මොහොතේදී මම අවධාරණය කරන්න ඕනෑ.

විශේෂයෙන් අද දවසේ සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත යටතේ වන නියෝගය සම්බන්ධ විවාදයට එක් වෙමින් මට තවත් කරුණු කිහිපයක් අවධාරණය කරන්න තිබෙනවා. මේ අවස්ථාවේදී ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාත් මේ සභාවේ හිටියා නම් හොඳයි. පසුගිය 06වැනි දා ගරු ඔෂානි උමංගා හපුආරච්චි මන්ත්‍රීතුමිය විසින් කම්කරු අමාත්‍යාංශයෙන් ප්‍රශ්නයක් විමසා තිබුණා. මම එයට පිළිතුරු ලබා දුන්නා. ඒ පිළිතුර ලබා දීම පිළිබඳව වැරැදි අර්ථ කථන ලබා දෙමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ පිළිබඳව මට කරුණු පැහැදිලි කරන්න ඉඩ දෙන්න. මම ඒ සම්බන්ධයෙන් අද ලිඛිත ප්‍රකාශයක් කරන්න අවස්ථාව ඉල්ලා සිටියා. නමුත්, මට මූලාසනයෙන් දැනුම් දුන්නේ එය මගේ මේ කථාව තුළ කරන්න කියායි.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ පසුගිය 06වැනි දා ගරු ඔෂානි උමංගා හපුආරච්චි මහත්මිය විසින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නයට සහ ඊට අදාළව ඇසූ අතුරු ප්‍රශ්නවලට මා විසින් පැහැදිලි කිරීමක් ලබා දුන්නා. එහිදී මා සඳහන් කළේ අදාළ අරමුදල් දෙක, අරමුණු දෙකක් සඳහා ස්ථාපනය කර ඇති බවයි. සේවක අර්ධසාධක අරමුදල ස්ථාපනය කර ඇත්තේ එහි සාමාජිකයින්ගේ සමාජ ආරක්ෂණය වෙනුවෙන් බවද මම එහිදී වැඩිදුරටත් පෙන්වා දුන්නා. එහිදී මා සඳහන් කළේ ඇතැම් සාමාජිකයින් සේවයෙන් විශ්‍රාම යාමට පෙර විවිධ අවස්ථාවලදී සිය සේවක අර්ථසාධක අරමුදලින් ප්‍රතිලාභ ලබා ගැනීම හේතුවෙන් විශ්‍රාම යන විට ඔවුන්ගේ සමාජ ආරක්ෂණ අරමුණු ඉටු නොවන බවයි. එහෙම නැතුව වෙන විධියකට ඒක ගන්න එපා, තහනම් කරනවා කියලා මම කොහේදීවත් කිව්වේ නැහැ. වෙලාවක සියයට 30ක් ගන්නවා, ඔවුන් විශ්‍රාම යනකොට

සම්පූර්ණ මුදල එකවර ගන්නවා කියන මෙන්න මේ කරුණු පිළිබඳව සලකා බලා ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලබා දීම පිළිබඳව රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා කියන කාරණය තමයි අපි සඳහන් කළේ. ඒක අපේ අමාත්‍යාංශය තුළ මේ මොහොතේදී සාකච්ඡාවට ගැනෙන කරුණක් බවට පත් වෙලා තිබෙනවා. එම ප්‍රකාශය ඇතැම් මාධ්‍ය විසින් වැරැදි සහගත ලෙස අර්ථ කථනය කර තිබෙනවා දක්නට ලැබුණා. "ලංකාදීප" සහ “Daily Mirror” යන වෙබ් අඩවි ඊට උදාහරණ ලෙස දක්වන්න පුළුවන්. අන්න ඒ ප්‍රවෘත්තිය පදනම් කරගෙන සමාජ මාධ්‍ය තුළ ඒක බෙදා හරිමින් වැඩ කරන ජනතාව තුළ, විශේෂයෙන් EPF එකේ සාමාජිකත්වය දරන ජනතාව තුළ විවිධ වැරැදි මත හදන්න උත්සාහ කරලා තිබුණා. අදාළ මාධ්‍ය වාර්තාවල දක්වා තිබුණේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් විශ්‍රාම යන විට ඔවුන්ට හිමි ප්‍රතිලාභ ගෙවීම වෙනුවට ඔවුන්ට විශ්‍රාම වැටුපක් ගෙවීමට රජය තීරණය කර ඇති බවයි. EPF එක අහෝසි කරලා විශ්‍රාම වැටුපක් ගෙවන්න යනවා කියලා තමයි ඔවුන් ප්‍රවෘත්තියේ සඳහන් කළේ. ඒක සම්පූර්ණයෙන් අසත්‍ය ප්‍රකාශයක්, ප්‍රවෘත්තියක් කියන එක මම මේ මොහොතේදී සඳහන් කරන්නට ඕනෑ.

මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න. ආණ්ඩුවක් විධියට බලයට පත් වීම සඳහා මේ රටේ වැඩ කරන ජනතාව දක්වපු දායකත්වය කිසි ලෙසකින්වත් අපි අවතක්සේරු කරන්නේ නැහැ. ඒ නිසා තමයි රාජ්‍ය සේවකයින්ට අදියර තුනකින් ඉතිහාසයේ දැවැන්තම වැටුප් වැඩිවීමක් ලබා දෙන්න අපි කටයුතු කළේ. වසර ගණනාවක් නොකැඳවා තිබුණු ජාතික කම්කරු උපදේශක සභාව වත්මන් රජය බලයට පත් වීමෙන් අනතුරුව තමයි ආපසු කැඳවන්න කටයුතු කළේ. ඒ වාගේම ගත වූ වසරක කාලය තුළ අපි හත් වතාවක් NLAC එක කැඳවා තිබෙනවා. ඒ වාගේම වතුවල වැඩ කරන ජනතාවගේ වැටුප් වැඩි කිරීම, පෞද්ගලික අංශයේ සේවකයින්ගේ ජාතික අවම වැටුප රුපියල් 30,000 දක්වා ඉහළ දැමීම ජාතික කම්කරු උපදේශක සභා රැස්වීම්වලදී අපි ගත් තීන්දු තීරණ විධියට පෙන්වා දෙන්න පුළුවන්කම තිබෙනවා.

ඊට අමතරව අලුත් කම්කරු පනතක් හදන්න මේ වෙනකොට කම්කරු අමාත්‍යාංශය ලෙස අපි පියවර ගෙන තිබෙනවා. ඒ සඳහා 17දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත් කරලා කටයුතු කරමින් සිටිනවා. සේවක අර්ථසාධක අරමුදල හෝ කම්කරුවන් සම්බන්ධයෙන් ගන්නා තීන්දු තීරණ හැම විටම ජාතික කම්කරු උපදේශක සභාව හරහා සාකච්ඡාවට ලක් කිරීමට අපි නිරන්තරයෙන් කටයුතු කරනවා. ඒකට හොරෙන්, ඒකට පිටින් කිසිවක් කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ සියලු කරුණු ජාතික කම්කරු උපදේශක සභාව තුළ සාකච්ඡා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mahinda Jayasinghe, you have exceeded your time.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අතීතයේ මෙන් සේවක අර්ථසාධක අරමුදලේ අරමුදල් වංචනිකව, අදූරදර්ශී ලෙස හෝ පෞද්ගලික අභිමතාර්ථ වෙනුවෙන් යොදා නොගන්නා බව මේ ආණ්ඩුව පත් කළ ජනතාවට වාගේම විශේෂයෙන්ම සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ටත් අපි අවධාරණය කරනවා. අපි හිතනවා, ඔවුන් ඒක හොඳින් දන්නවා කියලා. ඒ වාගේම, මෙරට කම්කරු ප්‍රජාව සම්බන්ධව ඕනෑම පියවරක් හෝ අවසන් තීරණයක් ගනු ලබන්නේ මෙරට වෘත්තීය සමිති සමඟ වාගේම ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය සමඟ සහ රජයේ පාර්ශ්වවලින් සැදුම්ලත් ජාතික කම්කරු උපදේශක සභාව හරහා පමණක් බවත් අවධාරණය කරමින්, මට අතිරේක කාලයක් ලබා දීම සම්බන්ධව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. S.M. Marikkar. You may speak until the lunch break, which is due at 12.30 p.m.

[අ.භා. 12.22]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ජාතික ජන බලවේගය තමයි හැම දාම බලයේ ඉන්නේ වාගේ කථාවක්. හැබැයි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩෙන් නාගෙන ඉන්නවා කියලා නම් එතුමන්ලා පිළිගන්නේ නැහැ. මම දන්නේ නැහැ, එතුමන්ලාට ඒක තේරෙන්නේ නැද්ද කියලා. ඇත්තවශයෙන්ම මම මේ කාරණයත් කියන්න ඕනෑ. මට වෙලාවකට අගමැතිතුමිය ගැන පව් කියලා හිතෙනවා. මොකද, මට සැකයක් තිබෙනවා, 6 ශ්‍රේණියේ ඉංග්‍රීසි පෙළ පොතට LGBTQ logo එක සහිත link එක දාපු එක පැලවත්තෙන් කරපු වැඩක්ද කියලා. මොකද, එතුමියව බේරා ගන්න ජනතා විමුක්ති පෙරමුණේ කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ අයට අද අමතක වෙලා තිබෙනවා, ඔවුන්ට එදා ලැබුණේ සියයට 3ක ඡන්ද ප්‍රතිශතයක් කියන එක. හරිනි අමරසූරිය මැතිනිය එතුමන්ලාගේ පක්ෂයට ඇවිල්ලා මාලිමාව කියලා පක්ෂයක් හදපු හින්දා තමයි ඔවුන් ජයග්‍රහණය කරලා අද මේ මැති ඇමතිකම් දරන්නේ. අද එතුමියව බේරා ගන්න කවුරුවත් නැහැ. මට එතුමිය ගැන දුකේ බැහැ. ඊයේ ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලා හමු වෙන්න අගමැතිතුමියම යනවා, තමන්ව බේරා ගන්න කියලා. හැබැයි, එතුමිය ගිහිල්ලා කියනවා, මේ link එක තිබුණාට බලන්න කියලා අපි කිව්වේ නැහැ ලු. එහෙනම් ඕනෑ comment එකකට අසැබි link එකක් දාලා ඒක බලන්න කිව්වේ නැහැ කියලා කියන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මාර විහිළුවක් නේ. බලන්න, මේ පොත දිහා. LGBTQ website එකේ තිබෙනවා, ඔවුන්ගේ නිල logo එක. ඒ colour එකම දාලා තමයි හදලා තිබෙන්නේ. ඒ නිසා මේක එතරම් ලෙහෙසියෙන් බැහැර කරන්න පුළුවන් වැඩක් නොවෙයි. මේක, නිකම් මුට්ටිය දාලා බලනවා වාගේ වැඩක්. ගමේ කථාවක් තිබෙනවා, "දැක්කොත් බුවා නොදැක්කොත් එබුවා" කියලා. මේකත් ඒ වාගේ කේස් එකක්ද කියලා තමයි මට සැකය තිබෙන්නේ.

මේකෙන් මතු වන අනෙක් ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? දැන් මේකෙන් වෙලා තිබෙන පාඩුවට, රාජ්‍ය මුදල් නාස්තියට කවුද වග කියන්නේ? ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි, හැම දාම ආණ්ඩුවේ ඉන්නවා කියලා හිතාගෙන වැඩ කරන්න එපා කියලා. ආණ්ඩු මාරු වෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් හිතාගෙන හිටියේ එතුමා හැම දාම ජනාධිපති කියලා. ආණ්ඩු මාරු වෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ බව තේරුම් ගෙන තමන්ට

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පෞද්ගලිකව කර ගන්න ඕනෑ දෙයක් තිබෙනවා නම් ගෙදර ගිහිල්ලා, පැලවත්තට ගිහිල්ලා කර ගන්න. මේ රටේ ශිෂ්ටත්වයට, සභ්‍යත්වයට, සදාචාරයට, සංස්කෘතිකත්වයට ගරු කරන්න වෙනවා. ඒ මොනවා වුණත් මිනිස්සුන්ට බඩගින්නට වැඩිය, ගෙවල්-දොරවල්වලට වැඩිය මේක වටිනවා කියන එක මම මතක් කරලා දෙන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණය, නාස්තිය, වංචාව නැති කරනවාය කියලා ආපු ආණ්ඩුව දැන් ඔන්න වැඩ පටන්ගෙන. දැන් ලංකාවට ගල් අඟුරු ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, ඒවා බාල ගල් අඟුරු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් ඔබතුමාට ඒ ගැන උදාහරණ සහිතව කියන්නම්. මේ ගල් අඟුරු ටෙන්ඩරය දමනකොට මේ ටෙන්ඩරය එක්තරා සමාගමකට ලැබෙන විධියටම තමයි දැම්මේ. ගල් අඟුරු සමාගමේ සභාපතිට ටෙන්ඩර් කමිටුවේ වාඩි වෙන්න බැහැ. හැබැයි, හිටපු සභාපතිවරයා ටෙන්ඩර් කමිටුවේ වාඩි වෙලා ටෙන්ඩරය ඉවර වුණාට පස්සේ අස් වෙලා හෙමින් සීරුවේ මාරු වුණා. දැන් තිබෙන අලුත්ම ක්‍රමය මේක. අලුත්ම ක්‍රමය තමයි, තමන් වැඩේ කරලා වැඩේ වෙනකොට වෙන කෙනෙකුට දීලා මාරු වෙන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ටෙන්ඩර් පත්‍රිකාව අනුව කිලෝ කැලරි 5,900ක ධාරිතාවක් තිබෙන්න ඕනෑ, මේ ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයේ බොයිලේරුව මෙගාවොට් 320ට, එහෙම නැත්නම් 300ට ගේන්න. සාමාන්‍යයෙන් ගල් අඟුරු මෙට්‍රික්ටොන් 107ක් ඕනෑ, පැයකට මෙගාවොට් 300ට ගේන්න. හැබැයි, දැන් අලුතින්ම ජනවාරි මාසයේ දිනක ආපු ගල් අඟුරු නැව් දෙකෙන්ම ගල් අඟුරු මෙට්‍රික් ටොන් 120ක් දමන්න ඕනෑ.

බාල ගල්අඟුරු ගෙන්වීම නිසා ගල්අඟුරු මෙට්‍රික් ටොන් 120ක් දමන්න ඕනෑ, මෙගාවොට් 300ක් නිපදවන්න නම්. මෙන්න, වාර්තාව තිබෙනවා. ටෙන්ඩර් කරද්දී කිලෝ කැලරි 5,900ක් තිබෙනවා කියලා ඔවුන් කිව්වාට, පළමුවෙනි belt එකේ තිබෙන්නේ 5,739යි, දෙවැනි belt එකේ තිබෙන්නේ 5,830යි, තුන්වැනි belt එකේ තිබෙන්නේ 5,689යි, හතරවැනි belt එකේ තිබෙන්නේ 5,760යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක බොයිලේරුවකට පැයකට ගල්අඟුරු මෙට්‍රික් ටොන් 13ක් වැඩියෙන් දමන්න ඕනෑ. එතකොට බොයිලේරු තුනට වැඩිපුර ගල්අඟුරු මෙට්‍රික් ටොන් 39ක් දමන්න ඕනෑ. පැයකට මෙට්‍රික් ටොන් 39 ගණනේ බැලුවාම, පැය 24කට මෙට්‍රික් ටොන් 936ක්. ඒ කියන්නේ පැය 24කට -දවසකට- මෙට්‍රික් ටොන් 936ක් වැඩිපුර දමන්න ඕනෑ. මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 100යි. ඒ කියන්නේ මේ බාල ගල්අඟුරු නිසා දවසකට ඇමෙරිකානු ඩොලර් 93,600ක් රජයේ මුදල් නාස්ති වෙනවා. ඒ අනුව අවුරුද්දකට මෙට්‍රික් ටොන් 341,640ක් සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 10,000කට වැඩි ප්‍රමාණයක් මේ රටේ මහජනතාවගේ බදු මුදල් නාස්ති වෙනවා. නැවකින් එන්නේ ගල්අඟුරු මෙට්‍රික් ටොන් 60,000යි. එතකොට අවුරුද්දකට ගල්අඟුරු මෙට්‍රික් ටොන් 341,640ක් වැඩිපුර දමනවා කියන්නේ දළ වශයෙන් නැව් 6ක්වත් වැඩිපුර ගෙනෙන්න වෙනවා.

මේ කාර්යය සිදු වෙද්දී, තව තව දේවලුත් සිද්ධ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කියන්න නම් විස්තර ගොඩක් තිබෙනවා. නමුත් වේලාව මදි නිසා කියන්න විධියක් නැහැ. මගේ අතේ මේ තිබෙන්නේ Mitra SK South Africa (Pvt.) Limited එකෙන් එවන ලද වාර්තාව. මේ නැව එහෙන් පිටත් වෙනකොට මේ වාර්තාව එන්න ඕනෑ; departure report එක එන්න ඕනෑ. මේ වාර්තාව නැව ලංකාවට එන්න කලින් එන්න ඕනෑ. හැබැයි, මේ report එක එන්නේ, නැව ආවාට පසුව. මේක අතේ ගෙනෙන්නේ. මේක සාමාන්‍යයෙන් එවන්න ඕනෑ, e-mail එකෙන්. නමුත් මේක අතේ ගෙනෙන්නේ. මේවා තිරය පිටුපස සිද්ධ වෙන දේවල්. රුපියල් මිලියන 10,000ක් කියන්නේ, මහ බැංකු බැඳුම්කර මංකොල්ලය වාගේ හොරකමක්; මහ දවාලේ හොරකමක්.

ඒ මදිවාට දැන් මේක සැපයුම්කරුවාගේ වරදක් නම්, ඔහු අතින් වෙලා තිබෙන ප්‍රශ්නයක් නම්, කටයුතු කරන්න ඕනෑ විධියක් තිබෙනවා නේ. හැබැයි මේ ඇමතිවරයා ප්‍රමුඛ අමාත්‍යාංශය ඊයේ නිවේදනයක් නිකුත් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකේ කියනවා, එහෙම බාල එකක් ඇවිල්ලා තිබෙනවා නම් දඩ ගහන්න පුළුවන් ලු. ඒක වැරදියි. නැව් දෙකක් reject වුණොත්, ටෙන්ඩරය cancel කරන්න ඕනෑ. එතකොට spot tender එකකට යන්න වෙනවා. ඒ නිසා, යථාර්ථවාදීව බොයිලේරුවට දමලා test කරලා තිබෙන එක අපට ආරංචියි දැන් 14වැනි දා වෙනකොට report එකක් හදලා මාරු කරන්න හදනවාය කියලා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියනවා, මේ ටෙන්ඩරය යථාර්ථවාදී report එක අනුව ෆේල් නිසා, ඒක ලබා ගැනීම සඳහා බාල quality එකේ බඩු ලබා දීම නිසා මේ ටෙන්ඩරය අහෝසි කළ යුතුයි කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇමතිවරයා සූදානම් වෙනවා නම් නිලධාරීන් බිල්ලට දීලා දඩයක් ගහලා බේරා ගන්න, එහෙම බේරන්න බැහැ. එහෙම නම් මහින්දානන්ද අලුත්ගමගේටත් කැරම් බෝඩ් නඩුවට අදාළව සල්ලි ටිකක් දීලා හිරේ නොගිහින් ඉන්න පුළුවන් නේ. ඒ නිසා, නිසි පරීක්ෂණයක් කරලා මේ හොරකම, මේ වංචාව පිටුපස්සේ ඉන්න උදවිය හරි විධියට හොයා ගන්න ඕනෑ. හැබැයි, හොරාට කලින් කෙහෙල් කැන වැට පැන්නා වාගේ අමාත්‍යාංශයෙන් නිවේදන නිකුත් කරනවා, දඩ ගහන්න පුළුවන් කියලා. ඇත්ත වශයෙන්ම ඔවුන් 14වැනි දා ගෙනෙන්නට නියමිත report එකෙන් clear කරනවා නම් ඇයි, දඩ ගහනවාය කියලා කලින් කියන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, we have to suspend the Sitting for lunch. So, please wind up now.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Just give me one more minute, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු අප්‍රිකානු වරායෙන් ආපු මේ document එක, මේකේ තත්ත්ව වාර්තාව මම **සභාගත*** කරනවා.

ඒ වාගේම මේකෙන් තවත් දෙයක් වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ විධියට ගිහිල්ලා, මේ පෙර සැපයුම්කරුවන් එවා තිබෙන බඩු ඉවර වුණාට පස්සේ නැවත කළුවර යුගයකට දක්කාගෙන යන්නද මේ ඇමතිවරයා කටයුතු කරන්නේ කියලා මම අහන්න කැමැතියි. රජයේ සියලු මන්ත්‍රීතුමන්ලාට මම කියන්න කැමැතියි, මෙන්න මේ කාරණය. ඔබතුමන්ලා මේක ගැන දන්නේ නැහැ. හැබැයි මේ ඇමතිවරයාගේ ක්‍රියා කලාපය නිසා අන්තිමට අමාරුවේ වැටෙන්නේ ඔබතුමන්ලා. බේරා ගන්න යන්න වෙන්නේ ඔබතුමන්ලාට. ඒවාට මුහුණ දෙන්න වෙන්නේ ඔබතුමන්ලාට. ඒ නිසා මහ බැංකු බැඳුම්කර සිද්ධිය හා සමානවම වෙන්න යන,

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

වෙමින් පවතින මේ හොරකම නැවැත්වීම සඳහා කටයුතු කරන්න. විශේෂයෙන්ම මේවා ගෙනැල්ලා තිබෙන්නේ, Ceylon Shipping Corporation එකට අදාළ නැවකින්. ඒකේ තිබෙන වංචා දූෂණ, එහි සභාපතිවරයා කරපු ඒවා ඊළඟ පාර්ලිමේන්තු සභා වාරයේදී documents සහිතව මම එළියට දමන්නම්. ඒ නිසා මේ මන්ත්‍රීතුමන්ලාගෙන් අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ හොරකම නවත්වා ගන්න පුළුවන්. මේ හොරකම නවත්වා ගන්න පුළුවන් එකම ක්‍රමය, මේ රටට වෙන පාඩුව නවත්වා ගන්න පුළුවන් එකම ක්‍රමය මේ ටෙන්ඩරය අහෝසි කරලා, quality assure කරපු ටෙන්ඩරයකට නැවත යන එක. මොකද, අඩු ලංසුවක් තිබුණාය කියලා quality එක බැහැලා තිබෙනවා නම්, මේ වැඩේ කරන්න බැහැ. ඒ නිසා බලශක්ති ඇමතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව මේකට වග කියන්න ඕනෑ. ඒ නිසා වහාම මේ ටෙන්ඩරය අත්හිටුවන්න කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Business of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රුවන් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද විශේෂයෙන් සංචාරක කර්මාන්තයට ඉතාම වැදගත් දවසක්. මොකද, සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන මෙම නියෝගය සංචාරක ක්ෂේත්‍රයටත් ඉතා වැදගත් වනවා. එම නිසා මෙම නියෝගය ගැන අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත සම්මත වන්නේ 1954දීයි. ඉන් අවුරුදු 20කට පසුව, එනම් 1974දී තමයි රාත්‍රි කාලයේ කාන්තාවන් සේවයේ යොදවන්න -විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයට අදාළව- කාමර සේවා සපයන්නියන්, පිළිගැනීමේ නිලධාරිනියන් සහ janitorial service - cleaning කියන අංශ තුන ඇතුළත් වුණේ. අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය ආර්ථික කටයුත්තක් විධියට ආරම්භ කරන්නේ 1966න් පසුවයි. එම කර්මාන්තය 60, 70 දශකවල ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වුණා. එයින් වසර 51කට පසුව තමයි අපි ආහාර පාන සපයන සේවාව - food and beverage service - රාත්‍රි කාලයේ සේවා වැඩ මුරය සඳහා කාන්තාවන්ට විවර කරන්නේ. එම නිසා අද අප සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතට ගෙන එන මෙම නියෝගය සංචාරක කර්මාන්තය අංශයෙන් ගත්තොත් ඉතාම වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක ක්ෂේත්‍රයට අදාළව අපි කාන්තා සේවා නියුක්තියේ තත්ත්වය ගනිමු. ලෝකයේ තත්ත්වය, global average එක ගත්තොත්, සංචාරක කර්මාන්තය ආශ්‍රිතව කාන්තාවන් සියයට 54ක් වැඩ කරනවා. ශ්‍රී ලංකාවේ තත්ත්වය ගත්තොත්, සියයට 10යි. ඒක අතිශයින්ම අවම සේවා නියුක්තියක්. කාන්තාවන්ගේ අවම සහභාගිත්වයක් තිබෙන්නේ අපේ රටේ සංචාරක කර්මාන්තයේයි. ඉන්දියාව ගත්තොත්, සංචාරක ක්ෂේත්‍රයේ කාන්තා සේවා නියුක්තිය සියයට 40ක් වනවා; වියට්නාමය ගත්තොත්, සියයට 79ක් වනවා. තායිලන්තයේ, සියයට 68යි. කාම්බෝජය ගත්තොත්, සියයට 60යි. මෙවැනි සේවා නියුක්තියක් තිබෙන සංචාරක ක්ෂේත්‍රයේ තවත් එක් රැකියා අවස්ථාවක් උදා කර ගන්න අවස්ථාවක් තමයි කාන්තාවන්ට අප අද මේ විවෘත කරන්නේ. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා වාගේ විශේෂයෙන් රාත්‍රි කාලයේ -හැන්දෑවේ 6.00ත් උදේ 6.00ත් අතර- කාන්තාවන් සේවා මුරයේ යෙදවීමට අදාළව යම් යම් Regulations මෙයට එකතු කරලා තිබෙනවා. විශේෂයෙන් එවැනි සේවිකාවක් ඒ කාලය තුළ සේවයේ යොදවනවා නම් ඒ අදාළ සේවිකාවගේ කැමැත්ත ලබා ගත යුතුයි. ඒ වාගේම ඒ කාලය තුළ ඒ අයට නවාතැන් පහසුකම් හෝ ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතුයි. ඒ කොන්දේසිවලට යටත්ව තමයි රාත්‍රි කාලයේ කාන්තාවන් එකී සේවයේ යොදවන්න යෝජනා කරලා තිබෙන්නේ. මා මුලින් සඳහන් කළ සංඛ්‍යා, දත්ත අනුව මම හිතනවා අප අද අරගෙන එන්නේ සංචාරක ක්ෂේත්‍රයේ දියුණුවට, අභිවෘද්ධියට ඉතා වැදගත් නියෝගයක් කියලා. මොකද, ලෝකයේ සියයට 54ක් කාන්තාවන් මෙම ක්ෂේත්‍රයේ වැඩ කරන කොට අපේ රටේ සියයට 10ක් නම් වැඩ කරන්නේ, මම හිතන විධියට ඒක ඉතා අඩු අගයක්.

අපි දන්නවා, tourism පැත්තෙන් ගත්තාම, තායිලන්තය, කාම්බෝජය, මලයාසියාව සහ ඉන්දියාව වාගේ රටවල brand එක ලෝකයේ ඉහළින් තිබෙන බව. කර්මාන්තයක සේවා ගුණාත්මකතාව පවත්වාගෙන යන්න; සේවා විවිධත්වය පවත්වාගෙන යන්න අතිශයින්ම වැදගත් සංවේදී කාරණාවක් වනවා, සේවකයන්ගේ විවිධත්වයත්. එහෙම ගත්තත් ඉතාම වැදගත් නියෝගයක් තමයි අප අද මේ ගෙනැවිත් තිබෙන්නේ, ඉහත කී පනතට. මම හිතනවා අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මෙම නියෝගය සඳහා සහයෝගය දෙයි කියලා.

ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල දරුවෝ විශාල පිරිසක් අවශ්‍ය සුදුසුකම් සපුරාගෙන බලාගෙන ඉන්නවා, මේ කර්මාන්තයට ඇතුළු වෙන්න. ඒ අයට තමන්ගේ වෘත්තියේ තවදුරටත් ඉහළට යන්න අවස්ථා නිර්මාණය වන්නේ, නීති ලිහිල් කරලා මේ වාගේ දේවල් හඳුන්වා දීම තුළයි. මේවාටත් එක්කම තමයි අපේ රජය මේ අවුරුද්ද සඳහා අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවත් එක්ක එකතුව ග්‍රාමීය අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සංචාරක ක්ෂේත්‍රයේ රැකියා සඳහා පුහුණු කරන්න "සත්කාරයේ ශ්‍රම සේනා" කියන ව්‍යාපෘතිය අපි ආරම්භ කළා. දරුවන් 20,000ක් පුහුණු කිරීමේ අරමුණින් අපි එම ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා.

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

අපි මේ වනකොට 1,000ක් පමණ සම්පූර්ණ කර තිබෙනවා. මේ පුහුණුව ලබන දරුවන්ට අත්දැකීම් ලබන්න සහ මේ කර්මාන්තයේ රැකියාවේ නියැළෙන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන තමයි අප අද මෙහිදී ඉදිරිපත් කර තිබෙන්නේ. මා මුලින් කිව්වා වාගේ මෙය සංචාරක ක්ෂේත්‍රයට අදාළව ඉතාම වැදගත් නියෝගයක්.

සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, එය මේ වෙලාවේ මුළු ලෝකයම කථා කරන සහ අවධානය යොමු කර තිබෙන ක්ෂේත්‍රයක් බව අපි දන්නවා. ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය ගත්තොත්, විශේෂයෙන්ම 2025 වර්ෂය තුළ 2,362,521ක් වැනි ඉතිහාසයේ වැඩිම සංචාරකයින්ගේ පැමිණීමේ අගය වාර්තා කරන්න අපට පුළුවන් වුණා. මාසිකව ගත්තත්, දෙසැම්බර් මාසයේ සංචාරකයින් 258,928ක් පැමිණියා. මාසයක් තුළ සංචාරකයින්ගේ පැමිණීමේ ප්‍රමාණය ගත්තත්, මම හිතනවා ශ්‍රී ලංකා ඉතිහාසයේ මාසයක් තුළ පැමිණි වැඩිම සංචාරකයින් ප්‍රමාණය තමයි ඒ වාර්තා වෙන්නේ කියලා. සංචාරකයින්ගේ පැමිණීම සාමාන්‍ය විධියට ගත්තොත්, එය 2024 වර්ෂයට සාපේක්ෂව සියයට 15ක ඉහළ යෑමක්. පසු ගිය අවුරුද්දේ ලෝකයේ සංචාරක ක්ෂේත්‍රය වර්ධනය වුණේ සියයට 3කින්. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ඉහළට ගෙන යන්න, 2026දී එය තවදුරටත් වර්ධනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරමින් ඉන්නවා.

"දිට්වා" සුළි කුණාටුව වෙලාවේ විශේෂයෙන් අපේ ආරක්ෂක අංශ, අපේ රාජ්‍ය සේවය, පොදු මහජනතාව ආදි සියලු දෙනා සහ විදේශ රටවල් එකතු වෙලා නිසි ක්‍රියාමාර්ග අරගෙන, නිසි වෙලාවට ඒ තත්ත්වය කළමනාකරණය කළා. එසේ කරන්න පුළුවන් වුණු නිසා තමයි දෙසැම්බර් මාසයේ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ගෙන්වා ගන්න අපට පුළුවන් වුණේ. අපට එය mismanage වුණා නම්, අප එය හරියට කළමනාකරණය කළේ නැත්නම් මම හිතන විධියට දෙසැම්බර් මාසයේ පැමිණි ඒ වැඩිම සංචාරකයන් පිරිස අපේ රටට පැමිණෙන එකක් නැහැ. විශේෂයෙන් සංචාරකයින් 62,000ක් විතර සිටියා "දිට්වා" සුළි කුණාටුව ඇති වුණු වෙලාවේ. ඒ වෙලාවේ අපට Airport එකේ කටයුතු ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා; ගංවතුර නිසා සේවකයින්ට Airport එකට එන්න බැරි වුණා. ඒ අවස්ථාවේ ගුවන් හමුදාව යොදවා අපි Airport එක operate කළා. ඊට පසුව ගුවන් මඟින් යම් යම් සංචාරකයන් මුදා ගන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන් එදා - 27වැනි දා - රාත්‍රියේ අර වැලිමඩ, සිල්මියාපුර නායයෑම සිද්ධ වනකොට එතැන විදේශීය කාන්තාවන් දෙදෙනෙක් සිටියා. අපේ දියතලාව යුද හමුදා අනුබණ්ඩය පාන්දර පැය 8ක් විතර පා ගමනින් ගිහිල්ලා තමයි ඒගොල්ලන් මුදා ගත්තේ. ඒ වාගේම, රාජ්‍ය සේවය, පොදු මහජනතාව ඇතුළු සියලුදෙනා ඒ ආපදා අවස්ථාවේ මැදිහත් වුණා. ඒ සියලුදෙනාට මම මේ අවස්ථාවේ කෘතවේදී වෙන්න කැමැතියි. විශේෂයෙන්ම අපේ ආගමික ස්ථාන, පන්සල් තමයි ඒගොල්ලන්ට උදවු උපකාර කළේ. කිසිම අනතුරක්, හානියක්, සීරීමක්වත් සිද්ධ වන්නේ නැතිව ඒ සංචාරකයින් 62,000ටම තමන්ගේ රටවලට සුරක්ෂිතව ආපසු යන්න අවශ්‍ය මැදිහත් වීම අපි කළා. ඉතින්, ඒ කටයුත්ත කිරීම වෙනුවෙනුත් මම මේ අවස්ථාවේදී කෘතවේදී වෙනවා.

අවසාන වශයෙන්, අපේ රටේ ආර්ථිකයට දැවැන්ත ශක්තියක් වන සංචාරක කර්මාන්තයේ ප්‍රගමනය වෙනුවෙන් අපි මේ Shop and Office Employees (Regulation of Employment and Remuneration) Act එක යටතේ ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලට සියලු දෙනාගේ සහාය අපේක්ෂා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[1.08 p.m.]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Deputy Chairperson of Committees, before I get onto my speech, I would like to congratulate Professor Nishan Canagarajah, who had been knighted in the 2026 King's New Year Honours. Professor Canagarajah was born in Sri Lanka and is also an alumnus of St. John's College. He is the Vice-Chancellor of the University of Leicester. Therefore, I would like to congratulate him in Parliament.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ මේ මොහොතේ විවාද වනවා සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත යටතේ වන නියෝගයක් පිළිබඳව. විශේෂයෙන්ම වයස අවුරුදු 18ට වැඩි සේවිකාවන් පස්වරු 6.00න් පසුව සහ පෙරවරු 6.00ට පෙර food and beverage - F&B - කටයුතු සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය නීතිමය සංශෝධන හඳුන්වා දීමත් අද මේ නියෝගයේ අන්තර්ගතය වෙලා තිබෙනවා. මට හිතාගන්න බැහැ, නීතියක් නැතිව මෙච්චර කල් ඒ සේවය සිදු වුණේ කොහොමද කියලා. මේ රට තුළ කාන්තාවන්ට රැකියාවල නිරත වීමට වැඩි වැඩියෙන් අවස්ථාව ලැබෙන්න ඕනෑ, කාන්තාවන්ට සම අයිතිවාසිකම් ලැබෙන්න ඕනෑ, පාර්ලිමේන්තුව තුළත්, දේශපාලනය තුළත් එම අවස්ථා ලැබෙන්න ඕනෑ කියන මතයේ ඉන්න පක්ෂයක් වශයෙන් මෙය ඉතාම හොඳ වැඩක් කියලා අපි කියනවා.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ.

දැන් මේ වෙනකොට රට තුළ විශාල කථාබහක් ඇති වෙලා තිබෙනවා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ කරගෙන යන වැඩ කටයුතු පිළිබඳව අපට විශාල විවේචනයක් තිබෙනවා. ඒ සම්බන්ධව පරස්පර විරෝධී, විරුද්ධ අදහස් අපට තිබෙනවා. ග්‍රාමීය මට්ටමින්, curricular එක පැත්තෙන් විශාල විවේචන තිබෙනවා. ඒ වාගේම ඉතිහාසය විෂයයේ අන්තර්ගතය පිළිබඳව අපට විශාල විවේචන තිබෙනවා. අද උදෑසන අපි - ඉලංකෙයි තමිල් අරසු කච්චි මන්ත්‍රීවරු කණ්ඩායම- අගමැතිතුමියව හම්බවෙලා ඒ පිළිබඳව සාකච්ඡා කළා.

හැබැයි, මේ අවස්ථාවේදී අගමැතිතුමියට, කාන්තාවකට විරුද්ධව ඉතා පහත් අන්දමට කරගෙන යන මඩ ගැසීමේ ව්‍යාපාරය අපි තරයේ හෙළා දකිනවා. We stand in solidarity with the Hon. Prime Minister against the vicious attacks on her personal affairs. It is unacceptable, especially being the Prime Minister and also a female politician. Therefore, we condemn those vicious personal attacks, even though we have differences of opinion regarding her agenda on educational reforms. මේ අවස්ථාවේදී මම ඒක කියන්න ඕනෑ. අගමැතිතුමියට මේ දෙන ප්‍රහාර ගැන කිව්වොත්, විපක්ෂයට වඩා ආණ්ඩු පක්ෂය අතුළෙන් අගමැතිතුමියට ප්‍රහාර එල්ල කරන බව යම් යම් අවස්ථාවල අපට පෙනී ගිහින් තිබෙනවා.

මේ අවස්ථාවේදී, I would like to caution her; පරිස්සමින් ඉන්න, අගමැතිතුමියගේ පුටුවට විදින්න බලාගෙන ඉන්න සමහර කට්ටියත් ඔබතුමියට විරුද්ධව මේ campaign එක එළියේ ගෙන යන බව ඔබතුමිය හිතේ තියා ගන්න කියන එකත් මම මේ වෙලාවේදී කියන්න ඕනෑ.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் இன்னும் இரண்டு மிக முக்கியமான விடயங்களை இங்கு சொல்ல வேண்டும். நேற்று முன்தினம் எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தைச் சேர்ந்த சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள் காரமுனை நிலம் சம்பந்தமாகச் சில கருத்துகளைக் கூறியிருந்தார். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, காரமுனை என்பது பூர்வீகமாகத் தமிழர்கள் வாழ்ந்த ஒரு பிரதேசமாகும். இந்தப் பிரதேசத்தில் முஸ்லிம் சகோதரர்கள் வாழ்ந்ததாகவும், அது தொடர்பான சான்றுகள் அழிக்கப்பட்டு இருப்பதாகவும் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள் சொல்லியிருந்தார். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த விடயத்தில் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள அரச அதிகாரிகள்மீது பழிசுமத்துவது மிகவும் பிழையானதொரு விடயமாகும். 2023ஆம் ஆண்டு காரமுனைப் பிரதேசத்தில் பெரும்பான்மை சமூகத்தைச் சேர்ந்தவர்களைக் குடியேற்ற முனைந்தபோது, நானும் எமது கட்சியைச் சேர்ந்த உறுப்பினர்களும் அந்த இடத்தில் நின்று, காணி ஆணையாளரையும் இராணுவ அதிகாரிகளையும் பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த சகோதரர்களையும் விரட்டியடித்தோம். அப்பொழுது, காரமுனையைப் பாதுகாப்பதற்கு ஹிஸ்புல்லாஹ் அவர்கள் வரவில்லை.

மேற்குறித்த விடயம் தொடர்பில் சில அரச அதிகாரிகளுடன் நான் பேசினேன். வாகரை - கோரளைப்பற்று வடக்கு - பிரதேசத்தில் இருந்த சிலர், யுத்தம் காரணமாக இடம்பெயர்ந்து இருக்கிறார்கள். அவர்களுக்கு மாற்றுக் காணிகள் வழங்கப்பட்டு இருக்கின்றன. அவர்கள் அதையும் வைத்துக்கொண்டு, பூர்வீகமாக வாழ்ந்த காணிகளையும் கேட்பது நியாயமில்லையென அந்த அதிகாரிகள் சொல்கிறார்கள். காரமுனை என்பது, தமிழர்களுக்குச் சொந்தமான ஒரு பிரதேசமாகும். தற்பொழுது இந்தச் சபையில் கௌரவ அமைச்சர் அவர்களும் இருக்கிறார். இந்த விடயம் சம்பந்தமாக நாங்கள் மாவட்ட மட்டத்தில் ஆராயாமல், பாராளுமன்றத்தில் சில தீர்வுத் திட்டங்களைக் கொண்டுவந்து அதனை அங்கீகரிக்க முடியாது.

அடுத்து, மட்டக்களப்பு - கொழும்பு புகையிரத சேவை பற்றி சொல்ல வேண்டும். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அரசாங்கங்கள் புதிய புகையிரத சேவைகளை ஆரம்பித்ததை நான் கேள்விப்பட்டு இருக்கின்றேன்; புதிதாக railway trackஐ உருவாக்கியதைக் கேள்விப்பட்டு இருக்கிறேன்; புதிய புகையிரதங்களைக் கொண்டுவந்ததைக் கேள்விப்பட்டு இருக்கின்றேன். ஆனால், இருந்த புகையிரத சேவைகளை இல்லாமல் செய்திருப்பதைக் கேள்விப்படுவது இதுவே முதற் தடவையாகும். அதாவது, மட்டக்களப்பில் இருந்து கொழும்புக்கு இருந்த நான்கு புகையிரத சேவைகளை ஒரு சேவையாகக் குறைத்திருக்கிறார்கள். இந்த வரலாற்றுச் சாதனையைச் செய்த பெருமை தேசிய மக்கள் சக்தி அரசாங்கத்தையே சாரும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, காலை 6.10 மணிக்கு மட்டக்களப்பிலிருந்து ஆரம்பமாகி கொழும்புக்கும் செல்லும் புகையிரத சேவை தற்போது அதிகாலை 5.00 மணிக்கு ஆரம்பமாகின்றது. கொழும்புக்குச் செல்பவர்கள் இந்தப் புகையிரதத்தில் கல்லோயாவுக்குச் சென்று, திருகோணமலையிலிருந்து வரும் புகையிரதத்தில் ஏறி, மீண்டும் பயணிக்க வேண்டிய நிலைமை இருக்கின்றது. அதேபோன்று, கொழும்பிலிருந்து வரும்போதும் கல்லோயா வில் இறங்கி, மீண்டும் இன்னொரு புகையிரதத்தில் பயணிக்க வேண்டிய நிலைமை இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කථාව අවසන් කරනවා, ඔබතුමිය මට තත්පර කීපයක් දෙන්න.

நான் கடந்த அரசாங்கத்துடன் பேசி, 'புலதிசி' என்ற புகையிரத சேவையை மட்டக்களப்புக்குவரை நீடித்திருந்தேன். தற்போது, நீங்கள் இந்தப் புகையிரத சேவையை வெள்ளிக் கிழமைக்கும் ஞாயிற்றுக்கிழமைக்கும் மாத்திரம் மட்டுப்படுத்தி இருக்கின்றீர்கள். அதேபோல, இரவு 8.15 மணிக்கு மட்டக்களப்பிலிருந்து ஆரம்பிக்கப்பட்ட night mail train serviceஐ நீங்கள் முழுமையாக இல்லாமல் செய்திருக்கிறீர்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களுடன் பேசி, மட்டக்களப்பு மாவட்டத்தில் உள்ளூர் விமான சேவையை ஆரம்பிப்பதற்கு முயற்சி எடுக்கும்பொழுது, அங்கிருக்கின்ற புகையிரத சேவைகளை இல்லாமல் செய்து, எங்களுடைய மக்களைக் கஷ்டத்துக்குள் தள்ளுவதென்பது ஏற்றுக்கொள்ள முடியாத விடயமாகும். பாரம் கூடினால் அங்குள்ள புகையிரதப் பாதையில் புகையிரதப் போக்குவரத்துச் செய்ய முடியாதென அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் இதற்குக் காரணம் சொல்லப்பட்டு இருக்கின்றது. ஆனால், இன்றும் oil tank வருகின்றது. இவ்வாறு அபாண்டமான பொய்யைச் சொல்லி, எங்களுடைய மக்களுக்கான புகையிரத சேவைகளை இல்லாமல் செய்வதை நான் வன்மையாகக் கண்டிக்கிறேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.15]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් කථා කළ ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කිව්වා අපේ ආදරණීය අගමැතිතුමියගේ පුටුව ඩැහැ ගන්න ජාතික ජන බලවේගය ඇතුළේ කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හරිනි අමරසූරිය සහෝදරිය කියන්නේ ලාංකීය කාන්තා දේශපාලනයේ වෙනම හැරවුම් ලක්ෂ්‍යයක්. එතුමියගේ ජීවිතය, එතුමියට තිබෙන ඉහළම වටිනාකම්, -එතුමිය විශ්වවිද්‍යාල ආචාර්යවරියක්, එතුමිය හොඳ පවුලකින් පැවත එන තැනැත්තියක්, හොඳට දේපොළ තිබෙන තැනැත්තියක්- කැප කරලා සමාජ ව්‍යාපාරයක දේශපාලන ලකුණක් සලකුණු කළ

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

චරිතයක්. ජාතික ජන බලවේගයේ අපි කාටවත් හරිනි සහෝදරියගේ දේශපාලන පුටුව ඩැහැ ගැනීමට කිසිම වුවමනාවකුත් නැහැ. එහෙම අදහසක්වත් අපි කිසි කෙනෙක් ළඟ නැහැ. එතුමියට අපි ඉතාම වටිනාකමකින්, ඉතාම ගෞරවයෙන් සලකනවා. එතුමිය අපේ කාන්තා දේශපාලනයේ වෙනම හැරවුම් ලක්ෂ්‍යයක් සලකුණු කරන චරිතයක්. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා මතු කළ නිසායි මම මේ කාරණා කිව්වේ.

ඕනෑම සමාජ පරිවර්තනයක, ඕනෑම සමාජ විප්ලවයක බැරෑරුම්ම අංශ දෙක තමයි දේශපාලන සහ ආර්ථික වෙනස්කම්. ඒක ඇතුළේ අධ්‍යාපනය වෘද්ධ සහ මනෝරාජික ලෙස විනාශ කරන්නට ඒ සමාජ බලපෑම් ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා නෙල්සන් මැන්ඩෙලා එක වෙලාවකදී කියනවා, "අධ්‍යාපනය නොවෙයි, ඕනෑම දෙයක් ආරම්භ කරන්න පෙර අපි එහි විචේචනයක් දකිනවා නම්, අපට කවදාවත්ම ඒක කරන්න බැහැ කියලා හිතනවා නම්, අපට ඉතිහාසයේ කිසිවක් වෙනස් කරන්නට බැහැ" කියලා. ජාතික ජන බලවේගයේ අපි, දරුවන්ගේ යහපත් අනාගතය වෙනුවෙන්, යහපත් සමාජ දිශානතිය වෙනුවෙන් ආරම්භ කළ සමාජ ප්‍රතිසංස්කරණවලින් එකක් තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ. ඒක විෂය කාරණා සම්බන්ධ ප්‍රතිසංස්කරණයක්, යටිතල පහසුකම් සම්බන්ධ ප්‍රතිසංස්කරණයක්, මානව සමාජයේ ප්‍රගමනය උදෙසා කරන ප්‍රතිසංස්කරණයක් වෙන්න පුළුවන්. ඒ සියල්ල අපි වෙනස් කරනවා. අපි ඒ කිසිවක් පසෙකට තියන්නේ නැහැ. ඒවා වෙනස් කරලා මිස, මේ ප්‍රතිසංස්කරණ තුළ දියුණු මානව සමාජයක් අත්පත් කරලා දීලා මිස අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නැවත හරවා ගන්නේ නැහැ කියන එක මේ සභාවේදී අපි පසක් කරනවා. ජාතික ජන බලවේගයේ අපි සියලුදෙනා ඒකට සූදානම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මාතෘකාව වශයෙන් තිබෙන්නේ වෙනම කාරණයක්. අපි අද කථා කරන්නේ, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත යටතේ එන නියෝගයක් පිළිබඳවයි. මේ රටේ ආර්ථික ක්‍රියාවලිය තුළ කාන්තාවට භූමිකාවක් නිර්මාණය කර දීම සහ ආර්ථිකයට කාන්තාවගෙන් උපරිම ශ්‍රම දායකත්වයක් ලබා ගැනීම වෙනුවෙන් තමයි, මේ නියෝගය ගෙන එන්නේ. අපේ ගරු අමාත්‍යතුමා ඒ සම්බන්ධයෙන් සැහෙන්න පැහැදිලි කිරීමක් කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ කථාව ඇතුළේ යම් කාරණයක් මතක් කරන්නට තිබෙනවා. මේ නියෝගය සම්මත කර ගන්නට ඉදිරිපත් කරන අතරතුර, ඊයේ අපි ඉතිහාසයේ ලොකු ජයග්‍රහණයක් ලබා ගත්තා. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ - ILO එකේ - 190වැනි සම්මුතිය අපි ඊයේ අපරානුමත කළා සම්මුතිය පිළිගැනීම තුළින්. එම සම්මුතියට අත්සන් කිරීම තුළින් අපේ කම්කරු නීතියේ අඩියක් ඉස්සරහට තියලා තිබෙනවා. ඉතිහාසයේ මෙම සම්මුතිය අපරානුමත කරන ලද දකුණු ආසියාවේ දෙවැනි රට තමයි ශ්‍රී ලංකාව. අපි ඒක අපේ රටේ නීතියක් බවට පරිවර්තනය කර ගන්නවා. ඒ අනුව ඊයේ සිට අපි කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශාල පියවරක් ඉදිරියට තබා තිබෙනවා.

මෙම සම්මුතියේ පොදු හරය ගත්තාම, රැකියා ස්ථානයේ සිදු වන සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්ව, හිරිහැර අවසන් කිරීම හා ගෞරවනීය සේවා පරිසරයක් සහතික කිරීම මෙහි ප්‍රධාන අංගයක්. ඒක ජාත්‍යන්තර සම්මුතියක් විධියට තිබුණාට, අපි ඊයේ තමයි ඊට අදාළ සාධන පත්‍රය අත්සන් කරලා අදාළ නියෝජිතවරයන්ට භාර දුන්නේ. ඒ නිසා අපට මින් ඉදිරියට ඒ කියන සම්මුතියෙන් ආරක්ෂා වන සියලු අයිතිවාසිකම් ලැබෙනවා. ඒ කියන්නේ, ඒ සම්මුතියට අත්සන් කරපු නිසා යහපත්, වඩාත් ඵලදායී වැඩ පරිසරයක් නිර්මාණය කිරීමට අපට අවස්ථාව ලැබෙනවා. ඒ සම්මුතිය සම්මත කරනු ලැබුවේ 2019 අවුරුද්දේ. හැබැයි, 2019 අවුරුද්දේ ඉඳලා 2025 අවුරුද්දේ අපි ඒක බලාත්මක කරනතුරු, ඊයේ ඒක අත්සන් කරලා භාර දෙනතුරු, එවකට හිටපු කිසිම රජයක් හෝ කිසිම මහජන නියෝජිතයෙක් ඒ සම්බන්ධයෙන් කථා කරලා ඒ සම්මුතිය අපරානුමත කරන්න කටයුතු කළේ නැහැ. ඒ නිසා ඒ පැත්තෙන් බැලුවොත් අපි විශාල ජයග්‍රහණයක් ලබා ගන්නවා. මේ සම්මුතියේ "සේවකයා" කියන එක විශාල වශයෙන් අර්ථ නිරූපණය කරලා තිබෙනවා. සේවකයා කියන්නේ කවුද? රාජ්‍ය සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන්, අවිධිමත් අංශයේ සේවකයන්, ස්වේච්ඡා සේවකයන්, රැකියා අපේක්ෂිත සහ රැකියා බලාපොරොත්තුවෙන් සිටින සියලු සේවකයන් මේකට අයිතියි.

ඒ වාගේම, මේ සම්මුතියේ "වැඩබිම" කියන එකත් අර්ථ නිරූපණය කරලා තිබෙනවා. ඒ "වැඩබිම" කියන එක ඉතා පුළුල් පරාසයක් තුළ මේ සම්මුතියේ පැහැදිලි කරලා තිබෙනවා. ඒ අනුව, රාජකාරි ගමනක් බිමනක් වෙන්න පුළුවන්, පුහුණු වැඩසටහනක් වෙන්න පුළුවන්, විවේකය ලබා ගන්නා ස්ථානය වෙන්න පුළුවන්, නිවසේ සිට වැඩ කරනවා පුළුවන්, අන්තර්ජාල සම්බන්ධතා පවත්වන ස්ථානය වෙන්න පුළුවන්, ඒ සියල්ල වැඩ බිම් තමයි. ඒ නිසා "වැඩබිම" කියන එක පුළුල්ව අර්ථ නිරූපණය කරලා තිබෙනවා.

ඒ නිසා මේ සම්මුතිය ඉතා වැදගත් සම්මුතියක්. මේකේ නීතිමය රාමුව ගැන කථා කළොත්, රජය විසින් ශක්තිමත් ප්‍රතිපත්ති හදන්න ඕනෑ. ඒ වාගේම සේවායෝජකයින් විසින් ප්‍රතිපත්ති හදන්න ඕනෑ, නීති නිර්මාණය කරන්න ඕනෑ. ඒ වාගේම මේ තුළ පැමිණිලි කරන්නට යාන්ත්‍රණයක් තිබෙනවා, ප්‍රතිපත්ති සකස් කිරීමට යාන්ත්‍රණයක් තිබෙනවා. කාන්තාවන්ගෙන් වැඩිපුර ලබා ගන්නා ශ්‍රම දායකත්වයට, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ඔවුන්ගෙන් ලබා ගන්නා සේවයට සරිලන ආරක්ෂණයක් ILO Convention No. 190 සම්මත කිරීම තුළින් අපට ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පසුගිය අවුරුද්දේ නීති කෙටුම්පත් විශාල ප්‍රමාණයක් සම්මත කිරීමට අදාළ වූ කටයුතු සිදු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවට භාර දීලා තිබෙනවා. රටේ ආර්ථිකය හොඳ ශක්තිමත් තැනකට ගෙනයන්න කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය සහ ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව අපට ඉදිරියටත් අවශ්‍ය වෙනවා. ජාතික ජන බලවේග ආණ්ඩුව හැටියට අපි මේ රටේ මිනිස්සුන්ට පොරොන්දු වෙලා තිබෙනවා, අපි මේ රට හදන්න අවශ්‍ය නීති සම්පාදනය කරනවා, අවශ්‍ය නැති නීති අයින් කර දමනවා කියලා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපි නොබෝ දිනකින්, අපේ රටේ මිනිස්සුන්ගෙන් සල්ලි ගත්ත, අපේ රටේ මිනිස්සු දුක් මහන්සියෙන් හම්බ කරපු සල්ලි විනාශ කරපු ඉතිහාසයේ එක් තැනක් වෙනස් කරනවා. තව නොබෝ දිනකින් අපි ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සියලු දෙනාගේම විශ්‍රාම වැටුප අහෝසි කරනවා. ඒ සඳහා අපි කටයුතු කරනවා. ඒ වාගේ විශාල සුබසාධන කාර්යයක් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ජාතික ජන බලවේගයේ අපි සියලු දෙනා සූදානමින් සිටිනවා කියන එක මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.22]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මතයක් හදන්න උත්සාහ කරනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනවාට විරුද්ධයි, අධ්‍යාපනය අලුත් ක්‍රමවේදයකට මාරු කරනවාට විරුද්ධයි කියලා. එහෙම එකක් නැහැ. අපිත් දැඩි සේ විශ්වාස කරනවා, මේ රටට ගැළපෙන විධියට අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ කියලා. ඒ වාගේම ලෝක රැකියා වෙළඳ පොළත් නූතනත්වයට ගැළපෙන්න ඕනෑ. හැබැයි, ඒ ගැළපෙන නූතනත්වය හෝ ලෝක රැකියා වෙළෙඳ පොළ වෙන රටකට ගැළපෙන දෙයක් වෙන්න බැහැ. ඒ වාගේම තවත් රටක තිබෙන එකක් cut and paste කරලා මෙහෙට ගෙනාවට හරියන්නෙත් නැහැ. හැබැයි, අද වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් මේකේ වගකීම භාර ගන්නේ කවුද? වගකීම භාරගන්න කෙනෙක් නැහැ. බහුතරයක් කමිටු පත් කරන්නේ විෂය භාර ඇමතිවරයා නේ. ඒ කියන්නේ අග්‍රාමාත්‍යවරිය. තමන් පත් කරපු කමිටුවේ වගකීම භාර ගන්න බැරි නම් එතැනින් එහාට ඒ ගැන කථා කරලා වැඩක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතුමියත් පිළිගන්නවා වැරදීමක් වෙලා තිබෙනවා කියලා. හැබැයි, ඒ කමිටුව පත් කළේ එතුමිය නේ. තමන් පත් කරපු කමිටුවක් තිබෙනවා නම්, යම්කිසි ක්‍රමවේදයකට ඇවිල්ලා තිබෙනවා නම්, ඒක වැරදියි කියලා තමනුත් පිළිගන්නවා නම් එතැනින් එහාට ඒ ගැන කථා කරලා එලක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න. හැබැයි, රටට ගැළපෙන, සංස්කෘතියට ගැළපෙන අධ්‍යාපන ක්‍රමවේදයක් අපේ රටට හඳුන්වා දෙන්න ඕනෑ. අපි නූතනත්වයට යන්න ඕනෑ. ඉතිහාසයේ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ ඉඳලා අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙමින් ඇවිල්ලා තිබෙනවා. කාලයෙන් කාලයට, රටට ගැළපෙන විධියට, අවශ්‍ය විධියට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු වුණා. අන්න එහෙම කරන්න.

ගමේ ගොඩේ මෙන්න මෙහෙම කථාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එක්තරා ගෙදරක වියනක් ගහන්න වැඩට මනුස්සයෙක් ගෙනාවා. වැඩට ආපු මනුස්සයා වියන ගහන්න රෙද්දකුත් අරගෙන තමයි ආවේ. හැබැයි, ඒ මනුස්සයා අරගෙන ආවේ පරණ රෙදි කෑල්ලක්. ඒ නිසා ගෙදර ඉන්න නෝනයි මහත්මයයි කිව්වා, ඕක පරණ රෙදි කෑල්ලක් නිසා පැත්තකින් තියන්න, අපි අලුත් එකක් දෙන්නම් කියලා. ඊට පස්සේ ඒ මනුස්සයා මේක අලුත් රෙද්දක්, මේක හොඳයි කියලා හිතලා තමන්ගේ සරම යටින් අලුත් රෙද්ද ඇඳගෙන පරණ රෙද්ද වියනට ගැහුවා. ගෙදර අයිතිකාරයෝ දෙන්නා ඇවිල්ලා බලපුවාම, දීපු අලුත් රෙද්ද වෙනුවට පරණ රෙද්ද තමයි වියනේ තිබුණේ. ඊට පස්සේ අලුත් රෙද්ද කොහේද තිබෙන්නේ කියලා හොයනකොට වියන ගහන්න ආපු මනුස්සයා සරම යටින් අලුත් රෙද්ද ඇඳගෙන ඉන්නවා දැක්කා. "මේක කොහොමද මෙතැනට ආවේ?" කියලා ඇහුවාම, ඒක තමයි මමත් බැලුවේ, කවුද මට මේක ඇන්දුවේ කියලා ඒ මනුස්සයා අහනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒවාගේ තමයි අපේ අගමැතිතුමියත්, මේ ආණ්ඩුවත්. මේක තමන්ගේ විෂය. හැබැයි, දැන් තමයි මේක print කළේ කවුද කියලා හොයන්නේ. මේක දැම්මේ කවුද? තමන් ම සරම අස්සෙන් අලුත් රෙදි කෑල්ල ඇඳගෙන, මට මේක අන්දපු එකා කවුද කියලා හොයනවා වාගේ මේක වෙනස් කළේ කවුද කියලා දැන් හොයනවා.

කවුද, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ගෙනාවේ, කවුද මේකට link එක දැම්මේ, කවුද මේකට QR codes දැම්මේ කියලා හොයනවා.

දැන් මේ වාගේම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරනවාය කියලා එක්තරා සභාපතිවරයෙක් LGBTQ සම්බන්ධයෙන් ලියුමක් ගැහුවාය කිව්වා. ඒ පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද? අර රෙද්ද ඇඳගෙන රෙද්ද ඇන්දුවේ කවුද කියලා හොයනවා වාගේ න්‍යාය පත්‍රයක් නොවෙයිද ක්‍රියාත්මක වුණේ? ඒ වාගේම තමයි ආපදා කළමනාකරණයට අදාළ රෙගුලාසි ගැසට් කරනකොට ඒකේත් මේ කාරණය සම්බන්ධයෙන් තිබෙනවා; දැන් 6 වසර පොතේත් තිබෙනවා. ඒක අහඹු සිදුවීමක් කියන්න පුළුවන්ද? එක අහඹු සිදුවීමක් වෙන්න පුළුවන්. හැබැයි මේ ආණ්ඩුව යටතේ, අමාත්‍යාංශ තුනක් යටතේ සිදු වන දෙයක් අහඹු සිදුවීමක් කියලා අත පිහදා ගන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා අධ්‍යාපනයට, නූතනත්වයට ගැළපෙන ක්‍රමවේදයකට මේක හඳුන්වා දෙන්න කියලා ආණ්ඩුවට අපි කියනවා. හැබැයි ඒක වෙන්න ඕනෑ අපේ සංස්කෘතියට, මේ රටට ගැළපෙන විධියට. එහෙම නැතුව ජේවීපී එකට හෝ ඔබේ පක්ෂයට ගැළපෙන විධියට නොවෙයි. අමාත්‍යවරියට හෝ අග්‍රාමාත්‍යවරියට හෝ ජනාධිපතිවරයාට හෝ ආණ්ඩුවට ගැළපෙන විධියට නොවෙයි. රටට ගැළපෙන විධියට අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න. ඒකට කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ. හැබැයි ඒ වෙනස් කරන එක ඇතුළේ ළමා මනස දූෂණය කරනවා නම්; පුංචි දරුවාගේ මනස දූෂණය කරන්න ලැහැස්ති වෙනවා නම්, අපි ඒකට ඉඩ තියන්නේ නැහැ කියන එකත් මතක් කරන්න ඕනෑ.

දැන් අද මේ විවාදයෙන් පස්සේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනැල්ලා තිබෙන රෙගුලාසි පිළිබඳ විවාදය පැවැත්වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් ආනයන හා අපනයන ගැන විවාද කරන්න කලින් අර කන්ටේනර් 323ට මොකද වුණේ කියලා අපි අහන්න ඕනෑ. කන්ටේනර් 323 සම්බන්ධයෙන් Parliamentary Select Committee එකක් පත් කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

එම Select Committee එකේ සභාපතිවරයා ආණ්ඩු පක්ෂයේ අධිකරණ ඇමතිවරයා. ඒ Select Committee එකේ ඉන්නවා, පොලීසිය භාර ඇමතිවරයා; වරාය භාර ඇමතිවරයා. ඒක වෙන්නේ නැහැ කියලා අපි කිව්වා. නැහැ, අපි ස්වාධීනව පරීක්ෂණයක් කරනවා, Select Committee එකෙන් හොයලා අපි වාර්තාවක් දෙනවාය කිව්වා. මොකක්ද වුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි?

අද වනතුරු එක දවසකවත් ඒ කාරක සභාව රැස් වෙලා නැහැ. ඒ විශේෂ කාරක සභාව රැස් වන්න නියම කරපු දවසට මොකක්ද කළේ? ඒකට එක දවසක් දැම්මා. නමුත්, එහි සභාපතිවරයා වන අධිකරණය භාර ඇමතිවරයා වෙන දවසක් ඉල්ලා ලියුමක් එව්වා. අද වනතුරු containers 323 වරායෙන් පන්නපු ක්‍රමය හොයාගන්න නැහැ. ඒ සඳහා Select Committee එකක් පත් කරන්න කියලා ඉල්ලුවාම, ආණ්ඩුවට ඕනෑ විධියට ආණ්ඩුවෙන් අටදෙනායි, විපක්ෂයෙන් හතරදෙනායි දාලා ඒක පත් කළා. නමුත්, අද වනතුරු එක දවසක් ඒ කාරක සභාවේ සාමාජිකයින් හම්බ වුණේ නැහැ. එතකොට හිතාගන්න පුළුවන් නේ, හොරකම් අල්ලන්න මේ ආණ්ඩුවට තිබෙන වුවමනාව ගැන.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වරායෙන් පන්නපු containers 323 හොයාගන්න Parliament Select Committee එක දාගන්න බැහැ, මේ ආණ්ඩුවට. කුඩු තිබෙන containers දෙකක් Police Narcotics Bureau එකෙනුයි, Customs එකෙනුයි check කරලා පැන්නුවා කියලා කිව්වා. ඒ containers දෙක පැන්නුවේ කවුද කියලා අපි ඇහුවා, පොලීසිය භාර ඇමතිවරයාගෙන්. අද වනතුරු ඒවා පන්නපු එකාගේ නම කියන්න විධියක් නැහැ. මොකද, ඒ අය අත්අඩංගුවට අරගෙන නැහැ. ඉතින් තව මොකක්ද කථා කරන්න තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආණ්ඩුවෙන් ඉල්ලන්නේ, කරුණාකරලා ඒ containers 323 සම්බන්ධයෙන් හොයන්න Select Committee එක පත් කරන්න කියලා. ආණ්ඩුවට ඕනෑ කෙනෙක් විගණකාධිපතිවරයා බවට පත් කරගන්න වුවමනා වෙලා තිබෙන්නේ මේවා වහගන්නද කියලා සමාජයේ දැන් කතිකාවක් ගොඩනැඟිලා තිබෙනවා. මොකද, ඒ containers 323 සම්බන්ධ වාර්තාවේ තිබෙනවා, මේ පිළිබඳව විගණනයක් කරන්න කියලා. හැබැයි, ආණ්ඩුවට මේ සම්බන්ධව විගණනයක් කරන්න බැහැ. එම නිසා ආණ්ඩුවට ඕනෑ පුද්ගලයා විගණකාධිපතිවරයා බවට පත් වනතුරු මේක කල් දමනවා.

එක පැත්තකින් තමුන්නාන්සේලා මැතිවරණ කාලයේ දීපු පොරොන්දු ඉටු කරන්නේ නැහැ. අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා බලයට ඇවිල්ලා බොරු කියනවා. පසුගිය කාලයේ ගල්අඟුරු සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් මතු වෙලා තිබුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තත්පර 30ක් දෙන්න.

Containers 323 සම්බන්ධයෙන් ඇති වූ ප්‍රශ්නය තවම යට ගහමින් යනවා. කුඩු containers දෙක සම්බන්ධයෙන් ඇති වූ ප්‍රශ්නයත් යට ගහමින් යනවා. Cabs නම් ගේනවා. කුරුණෑගල පස් කපන ඒවා අල්ලන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගම්වල මනුස්සයෙක් wildlife area එකේ වැසිකිළි වළක් කැපුවත් හිරේ. හැබැයි, ඔබතුමන්ලාට සම්බන්ධ අය අක්කර ගණන්, හෙක්ටෙයාර ගණන් පස් කපනවා, මේකෙන් ආපදාවක් වෙන්න පුළුවන් කියලා. මේවාට එරෙහිව ක්‍රියාත්මක වන්න කියන ඉල්ලීමත් කරමින්, අවසාන වශයෙන් අපි තමුන්නාන්සේලාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගාල්ලේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ගියාම ඒ අයව ප්‍රගති සමාලෝචන රැස්වීමට අරගෙන නැහැ. ඒ හින්දා ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්න, විපක්ෂයේ මන්ත්‍රීවරුන්වත් ඒ ප්‍රගති සමාලෝචනවලට ගන්න කියන කාරණය සම්බන්ධයෙන්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා.1.30]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනයේදී විවාදයට ගන්න විෂයට සෘජුවම සම්බන්ධ මාතෘකාවක් නොවුණත්, යම් කිසි වැදගත් දෙයක් පිළිබඳව කරුණු කිපයක් කියන්න තමයි මේ වෙලාවේ මා බලාපොරොත්තු වන්නේ.

පළමුවැනි කරුණ මෙයයි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විශේෂ කාරක සභාවක් පිළිබඳ ඉල්ලීමට අදාළව අද දිනයේදී කථානායකතුමා එතුමාගේ තීන්දුව ලබා දුන්නා. එහි මූලික සාරය බවට පත් වුණේ අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය කියන මේ ආයතන තුන අතර තිබෙන එකඟතාව සහ සීමා පිළිබඳවයි. ඒ මූලධර්මය මත පදනම් වෙලා තමයි ඒ Ruling එක දීලා තිබෙන්නේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදලා තිබෙන්නේත්, ලෝකයේ බොහෝ ව්‍යවස්ථා හදලා තිබෙන්නේත් ඔය කියන ආයතන තුන එකට පවතින්නත් ඕනෑ, එක විටම වෙන්ව පවතින්නත් ඕනෑ කියන පදනම මතයි. මම ඒ Ruling එක පිළිබඳව මේ වෙලාවේ නීතිමය වශයෙන් වාද විවාද කරන්න යන්නේ නැහැ. හැබැයි ඒක අධ්‍යයනය කරන්න වටිනා වාර්තාවක්. නමුත්, එවැනි කාරක සභාවක් අවශ්‍ය වන දේශපාලන පසුබිම, විෂය මූලික පසුබිම ගැන මේ රටේ ජනතාවට යම්කිසි කරුණු-කාරණා ප්‍රමාණයක් කියන්න ඕනෑය කියලා මා හිතුවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා මේ වනකොට මාස 13යි වෙන්නේ කියලා. අධිකරණ ක්ෂේත්‍රය තුළට පත් වෙලා ඉන්න අති බහුතරයක් ඉන්නේ පසුගිය කාලයේදී අධිකරණ සේවයට ආපු අය. ඒ වාගේම අධිකරණ ක්ෂේත්‍රය තුළ අති විශාල ප්‍රතිසංස්කරණ ප්‍රමාණයක් කරන්න අපට තවම කාලය ලැබිලා නැහැ කියන එකත් මේ රටේ ජනතාව දන්නා සැබෑ කරුණක්. ඒක නිකම් අදහසක් නොවෙයි. අපි දන්න දේ තමයි, රටක් පාලනය කරනකොට විවිධ හේතු මත, ඉතාම නරකම නරක දේශපාලන වුවමනා මත වාගේම ඉතාම ප්‍රායෝගික හේතු මතත් යම්කිසි ප්‍රතිවිරුද්ධතාවක්, යම්කිසි ඝට්ටනයක් ඇති වන්නේ සාමාන්‍යයෙන් ආණ්ඩුව සහ අධිකරණය අතරයි කියන එක.

ආණ්ඩුවත් එක්ක තමයි අධිකරණයට ප්‍රශ්න එන්නේ. අධිකරණය ස්වාධීනව සහ පිළිගත් සුදුසුකම් සහිත පුද්ගලයින්ගෙන් නම් පත් වෙලා තිබෙන්නේ, එහෙම තමයි ගැටුම එන්නේ. ඒ නිසා ආණ්ඩුව සහ අධිකරණය අතර තමයි ගැටුම තිබෙන්නේ. අපි දැක්කා, 2013දී ශිරාණි බණ්ඩාරනායක මැතිනිය ඉවත් කළේත් ආණ්ඩුවෙන් බව. අධිකරණය සහ ආණ්ඩුව අතරයි ප්‍රශ්නය තිබුණේ. ඊට කලින් අපි අසා තිබෙනවා, නමුත් දැකලා නැහැ, නෙවිල් සමරකෝන් කියලා අග්‍රවිනිශ්චයකාරතුමෙක් සම්බන්ධවත් ඒ විධියටම කටයුතු කරන්න උත්සාහ කළ බව. ආණ්ඩුවට එතුමා එක්ක ප්‍රශ්න තිබුණා.

හැබැයි, වර්තමානයේ සිදුවන මෙම කටයුත්ත ඉතාම දුර්ලභයි කියලා මම හිතනවා. මෙවර අධිකරණයේ කටයුතු ප්‍රශ්න කරන්න ඕනෑය කියන එක විපක්ෂයකින් එන එකක්. එවැනි අවස්ථා ඉතාම අඩුයි. ලෝකයේ කොහේ හරි වෙලා ඇති. ලංකාවේත් ඉඳලා

හිටලා සිද්ධ වෙලා තිබෙන්න පුළුවන්. ඒ ගැන මම දන්නේ නැහැ. හැබැයි, සාමාන්‍ය දේශපාලන මූලධර්මයක් විධියට රට පාලනය කරගෙන යද්දී මේ ආයතන තුන තුළ සමගිය වාගේම යම් යම් grudge ද තිබෙනවා. දින 52 කුමන්ත්‍රණයේදී - මංකොල්ලයේදී - වුණත් අපි ඒක දැක්කා. එතැනදීත් අධිකරණය සහ පවතින ආණ්ඩුව අතර තමයි යම් ප්‍රමාණයකට ගැටුම තිබුණේ. ඒ වාගේම ඒකට පාර්ලිමේන්තුවත් සම්බන්ධයි. අපි දැක්කා, ඒ වෙලාවේ විධායකය විසින් අධිකරණය යොදාගන්න, පාර්ලිමේන්තුව යටපත් කරන්න හදනවා. නමුත්, අධිකරණය ස්වාධීන වෙලා තිබිච්ච නිසා දින 52 කුමන්ත්‍රණය අහෝසි වනවා. එහෙම තමයි ඒක වුණේ. ඒ නිසා මේ ආයතන තුන එකටත් වැඩ කරනවා; ස්වාධීනවත් වැඩ කරනවා. ඒ, අපට මතක ඉතිහාසය.

මම ඒකයි කිව්වේ, සාමාන්‍යයෙන් ආණ්ඩුව සහ අධිකරණය අතර තමයි ගැටුම එන්නේ කියලා. හැබැයි, මෙතැන තිබෙන දේ තමයි, විශේෂ කාරක සභාව යෝජනා කරන්නේ විපක්ෂයෙන්. එතකොට මේකේ පුදුමයක් තිබෙනවා. ඒ පුදුමය වෙන්න පුළුවන් හේතු 2ක් තිබෙනවා. එක්කෝ, අධිකරණය අන්ත දූෂිත, කිසිම සුදුසුකමක් නැති, දේශපාලන තක්කඩියන්ගෙන් පිරිච්ච අධිකරණයක් නම් -ලෝකයේ සමහර රටවල තිබුණා වාගේ; සමහර විට තවමත් ඇති- විපක්ෂයට කියන්න පුළුවන්, මේ අධිකරණය කටයුතු කරන්නේ පවතින ආණ්ඩුවට ඕනෑ විධියටයි කියලා. අපේ රටේ අධිකරණය ඒ මට්ටමට වැටිලා කියලා අපි කවුරුවත් කියන්නේ නැහැ. අපට එහෙම කියන්න කිසිම සාධකයකුත් නැහැ. එම නිසා දැන් එහෙම එකක් නැහැ. පොඩි පොඩි අඩුපාඩුකම් ඇති. මනුෂ්‍යයෝ වැඩ කරන තැනක අඩුපාඩුකම් සිදුවනවා ඇති. අධිකරණය දේශපාලන අධිකාරියෙන් කළමනාකරණය වනවා කියන බරපතළ චෝදනාව අපේ අධිකරණයට වර්තමානයේ එල්ල වන්නේ නැහැ. එහෙම තිබිච්ච යුග තිබෙනවා. ඒවා බේරාගන්නත් එක්ක තමයි Constitutional Council වාගේ ඒවා හදන්නේ. අතීතයේ තිබිච්ච ගැටලු නිසා තමයි ව්‍යවස්ථාදායක සභාව හදන්නේ, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, ඊටපස්සේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - ඊට පසුව මේ ආසන්න භාගයේ.

එතකොට අපි බලන්න ඕනෑකම තිබෙන්නේ, ඇයි මේ අධිකරණ සේවා කොමිසම කරන කටයුතුවලට, අධිකරණයේ විනිශ්චයකරුවන්ගේ දේවල්වලට ඉතාම ගැඹුරෙන් මැදිහත් වෙලා -මතු පිටින් නොවෙයි- ඒ හැම දෙයක් ගැනම හොයන්නේ ඇයි කියලායි. මොකද, විශේෂ කාරක සභාවකට endless powers වාගේ තිබෙන්නේ. ඕනෑ කෙනෙක් කැඳවන්න පුළුවන්. ඕනෑ දෙයක් පිළිබඳව ප්‍රශ්න කරන්න පුළුවන්. හිරේ දමන්න බැහැ. නමුත්, ඕනෑ දෙයක් ගැන ප්‍රශ්න කරන්න පුළුවන්. ඒවා, විශාල බලතල තිබෙන කාරක සභා. එහෙම එකක් විපක්ෂයේ සමහරු යෝජනා කරන්නේ ඇයි? අධිකරණය දූෂිත නොවෙයි නම්, වෙන්න පුළුවන් අනෙක් හේතුව මොකක්ද?

අද මේ විපක්ෂයේ ඉන්න අයගෙන් වැඩිපුර ප්‍රමාණයක් පසුගිය අවුරුදු 20ක්, 30ක්, 40ක් තිස්සේම ආණ්ඩු පක්ෂයේ හිටපු අය. ඒගොල්ලන් තවම ඉන්නේත් ආණ්ඩු මානසිකත්වයෙන්. ඒගොල්ලන්ට තවම දිරවාගන්න බැහැ, මේ මොකක්ද වුණේ කියලා. ඔය ඉන්නේ අන්ද මන්ද වෙලා. අපටත් හිටපු ගමන්, "ඇමතිතුමා" කියලා කියවෙනවා නේ. මොකද, අප කුඩා කාලයේ ඉඳන්ම දැකලා තිබෙන්නේ ඒගොල්ලන්. අපටත් සමහර වෙලාවට පොඩි පොඩි පටලැවිලි වෙනවා. ඒගොල්ලන්ට ඒක තදට දැනෙනවා; තදට වේදනාව තිබෙනවා. ඒ නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? පසුගිය වසර 20ක, 25ක කාලය තුළදී මේ රට තුළ දේශපාලන අපරාධ, මූල්‍ය අපරාධ අතිවිශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් ඉතිරිව තිබෙනවා. නමුත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දැනුම් දී තිබෙනවා, ඔබතුමාට අවශ්‍ය කාලය ලබා ගන්න පුළුවන් කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මාධ්‍යවේදීන්ගේ ඝාතන ගත්තොත්, ලසන්ත වික්‍රමතුංග ඝාතනය තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙනවා. ඒ, අවුරුදු 17කට කලින් වෙච්ච එකක්. "සිරස" නාළිකාවට ගහපු එක පිළිබඳවත් පරීක්ෂණ පැවැත්වෙනවා. ඒකත් අවුරුදු 17ක් පරණයි. පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණත් පැවැත්වෙනවා. ඒක අවුරුදු 7ක් පරණයි. තාජුඩීන් ඝාතනය සම්බන්ධ පරීක්ෂණත් පැවැත්වෙනවා. ඒත් අවුරුදු 14ක්, 15ක් පරණයි. මීට විනාඩි 10කට පමණ කලින් කරපු කථාවකදී මට ඒ වෙඩි සුවඳ දැනුණා. ඝාතකයාගේ ඒ වෙඩි සුවඳ මට දැණුනා. දැන් ඒ වාගේ පරීක්ෂණ ගොඩක් පැවැත්වෙනවා. මහ බැංකු මංකොල්ලය සම්බන්ධව, පාස්කු ප්‍රහාරය සම්බන්ධව ආදී පරීක්ෂණ ගොඩක් දැන් පැවැත්වෙනවා. ඊට අමතරව වෙච්ච සිවිල් අපරාධ පිළිබඳවත් පරීක්ෂණ තිබෙනවා. සිවිල් පැත්තෙන් වෙච්ච ඒවාත් තිබෙනවා, දූෂණ, වංචා පිළිබඳවත් තිබෙනවා.

දැන් අධිකරණය මොකක්ද කරමින් ඉන්නේ? දැන් අධිකරණය කරන්නේ මෙන්න මේ පිළිබඳව පරීක්ෂණ කරගෙන යන එකයි. එතකොට දැන් මේ පරීක්ෂණවලට ලක් වෙන්නේ කවුද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේ පරීක්ෂණවලට ලක් වෙන්නේ මීට අවුරුද්දකට කලින්, පසුගිය අවුරුදු 20, 25 තුළ මේ රට පාලනය කරපු දේශපාලන නායකයෝ, සමහර නිලධාරීන්, ජනාධිපතිවරු, අගමැතිවරු, කැබිනට් ඇමතිවරු, මන්ත්‍රීවරු. ඒගොල්ලන් තමයි මේ පරීක්ෂණවලට ලක් වෙන්නේ. මේගොල්ලන් පසුගිය කාලයේ කළේ මොකක්ද? විපක්ෂය විසින් අධිකරණය කොටු කරන්න, අධිකරණ විනිශ්චයකාරවරු පාර්ලිමේන්තුවට ගෙනැල්ලා එක එක ඒවා ගැන ප්‍රශ්න කරන්න, හැල්ලු කරන්න, භය කරන්න හදනවා. මොකද, අපට අත්දැකීමක් තිබෙනවා නේ, අපේ රටේ හිටපු අග්‍ර විනිශ්චයකාරතුමියකට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරලා, ඔය දැන් කථා කරලා ගියපු කට්ටිය කටයුතු කළේ කොහොමද කියලා. ලජ්ජයි. කොහොමද එහෙම කථා කරන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. මම ඒ ගැන කියන්න මගේ කාලය නාස්ති කරන්නේ නැහැ. දැන් මෙහි තිබෙන එකම අරමුණ මොකක්ද? තමන්ට නඩු වැටිලා තිබෙනවා. ඒ නිසා තමන්ගේ නඩු ටික බේරා ගන්න ඕනෑ. එම නිසා ඒ නඩු ටික බේරා ගන්න එක එක ක්‍රම හොයනවා.

පසුගිය කාලයේ මේ කණ්ඩායම් ඔක්කෝම එකතු වෙලා මොකක්ද කළේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සම්පූර්ණයෙන්ම මේ අපරාධමය පරීක්ෂණ කරන්න තිබෙන ආයතන ඔක්කෝම පරීක්ෂණ යට ගැසීම සඳහා පාවිච්චි කළා. ඒ සඳහා ශ්‍රී ලංකා පොලීසිය අමු අමුවේ යොදා ගත්තා. එහි එක සංකේතයක් විතරයි, ඔය දේශබන්දු තෙන්නකෝන් කියන්නේ. මේ සමස්ත අපරාධ යට ගහන්න, සාක්ෂිකරුවන් හංගන්න, සාක්ෂි විනාශ කරන්න, පොත්වල පිටු ඉරන්න, නඩු සහමුලින්ම පාවිච්චි කළේ අපරාධකරුවා ආරක්ෂා කරමින් අපරාධය යට ගහන්නයි. ඒක නිශ්චිත කරුණක්. ඒවා නිකම්, "ආ, කොහොමද?" කියන්න

[ගරු බිමල් රත්නායක මහතා]

කියලා කියන්න බැහැ. පාර්ලිමේන්තුවම එකතු වෙලා දේශබන්දු අයින් කළේ ඒ නිසා. ඒ වාගේම හිටපු පොලිස්පතිතුමා ලියලා කිව්වා, OICලා 184න්, 182ක්ම එහෙම තමයි මේගොල්ලන් දේශපාලන විධියට පත් කළේ කියලා. ඒ විතරක් නොවෙයි, ඔබතුමිය දන්නවා, පාස්කු ප්‍රහාරය ගත්තොත්, ගෝඨාභය රාජපක්ෂලා දිනපු ගමන්ම මොකක්ද කළේ කියන එක. පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ කරපු බොහෝ නිලධාරින් මාරු කළා. සමහරු හිරේත් දැම්මා. ඉතින්, පරීක්ෂණ යට ගැසීම වෙනුවෙන් තමයි පරීක්ෂණ ආයතන ඔක්කෝම කටයුතු කළේ. ඒ වාගේම අධිකරණයටත් යම් යම් බලපෑම් කළා. එහි ඉතා නරකම සංකේතය තමයි, ශිරානි බණ්ඩාරනායක හිටපු අග්‍ර විනිශ්චයකාරතුමියට කරපු දේ. එතුමියට ඒ කරපු දෙයින් අනික් අධිකරණ විනිශ්චයකාරවරුන්ටත් දුන්නු signal එක තමයි, ඔයගොල්ලනුත් මේක ගැන හිතන්න කියන එක.

මට මතකයි, 2015-2019 ආණ්ඩුව ඇවිල්ලා, අධිකරණයේ යම් ප්‍රමාණයකට වැඩ පටන් ගත්ත බව. පැමිණිලි දැම්මා; අපිත් දැම්මා. යම්කිසි ප්‍රමාණයකට ඒ mandate එකේ තිබුණා, අවුරුදු ගාණක් හොරකම් කරපු අයට විරුද්ධව දඬුවම් කරන්න ඕනෑ කියලා. හැබැයි, ඒත් පටන් ගන්නකොටම මහ බැංකුව කඩලා ඉවරයි, රනිල් වික්‍රමසිංහලා ඇතුළු කණ්ඩායම. නමුත්, ඒ වේලාවේදී රජයේ නිලධාරින්, අධිකරණ නිලධාරින් සහ පොලිස් නිලධාරින් යම් ප්‍රමාණයකට පරීක්ෂණ පටන් ගත්තා. ඒ පරීක්ෂණ කරගෙන යනකොට Hyde Park එකේ තිබුණා, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ රැස්වීමක්. මට මතක නැහැ, ඒ මොන අවුරුද්දේදී කියලා. ඒ වාගේම මට මතක නැහැ, ඒ රැස්වීමට කීයක් ආවාද කියලා. සාමාන්‍යයෙන් Hyde Park එකට දාන්න පුළුවන් කොපමණ ප්‍රමාණයක්ද කියන එක ගැන මනෝ මන්ත්‍රීතුමා වාගේම මමත් දන්නවා. තුන් හාරදහසක් ඉන්න ඇති. ඒ රැස්වීමේදී රාජපක්ෂ මොකක්ද කිව්වේ? මට තාම මතකයි, එතුමා කිව්ව දේ. උසාවිය බලා ගන්න කිව්වා, මේ සෙනඟ ගැන; මේ සෙනඟ දිහා උසාවිය බලන්න කිව්වා. මට ඒ ගැන හොඳට මතකයි. මොකක්ද, ඒ දෙන message එක? අපි ආණ්ඩුව ගන්නවා, නඩු තීන්දු දෙනකොට බලා ගන්න කියන එක තමයි ඒ කියන්නේ. ඒ නිසා දැන් අධිකරණය බිත්තියට හේත්තු කරන්න මේ වුවමනාව කාටද ඇවිල්ලා තිබෙන්නේ? මේ වුවමනාව ඇවිල්ලා තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි. දැන් අධිකරණය, පොලීසිය, පරීක්ෂණ ආයතන කටයුතු කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ, මොනවා ගැනද? මේ ඇත්ත අපරාධකරුවන්ට විරුද්ධව, මහජන මුදල් නාස්ති කරපු අයට විරුද්ධව සහ මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ ඇලෝසියස්ගෙන් සල්ලි ගත්ත අයට විරුද්ධව. ඒ නිසා කරන්න තිබෙන එක දෙයක් තමයි, ආණ්ඩුව වට්ටන එක. ඒක කරන්න බැහැ නේ. ඒක කරන්න ලොවෙත් බැහැ. එහෙම කරන්න පුළුවන්, මුහුදට ගිය කකුළුවෝ ටික ඡන්දය දුන්නොත් තමයි; මුහුදට ගිය කකුළුවෝ ටික ඇවිල්ලා, ඡන්දය දුන්නොත් පුළුවන්. හැබැයි, මිනිස්සු ඡන්දය දෙන්නේ නැහැ. ඒ නිසා දැන් වෙලා තිබෙන දේ මේකයි. ඒගොල්ලන් විතරක් නොවෙයි, විපක්ෂය පැත්තෙත් ඒ දූෂණවලට සම්බන්ධ පිරිසක් ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩුවට මඩ ගහලා බැරි නිසාත්, පරීක්ෂණ ආයතනවලට මඩ ගහලා බැරි නිසාත් දැන් ඒගොල්ලන් උත්සාහ කරනවා, අධිකරණයට බලපෑම් කරන්න. මොකද, අවසාන තීන්දුව එන්නේ අධිකරණයෙන් නේ. දැන් අධිකරණය සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් කවුද ගෙනාවේ?

මේ විශේෂ කාරක සභාව ගෙනාවේ පැහැදිලිව මේ දූෂිතයින් ආරක්ෂා කර ගැනීමේ වුවමනාවට මිසක් වෙන දෙයකට නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඔබතුමියට කියන්න කැමතියි, රාජපක්ෂලා ඇවිල්ලා ව්‍යවස්ථාදායක සභාවට මොකක්ද කළේ කියන එක. ව්‍යවස්ථාදායක සභාවත් අහෝසි කළා. එහෙම තමයි රාජපක්ෂලා වැඩ කළේ. අද රාජපක්ෂලාට යටින්, උඩින්, දවල් - රෑ නැතුව කඩේ යන කට්ටියක් විපක්ෂය පැත්තේ ඉන්නවා. එහෙම තමයි ඒගොල්ලන් කටයුතු කළේ. බොහොම අමාරුවෙන් තමයි නැවත ව්‍යවස්ථාදායක සභාව හදා ගත්තේ.

දැන් මට කිව්වා, විගණකාධිපති කෙනෙක් ගැන. විගණකාධිපති පත් කර ගන්න බැරි අපි නිසා නොවෙයි. ජනාධිපතිතුමා විගණකාධිපති තනතුරට යෝජනා හතරක් එව්වා. ඒ යෝජනා හතරම ප්‍රතික්ෂේප කළා. ප්‍රතික්ෂේප කරන්න අයිතිය තිබෙන එක වෙනම එකක්. නමුත්, ව්‍යවස්ථාදායක සභාවට තිබෙනවා, විධායකයේ වගකීමක්. ඒක පාර්ලිමේන්තුවේ එකක් නොවෙයි. ජනාධිපතිතුමාට දීලා තිබෙන බලතලවලින් කොටසක් තමයි, ව්‍යවස්ථාදායක සභාවට දීලා තිබෙන්නේ. රටට විගණකාධිපතිවරයෙක් නැහැ, ඒ නිසා සල්ලි එවන්න එපා කියාත් සමහරු කියනවා. විගණකාධිපති කෙනෙක් නැති කළේ වෙන කවුරුවත් නොවෙයි, විගණකාධිපතිවරු හතරදෙනෙකුට විරුද්ධව ඡන්දය දීපු කට්ටිය. ජනාධිපතිතුමාට කියන්නේ ජනාධිපති ඒ හතර දෙනාට ඕනෑ විධියට පත් කරන්න කියලාද? එහෙම බැහැ. හතරදෙනෙකුගේ නම් එවලා තිබෙනවා. ඒ හතරදෙනාගෙන්, තුන්දෙනෙක් රජයේ නිලධාරින්. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පළමුවැනියා, දෙවැනියා ඉන්නවා. මම ඒකයි කියන්නේ ව්‍යවස්ථාදායක සභාව අහෝසි කරපු කට්ටිය සහ දැන් ව්‍යවස්ථාදායක සභාව තමන්ට ඕනෑ විධියට කළමනාකරණය කර ගන්න උත්සාහ කරන කට්ටිය ඉන්නවාය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. මෙතැන අද වෙලා තිබෙන දේ සහ අනුර බණ්ඩාරනායක මැතිතුමා ඉදිරිපත් කළ Ruling එකේයි කිසිදු වෙනසක් නැහැ. මම මේ ගැන අහගෙන හිටපු කෙනෙක්. මම මේ Ruling එක දැනුත් බැලුවා. මේ Ruling එකේ මොකක්ද තිබෙන්නේ? අනුර බණ්ඩාරනායක මැතිතුමා කථානායකවරයා වශයෙන් සිටියදී ඉදිරිපත් කළ Ruling එක මම මේ අවස්ථාවේදී **table*** කරනවා.

අනුර බණ්ඩාරනායක මැතිතුමා මෙතැනදී ඉතා විශිෂ්ට තීන්දුවක් ලබා දුන්නා. ඒ, එතුමා තනියම ලියලා නොවෙයි. මම කියන්නේ, ලංකාවේ කථානායක කෙනෙකුට තනියම ලියන්න පුළුවන් වුණත් එහෙම ලියන්න හොඳ නැහැ කියායි. මේවා මුළු රටකට අදාළ තීන්දු. අපි කැමතියි, මේ වාගේ දැනුමක් තිබෙන තීරණ ලැබෙනවාට. නමුත්, අද ඒවා හැල්ලුවට ලක් කළා.

රූපවාහිනී විවාදයකට තනියම එන්නේ නැති කෙනෙක් නේ විපක්ෂ නායකතුමා කියන්නේ. අනුර සහෝදරයා ගිහිල්ලා එතුමා විවාදයකට එනතුරු බලාගෙන හිටියා. නමුත්, එතුමා ආවේ නැහැ. බොහෝ වෙලාවට script එකක් නැතුව එතුමාට කථා කරන්න බැහැ. මම එතුමාට තමයි මේ කාරණය කියන්නේ. මොකද, එතුමා තමයි දැන් කිව්වේ මේක කවුරු හරි ලියලා දුන්නු එකක් කියලා. මේක එහෙම කවුරු හරි ලියලා දුන්නු එකක් නොවෙයි. එච්චර පටු වෙන්න හොඳ නැහැ. මේ වාගේ දේවල් හදන්නේ නීති විශාරද කණ්ඩායම් එකතු වෙලා. අනුර බණ්ඩාරනායක මැතිතුමා තනියම මේක ලිව්වේ නැහැ. මට මතක විධියට එතුමා ඒ සම්බන්ධයෙන් expertsලාට ස්තුති කළා. හෙට වෙන්න ඕනෑත් එහෙම තමයි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන තිබෙන දේ මොකක්ද? අද හොරුන්ට විරුද්ධව පොලීසිය, පරීක්ෂණ ආයතන වාගේම අධිකරණය ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා දැන් ඕනෑකම තිබෙනවා, පාර්ලිමේන්තුවට තිබෙන අවස්ථාව පාවිච්චි කරන්න. අපි ඉල්ලපු හැම විශේෂ කාරක සභාවක්ම ලබා දුන්නා. මේකත් අපි දෙන්න කැමතියි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කැමති නම්. අනුර බණ්ඩාරනායක මැතිතුමාගේයි, ජගත් වික්‍රමරත්න මැතිතුමාගේයි Rulings දෙක සහමුලින්ම දෙකක්. මොකක්ද, මේකෙන් කියන්නේ? අපිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලයක් තිබෙනවා. අග්‍ර විනිශ්චයකාරවරයෙක් හෝ අග්‍ර විනිශ්චයකාරවරියක් ඒකට අදාළ කරන impeach කරන්න පුළුවන් බලයක් අපට දීලා තිබෙනවා. ශිරානි බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධ සිද්ධියේ දී කරපු විධිය වැරදි වුණාට පාර්ලිමේන්තුවට ඒක කරන්න බලයක් තිබුණා. කරපු විධියයි වැරදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ඒ බලය දීලා තිබෙනවා. ඒ, කොහොමද?

අධිකරණයේ කෙනෙක් සම්බන්ධව යමක් කරන්න ඕනෑ නම් කරන විධියක් තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව. ඒක තමයි අධිකරණයෙන් නතර කළේ. ඔබතුමිය මේ ගැන දන්නවා. හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය වන ශිරානි බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධ සිද්ධියේදී මට මතක විධියට උසාවිය කිව්වා, "මේක කරන්න එපා" කියලා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ඒ බලය දීලා තිබුණා. එම නිසා ඒ බලය පාර්ලිමේන්තුව භුක්ති වින්දා. ඒ කටයුත්ත කරපු අරමුණයි, කරපු විධියයි බොහොම කැතයි, වැරදියි. ඒ නිසා තේ එතුමිය නැවත පත් වුණේ. අනුර බණ්ඩාරනායක මැතිතුමා තීන්දු කළේ මීට හාත්පසින්ම වෙනස් කරුණක් ගැන. එතුමා මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "ව්‍යවස්ථාවෙන් දීපු බලයක් තිබෙනවා. පාර්ලිමේන්තුවට විනිශ්චයකාරවරයෙකුගේ Impeachment එක ගැන කථා කරන්න පුළුවන්. ඒ දීලා තිබෙන විධියට ඒක නතර කරන්න උසාවියට බැහැ" කියලා. ඒක තමයි, මේ. අද මොකක්ද මේ කරන්නේ? අද පාර්ලිමේන්තුව ඉල්ලනවා, උසාවියේ විනිශ්චයකරුවන් පිළිබඳව, ඒගොල්ලන් ගැන කටයුතු කරන අධිකරණ සේවා කොමිෂන් සභාව - JSC - පිළිබඳව අධ්‍යයනය කරන්න, ඒගොල්ලන් ගැන විමර්ශන කරන්න, කැඳවන්න බලය. ඒ විශේෂ කාරක සභාව,-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ. කියවලා ඉන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම කියවලා තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අසත්‍ය කියන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට බාධා නොකර ඉන්න. මේ මොකක්ද කරන්න හදන්නේ? දැන් මේගොල්ලන් කරන්න හදන්නේ මේකයි. *[බාධා කිරීම්]* අහගෙන ඉන්නකෝ, අහගෙන ඉන්නකෝ. *[බාධා කිරීම්]* විශේෂ කාරක සභාව කැඳවන්නේ මොකටද? විනිශ්චයකාරවරු මෙතැනට කැඳවන්න. *[බාධා කිරීම්]* වාඩි වෙන්න. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය මෙතුමාව වාඩි කරවන්න. *[බාධා කිරීම්]* නැහැ, මට වෙලාවක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා ගරු සභානායකතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න. හොරුන්ට කඩේ යන්න එපා. ඔය දෙපැත්තේම ඉන්නේ ඇලෝසියස්ගෙන් සල්ලි ගත්ත අය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියට කියන්නේ මේකයි. *[බාධා කිරීම්]* ඔය දෙපැත්තේම ඉන්නේ ඇලෝසියස්ගෙන් සල්ලි ගත්ත අය. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඕනෑ කෙනෙක් අපේ දේශපාලන සදාචාරය check කරන්න. *[බාධා කිරීමක්]* ඒවා ගැන කියලා කිසි දෙයක් කරන්න බැහැ. ඒවා ගැන කියන්න මම කාලය නාස්ති කරන්නේ නැහැ. මම කියන්නේ මෙච්චරයි. මේකේ මොකක්ද තිබෙන්නේ? මේ කරන්න හදන්නේ මේකයි. විශේෂ කාරක සභාව කැඳවලා, අග්‍ර විනිශ්චයකාරතුමාත් කැඳවන්න පුළුවන්; විනිශ්චයකාරවරුනුත් කැඳවන්න පුළුවන්; කොහොමද කළේ කියලා අහන්න කියන්න පුළුවන්. මේක සහමුලින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවේ අපට දීලා නැති බලයක්. අපට එහෙම බලයක් දීලා නැහැ. ඒ බලය හරහා මොකක්ද කියන්න හදන්නේ? මහින්ද රාජපක්ෂ 2017දී විතර රැස්වීමක් කැඳවලා "මෙන්න බලා ගන්න" කියලා දීපු signal එක තමයි මේ දෙන්න හදන්නේ. එහෙම බලයක් අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දීලා නැහැ. ඒක තමයි මේ කරන්න යන්නේ.

අනෙක, මේ හොරු. මේ, අධිකරණවල නඩු තිබෙන කට්ටිය. අද මෙතැන අධිකරණයට වැඩියෙන් බණින්නේ කවුද? මෙතැන විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අධිකරණයට බණිනවාද? එහෙම වෙන්නේ බොහොම කලාතුරකින්; ඒත් වෙන කෙනෙක් ගැන කථා කරන්න ගිහිල්ලා. සාමාන්‍ය මනුස්සයෙකුගේ ප්‍රශ්නයක් වෙනුවෙන් කථා කරන්න ගිහිල්ලා එහෙම වෙන්න පුළුවන්. මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීතුමන්ලා අධිකරණයට බණිනවාද? නැහැ. සමගි ජන බලවේගය නියෝජනය කරන මේ මන්ත්‍රීතුමන්ලාගේත් සමහර මන්ත්‍රීතුමන්ලා ඉන්නවා, අධිකරණයට මුකුත් කියන්නේ නැති. අධිකරණයට වැඩියෙන්ම කෑ ගහන්නේ කවුද? නඩු තිබෙන කට්ටිය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නඩු තිබෙන උදවිය, අධිකරණවල නඩු විභාග වෙමින් තිබෙන උදවිය තමයි මේ කෑ ගහන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මම කියන්න කැමැතියි, මෙතැන අද අපි දුන්නු Ruling එකෙන් පාර්ලිමේන්තුවේ බලතල එක දශමයක්වත් නැති වෙලා නැහැ කියන එක. ඒ නිසා ව්‍යවස්ථාදායක සභාවේ අපට තිබෙනවා, පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවකුත්. ව්‍යවස්ථාදායක සභාවෙන් පත් කරන ලද ස්වාධීන කොමිෂන් සභා Standing Orders අනුව ඒ කාරක සභාවට කැඳවන්න අපට පුළුවන්. නමුත්, ඒ එක කොමිෂන් සභාවක් හැර. ඒ, කොමිෂන් සභාව මොකක්ද? අපේ ඒ කාරක සභාවටවත් බැහැ, අධිකරණ සේවා කොමිෂන් සභාව කැඳවන්න කියන එකයි මම මේ කිව්වේ. සාමාන්‍යයෙන් ආණ්ඩුවක් තමයි මේක කරන්න ඕනෑකම තිබෙන්නේ. හැබැයි, දැන් මේ කරලා තිබෙන්නේ මොකක්ද? පසුගිය ආණ්ඩුවල හිටපු

[ගරු බිමල් රත්නායක මහතා]

හොරු දැන් භය වෙලා ඉන්නවා. මොකද, දැන් ජන වරම ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව අධිකරණය දැන් කලින්ට වඩා තමුන්ගේ කොන්ද පාවිච්චි කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා තමයි අද මේ ගෝරනාඩුව තිබෙන්නේ. අපි පාර්ලිමේන්තුවේ සම්පූර්ණ ස්වෛරීත්වය ආරක්ෂා කරනවා. පාර්ලිමේන්තුවට දීලා තිබෙන එක බලයක්වත් අපි අඩු කරන්නේ නැහැ. ස්ථාවර නියෝග පවා හරියට කරන්න කියලා අපි කියන්නේ ඒකයි. ඒක තමයි අපිට මේ සම්බන්ධයෙන් අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ. ඒ නිසා අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ තීන්දුව එලෙසම වලංගුයි; ඒ spirit එකත් එලෙසම වලංගුයි. ඒ වාගේම, ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මැතිතුමාගේ තීන්දුවත් එලෙසම වලංගුයි. එහෙම තමයි අපි ප්‍රජාතන්ත්‍රවාදීව රට කරන්න හදන්නේ. එහෙම නැතුව අපට තිබෙන බලය පාවිච්චි කරලා අපි වෙනත් ආයතන අකර්මණ්‍ය කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද කියලා කියන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ස්ථාවර නියෝග 92 යටතේ මම මේක කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට මම ඉතා ගෞරවයෙන් මේ කාරණය කියන්න ඕනෑ. මේ වෙලාවේ සභානායකතුමා සම්පූර්ණයෙන්ම සභාව නොමඟ යැව්වා. මොකද, එතුමා සභාව නොමඟ යැව්වා කියන්නේ, මෙන්න මේ නිසායි. අපි ඉදිරිපත් කර තිබෙන යෝජනාවයි, එතුමා කථා කළ එකයි සම්පූර්ණ වෙනස්. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ කාරණය කියන්න දෙන්න. මොකද, මේක අදාළ වෙනවා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහන්න. අදාළ කාරණය මම පැහැදිලි කරන්නම්. *[බාධා කිරීමක්]* ඒක සම්පූර්ණයෙන්ම අදාළ වෙනවා. *[බාධා කිරීම්]* මොකද, මේ කාරණය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම වැරදි අදහස් තමයි ඉදිරිපත් කළේ. *[බාධා කිරීම්]* අධිකරණයට විරුද්ධව නොවෙයි, විනිශ්චයකාරවරුන් මාරු කිරීම ගැන ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින්,- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීම්]*

[අ.භා. 1.51]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි සභාවට ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව ගැන නොවෙයි අපේ සභානායකතුමා කථා කළේ. ඒක අපි දැක්කා. ඒක අනාගතයේ හෙළි වෙයි. *[බාධා කිරීම්]* ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මේ සභාවේ අසත්‍ය කියලා මේ දේවල් වෙනතකට අරගෙන යන්න එපා කියලා ඉල්ලීමක් කරමින් මම ද්‍රවිඩ භාෂාවෙන් කථා කරන්නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා අසත්‍ය කියන්න එපා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මම කාරණා දෙකයි කිව්වේ. *[බාධා කිරීමක්]* අසත්‍ය කියන්න එපා කියලායි මම කිව්වේ. අපේ යෝජනාව ඒක නොවෙයි. එතුමා වෙන මොනවා හෝ දෙයක් ගැන කථා කරගෙන ගියා. අපිට ඒකට කමක් නැහැ.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் அநுராதபுரத்தில் “Rebuilding Sri Lanka” வேலைத்திட்டத்தின் கீழ் housing initiativeஐ ஆரம்பித்து வைத்திருக்கிறார். அதாவது, இலங்கையை மீளக்கட்டியெழுப்பும் வேலைத் திட்டத்தின்கீழ் வீடமைப்புத் திட்டத்தை சம்பிரதாயபூர்வமாக இன்று ஆரம்பித்துவைத்து இருக்கிறார். நல்ல விஷயம்! அவருக்குப் பாராட்டுக்களையும் வாழ்த்துக்களையும் தெரிவித்துக் கொள்கின்றேன்.

வீட்டுரிமை மற்றும் காணியுரிமையில் இலங்கையில் மிகவும் பின்தங்கிய மக்களாக இருக்கக்கூடிய மலையக மக்களுக்குரிய இடம் எங்கே? என நண்பரும் சகோதரருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களிடம் நான் கேள்வியெழுப்ப விரும்புகின்றேன். பேரனர்த்தத்துக்குப் பிறகு, மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்தச் சபையில் நிறைய நிவாரணங்களை அறிவித்தார். குறிப்பாக, வீடுகளைத் துப்புரவு செய்வதற்கு 25,000 ரூபாயும் பாதிக்கப்பட்ட பாடசாலைப் பிள்ளைகளுக்கு 15,000 ரூபாயும் வழங்குவதாகச் சொன்னார். அதுதவிர, பாதிக்கப்பட்ட மக்களுக்கும் சிறிய வியாபாரிகளுக்கும் பயிர்ச்செய்கையாளர் களுக்கும் கால்நடை வளர்ப்பாளர்களுக்கும் நிவாரணங்களை வழங்குவதாகச் சொன்னார். இதில்கூட, மலையக மக்களுக்குப் பாரபட்சம் காட்டப்பட்டுள்ளது. அவர்கள் விடயத்தில் மாற்றாந்தாய் மனப்பான்மையுடன்தான் அரசாங்கம் நடந்து கொள்கின்றது என்பதை நான் இங்கு தெளிவாகக் கூறிவைக்க விரும்புகின்றேன்.

வீட்டுரிமையும் காணியுரிமையும் அதைவிட முக்கிய மானது. இன்று பாருங்கள்! மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களின் பிரபலமான கூற்று நாடெங்கும் ஒலித்துக்கொண்டு இருக்கின்றது. அவர் உரக்கச் சொல்லிக்கொண்டு இருக்கிறார். அனர்த்தத்தால் வீடுகளை இழந்தவர்களுக்கு காணி வாங்குவதற்கு 50 இலட்சம் ரூபாயும், வீடு கட்டுவதற்கு இன்னும் 50 இலட்சம் ரூபாயும் வழங்கு வதாக அவர் கூறுகின்றார். இவ்விடயத்தில் மலையக மக்கள் குறிப்பாக, பெருந்தோட்ட மக்கள் எங்கே இருக்கிறார்கள் என்பதை இந்த அரசாங்கம் தெளிவாகக் கூற வேண்டும். இந்தப் பேரிடரால் அதிகமான துன்பங்களைச் சந்தித்தவர்கள் தான், கண்டி, நுவரெலியா, பதுளை, கேகாலை, மாத்தளை உட்பட பல மாவட்டங்களில் மலைப் பிரதேசங்களில் வாழ்ந்துகொண்டு இருக்கக்கூடிய பெருந்தோட்ட மக்கள்! அவர்கள் தோட்டத் தொழிலாளர்களாவும் இருக்கிறார்கள்;

தோட்டத்தில் தொழில் செய்யாதவர்களாகவும் இருக்கிறார்கள். இன்றும்கூட, அங்கு கிட்டத்தட்ட 10,000 பேர் இடம்பெயர்ந்து இருக்கிறார்கள். ஒரு சிலர் அங்கு இருக்கக்கூடிய பாடசாலைகளிலும் சனசமூக நிலையங்களிலும் இன்னும் பலர் தமது உறவினர்கள் வீடுகளிலும் இருக்கிறார்கள். அவர்கள் displacedஆகி இருப்பது உண்மை! இன்று அந்த மக்கள் செய்வதறியாத நிலையில், திக்குத் தெரியாத நிலையில் இருக்கிறார்கள். ஏனைய மக்களுக்கு 50 இலட்சம் ரூபாய் தருவதாக சனாதிபதி அவர்கள் கூறுகின்றார். எனினும், இவர்களுக்கு அப்படியல்ல! இந்த விடயம் தொடர்பில் அரசாங்கம் தெளிவுபடுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நாங்கள் எங்களுடைய ஆட்சிக் காலத்தில் இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களுடன் பேச்சுவார்த்தை நடத்தி, முதலில் 10,000 வீடுகளையும் அதன் பிறகு 4,000 வீடுகளையும் பெற்றோம். அந்த 10,000 வீடுகளை அமைக்கும் திட்டத்திலிருந்து உதவித் தொகையைப் பெற்று மலையக மக்களுக்கு வழங்குவதாக இன்று ஒரு பேச்சு அடிபடுகிறது. அதை நாங்கள் ஒருபோதும் ஏற்றுக்கொள்ள மாட்டோம். இது சம்பந்தமான எனது நிலைப்பாட்டை நேற்று இரவு நான் இலங்கையில் இருக்கக்கூடிய இந்தியத் தூதுவர் சந்தோஷ் ஜா அவர்களுக்குத் தெளிவாக எழுத்துமூலம் அறிவித்திருக்கிறேன். தயவுசெய்து, பெருந்தோட்டத்துறை மக்களுக்கான இந்திய வீடமைப்புத் திட்டத்தை இலங்கையில் பேரிடரால் பாதிக்கப்பட்டு நிவாரணம் பெறக்கூடிய மலையக மக்களுக்குப் பயன்படுத்த வேண்டாமெனக் கூறியிருக்கிறேன். அது வேறு, இது வேறு! ஏனைய மக்களுக்கு 50 இலட்சம் ரூபாய் வழங்க முடியுமென்றால், அதை மலையக மக்களுக்கும் வழங்க வேண்டும். மலையக மக்கள் மாற்றாந்தாய் பிள்ளைகளா? இரண்டாந் தரக் குடிமக்களா? என நான் கேட்க விரும்புகின்றேன். எனவே, அதை வைத்துக்கொண்டு இதைச் செய்யக் கூடாது.

இயல்பான காலகட்டத்தில் இலங்கையில் பெருந்தோட்டப் பகுதியில் வாழ்ந்துகொண்டு இருக்கக்கூடிய காணி உரிமை இல்லாத, வீட்டுரிமை இல்லாத மக்களுக்குக் காணிகளை வழங்கி, அதில் வீடுகளை அமைத்துக் கொடுக்கும் நோக்கில்தான் நாங்கள் இந்திய அரசாங்கத்துடன் பேசி இந்தத் திட்டத்தைக் கொண்டுவந்தோம். இது அப்படியல்ல, இது வேறு விஷயம்! இது பேரிடர் நடந்திருக்கின்ற விசேடமான காலப்பகுதியாகும். இந்த நாட்டில் மலைப் பாங்கான பகுதிகளில் வாழ்ந்துகொண்டு இருக்கின்ற மக்கள்தான் மண்சரிவிலும் வெள்ளத்திலும் அகப்பட்டு துன்பத்தை அனுபவித்துக்கொண்டு இருக்கிறார்கள். அதைப் புரிந்து கொள்ள வேண்டும். நேற்று முன்தினம் பாராளுமன்றக் கட்டடித்தொகுதியில் நடைபெற்ற பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் பேசும்பொழுது, மலையக மக்கள் சம்பந்தமாக ஒரு வார்த்தைகூட கூறவில்லை. திரும்பத் திரும்ப 'மலையகம்' என்று பேசி, எமது மக்களின் மனங்களைக் கவர்கின்றாரே தவிர, மலையக மக்கள் தொடர்பாக விசேட அவதானம் செலுத்தவில்லை. அவர்கள் மீதான அவதானம் குறைவாக இருக்கின்றது.

மாண்புமிகு சனாதிபதி அவர்கள் நிறைய நிவாரணங்களை அறிவிக்கிறார். அதாவது, பிள்ளைகளுக்கு, வீடமைப்புக்கு, காணி உரிமைக்கு, சிறுதோட்ட உரிமையாளர்களுக்கு, தொழிலாளர்களுக்கு எனப் பல நிவாரணங்களை அறிவிக் கிறார். மாவட்டச் செயலாளர்கள், பிரதேச செயலாளர்கள், கிராம சேவகர்கள், NBRI அதிகாரிகள் போன்றோர் மூலமாகத்தான் அவை வழங்கப்படுகின்றன. எனினும், எங்களுடைய மக்களுக்கு அவை கிடைப்பதில்லை. எங்களுடைய மக்கள் மாற்றாந்தாய் மனப்பான்மையுடனும் இரண்டாந்த தரப் பிரஜைகளாகவும் நடத்தப்படுகிறார்க ளென்ற குற்றச்சாட்டை நான் திட்டவட்டமாகக் கூற விரும்புகின்றேன். அதற்குப் பதில் கூற வேண்டும். சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள்மீது நாங்கள் நம்பிக்கை வைத்திருக்கிறோம்; மக்களும் நம்பிக்கை வைத்திருக்கிறார்கள். அந்த நம்பிக்கைக்குப் பாத்திரமாக நடந்துகொள்ளவேண்டிய கடப்பாடு அவருக்கு இருக்கின்றது.

நாட்கள் செல்லச் செல்ல, காலம் போகப் போக, மாதங்கள் முடிய பார்த்தல் அவர் மீதான நம்பிக்கை குறைவடைந்து வருவதை அவதானிக்கலாம். கடந்த காலங்களில் போன்று, "இப்போதுதான் ஆட்சிக்கு வந்தோம்; கொஞ்ச கால அவகாசம் தாருங்கள்!" என்று சொல்ல முடியாது. நீங்கள் ஆட்சிக்கு வந்து ஒரு வருடத்துக்கும் மேலாகி விட்டது. இனிமேலும் கால அவகாசம் கோர முடியாது. ஏனைய மக்களுக்கு வழங்குவது போல எங்களுடைய மக்களும் நிவாரணங்களை வழங்கு வதற்குத் தயாராக இருக்க வேண்டும். எக்காரணம் கொண்டும் இந்திய வீடமைப்புத் திட்டத்தை இதில் இணைக்க வேண்டாம். “கடைத் தேங்காயை எடுத்து வழிப் பிள்ளையாருக்கு அடிப்பது போல” இந்தியாவின் உதவியைப் பெற்று எங்களுக்குத் தர வேண்டாம். நாங்கள் அதைப் பார்த்துக் கொள்கிறோம். உலக வங்கியிடம் கடன் வாங்கி ஏன் நாட்டை அபிவிருத்தி செய்ய வேண்டுமென அரசாங்கத் தரப்பினர் கடந்த காலங்களில் கேட்டது ஞாபகத்துக் வருகின்றது.

ලෝක බැංකුවෙන් ණය අරගෙන රට සංවර්ධනය කරන්නේ ඇයි කියලා එදා ඇහුවා; ඒකට ආණ්ඩුවක් ඕනෑද කියලා ඇහුවා. මමත් ඒකයි අහන්නේ. ඉන්දියාවෙන් සල්ලි අරගෙන අපට දෙනවා නම්, ආණ්ඩුවක් ඕනෑ නැහැ අපිට. අපි ශ්‍රී ලාංකිකයෝ. අපි අපේ රටේ පුරවැසියෝ. ඒ නිසා ශ්‍රී ලංකා ආණ්ඩුව අනෙක් පුරවැසියන්ට ගෙවල් හදන්න දෙන ලක්ෂ 50 අපටත් ලබා දෙන්න ඕනෑ. ඒ ගෙවල් හදන එක ඉන්දියාවේ ගොඩට දාන්න හදන්න එපා. මම ඒක පැහැදිලිව කියන්න කැමැතියි. ඒක තේරුම් අරගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට තත්පර කීපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

எங்களுடைய மக்களுக்கு மாடி வீடுகள் கட்டப் போகின்றார்களாம்! அவர்களுக்கு மாடி வீடுகள் வேண்டாம். அவர்களுக்குத் தனி வீடுகள்தான் வேண்டும். நீங்கள் மாடி வீடுகளை நகரங்களில் கட்டுங்கள்! மலையகத்தில் கட்ட வேண்டாம். மலையக மக்களுக்கு நிலத் தொடர்புடன்கூடிய வீடுகள் வேண்டும். அப்படி இருந்தால்தான் நாங்கள் ஓர் இனமாக வாழ முடியும்; நடமாட முடியும். எனவே, நாங்கள் மாடி வீடுகளை ஏற்றுக்கொள்ள மாட்டோம். எங்களுடைய கட்சியும் ஒருபோதும் ஏற்றுக்கொள்ளாது. இதனை நீங்கள் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். எனவே, எங்களுடைய மக்களுக்குத் தனி வீடுகளைக் கட்டிக்கொடுக்க வேண்டும். ஏனைய மக்களுக்கு வழங்குகின்ற 50 இலட்சம் ரூபாயை எங்களுடைய மக்களுக்கும் வழங்க வேண்டும். நீங்கள் அதை

[ගරු මනෝ ගනේසන් මහතා]

வழங்காமல் விடுவீர்களேயானால், இந்த அரசாங்கத்தின் மீது எங்களுக்கிருந்த நம்பிக்கை இல்லாமற்போகும். அத்துடன், நாங்கள் போராட்டத்திலும் ஈடுபட வேண்டிவரும். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හිරුණි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.59]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමා ආපදා සහන පිළිබඳ කරුණු ඉදිරිපත් කළේ සමස්ත ශ්‍රී ලංකාවේම සිටින ජනතාව වෙනුවෙන් බව. මලෛයහම් ජනතාව වෙනස් කොට සැලකීමක් කිසිදු ලෙසකින්වත් සිදු වන්නේ නැහැ. ඒ ආපදාවට ලක් වෙලා පූර්ණ වශයෙන් නිවාස හානි වුණු කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවට ලක්ෂ 50ක මුදල පිරිනැමීම සහ ආපදාවට ලක් වූවන්ට නිවාස ඉදි කිරීමට අදාළව මුල්ගල් තැබීම අද දවසේ ගරු ජනාධිපතිතුමා අතින් සිදු වෙනවා. එම කටයුත්ත සංකේතාත්මකව අනුරාධපුරයෙන් සහ කුරුණෑගලින් අද පටන් ගන්නවා. ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා තමන්ගේ ජනතාවට අසාධාරණයක් වෙලා කියලා කිව්වාට ඒ වැඩසටහන අද ජනාධිපතිතුමාගේ අතින්ම ක්‍රියාත්මක වෙනවා කියලා මම කියන්න කැමැතියි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොඩි පැහැදිලි කර ගැනීමකට ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කැමැතිද, පොඩි පැහැදිලි කර ගැනීමකට අවස්ථාව දෙන්න?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එහෙම කැමැත්ත අහන්න ඕනෑ නැහැ නේ, point of Order එකක් ඉල්ලුවාම.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථා කරන මන්ත්‍රීතුමියගේ කැමැත්ත තිබෙනවා නම් අවස්ථාව දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, තත්පර 15කින් කියන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු මන්ත්‍රීතුමියනි, මටත් ඒකයි ඕනෑ. අපට වෙනසක් පෙන්වන්න එපා. දෙවැනි, තුන්වැනි පුරවැසියන් විධියට අපට සලකන්න එපා. ඒකයි කියන්නේ. විනාශ වුණු ගෙවල් හදන්න ඔක්කෝටම ලක්ෂ 50ක් දෙනවා නම්, ගෙවල් හදලා දෙනවා නම් අපිටත් දෙන්න. ඉන්දියාවේ උදව් උපකාර අපි ලබා ගත්තේ ඒ කාලයේ; අපේ ආණ්ඩු කාලයේ. ඒවා මේකට අදාළ කර ගන්න එපා. ඉන්දියාවේ account එකට මේක දාන්න එපා. ඉන්දියාව ගෙවල් හදලා දෙන්නේ සාමාන්‍ය කාලයේ. මේක හදිසියක් වෙච්ච කාලයක්. අනෙක් අයට දෙන ලක්ෂ 50 අපටත් දෙන්න ඕනෑ. ඒක අමතක කරන්න එපා, වරද්දා ගන්න එපා. එච්චරයි කියන්නේ.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. කිසිදු වෙනස්කමක් නැහැ. ඔබ ප්‍රදේශයේ ජනතාවටත් අනිවාර්යයෙන් සහන ටික සැලසෙනවා. අද තමයි ඒ කටයුත්තේ සමාරම්භක දිනය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ දින ටිකේම පාර්ලිමේන්තුවේ කථා බහ ගෙන බලද්දී මට මතක් වෙනවා මා කුඩා කාලයේ ඉගෙන ගත්තු කථාවක්. ඒ, මැක්කා ගැන රචනා ලියන ළමයෙක් ගැනයි. ඒ කථාවට අනුව පන්තිය භාර ගුරුතුමිය හැම දාම රචනාවක් ලියන්න දෙනවා ලු. ඒ ළමයා කොහෙන් ගියත් අවසානයට මැක්කා ගැන තමයි රචනාව ලියන්නේ. ගුරුතුමිය බැරිම තැන "මගේ සුරතලා මයිනා" කියන මාතෘකාව දීලා ඔන්න දැන් රචනාව ලියන කල් බලාගෙන ඉන්නවා ලු. ඊට පසුව අර ළමයාගේ පොත ගත්තා ලු. පොත අරගෙන බැලුවාම, "මයිනා හරි හොඳයි" කියලා ලියලා, දෙවැනි වාක්‍යයේ ඉඳලා ඕං ආයෙත් මැක්කා ගැන ලියලා ලු, "බැරි වෙලාවත් මයිනාගේ ඇඟේ මැක්කෙක් හිටියොත්" කියලා, "උගේ කකුල් මෙච්චරයි, ඌ මේ පාටයි" ආදි වශයෙන් ලියලා ලු. විපක්ෂයේ හැසිරීම බලද්දී, ඒගොල්ලන්ටත් ඉන්නවා, ඒ විධියට මාතෘකාවෙන් මාතෘකාවට පෝෂණය කරන්න අවශ්‍ය වන මැක්කෙක්. ඒගොල්ලන් සතිපතා විවිධ මාතෘකාවල එල්ලිලා, අප මේ පාර්ලිමේන්තුවට ගෙන එන අණ පනත් මොකුත් අදාළ කර ගන්නේ නැතිව, මැක්කා ගැන රචනාව ලියාගෙන ලියාගෙන යන ළමයා වාගේ කථාව කියාගෙන කියාගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවස කාන්තාවන්ට සුවිශේෂී දවසක්. මේ රටේ සමස්ත ජනගහනයෙන් සියයට 51.7ක් නියෝජනය කරන කාන්තා බලකායෙන් සියයට 34ක පමණ ප්‍රමාණයක් තමයි ශ්‍රම බලකාය නියෝජනය කරන්නේ. මේ විධියට කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය අඩු වෙන්න හේතු වෙලා තිබෙනවා, විවිධ අණ පනත් හේතුවෙන් තිබෙන බාධා සහ සමාජයීය බාධා. අද දවසේ ගරු කම්කරු අමාත්‍යතුමාගේ මැදිහත් වීමෙන්, ඒ තිබෙන ව්‍යවස්ථාදායක බාධා ඉවත් කිරීමට කටයුතු කිරීම සිදු වෙනවා. ඒ අනුව සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතේ 66වන වගන්තිය යටතේ නියෝග නිකුත් කිරීමේ හැකියාව අමාත්‍යවරයාට තිබෙනවා.

ඒ අනුව 1974 මැයි 10 හා අංක 111 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නියෝග ඉදිරිපත් කර තිබුණා. මම ඉස්සෙල්លාම ඒ අදාළ නියෝගය කියවන්නම්. "ගුවන් නැව් සමාගමක් විසින් ගුවන් තොටුපළක පවත්වාගෙන යනු ලබන යම් කාර්යාලයක ගුවන්

තොටුපළ සේවිකාවක් වශයෙන් හෝ කිසියම් නේවාසික හෝටලයක අමුත්තන් පිළිගන්නියක්, කාන්තා ඇඳුම් කාමර සේවිකාවක්, කාන්තා හා රෙදිපිළි ගබඩා සේවිකාවක් හෝ කාන්තා වැසිකිළි සේවිකාවක් වශයෙන් අවුරුදු දහඅටට එළඹ සිටින කවර ස්ත්‍රියක් වුවද පෙර වරු 6.00 සිට පස් වරු 6.00 දක්වා සේවයේ යොදවන්න පුළුවන්" කියලා සඳහන්ව තිබෙනවා. මේ කාරණයේදී කාන්තාවන් වෙනුවෙන් විවෘත වෙලා තිබෙන රැකියා ක්ෂේත්‍රය පුළුල් කරලා ජාතික ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වය වැඩි කර ගැනීමේ සහ විශේෂයෙන්ම හෝටල් කර්මාන්තය, සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින් වාගේම කාන්තා වැසිකිළි සේවිකාවන්ට ගෞරවනීයත්වයක් සැපයීම සඳහා එම නම ද වෙනස් කරමින් ගරු අමාත්‍යතුමා එම නියෝගය 2025දී සංශෝධනය කර තිබෙනවා. ඒ අනුව, කාන්තා සනීපාරක්ෂක සේවිකාවන් හෝ හෝටල් කර්මාන්තයේ නියැළෙන කාන්තාවන්ට රැකියා අවස්ථා සඳහා ප්‍රවේශ වීමට අවස්ථාවක් සැලසීමේ අරමුණින් ආහාර පාන පිළිගන්වන සේවිකාවන්ට ද සවස් යාමයේ සිට උදෑසන දක්වා රැකියාවේ නියැළීමට අවස්ථාව සලසා දී තිබෙනවා. මොකද අපි ප්‍රායෝගිකව දකිනවා, හෝටල් ක්ෂේත්‍රයේ ආහාර පාන පිළිගන්වන අය හැටියට ඉන්නේ සේවකයන් හෙවත් පිරිමි තැනැත්තන් බව. නමුත්, එය පහසුවෙන්ම කාන්තාවන්ට කර ගැනීමට හැකියාවක් තිබෙන රැකියාවක්; පහසු ක්ෂේත්‍රයක්. ඉදිරියේදී සේවකයන්ට විතරක් නොවෙයි, සේවිකාවන්ටත් හෝටල් ක්ෂේත්‍රය ආශ්‍රිතව ආහාර පිළිගන්වන්නියන් හැටියට කටයුතු කිරීමට හැකියාව ලැබෙනවා. නමුත්, මෙහිදී යම්කිසි සීමාවක් තිබෙනවා. මේ සේවා මුරය සවස 6.00ත් උදේ 6.00ත් අතර අවසන් වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ අදාළ සේවා යෝජකයා විසින් ඒ ස්ත්‍රීන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් සපයන්න ඕනෑ. සේවා මුරයෙන් පසුව ඒ අයට අවශ්‍ය ස්ථානයට යෑමට ප්‍රවාහන පහසුකම් සැපයීම ද, සෞඛ්‍ය සහ සුබසාධන පහසුකම් සැපයීම ද අවශ්‍ය වෙනවා. මෙය ව්‍යවස්ථාදායකය -ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව- කාන්තාවන්ගේ ශ්‍රම බලකාය වැඩි කිරීමට ගත්තු ප්‍රශංසනීය තීරණයක්; නියෝගයක්.

අපි එතැනින් නතර වුණේ නැහැ. 2019දී ILO එකේ C190 සම්මුතිය සම්මත වෙනවා, වැඩ ලෝකයේ තිබෙන ප්‍රචණ්ඩත්වය දුරු කරගෙන ගෞරවනීය සේවා පරිසරයක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන්. අපි මේ ILO සම්මුතියේ පාර්ශ්වකාර රාජ්‍යයක්. 2019දී තමයි මේ සම්මුතිය ඉදිරිපත් කරන්නේ, වැඩ ලෝකයේ තිබෙන කුරුත්වය, ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීමට. 2019 ඉඳන් හිටපු ආණ්ඩු ඒක ratify කළේ නැහැ. අපේ ගරු කම්කරු ඇමතිතුමා මැදිහත් වෙලා ඊයේ දවසේදී අවශ්‍ය ලිපි ලේඛන භාර දුන්නා. 2026දී ILO C190 සම්මුතිය සම්මත කරලා, දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙනුත් වැඩ ලෝකයට පිවිසෙන කාන්තාවන් හිංසනයෙන් ආරක්ෂා කරගෙන, ඔවුන්ට සුරක්ෂිත විධියට සේවා ස්ථානයට පැමිණ තමන්ගේ රැකියාව ගෞරවනීය විධියට කරලා නිවෙස් කරා ගමන් කිරීමට අවස්ථාව උදා කර දීම තමයි අරමුණ. ඒ ඔස්සේ අපි දේශීය සහ ජාත්‍යන්තර යන්ත්‍රණය ලංකාව තුළට එකතු කරගෙන සියයට 35ක් වන කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව ප්‍රමාණය වර්ධනය කර ගැනීමට අවශ්‍ය නීති රාමුව මේ ආකාරයට සකසා තිබෙනවා. ඒ වෙනුවෙන් මැදිහත් වන කම්කරු අමාත්‍යතුමාට අපි බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ Point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I am asking you to refer to the Standing Orders. Because I am reading from its English version, sometimes, you may have the Sinhala version and there may be a difference in the Standing Order number. In the English version, Standing Order No. 92(2)(b) should be considered together with Standing Order No. 92(1)(e). Standing Order No. 92(1)(e)හි මෙහෙම තිබෙනවා:

> "shall maintain silence while another Member is speaking and shall not interrupt unless the Member speaking gives way;..."

ඒ, point of Order එකක් නොවෙයි නම්. හැබැයි, point of Order එකක් නම්, Standing Order No 92(2)(b) - මගේ ළඟ තිබෙන්නේ English එක - යටතේ මෙසේ කියා තිබෙනවා:

> "In making a point of Order, a member may not speak for more than one minute and may not speak on the question under consideration."

Madam, point of Order එකක් නම්, whatever the proceedings that are going on and unless there is a Division, we have the right to speak. So, you do not have to ask the Member who is speaking whether he gives way. Please understand that before sitting in the Chair.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය කථා කරන්න. ඔබතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.08]

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත යටතේ පැවැති නියෝගය, සියයට 52ක් වන කාන්තාවන්ට ධනාත්මක විධියට බලපාන අයුරින් වෙනස් කර තිබෙනවා.

විශේෂයෙන්ම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමියක් වන මම ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ බහුතරයක් දෙනා කාන්තාවන් වුණත්, අද වෙනකොට අපේ කාන්තාවන් ආර්ථිකයට ලබා දෙන දායකත්වය සියයට 34ක් වැනි අඩු මට්ටමක තිබෙන්නේ. ඒ සඳහා සමාජයීය කරුණු රාශියක් බලපානවා.

හෝටල් ක්ෂේත්‍රයේ කටයුතු කරන කාන්තාවන්ගේ රැකියා වේලාව සවස 6 සිට ඊළඟ දවසේ උදේ 6 දක්වා ලෙස තීරණය

[ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය]

කිරීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු සහ ගරු මන්ත්‍රීවරියන් සඳහන් කළා, ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් අනුමත කරන ලද ප්‍රඥප්තිය වන C190 අපේ රටේද අපරානුමත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. අද ඒ කාරණාව මේ සභාවට දැනුම් දුන්නා. ඉතින්, ඒ සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. මොකද, විශේෂයෙන්ම සවස 6 සිට ඊළඟ දවසේ උදේ 6 දක්වා සේවය කරනකොට කාන්තාවකට ප්‍රචණ්ඩත්වයෙන් සහ හිංසනයෙන් තොර පරිසරයක සේවය කිරීමේ අවස්ථාව සලසා දීම ඉතාම වැදගත්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි ලෝකයේ අනෙක් රටවල් එක්ක සංසන්දනය කරනකොට, විශේෂයෙන්ම කොවිඩ් උවදුරෙන් පස්සේ අපේ රටේ කාන්තාවන් විශාල සංඛ්‍යාවකට නිවසේ සිට සේවය සැපයීමට අවස්ථාව ලැබුණු බව අපි දන්නවා. ලංකාවේ පෞද්ගලික ආයතන ගත්තොත්, අද වෙනකොට කාන්තාවන් මෙන්ම පිරිමි සේවකයන් විශාල පිරිසක් work from home කියන concept එක අනුගමනය කරනවා. එම නිසා රාජ්‍ය සේවයේ ඉන්න කාන්තාවන්ටත් විශේෂයෙන්ම ඔවුන් නියැළෙන ක්ෂේත්‍රයට සුදුසු පරිදි නිවසේ සිට රාජකාරි කිරීමට අවස්ථාව ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙම කළොත් අපේ කාන්තාවන්ගේ දායකත්වය මීට වඩා වැඩි කිරීමට හැකියාව ලැබෙයි කියලා මම විශ්වාස කරනවා.

මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ කාන්තාවන් විශාල පිරිසකට ඔවුන්ගේ පලතුරු, එළවලු, ඒ අයගේ නිර්මාණ විකුණා ගන්න ලොකු සාප්පු නැහැ. අද ඒ අයට පදික වේදිකා වෙළඳාමත් අහිමි වීම නිසා ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. එක පැත්තකින් පදික වේදිකා නිදහස් කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා. මොකද මහනුවර දිස්ත්‍රික්කය UNESCO එක විසින් ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඉතින්, පදික වේදිකා හරියාකාරව තිබීම ගැන අපිත් කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් මෙතැන තිබෙන ගැටලුව තමයි ඒ පදික වෙළෙඳාම අහිමි වූ ඒ සියලුදෙනාටම හරියාකාර වෙනත් ස්ථානයක් ලබා නොදීම. මහනුවරට සංචාරකයන් විශාල පිරිසක් එනවා. විදේශ රටවල් ගත්තොත්, විශේෂයෙන්ම ඉන්දියාව ගත්තොත් දිල්ලි නුවර Chandni Chowk වාගේ markets තිබෙනවා. ඉතින්, අපේ මහනුවර ඒ කාන්තාවන්ට මෙන්ම පදික වෙළෙඳුන්ටත් ඒ සඳහා සුදුසු ස්ථානයක් ලබා දෙන්න කියලා තමයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහනුවර මහ නගර සීමාව තුළ වරිපනම් ගාස්තු මේ වන විට සියයට 300 සිට 500 දක්වා වැඩි වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, අද වෙනකොට මහනුවර දළදා මාළිගා වීදියේ වරිපනම් ගාස්තු පසුගිය වර්ෂයට වඩා එක් කාර්තුවකට සියයට 500කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, මහනුවර හේවාහැට පාරේ වරිපනම් බදු එක් කාර්තුවක් සඳහා සියයට 400කින් වැඩිවෙලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, කාර්තුවක් සඳහා රුපියල් 1,822ක් ගෙවපු ගෙදරකට, අද රුපියල් 7,012ක් ගෙවීමට සිදුවෙලා තිබෙනවා. ඒ වාගේම, එක් කාර්තුවක වරිපනම් ගාස්තු විධියට රුපියල් 6,907ක් ගෙවූ වාණිජ ගොඩනැඟිල්ලක් සඳහා අද රුපියල් 14,224ක් ගෙවීමට සිදු වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් වැඩි වශයෙන්ම බලපෑමට ලක් වුණේ. ඉතින්, ඒ වාතාවරණය තුළ මේ ආකාරයට වරිපනම් බදු සියයට 500 දක්වා වැඩි කිරීම ඉතාම අසාධාරණයි.

ඒ නිසා විශේෂයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු ඇතුළු නවදෙනෙක් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. මේ සම්බන්ධයෙන් සොයා බලා මහනුවර මහ නගර සභාව යටතේ සිටින ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉටු කර දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.13]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධනය ගත්තොත්, කලින් කියැවුණා වාගේම, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ නියෝග අංක 3ට අදාළව 1974 මැයි 10වන දින කරපු සංශෝධනයට එකතු කිරීමක් විධියට තමයි අද මේ සංශෝධනය ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මීට පෙර ඒ අදාළ සංශෝධන අනුව කිසියම් නේවාසික හෝටලයක අමුත්තන් පිළිගැනීමේ රාජකාරි, කාන්තා ඇඳුම් කාමරවල අදාළ රාජකාරි, කාන්තා ඇඳුම් ගබඩාවල රාජකාරි, කාන්තා වැසිකිළි සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ රාජකාරි වැනි සේවාවල අපේ රටේ කාන්තාවන් පස්වරු 6.00 සිට පෙරවරු 6.00 දක්වා යෙදවීමේ විධිවිධාන තිබුණා. අද ඒ විධිවිධානයට අලුත් එකතු කිරීමක් පමණයි සිදු වෙන්නේ. ඒ අනුව ආහාර පාන පිළිගන්වන්නියන්ගේ සේවය ලබා ගැනීමත් මේ පනත් සංශෝධනය මඟින් සිද්ධ වෙන්න නියමිතව තිබෙනවා. මෙහි ඉතාම වැදගත් කාරණයක් තිබෙනවා. මේ ක්‍රියාමාර්ග ගනිද්දී මේකට අදාළ කොන්දේසි කිහිපයක් සම්පූර්ණ කරන්න ඕනෑ. එකක් තමයි අදාළ නේවාසික පහසුකම් ලබා දිය යුතුයි, සේවය අවසන් වෙලා ඒ අයගේ නිත්‍ය පදිංචි ස්ථානයට යන්න බැරි නම්. නිත්‍ය පදිංචි ස්ථානයට යන්න පුළුවන්කම තිබෙනවා නම්, එම ස්ථානයට යෑම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතුයි. NLAC එක නියෝජනය කරන අපේ වෘත්තීය සමිති කරපු ඉල්ලීම තමයි සේවයේ යෙදවීම සඳහා අදාළ කාන්තාවගේ කැමැත්ත, එකඟතාව අනිවාර්යයෙන්ම ලබාගත යුතුයි කියන කාරණාව. ඒ සියලු පාර්ශ්වවල ඉල්ලීම් සහ කරුණු සලකා බලා ඉදිරිපත් කළ සංශෝධනය පිළිබඳව තමයි අද මේ විවාදය පැවැත්වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ රටේ තිබෙන කාලීන අවශ්‍යතා අනුව ආර්ථිකය ගොඩ නැඟීමේ ජාතික

වැඩ පිළිවෙළ, සංචාරක ක්ෂේත්‍රයේ නව පිබිදීම ආදී කටයුතු තුළින් රටේ ආර්ථිකය ස්ථාවර කරගනිමින් ඉදිරියට යද්දී අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් පමණ නියෝජනය කරන්නේ අපේ කාන්තාවන්. කාන්තාවන් ජනගහනයෙන් සියයට වැඩි පංගුව වුණත්, ශ්‍රම දායකත්වය තුළ ඔවුන්ගේ නියෝජනය සියයට 34යි. අපේ රටේ කාන්තා ශ්‍රම දායකත්වය වැඩි කිරීමට, ශ්‍රම බලවේගයට වැඩි නියෝජනයක් ලබා දීමට, අපේ රටේ ආර්ථික ස්ථාවරත්වයට, මේ ගොඩ නැඟෙන අනාගත ජාතික වැඩ පිළිවෙළට දායකත්වය ලබා ගැනීමට, කාන්තාවන්ගේ ආර්ථික හැකියාව සහ සමාජ මැදිහත්වීම් වැඩි දියුණු කරගැනීමට අපි ආණ්ඩුවක් විධියට මේ කරන සංශෝධනය වැදගත් වෙනවා කියලා මම විශ්වාස කරනවා.

මීට කලින් අදහස් දක්වපු අපේ මන්ත්‍රීතුමෙක් මතු කළා, මලෙයහම් ජනතාවට මේ ආණ්ඩුව අඩුවෙන් සලකනවාද කියලා. මම කියන්න කැමතියි, අවුරුදු 200ක් ඉක්මවා ගිය මලෛයහම් ජනතාවක් අපේ රටේ හිටිය බව. හැබැයි, ඒ අදහස් දක්වපු මන්ත්‍රීතුමා නියෝජනය කරපු ආණ්ඩු පවා මේ රටේ මලෛයහම් ජනතාවට සාධාරණය ඉටු කරන්න අසමත් වුණා. නමුත් වත්මන් ආණ්ඩුව මේ රටේ සමස්ත ජනතාවට වඩා නිවැරදි, යහපත් ජීවිතයක් නිර්මාණය කරන්න අවශ්‍ය වටපිටාව සකස් කරන අතරේ, මලෙයහම් ජනතාවට වසර 200 ගණනක් තිස්සේ සිදුවෙච්ච අසාධාරණකම් නිවැරදි කරන්න අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. ඒ නිසා තමයි ඒ නිවාස ඉදිකිරීම, වතු ආශ්‍රිත ජනතාවගේ මාර්ග පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ඇතුළු දේ වැඩිදියුණු කරමින් පවතින්නේ. ඒ කථා කරපු මන්ත්‍රීවරු එදා නියෝජනය කළ ආණ්ඩුවලින් ඒ ජනතාවට ඉටු නොකරපු සාධාරණය අද අපි ඉටු කරමින් ඒ කටයුතු කරමින් යද්දී තමයි එවැනි අදහස් පළ කරන්නේ. විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ගේ වුවමනාව ඉටු කරමින් ඒ මන්ත්‍රීවරු අදහස් දැක්වීම කනගාටුදායකයි. මලෛයහම් ජනතාවට ඉටු කළ යුතු සාධාරණය වත්මන් ආණ්ඩුව ඇතුළේ අපි අද ඉටු කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ සංවාදය ඇතුළේ අපට බොහෝ දේවල් අහන්න ලැබුණා. දැන් විපක්ෂය නියෝජනය කරන කණ්ඩායම් ගණනාවක් දශක ගණනාවක් අපේ රටේ ආණ්ඩු කළා. ඒගොල්ලන් විශ්වාස කළා, අපි වාගේ ආණ්ඩුවක් කවදාවත් බලයට එන්නේ නැහැ කියලා. ඒ නිසා ඒගොල්ලන් බලය තිබෙන කාලයේ ඒ බලය ඇතුළේ රස්තියාදු ගැහුවා; බලය ඇතුළේ ආතල් ගත්තා; බලය ඇතුළේ විවිධ ක්‍රියාමාර්ග ගත්තා. නාස්තිය, වංචා, දූෂණ, අපරාධ සියල්ල අඩු වැඩි වශයෙන් කළා. හැමෝම නොවුණත් ඒවාට අදාළ අය ඉන්නවා. ඒ ක්‍රියාවලිය ඇතුළේ මෙවැනි ආණ්ඩුවක් එයි කියලා ඒගොල්ලන් අපේක්ෂා කළේ නැහැ. ඒ නිසා කොන්දේසි විරහිතව බලය අයුතු ලෙස පාවිච්චි කරමින් කටයුතු කරමින් හිටියා.

හැබැයි, අද ජනතාවගේ ජන වරම තුළින් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ එතුමන්ලා අපේක්ෂා නොකරපු, නමුත් ජනතාව අපේක්ෂා කරන වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව ගෙනයමින් තිබෙනවා. ඒ නිසා තමයි වංචාව, දූෂණය, නාස්තිය නතර කරලා ඒවාට සම්බන්ධ අතීතයට අදාළ අය සම්බන්ධයෙන් නීත්‍යනුකූල ක්‍රියාමාර්ග ගනිමින් තිබෙන්නේ. ඒ වාගේම රටේ ආර්ථික බංකොලොත්භාවය ඇති කරපු ඒ කණ්ඩායම් එදා සිද්ධ කළ දේවල් වෙනුවට අද මේ රටේ ආර්ථික ස්ථාවරත්වය අපි ගොඩනඟලා තිබෙනවා. රටේ නිෂ්පාදනය වැඩි කරලා, අපනයන ආදායම ශක්තිමත් කරලා, මේ රටේ ආර්ථිකය ස්ථාවර කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. එදා ඒගොල්ලන් ජාතිවාදයෙන් දේශපාලනය කළා. අද ඒ ජාතිවාදය අවසන් කරලා ජාතික සමඟිය, සංහිඳියාව ඇතුළේ කටයුතු කරමින් තිබෙනවා. එදා ඒගොල්ලෝ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කළා. ඒවාට ඉඩ දුන්නේ නැහැ. හැබැයි අද ආණ්ඩුවක් විධියට අපි මේ රටේ වැඩ කරන ජනතාවගේ වැටුප් සියයට 66කින් වැඩි කරලා, වැටුප් වර්ධක සියයට 80කින් වැඩි කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, එදා ආණ්ඩුව ඒ අත්හිටුවා තිබුණු පූර්ණ විශ්‍රාම වැටුප් ක්‍රමය අපි යළි ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන්ගේ නිවාස හා දේපළ ණය අත්හිටුවා තිබුණා. අවුරුදු 5කින් රැකියාවලට බඳවාගත්තේ නැහැ. ඒ වාගේම දැන් ආපදා ණය රුපියල් ලක්ෂ 2 ½ සීමාව රුපියල් ලක්ෂ 4 කළා. ඒගොල්ලෝ කප්පාදු කරපු ඒවා, ඒගොල්ලෝ අහිමි කරපු ඒවා නිවැරදි කරන්න අද මේ ආණ්ඩුව කටයුතු කරමින් තිබෙනවා. ඒ වාගේම, වැටුප් විෂමතාව ඉවත් කරලා වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා වත්මන් ආණ්ඩුව ජනාධිපතිතුමාගේ අය වැය යෝජනාවක් අනුව රාජ්‍ය සේවයේ විෂමතා සහ වෘත්තීමය වශයෙන් මතු වී තිබෙන ගැටලු නිරාකරණය කරන්න අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. අද ඒවා එකින් එක, එකින් එක ක්‍රියාත්මක වෙද්දී එක පැත්තකින් පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඇතැම් කණ්ඩායම් කලබල වෙලා ඒවා අඩපණ කරන්න, ජනතාව තුළ වැරදි මත නිර්මාණය කරන්න උත්සාහ කරමින් සිටිනවා. ඒ වාගේම, විපක්ෂයේ ඇතැම් අයගේ ඍජු සහ වක්‍ර ආශීර්වාදය සහ සම්බන්ධය සහිත ඇතැම් වෘත්තීය සමිති කණ්ඩායම් එළියේ විවිධ සටන් පාඨ නිර්මාණය කරමින්, අපේ රටේ වැඩ කරන ජනතාව නොමඟ යවමින්, ඒගොල්ලන්ගේ පැවැත්ම ස්ථාවර කර ගැනීම සඳහා උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම තව එක කාරණයක් කිව යුතුයි. අද මේ විවාද කරන සංශෝධනය තුළින් මේ රටේ ආර්ථිකය ස්ථාවර කරන්නත්, අපේ කාන්තාවන්ට සුරක්ෂිතව ආර්ථිකය නියෝජනය කරන්නත්, රැකියා ක්ෂේත්‍රය නියෝජනය කරන්නත් ඉඩක් ලැබෙනවා. ඒ වාගේම මේ සිදුවීම් ඇතුළේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් රකිමින්; සුරක්ෂා කරමින්, ඒ වාගේම වැඩ කරන ජනතාවගේ වරප්‍රසාද ආරක්ෂා කරමින්, ඉතිහාසයේ මෙතෙක් ආණ්ඩු පාලනය කරපු සෑම පක්ෂයකටම වඩා ජනතාවාදීව; වැඩ කරන ජනතාවට හිතවත් ආකාරයෙන් මේ රාජ්‍ය පාලනය - ආණ්ඩුකරණය - සිදු කරමින් තිබෙන බව ඉතා පැහැදිලිව මම මේ මොහොතේ ප්‍රකාශ කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.21]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා හොඳ කථාවක් කිව්වා. එතුමා කිව්වා, මේ වාගේ ආණ්ඩුවක් - මොකක්ද, ලොවෙත් නැහැ කියලාද, කොහොමද කිව්වේ?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එයි කියලා හිතුවේ නැහැය කිව්වා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මේ වාගේ ආණ්ඩුවක් එයි කියලා හිතුවේ නැහැය කියලා එතුමා කිව්වා. කථාව ඇත්ත. එතුමාත් අපි ජීවිතේට දැකලා නැති දෙයක් කරනවා අපි දැක්කා. එතුමා ගිහිල්ලා දෙවැනි තට්ටුවේ මුල් ගලක් තැබුවා. ඇත්තටම මේ වාගේ ආණ්ඩුවක් එයි කියලා අපිත් හිතුවේ නැහැ. කථාව ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මාර පව තොගයක් කියාගෙන කියාගෙන ගියා. බොරු විදලා, එතුමා යන්න ගියා. එතුමා කියපු හොඳම කාරණය තමයි, ශිරානි බණ්ඩාරනායක ගැන කියපු කථාව. ඒ කතන්දරය මොකක්ද කියලා මම පොඩ්ඩක් කල්පනා කරලා බැලුවා. නාමල් රාජපක්ෂ මහත්මයා දිහා බලාගෙන තමයි එතුමා ඒවා කිව්වේ. ඉතිහාසයේ ශිරානි බණ්ඩාරනායක මැතිනියව එලෙව්වේ කවුද? එතුමියව එලෙව්වේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාව ජනාධිපති කළේ අපිද? මේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාද, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාද, ගයන්ත කරුණාතිලකද, මුජිබුර් රහුමාන්ද? නැහැ. ඒ හිටපු ජනාධිපතිතුමාව ජනාධිපති පුටුවට ගෙනාවේ ඔතැන ඉන්න ජේවීපී එකේ කට්ටිය. එතකොට ශිරානි බණ්ඩාරනායක එලවීමේ වගකීමත් බිමල් රත්නායක මහත්මයලා ගන්න ඕනෑ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

බිමල් රත්නායක තමයි 2005දි මහින්ද රාජපක්ෂගේ තරුණ ප්‍රතිපත්ති හැදුවේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මහින්ද රාජපක්ෂගේ තරුණ ප්‍රතිපත්තිය හැදුවේ එතුමා ලු. මොනවාද මේ කියන්නේ? එතකොට ශිරානි බණ්ඩාරනායක එලෙව්වේ අපි නොවෙයි. මහින්ද රාජපක්ෂලා, බිමල් රත්නායකලා, ඇතුළු ජේවීපී එක තමයි ශිරානි බණ්ඩාරනායකව එලෙව්වේ. ඒ නිසා අපි දිහා බලලා ගොරවලා හරියන්නේ නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අපිට තමයි එතුමා ඔරවන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

අපිට තමයි ඔරවන්නේ.

විගණකාධිපති පත් කිරීම සම්බන්ධවත් එතුමා කියනවා. *[බාධා කිරීමක්]* විගණකාධිපති පත් කිරීම සම්බන්ධයෙන් දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඔරවලා, ගොරවලා හරියනවාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නම් තුනක් එවලා තිබෙනවා. ඉන් එක්කෙනෙක් තමයි තමයි ජාතික විගණන කාර්යාලයේ සිටින පහළ නිලධාරියෙක්. ඔහුට දූෂණ චෝදනා තිබෙනවා. අනෙක් කෙනා Ceylon Petroleum Corporation එකේ accountant කෙනෙක්ද, කවුද. ඔහු private sector එකේ කෙනෙක්. අනෙක් කෙනා Army එකේ internal auditor කෙනෙක්.

ඇයි, දෙයියනේ! විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෝෂ්ඨයෝ ඉන්නවා නේ. එම දෙපාර්තමේන්තුවේ වැඩබලන විගණකාධිපතිතුමාගේ නම එවා නැත්තේ ඇයි? ඔහු නේ, ජ්‍යෝෂ්ඨයා. ඉතිහාසයේ වෙච්ච විධියක් තිබෙනවා නේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ මොකක් හරි අඩුපාඩුවක් තිබෙනවාද? ඒකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සහ එහි සාමාජිකයන්ට කෑ ගහලා, ගොරවලා, ඔරවලා හරියනවාද? ඒකට කරන්න ඕනෑ, සුදුසු නම එවන එකයි. සුදුසු නම එව්වා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් අනුමැතිය ලැබෙයි. ඒ නිසා අපිට ඔරවලා හරියන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සුදුසු නමක් එවා, ඒක අනුමත කරගන්න ක්‍රියාමාර්ග ගන්නේ නැතුව වෙන වෙන වංගු ගහන්නේ පසුගිය කාලයේ වෙච්ච ගනුදෙනුවල තිබෙන ප්‍රශ්න නිසා. වෙන මොකුත් නිසා නොවෙයි නේ. 2026දී Auditor-Generalගේ Report එක COPE එකට එනවා. ඉතින් මේ ආයතන බේරා ගන්න තමන්ට හිතවත් මොකෙක් හරි හෙංචයියෙක් දමා ගන්න නේ, මේ හදන්නේ.

ඊළඟට, තාජුඩීන්ගේ නඩුව ගැන කිව්වා. තාජුඩීන්ගේ නඩුවට අදාළ "B" report එක ගහපු රණවීර මහත්තයා ඉන්නේ කොහේද? ඔහු මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක. ඊළඟට, ඒ සම්බන්ධ දුරකථන දත්ත මකපු මහත්මයා කවුද? ඩිජිටල් උපදේශක, හාන්ස් මහත්මයා. ඉතින් මේවාට අපට ගොරවලා හරියන්නේ නැහැ. සාරා ජස්මින් ගැනත් කියනවා. සාරා ජස්මින්ව නැඟෙනහිරින් පැන්නුවේ කවුද? ආරක්ෂක නියෝජ්‍ය ඇමති. එතුමා තමයි පැන්නුවේ, "බංකු බංකු මහත්තයා". ඒක බිමල් රත්නායක මහත්තයා මේ පැත්ත බලාගෙන නොවෙයි, අර පැත්ත බලාගෙනයි කියන්න ඕනෑ. මේ පැත්ත බලා හරියන්නේ නැහැ. ඒගොල්ලන්ම නේ කිව්වේ, ඉන්දියාවට පැන්නුවාය කියලා. නලින්ද ජයතිස්ස මහත්තයා කිව්වේ. මොනවාද මේ කියන කථා?

අධිකරණ ස්ථාන මාරුවීම් සම්බන්ධව සොයා බැලීමට අපි පැහැදිලිවම විශේෂ කාරක සභාවක් ඉල්ලුවා. දැන් විනිසුරුවරුන් ඉන්නේ විශාල කලකිරීමකින්. ඔවුන්ව සී සී කඩ වීසි කර දමලා. මම දන්නේ නැහැ, විනිසුරුවන්ගේ staff එකටත් driver කෙනෙක් විධියටවත් පැලවත්තෙන් කෙනෙක් දමලාද කියලා. එහෙම නේ, මේගොල්ලන්ගේ මේ ආණ්ඩුව දුවන්නේ. අර ස්ථාන මාරු සම්බන්ධව විනිසුරුවන්ට විරෝධතාවක් දක්වන්න විධියක් තිබෙනවාද? නඩු කියන්න විධියක් තිබෙනවාද? ඒ අයට සාධාරණය ඉෂ්ට කිරීම මේ ව්‍යවස්ථාදායකයේ වගකීමක්. ඒකට විශේෂ කාරක සභාවක් ඉල්ලුවා කියලා නොයෙක් චෝදනා කරනවා. මේගොල්ලන් අතීතය අල්ලා ගෙන දැන් සමපාත කරන්න හදනවා, ඒ අය කරන ඒවා වහගන්න. මේකට අපි දැඩි විරෝධතාවක් දක්වනවා.

මේ කාරණාවලට හොඳම උදාහරණය තමයි, මුජිබුර් මහත්මයා කියපු ගනුදෙනුව. සුළං සහ සූර්ය බල මෙගාවොට් 550ක් තම හිතවතුන්ට දෙන්න කැබිනට් පත්‍රිකාවකින් අනුමැතිය දීලා තිබෙනවා. කීයටද දෙන්නේ? රුපියල් 18යි ගණනකට. මීට මාස කිහිපයකට කලින් හේලීස් සමාගමට - ඒ කියන්නේ technically qualify වෙච්ච නැති සමාගමකට - දුන්නා, මට මතක විධියට ඩොලර් ශත 4යි ගණනකට. ඩොලර් ශත 4.85ට සමාගමක් qualify වෙලා තිබියදී, ඩොලර් ශත 4.65ට දුන්නා. ඒ අවස්ථාවේදී ඒගොල්ලන් ඉදිරිපත් කළ තර්කය තමයි, "අපි දුන්නේ අඩු එකට" කියන එක. හැබැයි, එම සමාගම technically qualified නැහැ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඩොලර් ශත 4.65ක් කියන්නේ රුපියල් 15ටත් අඩු ගණනක්. දැන් මේගොල්ලන් ඩොලර් 18යි ගණනකට දෙනවා, මෙගාවොට් 500 ගණනක්. කොහොමද දෙන්නේ? Expressions of Interest ඉදිරිපත් කරපු අය අතරින් තමන්ගේ රුචි-අරුචිකම් මත තෝරා ගත් 5-6දෙනෙකුට දෙනවා. කවුද මේ රුචි අරුචිකම් මත තෝරාගත් අය?

එක පැත්තකින්, ඒ අයට කඩේ ගිය ක්‍රීඩකයෝ දෙදෙනෙක්. අනෙක් පැත්තෙන්, අපේ බලශක්ති ඇමතිතුමා. එතුමා නම් දැන් මැච් එක ගහන්න පටන් අරගෙන. දැන් 6 පහර කිහිපයක් ගසා තිබෙන්නේ. මේ ගහන්න යන්නේ ඕවරයේ බෝල 6ටම,- හයේ ඒවා හයක් ගහන්න යන්නේ. මම හිතන විධියට ගහලා ඉවරයි. මේක වෙන්න දෙන්න බැහැ. මේක ගණනය කරලා බැලුවොත්, පාඩුව බිලියන ගණනක් වෙනවා.

මේකෙන් වන පාඩුව රුපියල් 3ක් - රුපියල් 15ක් නොවෙයි, ඊයේ පෙරේදා ටෙන්ඩරයක් ගියා රුපියල් 11ට, 12ට. එතකොට unit එකකින් රුපියල් 4ක්, 5ක් රටට අහිමි වෙද්දී, මෙගාවොට් 550කින් එක දවසකට කෝටි ගණනක් අහිමි වෙනවා. මේවා කාගේ සාක්කුවලටද යන්නේ? මේ ගනුදෙනු කාගේ වුවමනාවලටද වෙන්නේ? කැබිනට් මණ්ඩලයත් මේවාට වග කියන්න ඕනෑ. මොකද, කුමාර ජයකොඩි මහත්මයාගේ Cabinet Paper එක අනුමත කෙරුවේ ජනාධිපතිතුමාත් සිටි කැබිනට් මණ්ඩලය නේ. අපි මේ පිළිබඳව තවත් කරුණු ඉදිරියේදී එළිදක්වනවා. මේ පුද්ගලයින් පිළිබඳව දැනටමත් අපි දන්නවා. මේ නම් හෙළි වෙලා තිබෙනවා. මේ අය මෙම ක්ෂේත්‍රයේ හිටපු අය නොවෙයි. මේ නම් 6 තුළ මේ ක්ෂේත්‍රයේ හිටපු දැවැන්තයෝ එක්කෙනෙක්වත් නැහැ. වෙන වෙන පුද්ගලයින් ටිකක් තමයි ඇවිල්ලා තිබෙන්නේ. ඉදිකිරීම් කරපු, පාරවල් හදපු අයත් දැන් ඇවිල්ලා ඉන්නවා, එතුමාගේ පරණ කොම්පැනියේ solar panels ගහන්න.

ඉතින් ඒ අනුව පැහැදිලිවම පෙනෙනවා දැන් හොරකම පටන් අරගෙන තිබෙනවා කියලා. හැබැයි පොඩිත් නොවෙයි; සිල්ලරත් නොවෙයි; මෙගා ඒවා යන්නේ. හයේ ඒවා ගහනවා, බෝල හයටම. ඉතින් ඒ නිසා අපට පැහැදිලියි, විගණකාධිපති පත් කරන ඒවා ඇතුළු මේ සේරම කරන්නේ, කුට්ටම අනන්නේ, තමන්ට මැච් එක ගහන්න, තමන්ට මේ ගේම් එක ගහන්න පුළුවන් විධියට තමන්ගේ පිටිය හසුරුවා ගන්න කියලා. ඒකට තමයි අද මේ වැඩේ කරන්නේ.

ඒ විතරක් නොවෙයි. දැන් මේ ටිකේම කථා වෙනවා නේ, අපේ අගමැතිතුමිය ගැන. මොකක්ද, 6 වසර මොඩියුලයකට අසභ්‍ය වෙබ් අඩවි ඇතුළත් කරපු එකක් ගැන. පසුගිය කාලයේ LGBTQ කිව්වා, අරවා කිව්වා, මේවා කිව්වා. මේක ඇතුළේත් එහෙම අය ඉන්නවාය කියාවි. ඒ මදිවාට දැන් පොඩි එකාගේ ඔළුවත් කන්න නේ හදන්නේ. සමාජයේ එහෙම යම් කොටසක් ඉන්නවා නම් ඒ අයට සාධාරණය ඉෂ්ට කළාට මට නම් පෞද්ගලිකව ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඒ සමාජ ස්තරයේ නැති, ලිංගිකත්වය පිළිබඳව දැනුමක් නැති, අවබෝධයක් නැති, හැඟීමක් නැති කුඩා දරුවන්ගේ ඔළුවලට ඒක ඇතුළත් කරනවාය කියන්නේ බරපතළ තත්ත්වයක්, මුජිබුර් මන්ත්‍රීතුමා. එහෙම ජන කොට්ඨාසයක් ඉන්නවා නම්, ඒ අය ගැන වෙනම බලාගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒ අය ඒක කර ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කුඩා දරුවන් තුළ මේ අනවශ්‍ය මානසිකත්වයන් ඇති කරන එක වැරදියි.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බලන්න, අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන case දිහා. මේ මගේ අතේ තිබෙන්නේ, අපේ රාජ්‍ය ලාංඡනයේ පින්තූරයක්. බොහොම පැහැදිලියි, මේ රාජ්‍ය ලාංඡනයේ උඩින්ම තිබෙන්නේ අපේ ධර්ම චක්‍රය. නිවැරදි ධර්ම චක්‍රය මොකක්ද කියලා හොයන්න ආයෙත් වෙන එකක් ඕනෑ නැහැ, රාජ්‍ය ලාංඡනය බැලුවා නම් මෙන්න ධර්ම චක්‍රය තිබෙනවා, රාජ්‍ය ලාංඡනයේ උඩින්ම. නමුත් දැන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පොත්වල තිබෙන රාජ්‍ය ලාංඡනය ඒක නොවෙයි. මා සතු මේ පින්තූරයේ තිබෙන ධර්ම චක්‍රය තමයි ඒ පොත්වල තිබෙන්නේ. නිවැරදි ධර්ම චක්‍රය රාජ්‍ය ලාංඡනයේ තිබෙන එක. නමුත් මෙන්න දැන් වෙන මොකක්ද චක්‍රයක් ඇවිල්ලා තිබෙනවා. අපි හොයා බැලුවාම, අශෝක අධිරාජ්‍යයාගේ චක්‍රය තමයි ධර්ම චක්‍රය විධියට මේ පොත්වල යොදා තිබෙන්නේ. බුද්ධාගම, ධර්ම චක්‍රය, බුදුරජාණන් වහන්සේ, ආදී විස්තර තිබෙන මේ වගුවේ ධර්ම චක්‍රයට යොදා තිබෙන්නේ අශෝක අධිරාජ්‍යයාගේ චක්‍රය. ඒ කියන්නේ, දැන් මේ ආණ්ඩුව ලිංගික අධ්‍යාපනයට එක එක විකාර කරනවා විතරක් නොවෙයි, බුද්ධ ධර්මයත් - බුද්ධාගමත් - විකෘති කරන්න හදනවා; ධර්ම චක්‍රයත් වෙනස් කරන්න හදනවා. මම දන්නේ නැහැ, අශෝක අධිරාජ්‍යයා නැවත උපත ලබා පත් වෙලා හෙට අනිද්දා අපේ රටත් අල්ලා ගනීවිද කියලා. එහෙම case එකක්වත් වෙන්න තිබෙනවාද දන්නේ නැහැ. ඒකත් ලියලා දේවි, එච්චරට කට්ටිය! නිසා පැහැදිලිවම කියන්න ඕනෑ, අද මේ ආණ්ඩුව යන්නේ රුචිතෙට බව.

ඊයේ පෙරේදා අපි දැක්කා, ගල්ගමුවේ බොරලු case එක. ඇමතිවරුන් මැදිහත් වෙලා නිලධාරින්ට බලහත්කාරකම් කරලා, අද ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ. හෙට අනිද්දාට ඒ නිලධාරින් ටිකත් එහාට මෙහාට පන්නලා දමාවි. මොනවාද මේ වෙන්නේ? ඇයි මෙහෙම කරන්නේ? කාටද මේ වුවමනාව තිබෙන්නේ, රාජ්‍ය නිලධාරින්ට තමන්ගේ වගකීම ඉටු කරන්න, නීතිය ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැතුව බලපෑම් කරන්න? මේවා බොහොම වැරදියි. මේවා කරන්න නොවෙයි එනවාය කිව්වේ. නීතිය කාටත් සමයි, පොදුයි කියලා කිව්වේ. හැබැයි අද නීතිය කාටත් සම නැහැ; පොදු නැහැ. ඔබතුමන්ලාට ඕනෑ දේ, පැලවත්තට ඕනෑ දේ තමයි නීතිය බවට පරිවර්තනය කරමින් යන්නේ.

අද වත් අහිංසක මිනිස්සු කොට්ඨාසයක් ඉන්නවා. ඒ, අපේ සිවිල් ආරක්ෂක භටයෝ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම කථාව අවසන් කරනවා.

අනුරාධපුරය, පොළොන්නරුව, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල හිටපු සිවිල් ආරක්ෂක භටයින් සේරම අද කොළඹ පැත්තේ පොලීසිවලට දමලා. ඒ මිනිස්සුන්ට ආහාර සලාකයක් නැහැ; ඉන්න තැනක් නැහැ. ඒ මිනිස්සු යුද්ධය කාලයේදී විශාල සේවයක් කළා. මේගොල්ලන් හැම සමාජ ස්තරයකින්ම, හැම කොට්ඨාසයකින්ම පළිගන්නවා. පුදුම වෛරයක් තිබෙන මිනිස්සු. ඒ නිසා බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, අද ඔයගොල්ලන් යන්නේ වැරදි ගමනක් බව. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තරම් ආණ්ඩුවක් ලොවෙත් නැහැ තමයි. ඒක ඇත්ත.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.31]

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි සාකච්ඡා කරන්නේ, සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත යටතේ ගෙනැල්ලා තිබෙන නියෝගය ගැනයි. අපි දීර්ඝ කාලයක් තිස්සේ දැනගෙන හිටියා, ILO සම්මුතිය අපි අපරානුමත - ratify - කළ බව. හැබැයි ඒකට අදාළ නියෝග පනවන්න මෙච්චර කාලයකට කිසිම උනන්දුවක් තිබුණේ නැහැ. ඒකෙන් අපේ රටට ප්‍රයෝජනයක් ගන්න මීට පෙර ආණ්ඩු කරපු අයට උනන්දුවක් තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා අපට මෙය අවස්ථාවක් කර ගන්න පුළුවන්. 2025 වර්ෂයේදී අපේ රටට සංචාරකයින් 2,363,000ක් පැමිණ තිබෙන බව අපි ඉතාම සාඩම්බරයෙන් කියනවා. අපි දැකලා තිබෙනවා, කාන්තාවන් සේවයේ යෙදවීම පිළිබඳව. අපේ රටේ ජනගහනයෙන් භාගයකට වඩා ඉන්නේ කාන්තාවන්. එහෙම රටක කාන්තාවන්ගේ සේවය ප්‍රශස්ත ලෙස ආර්ථිකයට දායක කර ගැනීමේ හැකියාව තිබුණත්, අපි ඒ සම්බන්ධයෙන් දැන් තමයි නීති පනවන්න ක්‍රියාත්මක වෙන්නේ. අපි මේ නීති පනවන්න ක්‍රියාත්මක වෙන්නේ නිකම්ම නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි මේ සම්බන්ධයෙන් කථා කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ත්‍රෛපාර්ශ්වික සාකච්ඡාවක් ඇතිවෙලා තිබෙනවා. වෘත්තීය සමිති, හාම්පුතුන් සහ ආණ්ඩුව වශයෙන් අපි එකතු වෙලා මේ ගැන සාකච්ඡා කරලා තමයි මේ තීරණ ගත්තේ.

එම සාකච්ඡාවට ආණ්ඩුව හැටියට අපි සම්බන්ධ වුණා. එහිදී අනෙකුත් පාර්ශ්වවලින් -විශේෂයෙන්ම කම්කරුවන්ගෙන් සහ හාම්පුතුන්ගෙන්- ආපු හැම යෝජනාවක්ම සලකා බලා තමයි අපි මේ තීන්දු-තීරණවලට එළඹුණේ. එහිදී ඒ පාර්ශ්වයන්ගෙන් වැඩිපුරම ඉදිරිපත් වුණු දේ තමයි, රාත්‍රි කාලයේ සේවයේ යෙදීමට කාන්තාවන්ගේ එකඟතාව ලබා ගැනීම අවශ්‍යයි කියන කාරණය. එම නිසා කිසිම ස්ත්‍රියකගේ කැමැත්තකින් තොරව රාත්‍රි කාලයේ සේවයේ යෙදීමට බල නොකළ යුතුය කියලා අපි තීන්දුවකට එළඹිලා තිබෙනවා. සෑම සේවා යෝජකයෙකු විසින්ම ස්ත්‍රීන් රාත්‍රි 10.00න් පසුව සේවයේ නියුක්ත කරවීමට පෙර කම්කරු කොමසාරිස්වරයාගෙන් ලිඛිත ආඥාවක් ලබා ගත යුතුයි. යම් දිනක පෙරවරු 6ත්, පස්වරු 6ත් අතර සේවයේ නියුක්ත කළ ස්ත්‍රියක් නැවත පස්වරු 10න් පසුව සේවයේ නියුක්ත නොකළ යුතුයි. රාත්‍රි කාලයේ වැඩ කරන සෑම ස්ත්‍රියකටම ඇය ලබා ගන්නා සාමාන්‍ය ගෙවීම මෙන් එකහමාරකට නොඅඩු ගෙවීමක් ලැබිය යුතුයි. රාත්‍රි කාලයේ වැඩ කරන කම්කරු ස්ත්‍රීන්ගේ සුබසාධනය පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා පාලිකාවන් පත් කළ යුතුයි. රාත්‍රි කාලයේ වැඩ කරන සෑම කම්කරු ස්ත්‍රියකටම සේවා යෝජක විසින් විවේක කාමර හා ආහාර සැපයිය යුතුයි. එක් මාසයක් තුළදී කිසිම ස්ත්‍රියක් දින 10කට වැඩියෙන් රාත්‍රි වැඩ සඳහා නියුක්ත නොකළ යුතුයි. මෙවැනි කොන්දේසි සහිතව, සේවා යෝජකයාගේ සහ සේවකයාගේ කැමැත්ත ලබා ගනිමින් තමයි මේ නියෝගය ගෙනැවිත් තිබෙන්නේ.

කාන්තාවන්ට රාත්‍රි කාලයේ සේවයේ යෙදෙන්න අවශ්‍යතාව තිබුණත්, ඒ කාන්තාවන්ට මෙච්චර කාලයක් ගැටලුවක් වෙලා තිබුණේ සේවයේ යෙදිලා නිවසට යන්න ප්‍රවාහන පහසුකම් නොලැබීමයි. දැන් අපි ඒ ගැටලුවට විසඳුම් දීලා තිබෙනවා. කාන්තාවකට රාත්‍රි කාලයේ පමණක් නොවෙයි, දහවල් කාලයේ වුණත් යන්න එන්න ප්‍රවාහන පහසුකම් නොමැති රටක තමයි අපි ජීවත් වෙන්නේ. හැබැයි, විදේශ රටවල තත්ත්වය නම් ඊට වෙනස්. ශ්‍රී ලාංකිකයින් පවා වෙනත් රටවලට සංක්‍රමණය වෙලා රැකියා කරන ආකාරය අපි දැකලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියගේ කථාවෙන් පසුව අවස්ථාව දෙන්නම්.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
විදෙස්ගත වී ස්වාමිපුරුෂයාත්, භාර්යාවත් රැකියා කරනවා, එහෙම නැත්නම් දෙදෙනා වෙන් වෙන් වශයෙන් රැකියා කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා නිහඬව වාඩිවෙන්න. ගරු මන්ත්‍රීතුමියට කථාව කරන්න ඉඩ දෙන්න.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
සමහර විට ස්වාමිපුරුෂයා රාත්‍රි කාලයේ සේවයේ යෙදෙනවා හෝ භාර්යාව දිවා කාලයේ සේවයේ යෙදෙනවා හෝ ඒ අය shift වශයෙන් වැඩ යොදාගෙන දරුවනුත් රැක බලාගෙන ඉන්නවා. අපේ රටේ සිටින ගම්බද කාන්තාවන්ටත් රැකියාවකට යෑමේ අවශ්‍යතාව තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් ඒ අයට රැකියාවකට යෑමේ අවස්ථාව අහිමි කරමින් බොහෝ විට දරුවන්ගේ රාජකාරි කරගෙන නිවසේ ඉන්න සිදු වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order!

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
එක් අයෙකුගේ ආදායමෙන් මුළු පවුලක් රැකගන්න අපහසු නිසා, එවැනි අවස්ථාවලදී වැඩිහිටි දෙමව්පියන්ට ඒ අයගේ නිදහස අහිමි වුණත්, වයස්ගත වුණත් තමන්ව රැකබලා ගන්නා දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ දරුවන් බලාගන්න සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්තුතියි.

මව උදේට වැඩට යනවා නම් පියාට පුළුවන්, දවල් වරුවේ දරුවෝ බලාගෙන ඉන්න. එහෙම නැත්නම් මව රාත්‍රි කාලයේ වැඩට යනවා නම් පියාට පුළුවන්, නිවසේ ඉඳලා දරුවෝ බලාගෙන ඉන්න. එතකොට පවුලේ ආර්ථිය නංවා ගැනීමට එම දෙදෙනාටම රැකියාවේ යෙදීමේ හැකියාවක් තිබෙනවා. මා ජීවත් වන මහනුවර ප්‍රදේශයේ සිටින කාන්තාවන්ට රැකියාවක් කිරීමේ අවශ්‍යතාව කොපමණක් තිබෙනවාද කියලා මං දන්නවා. කොළඹ ප්‍රදේශයේ සාප්පුවක හෝ ආපන ශාලාවක වැඩ කරන කාන්තාවන්ගෙන් හෝ ගැහැනු දරුවන්ගෙන් අහලා බලන්න, ඒ අයගේ ගම් ප්‍රදේශ කොහේද කියලා. ඒ අය මධ්‍යම කඳුකරයේ; අපේ ප්‍රදේශවල. ඒ අය මේ ප්‍රදේශවලට ඇවිල්ලා රැකියාවේ යෙදිලා ඉන්නවා. ඒ අයට ඉතාම වැදගත් අවස්ථාවක් තමයි අද මේ ලැබිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැන කථා කරනවා, - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order!

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
අද ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ, අවශ්‍ය දේ නොවෙයි මේ අය මෙතැන කථා කරන්නේ. අර මැක්කා ගැන කියනවා වාගේයි. මොන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න දුන්නත්, ලියන්නේ මැක්කා කළුයි, මැක්කා කුඩායි කියමින් මැක්කා ගැන. අන්න ඒ වාගේ තමයි මෙතැනත්. අද කිව්වේත් එවැනි කථා. වියනක් බැන්ද කෙනෙක් ගැන කථාවක් මන්ත්‍රීවරයෙක් කිව්වා. වියනක් බැන්ද කථාවට කියන්න තිබෙන්නේ මෙයයි. අපි උත්තරය හැටියට කියන්නේ නැහැ, ඩේසි ආච්චි මැණික් මල්ල ගැන කිව්ව දේ. අපට ඒවා කියන්න අවශ්‍යත් නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩිවෙන්න. ගරු මන්ත්‍රීතුමියගේ කථාව ඉවර වුණාම වෙලාව ලබා දෙන්නම්.

**ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
අපි පැහැදිලිව උත්තර දෙනවා. අපි මේ දේවල් කියන්නේ හේතු ඇතුව.

ඊළඟට කිව්වා, පෙළ පොතේ කථාවක් ගැන. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව තිබෙන පෙළ පොත්වල ධර්මචක්‍රය නැහැ කිව්වා. ඊයේ අපි මල්වතු සහ අස්ගිරි පාර්ශ්වයේ මහා නාහිමිවරුන් මුණ ගැහුණා. ගරු අගමැතිතුමිය තනිව නොවෙයි, මහනුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුනුත් ඒ සඳහා සහභාගි වුණා. ඒ අවස්ථාවේ ධර්මචක්‍රය ගැනත් කථා කළා. ඒ අනුමත, පිළිගත් ධර්මචක්‍රය තමයි පෙළ පොතේ ඇතුළත් කරලා තිබෙන්නේ.

ආණ්ඩුව හැටියටත්, කාන්තාවන් හැටියටත්, මේ රටේ කාන්තාවන්ගේ නිදහස ගැනත් අපි හිතනවා. රටේ දෙවැනි පුරවැසියා වෙච්ච අපේ අගමැතිනියගේ අයිතිවාසිකම්, නිදහස සහ ගරුත්වය වෙනුවෙනුත් අපි පෙනී සිටිනවා කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point of Order එක ගෙනෙන Standing Order අංකය මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ point of Order එක, ස්ථාවර නියෝග 11 යටතේ. රුපියල් මිලියන 15ක් පාවිච්චි කරනවා, එක දවසක් පාර්ලිමේන්තුව පවත්වන්න. දැන් Quorum එක බලන්නකෝ, කවුරුවත් ඉන්නවාද කියලා පාර්ලිමේන්තුවේ. එක්කෙනෙක්වත් නැහැ පාර්ලිමේන්තුවේ. 20ක් ඉන්න ඕනෑ. ගණන් කරලා බලන්න, 20ක් ඉන්නවාද කියලා. අපරාදේ මිනිස්සුන්ගේ සල්ලි. ගණන් කරලා බලන්න, 20ක් ඉන්නවාද කියලා. මම පැයක් විතර point of Order එකට අවස්ථාව ඉල්ලුවා. ඔබතුමිය ඇහුණේ නැහැ වාගේ headset එක දමාගෙන ඉන්නවා. ගණන් කරලා බලන්න, 20ක් ඉන්නවාද කියලා. මිනිස්සුන්ට ආපදාව වෙනුවෙන් සල්ලි දීලාත් නැහැ. රුපියල් 25,000 දෙන්නේත් නැහැ ඔයගොල්ලන්. හැබැයි, රුපියල් මිලියන 15ක් පාවිච්චි කරනවා, මේ පාර්ලිමේන්තුව ඇතුළේ. ගණන් කරලා බලන්න, කරුණාකරලා. මේ ඉස්සරහ පේළියේ කවුරුත් නැහැ.

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අර්ච්චුනා මන්ත්‍රීතුමා හිතාමතාම මේ සභාව අපහසුතාවට පත් කළා. *[බාධා කිරීමක්]* මෙතැන හිටපු මන්ත්‍රීවරු දෙදෙනාව දැනුවත් කර එළියට යවා තමයි මේ රීති ප්‍රශ්නය මතු කරන්නේ. මේ වාගේ සදාචාර විරෝධී වැඩ කරන්න එපා, මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා තමයි මේ සභාව, වරප්‍රසාද අවභාවිත කරන්නේ. තමුන්නාන්සේ අතැන හිටපු මන්ත්‍රීවරු දෙදෙනා එළියට යවලා මෙතැන මේ රීති ප්‍රශ්න ඉදිරිපත්

[ගරු ගමගෙදර දිසානායක මහතා]

කරන්නේ කොහොමද? තමුන්නාන්සේ අතැන හිටපු මන්ත්‍රීවරු දෙදෙනා එළියට යවලා තමයි මේ කැත වැඩේ කරන්නේ. *[බාධා කිරීමක්]* කැත වැඩ කරන්න එපා ඔය වාගේ. තමුන්නාන්සේලා තමයි මේ පාර්ලිමේන්තුව අවභාවිත කරන්නේ. තමුන්නාන්සේලාගේ කැත දේශපාලනය පාවිච්චි කරන්න එපා. අර මන්ත්‍රීවරු දෙදෙනාට කියලා එළියට යවලා, - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

[பி.ப. 2.40]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி! *[இடையீடு]* கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தயவுசெய்து, எனது நேரத்தை வீணடிக்க வேண்டாம். நான் உரையாற்றுவதற்கு ஆரம்பிக்கின்ற நேரம் பி.ப. 2.41. எனக்குரிய நேரத்தை நீங்கள் முழுமையாகப் பெற்றுத்தர வேண்டும். *[இடையீடு]* இடையீடு செய்யவேண்டாமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කරුණාකර සභාව නිහඬ වෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.*[බාධා කිරීමක්]*

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, என்னால் உரையாற்ற முடியாமல் இருக்கின்றது. *[இடையீடு]* கௌரவ உறுப்பினர்களே, நீங்கள் சண்டைபிடிப்பதால் இந்த உயரிய சபையில் என்னால் உரையாற்ற முடியாமல் இருக்கின்றது. இப்படியான செயற்பாடுகளை நிறுத்தும்படி தயவாகக் கேட்டுக் கொள்கின்றேன். எனக்கு 5 நிமிடங்கள் தரப்பட்டு இருக்கின்றது. இப்போதிருந்துதான் என்னுடைய நேரம் ஆரம்பிக்கப்படுகின்றது. தயவுசெய்து, எனது நேரத்தைக் குறைக்க வேண்டாமென கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

இந்த நாட்டின் பொருளாதாரத்துக்கு மிகவும் பங்களிப்புச் செய்கின்றவர்களாகப் பெண்கள் காணப்படுகின்றார்கள். இந்த நாட்டின் சனத்தொகையில் 51.7 சதவீதமானவர்கள் பெண்களாக இருக்கின்றார்கள். அதேபோல், ஊழியப்படையில் 34 சதவீதமானவர்கள் பெண்களாக இருக்கின்றார்கள். இந்த நாட்டின் பொருளாதாரத்துக்கு மிகவும் பங்களிப்புச் செய்கின்ற பெண்களை நாங்கள் பாதுகாக்க வேண்டும்; அவர்களின் உரிமைகளைப் பாதுகாக்க வேண்டும்; அவர்களுக்கான அடிப்படைச் சம்பளத்தை - வேதனத்தை - உறுதிப்படுத்த வேண்டும். அவர்களின் பாதுகாப்பென்பது உறுதிப்படுத்தப்பட வேண்டிய ஒன்றாக இருக்கின்றது. அந்த வகையில், இன்றைய தினம் இந்தச் சபையில் கொண்டுவரப்பட்டு இருக்கின்ற ஒழுங்குவிதிகள் உண்மையிலேயே பாராட்டுக்குரியது.

அடுத்து, கல்விச் சீர்திருத்தம் சம்பந்தமாகச் சொல்ல வேண்டும். புதிய கல்விச் சீர்திருத்தத்தை மேற்கொள்ளும் போது, தமிழர்களின் அடையாளம், கலை, கலாசாரம், பண்பாடு என்பன பேணிப் பாதுகாக்கப்பட வேண்டும். அதன் அடிப்படையில், இன்று காலையில் நாங்கள் கௌரவ பிரதமர் அவர்களுடன் கலந்துரையாடல் ஒன்றை மேற் கொண்டிருந்தோம். கடந்த ஆட்சிக் காலத்தில் தமிழர்ககளின் வரலாறு அழிக்கப்பட்டு இருந்ததுடன், அது வேறு விதமாக மாற்றப்பட்டும் இருந்தது. எங்களது வரலாற்றை அடுத்த சந்ததியினர் கற்க வேண்டும். எனவே, எமது வரலாற்றைத் திரிபுபடுத்தக் கூடாது என்பதை இந்த இடத்தில் தெளிவாகக் கூற விரும்புகின்றேன். இதன் அடிப்படையிலேயே மேற்குறித்த கலந்துரையாடலும் மேற்கொள்ளப்பட்டது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
இல்லை! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் ஒரு நிமிடம்தான் உரையாற்றி இருக்கிறேன்.

அடுத்து, உள்ளூராட்சி மன்றங்களில் பணிபுரியும் ஊழியர்கள் பற்றி கதைக்க வேண்டும். இன்று பல உள்ளூராட்சி மன்றங்கள் வலுவிழந்து இருக்கின்றன. குறிப்பாக, அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற ஆலையடி வேம்பு, திருக்கோவில், காரைதீவு, நாவிதன்வெளி, இறக்காமம் போன்ற உள்ளூராட்சி மன்றங்கள் வலுவிழந்து காணப்படு கின்றன. அதேபோல், வட மாகாணம் உட்பட ஏனைய மாகாணங்களிலும் எந்தவித வருமானமற்ற நிலையில் உள்ளூராட்சி மன்றங்கள் காணப்படுகின்றன. உள்ளூராட்சி மன்றங்களுக்குக் கிடைக்கின்ற வருமானத்தின்மூலம் அங்கு வேலைசெய்கின்ற ஊழியர்களின் சம்பளத்துக்கு 20 சதவீத பங்களிப்பைச் செய்ய வேண்டுமென இந்த அரசு கூறுகின்றது. ஆனால், எந்தவித வருமானமும் அற்றிருக்கின்ற உள்ளூராட்சி மன்றங்கள் எப்படி அந்த நிதியை வழங்குவது? அப்படி நிதியை வழங்க வேண்டுமென்றால், நீங்கள் அந்த உள்ளூராட்சி மன்றங்களுக்கு வருமானத்தை ஈட்டக்கூடிய வகையிலான திட்டங்களை வகுத்துக்கொடுக்க வேண்டும். அப்படிச் செய்யாமல், அந்தச் சபைகள் 20 சதவீதத்தை வழங்க வேண்டும் என்றால், எப்படி அந்தச் சபையால் அதைக் கொடுக்க முடியும்? இதனால் அந்தச் சபை மேலும் பின்தள்ளிப் போகின்ற நிலைமைதான் ஏற்படும். இதன் அடிப்படையில் தான் நாங்கள் சொல்கின்றோம், நீங்கள் அந்தச் சபைகளுக்கு வருமானத்தை ஈட்டக்கூடிய வழிகளை ஏற்படுத்திவிட்டு, இந்தத் திட்டத்தை மேற்கொள்ள வேண்டும் என்று. இல்லையேல், எந்தவிதமான அபிவிருத்தி வேலைத்திட்டங் களையும் செய்ய முடியாத துர்ப்பாக்கிய நிலைக்கு அச்சபைகள் தள்ளப்படும்.

அடுத்து, three-wheeler ஓட்டுநர்கள், விவசாயிகள், மீனவர்கள் உட்பட ஏனைய ஊழியர்களுக்கான அடிப்படைச் சம்பளத்தைச் சரியாக நிர்ணயிப்பதோடு, அவர்களுக்கான ஓய்வூதியத்தையும் ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

ஏனெனில், அவர்கள் 60 வயதுக்குப் பிறகு வலுவற்றவர்களாக மாறுவார்கள். எனவே, அவர்களுக்கான ஓய்வூதியத் திட்டத்தை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.46]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் தொழில் அமைச்சரினால் கொண்டுவரப்பட்டு இருக்கின்ற 1954ஆம் ஆண்டின் 19ஆம் இலக்க, கடைகள் மற்றும் அலுவலகப் பணியாளர்கள் (சேவைகள் மற்றும் ஊதிய ஒழுங்குமுறை) சட்டத்தின்கீழான ஒழுங்குவிதியானது உண்மையிலேயே வரவேற்கத்தக்கது.

இலங்கையின் குடித்தொகையில் பெண்கள் 51 சத வீதமாக இருந்தாலும், ஊழியப்படையில் அவர்களின் பங்களிப்பு 34 சதவீதமாகவே காணப்படுகின்றது. நாட்டின் வேகமான வளர்ச்சிக்குப் பெண்களின் பங்களிப்பைப் பெற்றுக் கொள்வதற்கும், அதற்குத் தேவையான வசதிகளை அவர்களுக்கு வழங்குவதற்கும், தொழில் பங்கேற்பில் அவர்களுக்கு அதிகப்படியான வாய்ப்பை வழங்குவதற்கும் நிலவும் சட்டக் குறைபாடுகளை நிவர்த்திசெய்வது காலத்தின் தேவையாகும். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2018ஆம் வருடத்துக்குப் பிறகு, இலங்கைக்கு அதிகமான சுற்றுலாப் பயணிகள் வருகைதந்த வருடம் 2025 ஆகும். அதாவது, 2,360,000க்கும் அதிகமான சுற்றுலாப் பயணிகள் இலங்கைக்கு வருகை தந்திருக்கிறார்கள். அவர்களின் தேவைக்கேற்ப வசதிகளை மேம்படுத்த வேண்டும். எமக்கு வருமானத்தை ஈட்டித்தருகின்ற பிரதான துறையாக சுற்றுலாத்துறை அமைந்திருக்கின்றது.

பெண்களை இரவு நேரத்தில் வேலைக்கு அமர்த்துவதற்குத் தேவையான சட்ட ஏற்பாடுகளை உருவாக்கிக் கொடுத்து, அவர்களின் தேவைகளைப் பூர்த்திசெய்து கொடுக்க வேண்டியது எமது அரசாங்கத்தின் பொறுப்பாகும். எமது நாட்டில் தொழில் இன்மையால் பாரியளவு பிரச்சினைக் குள்ளாகி இருப்பவர்கள் பெண்களாவர். அவர்களின் திறமைகளை இந்த நாட்டின் வளர்ச்சிக்குப் பயன்படுத்த வேண்டுமென்றால், அவர்களை இரவு நேர வேலைகளில் ஈடுபடுத்த வேண்டும். அதற்குத் தேவையான சட்ட ஏற்பாடுகளை அமைத்துக்கொடுப்பதே எமது நோக்கமாகும். தற்பொழுது, எமது நாட்டுக்கு அதிகளவில் சுற்றுலாப் பயணிகள் வருகைதந்துகொண்டு இருக்கின்றார்கள். அவர்களில் அதிகமான பெண்களும் உள்ளடங்குகின்றனர். அவர்களுக்கான சேவைகளைப் பெற்றுக்கொடுப்பதற்காக எமது பெண்களை வேலைக்கு அமர்த்துவது தொடர்பில் கொண்டுவரப்பட்டுள்ள இந்தச் சட்ட ஏற்பாடு உண்மை யிலேயே வரவேற்கத்தக்கது.

எமது நாட்டிலுள்ள அதிகமான பெண்கள் வேலை யில்லாமல் திண்டாடுகின்றார்கள். இவ்வளவு காலமும் அவர்களுக்கு சமூகம் மற்றும் சூழல்மீது எந்தவித நம்பிக்கையும் இருக்கவில்லை. இதனால் தமது பெண் பிள்ளைகளை இரவு நேர வேலைக்கு அனுப்புவதற்குப் பெற்றோரும் விருப்ப மில்லாமல் இருந்தார்கள். தங்குமிட வசதி, போக்குவரத்து வசதிகளைக் கொடுத்து, பாதுகாப்பையும் உறுதிப்படுத்தி, அவர்களை வேலைக்கு அமர்த்துவதற்காகவே இந்தச் சட்ட ஏற்பாடு கொண்டுவரப்பட்டுள்ளது. இவ்வாறான சட்ட ஏற்பாடுகளைக் கொண்டுவருவதன்மூலம் தோட்டப் புறங்களில் வாழ்ந்துகொண்டு இருக்கின்ற எமது மலையகப் பெண்களையும் இரவு நேர வேலைக்குப் பயமில்லாமல் அனுப்ப முடியும். அந்த வகையில், இந்தச் சட்ட ஏற்பாடானது எங்களது மக்களுக்கும் வருமான வழியை ஏற்படுத்தக் கூடியதாக அமையுமென நாம் நம்புகின்றோம். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சுற்றுலாத்துறை சார்ந்து பெண்களை இரவு நேரத்தில் வேலைக்கு அமர்த்துவது தொடர்பில் தொழில் அமைச்சரால் கொண்டுவரப்பட்டுள்ள இந்த ஒழுங்குவிதியை நிறைவேற்றுவது காலத்தின் தேவை யெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

විනාඩි 7ක් නොවෙයි, මට විනාඩි 9ක් තිබෙනවා. තව විනාඩි 2ක් වැඩි කළා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මේ ලේඛනයේ සඳහන් වන්නේ විනාඩි 7යි, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 2.51]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, වෙලාව වැඩි කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශේෂයෙන් කියන්න කැමැතියි, අද ඇති වුණු තත්ත්වය පිළිබඳව; විශේෂයෙන් අපේ ගරු කථානායකතුමා ඉදිරිපත් කරපු, Ruling එක පිළිබඳව. සම්පූර්ණයෙන් කරුණු වරදවා වටහාගෙන තමයි එතුමාගේ Ruling එක ඉදිරිපත් කර තිබෙන්නේ. මම දැන් සෑහෙන වෙලාවක් මෙය කියෙව්වා. මටත් හරිම කනගාටුවක් දැනුණා. මේ පාර්ලිමේන්තුවේ අපි හැම වෙලේම භාවිත කරන Erskine May පොතත් අනික් පැත්ත හරවා තමයි එතුමා එය ලියා තිබෙන්නේ. ඒකෙන් තේරෙනවා, වල් පැළ ගලවා මල් පැළ හිටවපුවාම, මල් පැළවලින් හැදුණු කථානායකතුමා ලියපු ලියවිල්ල කොහොමද කියලා.

අපි මුල ඉඳලාම කියපු කාරණාව මෙයයි. අපි මේ ක්‍රියාදාමයෙන් බලාපොරොත්තු වෙන්නේ වෙන දෙයක් නොවෙයි. මේ රටේ විනිශ්චයකාරවරුන් මාරු කිරීමේ ක්‍රමවේදය, උසස් කිරීමේ ක්‍රමවේදය මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුව - අපි- දැනගත යුතුයි. මොකද, මේ පාර්ලිමේන්තුව තමයි Judicial Service Commission එකට මුදල් වෙන් කරන්නේ. ඒගොල්ලන් වරින් වර පාර්ලිමේන්තුවට වාර්තා කරනවා.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මේ පාර්ලිමේන්තුවේ COPA එකට Judicial Service Commission එක ගෙන්වනවා. ඒ අය ඇවිල්ලා මේවා ගැන කරුණු ඉදිරිපත් කරනවා, ඒකේ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ administrative body එකක්, ඒක අධිකරණයක් නොවෙයි. කථානායකතුමා ඒක වරද්දාගෙන, ඒක අධිකරණයක් කියලා කියනවා, Erskine May කිව්වා කියලා. කථානායකතුමා කියනවා, *"Erskine May* states that the courts and Parliament are 'separate and independent' organs…" කියලා . Yes, මම පිළිගන්නවා අධිකරණයයි, පාර්ලිමේන්තුවයි කියන්නේ දෙකක් තමයි. හැබැයි අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ courthouse එකක් නොවෙයි, ඒක administrative body එකක්. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු විනිශ්චයකාරවරු තුන්දෙනෙකු එතැන ඉන්නවා. ඒකෙන් කරන ක්‍රියාදාමය පිළිබඳවයි අපි කථා කළේ. නිහාල් සෙනෙවිරත්න මැතිතුමා ඉන්න කාලයේ 2001දී තමයි අනුර බණ්ඩාරනායක මැතිතුමා ඒ Ruling එක දෙන්නේ. එතුමාගේ Ruling එකේ පැත්තකින්වත් තියන්න බැහැ මේ Ruling එක. දැන් කියනවා ඒවා ගැන කල්පනා කරලා ලු, මේක ලිව්වේ. සත පහකට වැඩක් නැහැ. මොකද, හේතුව? මේ තීන්දුව ගන්නකොට කාර්ය මණ්ඩලය එක්ක කථා කරලා තිබෙනවාද? ලේකම්තුමියත් එක්ක කථා කරලා තිබෙනවාද? ලේකම්තුමන්ලා එක්ක කථා කරලා තිබෙනවාද? උපදෙස් අරගෙන තිබෙනවාද? අනුර බණ්ඩාරනායක මහත්තයාගේ Ruling එක ලිව්වේ එච්.එල්. ද සිල්වා මහත්තයා එක්ක කථා කරලා, එතුමාගෙන් උපදෙස් අරගෙන. මේ කාගේ එකක්ද අරගෙන ඇවිල්ලා කියෙව්වේ?

මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි, අසාධාරණයට ලක් වුණු විනිශ්චයකාරවරුන්ට යන්න තැනක් නැහැ කියන එක. ඒගොල්ලන් කොහේටද යන්නේ? පැමිණිල්ල කරනවා අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු අධිකරණ සේවා කොමිෂන් සභාව. පැමිණිල්ල කළ එක්කෙනාම නඩුවත් අහලා නඩුවේ තීන්දුවත් දෙනවා. ඒක මාර ප්‍රශ්නයක් නේ. මේ රටේ විනිශ්චයකාරවරුන්ට තමන්ට වෙන අසාධාරණකම් කියන්න තැනක් නැහැ.

අපි මුල ඉඳලා පටන් ගත්තේ. මේ රටේ විනිශ්චයකාරවරුන්ගේ seniority list එකක් තිබුණා. High Court එකට, මහාධිකරණයට පත් කරනකොට ඒ seniority list එක පැත්තකට විසි කරලා පත්වීම් කළා. ඒ seniority list එකේ 35 දක්වා ගෙනාවා ඒ පත්වීම් කරනකොට, පුරප්පාඩු තිබුණේ 18ක් වුණත්. ඒක කොහොමද කළේ? ඒ seniority list එකේ ඉන්න පළමුවෙනි කෙනා ෆර්ඩිනැන්ඩස් මැතිනිය, එතුමිය පැත්තකට කළා. ලියනගේ මැතිතුමා හිටියා තුන්වෙනියාට, එතුමාව පැත්තකට කළා. හේවාවසම් මැතිතුමා දහතුන්වෙනියාට හිටියා, එතුමාව පැත්තකට විසි කළා. ජයසිංහ මැතිතුමා දාහත්වෙනියාට හිටියා, එතුමා පැත්තකට විසි කළා. දහඅට වෙනියාට හිටියා වීරසූරිය මැතිනිය, එතුමියවත් පැත්තකට කළා. මාරසිංහ මැතිතුමා දහනවවැනියාට හිටියා. එතුමාව පැත්තකට විසි කළා. විසිතුන්වැනියාට ඩයස් මැතිතුමා හිටියා, එතුමාවත් පැත්තකට විසි කළා. විසිහයවැනියාට නෙළුම්දෙනිය මැතිතුමා හිටියා, එතුමාව පැත්තකට විසි කළා. ආටිගල මැතිතුමා හිටියා විසිහත්වෙනියාට, එතුමාව පැත්තකට විසි කළා. ඊළඟට, ද සිල්වා මැතිතුමා හිටියා, එතුමාවත් පැත්තකට විසි කළා. ඒ seniority list එක ඒ විධියට පැත්කට විසි කරලා තමයි ඒ පුරප්පාඩු පිරෙව්වේ. අපි මේක ගැන තමයි ඇහුවේ, වෙන එකක් නොවෙයි. මෙහෙම පත්වීම් දුන්නාම මොකද වෙන්නේ? Judiciary එකේ පල්ලෙහා ඉන්න කට්ටිය කල්පනා කරනවා අපි ආණ්ඩුව කැමැති තීන්දු දුන්නොත් අපට උඩට යන්න පුළුවන්, අපි ආණ්ඩුව කැමැති තීන්දුවක් දුන්නේ නැත්නම් අපට හැම දාම එක තැන ඉන්න වෙනවා කියලා. ඉතින් මොකද වෙන්නේ? එතකොට විනිශ්චයකාරවරු මේ උසස්වීමේ ක්‍රියාපටිපාටියත් එක්ක විශාල බැඳීම්වලට ලක් වෙනවා, අපි ආණ්ඩුව සම්බන්ධයෙන් එන ඒවාට සහයෝගය දුන්නේ නැත්නම් ලොකු ප්‍රශ්නයක් වෙනවා කියලා.

දැනට සති කිහිපයකට කලින් අධිකරණ සේවා සංගමයේ රැස්වීමක් තිබුණා. ඒ රැස්වීමට කැඳෙව්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්. එම කොමිසමේ අධ්‍යක්ෂ ජෙනරාල් ඇවිල්ලා මහෙස්ත්‍රාත්වරුන්ට කියනවා, "අපි ගේන නඩු සම්බන්ධයෙන් ඇප දෙන්න ඔබතුමන්ලාට බලයක් නැහැ. මම මේ මහාධිකරණ විනිශ්චයකාරයෙක් විධියට කථා කරන්නේ. ඒක නිසා ඔබතුමන්ලාට බලයක් නැහැ අපි ගේන ඒවාට ඇප දෙන්න, ඔබතුමන්ලා ඇප දෙන්නේ නැතිව ඒගොල්ලන්ව රිමාන්ඩ් කරන්න" කියලා. එහෙම කොහොමද කියන්නේ? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් එනවා අධිකරණ සේවා සංගමයේ රැස්වීමට. ඇවිල්ලා එතුමා මහෙස්ත්‍රාත්වරුන්ට උගන්වනවා ඇප දීමේ බලය කොහොමද පාවිච්චි කරන්නේ කියලා. ඒ බලය තිබෙන්නේ මේ රටේ මහෙස්ත්‍රාත්වරුන්ට. ඒ ක්‍රියාදාමය ඉස්සරහට යනවා.

ඊළඟට, මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් දමිළ විනිශ්චයකාරවරු හතරදෙනෙකු ගෙනෙන්න හදනවා. එහෙම පුරප්පාඩු හෝ අවශ්‍යතාවක් නැහැ. මොකද, ඒගොල්ලන්ට ඇති වෙනකම් අවස්ථා තිබෙනවා. මේ මොකක්ද කරන්න හදන්නේ? ඒ අයව ගෙනැල්ලා මේ ඉන්න අයට ආපහු පයින් ගහලා එළවන්න තමයි මේ හදන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම ලෝකයේ Bangalore Principles of Judicial Conduct කියලා දෙයක් තිබෙනවා, Istanbul Declaration කියලා එකක් තිබෙනවා. අද ලෝකයේ හැම රටක්ම වෙනස් වෙලා තිබෙන්නේ. මේ රටේ විනිශ්චයකාරවරු මාරු කිරීමේ ක්‍රියාදාමය සම්පූර්ණයෙන් වෙනස් කරලා තිබෙන්නේ. ඒවාට අලුත් doctrines හැදිලා තිබෙනවා, අලුත් වැඩ පිළිවෙළ හැදිලා තිබෙනවා, මාරු කරන ක්‍රමවේදය හැදිලා තිබෙනවා. ඒවා මොකක්වත් මේකේ නැහැ, ඒ නිසා මේක විශාල අර්බුදයක්.

ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා නීතිඥ සංගමය කියන්නේ මොකක්ද? "The BASL emphasizes the importance of a transparent and fair system in the granting of promotions and appointments in the Judiciary. Such a system is vital to maintaining public confidence in the Judiciary and ensuring that the administration of justice remains impartial and credible." Credible and impartial judgments ලැබෙන්න නම් මේ මාරු කිරීමේ ක්‍රමවේදය හදන්න කියලා ශ්‍රී ලංකා නීතිඥ සංගමය - Bar Association එක - ජනාධිපතිතුමාට ලියුමක් යවනවා. එහෙම නම් ඒගොල්ලනුත් අල්ලාගෙන ගිහින් නඩු දමන්න. මේ විධියට කටයුතු කරන්න එපා.

තමුන්නාන්සේලා කියනවා, අපි මේ ගැන කථා කරන්නේ අද Judiciary එක අපරාධකරුවන් අල්ලන නිසා කියලා. අනේ, අපට කිසි ප්‍රශ්නයක් නැහැ. ඊළඟට වැඩියෙන්ම හොරකම් ටික තිබෙන්නේ තමුන්නාන්සේලාගේ. බිමල් රත්නායක මහත්මයා මෙතැන ඇවිල්ලා කථා කරනවා. කන්ටේනර් 323ක් පන්නපු සිද්ධියට අදාළව දැන් නඩුවක් යනවා. තවම ඒ සම්බන්ධයෙන් ගත්තු තීරණයක් නැහැ. ඇමතිවරුන් හයදෙනෙකුට විරුද්ධව ලංකාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* කවුද මේ කථා කරන අය? මේ කථා කරන්නේ, 1988-1989 කාලයේ මේ රටේ අධිකරණ විනාශ කරපු මිනිස්සු. ඒ කාලයේ අධිකරණ විනාශ කරලා, අධිකරණවලට ගිනි තියලා, ඒ පොත් පත්වලට ගිනි

තියලා තමන්ම නඩු ඇහුවා. එහෙම කරපු මිනිස්සු දැන් ඇවිල්ලා කථා කරනවා, අධිකරණයේ ස්වාධීනත්වය ගැන. මට හිනා යනවා, ඔය පැත්තේ අය ඒවා ගැන කථා කළාම.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අධිකරණයට ක්‍රියාත්මක වෙන්න දෙන්න. අපට ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපි දන්නවා අධිකරණයේ අද මේ කරන උසස්වීම් සම්බන්ධයෙන් අර්බුද විශාල සංඛ්‍යාවක් මතු වෙලා තිබෙන බව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඔබතුමියගෙන් තවත් විනාඩියක් ඉල්ලා සිටිනවා.

මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව Parliamentary Business Committee එකේදී කථා කළේ නැහැ. එහෙම කථා කරන්නේ නැතුව කථානායකතුමා ඇවිල්ලා ඒ තීන්දුව දුන්නා. ඒ නිසා මම කියන්න කැමැතියි, අසාධාරණයට ලක් වුණු විනිශ්චයකාරවරුන් සම්බන්ධව නිවැරදි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරන්න කියලා. මොකද, විශාල සංඛ්‍යාවක් මේ ක්ෂේත්‍රයෙන් බලහත්කාරකමින් එළියට තල්ලු කරලා තිබෙනවා. ඒ නිසා ඒක නිවැරදි වෙන්න ඕනෑ. මම නීතිඥයෙකු විධියට මේ කාරණය කියන්න කැමැතියි. අපි මේ සෑම විනිශ්චයකාරවරයෙකුගෙන්ම බලාපොරොත්තු වෙනවා, සාධාරණයක්, නිවැරදි ඇහුම්කන් දීමක්, සාධාරණ නඩු විභාගයක්. සාධාරණ නඩු විභාගයක් විනිශ්චයකාරවරුන්ටත් ලැබෙන්නේ නැත්නම්, මේ රටේ නීතියට හා යුක්තියට දෙවියන්ගේම පිහිටයි! ඒ ගැනත් සඳහන් කරමින්, මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.00]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

අද දින විවාදයට ගැනෙන්නේ, සාප්පු සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනත යටතේ වන නියෝගයක් ගැනයි. මීට පෙර අදහස් දක්වපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා මේ නියෝගය පිළිබඳව, සේවකයන්ගේ අවස්ථා පුළුල් කිරීම පිළිබඳව එකදු වචනයක් හෝ කථා කරන්නේ නැතුව, බොහෝදුරට වෙනත් ක්ෂේත්‍ර වෙත අවධානය ගෙන ගියා. ඒක ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, අපි විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ, මේ නියෝගයෙන් සිද්ධ කරන්නේ මොකක්ද කියන එක පිළිබඳව.

දැනටමත් 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) පනතට සිදු කරන ලද සංශෝධනයක් මඟින් අමුත්තන් පිළිගැනීම, සනීපාරක්ෂක සේවා ආදි වශයෙන් රැකියා කටයුතු කිහිපයක් සම්බන්ධයෙන් කාන්තාවන් රාත්‍රි කාලයේ සේවයේ යෙදවීමට අවස්ථාව දීලා තිබෙනවා. මේ අවස්ථාවේදී අපි රට ස්ථායීකරණය කරලා, ආර්ථිකය ප්‍රසාරණය කරන කොට, ආර්ථික ක්‍රියාකාරකම්වලදී විශේෂයෙන්ම හෝටල් කර්මාන්තයේ ක්‍රියාකාරකම් වැඩි දියුණු වෙනවා. ඒ නිසා ආහාර පාන සැපයීමට වැඩි කාල වේලාවක් හෝටල් විවෘත කර තබන්න සිද්ධ වෙනවා. මහජනතාව ආර්ථික ක්‍රියාකාරකමක නියැළෙනවා නම්, ශ්‍රම බලකාය පුළුල් වෙන්නේ එතැනින්. ඒ අනුව තමයි, ආර්ථික වර්ධනය -වෘද්ධිය- අත්පත් කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසාම ඒ ක්ෂේත්‍රයේ ඉන්න ව්‍යාපාරික කණ්ඩායම්වලින්, හාම්පුතුන්ගෙන් වාගේම සේවකයන්ගේ වෘත්තීය සමිතිවලිනුත් මේ සම්බන්ධව ඉල්ලීමක් ආවා. ඒ වාගේම ජාතික කම්කරු උපදේශක සභාවේදීත් මේක සාකච්ඡාවට බඳුන් වුණා. ඒ නිසා ඒ කාලීන අවශ්‍යතාව සැලකිල්ලට භාජන කරලා, ආහාර පාන පිළිගන්වන්නියන්ට රාත්‍රි කාලයේ වැඩ කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් නීතිමය වශයෙන් තිබුණු බාධකය ඉවත් කිරීම තමයි, මේ නියෝගයෙන් සිදු කරන්නේ. ඒ නීතිමය බාධකය ඉවත් කරන කොට සවස 6.00ත් උදේ 6.00ත් අතර වේලාවක, විශේෂයෙන් රාත්‍රි කාලයේදී කාන්තාවන් සේවයේ යෙදවීම සම්බන්ධව අපේ සමාජයේ ප්‍රශ්නයක් තිබෙනවා. සමාජයීය සහ සංස්කෘතික වශයෙන් ප්‍රශ්නයක් තිබෙනවා, කාන්තාවන් රාත්‍රි කාලයේ සේවයේ යෙදවීමට ඉඩ දීමේදී ඒ අයගේ අනාරක්ෂිත බව සම්බන්ධයෙන් ගැටලු පැන නඟීවිද කියලා. ඒ නිසා මේ නියෝගයට අපි විශේෂයෙන් ඇතුළත් කළා, හෝටල් කර්මාන්තයේ වැඩ කටයුතුවලදී ඉහත කී කාලය තුළ කාන්තාවන් සේවයේ යෙදවීමේ අවස්ථාවක් නිර්මාණය වෙනවා නම්, ඒ අයගේ සේවා මුරය අවසාන වුණාට පසුව එක්කෝ ඒ කියන කාණ්ඩයේ ඉන්න කාන්තාවන්ට සුදුසු නවාතැන් පහසුකම් ලබා දිය යුතු වෙනවා. ඒ සඳහා ඔවුන් බැඳී සිටිනවා. එහෙම නැත්නම් ඉතා ආරක්ෂා සහිතව ඒ අයගේ සුපුරුදු වාසස්ථානයට යෑම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම ලබා දෙන්න ඕනෑ. අන්න ඒ පරමාර්ථ පෙරදැරි කරගෙන තමයි අද අප මේ සංශෝධන ටික සිදු කරන්නේ.

ඒ වාගේම මේ රාජ්‍යය පවත්වාගෙන යෑමේදී අපේ ආණ්ඩුව යටතේ කරන මේ පුළුල් පරිවර්තනයේදී අවධානය යොමු කරන තවත් ක්ෂේත්‍රයක් තමයි කම්කරු ක්ෂේත්‍රය. කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධ වෙලා තිබෙන්නේ, ශ්‍රමයත් එක්ක; ශ්‍රම බලකාය සහ මානව සම්පතත් එක්ක. වඩාත් දියුණු මානව සම්පතක් හැදීමේදී ශ්‍රම බලකාය විසිනුත් ජාතික ආර්ථිකයට විශාල පංගුවක් එකතු කරනවා. අපට විශේෂ හැකියාවක් තිබෙනවා, ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කර ගැනීම සඳහා. ඒ අනුව, අදාළ වූ වෙනත් වැඩ කටයුතු කරන ගමන් අපි විශේෂයෙන් කම්කරු අමාත්‍යාංශය හරහා මෙවැනි සංශෝධන විටින් විට ගෙන එනවා.

අතීත අත්දැකීම්වලට අනුව පෙනෙනවා, ගැටුම් නිර්මාණය වන පරිසරයක් හදලා කම්කරු අමාත්‍යාංශය හරහා ඒ ගැටුම්වලට උත්තර හොයන තැනකට තල්ලු වෙලා තිබුණු බවක්. අපි ඒ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

තත්ත්වය වෙනස් කරන්න යුහුසුළු වුණා; මැදිහත් වුණා. අපි ආණ්ඩුව ලබා ගන්න කොට, කම්කරු අණ පනත් ගණනාවක් කැඳ හැළියක් වාගේ එකට එකතු කරලා, එක ගොඩේ සම්මත කර ගන්න කටයුතු කරලා තිබුණා. හැබැයි ඒක විධිමත් වුණේ නැහැ. ඒ නිසාම විරෝධතාවන් පැන නැඟිලා තිබුණා. ඒ වාගේම වෘත්තීය සමිති ඒක ප්‍රතික්ෂේප කරලා තිබුණා. අපි මොකක්ද කළේ? ඒකත් එක්කම සමගාමී වන විධියට ඒ අණ පනත් එකතු කරලා, වඩාත් හොඳ විධියට, කාර්මික සාමයක් ඇති වන විධියට, නිෂ්පාදන සම්බන්ධතාවක් ගොඩ නැඟෙන විධියට ඒ අණ පනත් සංශෝධනය කළ යුතුයි කියලා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අරගෙන ඒ සඳහා කමිටුවක් පත් කළා. ඒ විද්වත් කමිටුවේ සාමාජිකයින් 17දෙනෙකු, මේ වන කොට අවස්ථා 10කදී මා මුණගැහිලා තිබෙනවා. ජනවාරි 15වන දාත් රැස්වීමක් යොදාගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ කියන පනත සංශෝධනය කරන්න. ඒක ඉතාම ඉදිරිගාමී පියවරක්. එය, ප්‍රධාන ක්ෂේත්‍ර 4ක් ඔස්සේ සංශෝධනය වෙමින් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා නීතිගත කිරීම සඳහා සම්මත කර ගැනීමට. සේවා ස්ථානය පිළිබඳව labour standards කියලා ලෝක පරිමාණයෙන් විවිධ වූ ආයතන දැන් ප්‍රමිතීන් හදාගෙන තිබෙනවා. වැඩ ලෝකය ඇතුළේ වැඩ කරන්න පුළුවන් වඩාත් හොඳ පරිසරයක් හැදෙන්න ඕනෑ. අපි ඒ standards අනුගමනය කරන්නේ කොහොමද කියා සාකච්ඡා වෙමින් තිබෙනවා.

ඒ වාගේම ඔවුන්ට වැඩ කටයුතු කිරීමේදී වෘත්තීය ආරක්ෂාව, සෞඛ්‍ය සම්පන්න වැඩ බිමක්, වෘත්තීය පරිසරයක් තිබෙන්න ඕනෑ. එහෙම නැතිව ඔවුන්ගේ ඵලදායීතාව ඉහළ යන්නේ නැහැ. මේ කලාපය ගත්තාම, ලංකාවේ නිෂ්පාදන ඵලදායීතාව සැහෙන දුරට අභියෝගයට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා වැඩ කරන වෘත්තීය පරිසරය සෞඛ්‍යයෙන් ඉහළ, ආරක්ෂාව තිබෙන තත්ත්වයකට පරිවර්තනය කරන්න ඕනෑ. ඒ සඳහාත් අපි මේ නීතියේ එක් ක්ෂේත්‍රයක් යොමු කරනවා. වෘත්තීය ආරක්ෂාව සහ වෘත්තීමය සෞඛ්‍ය පිළිබඳ කාරණයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය 2021දී සම්මුතියක් හඳුන්වා දුන්නා. ඒ තමයි සේවා ස්ථානයේ තිබෙන ප්‍රචණ්ඩත්වය සහ හිංසනය පිටු දැකීම සඳහා වූ C190 කියන සම්මුතිය. ඒ සම්මුතිය 2021දී තමයි හඳුන්වා දීලා තිබුණේ. නමුත් පැවැති ආණ්ඩු ඒ සඳහා අපරානුමතිය ලබා දීලා තිබුණේ නැහැ. නමුත් අපි වේගයෙන් අනෙකුත් වැඩ කටයුතු කරන ගමන් ඒ සඳහා අපරානුමතිය ලබා දුන්නා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන. ඒ වෙනුවෙන් වූ සුවිශේෂී උත්සවයක් ඊයේ පැවැත්වුවා, ජාත්‍යන්තර කම්කරු සංවිධානයත්, අනෙකුත් ජාත්‍යන්තර ආයතනත් සම්බන්ධ වෙලා. ඒ සඳහා අපේ ගරු කම්කරු නියෝජ්‍ය ඇමතිතුමාත් සම්බන්ධ වුණා ඔබතුමන්ලා දකින්න ඇති. අපි, ඒ ආකාරයට ඒ දෙවැනි ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමු නොකළහොත් වැඩ බිමේදී අනතුරට පත් වීම නිසා එක පැත්තකින් ඵලදායිතාව අහිමි වෙනවා; අනෙක් පැත්තෙන්, සේවකයන් රෝගාතුර වුණොත්, ඒ සඳහා යන වැය බර රටකට, රාජ්‍යයකට හොඳ දෙයක් නොවෙයි. ඒ නිසා අපි ඒ ගැනත් අවධානය යොමු කරනවා.

තුන්වැනි ක්ෂේත්‍රය තමයි, හොඳ කාර්මික සම්බන්ධතාවක් ඇති කර ගැනීම. මේ නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ ප්‍රධානම පාර්ශ්ව දෙක තමයි හාම්පුතා සහ සේවකයා. ඔවුන් නියෝජනය කරන වෘත්තීය සමිති අතර තිබුණේ විශේෂයෙන්ම එකිනෙකා ගැටෙන පරිසරයක්. ඔවුන් ඒ ගනුදෙනු බේරා ගත්තේ, නීති රීති හැදුවේ, තමන්ගේ වරප්‍රසාද හදා ගත්තේ කේවල් කිරීමේ ක්‍රියා පටිපාටිය තුළ ගැටුම්කාරී පරිසරයකයි. අද අපට පළමුවැනි වතාවට පුළුවන් වෙලා තිබෙනවා, ජාතික කම්කරු උපදේශන සභාව තුළ සමහර සේවකයන් වෙනුවෙන් වෘත්තීය සමිතිවලින් ගෙන එන යෝජනා අනුමත කරන්න. හාම්පුතුන්ගේ පැත්තෙන් හෙවත් සේවා යෝජකයන්ගේ පැත්තෙන් ඒ වෙනුවෙන් සහයෝගය ලබා දෙනවා. ඒ සඳහා ඉතාම හොඳ නැඹුරුතාවක් දකින්නට තිබෙනවා. එයින් අදහස් කරන්නේ අපි අයිතිවාසිකම් දිනා ගන්න කලින්, අපේ වටිනාකමට වැඩි ප්‍රතිලාභ ප්‍රමාණයක් ගන්න කලින්, රටේ නිෂ්පාදනයේ ඵලදායිතාව ඉහළට ගන්න නම් අපි ඔක්කෝම එකට එකතු වෙලා මේ කටයුත්ත කරන්න ඕනෑ කියන එකයි.

එම නිසා කම්කරු නීතිරීති, අණපනත් සම්පාදනය කිරීමේ මූලික පරමාර්ථය බවට පත් වෙනවා, වඩාත් හොඳ, සාමකාමී කාර්මික සම්බන්ධතාවක් ගොඩ නඟා ගැනීම. ඒ වාගේම නව කම්කරු නීති අතරේ වෘත්තීය සමිතිවලට මැදිහත් වීමට, ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටීමට, නව අදහස් ඉදිරිපත් කිරීමට, සමහර තීන්දු තීරණ ගන්නකොට කළමනාකරණ මණ්ඩලවලට පවා ඔවුනුත් ඉදිරියේදී ගෙන ඒමට අවස්ථාව අපි නිර්මාණය කරනවා. ඒ සඳහා වෘත්තීය සමිති පැත්තෙන් අවශ්‍ය නීතිරීති සකස් කරමින් තිබෙනවා. මේ වෙනකොට ඒ දළ කෙටුම්පත සකස් කිරීම අවසාන කරලා තිබෙනවා. ජනවාරි 27වැනි දා ජාතික කම්කරු උපදේශක සභාවට ඒක ඉදිරිපත් කරලා, ඒ කමිටුවත්, ඒ උපදේශක සභාවත් ඒ පිළිබඳ සාකච්ඡා පවත්වනවා. ඉන් අනතුරුව එය මහජනතාවට විවෘත කරලා ඒ කෙටුම්පතේ අවසාන කටයුත්ත කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මා කලින් සඳහන් කළා වාගේ මේ රජයේ ප්‍රධාන අරමුණක් වෙච්ච ශ්‍රම බලකාය පිළිබඳ දත්ත විශේෂ අවධානයකට ලක් කරන්න ඕනෑ. අපේ රටේ ජනගහනය පිළිබඳ 2025දී ඉදිරිපත් කරපු නවතම සංඛ්‍යා දත්ත ලේඛනයට අනුව ජනගහනය මිලියන 21.9ක් ඉන්නවා. එයින් ශ්‍රම බලකායට ඇතුළත් වෙන්නේ අඩු ප්‍රමාණයක්; මිලියන අටයි දශම ගණනක්. එයිනුත් කාන්තා ශ්‍රම බලකාය තිබෙන්නේ මිලියන 2.6ක්. ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත්, කාන්තා ශ්‍රම බලකාය සියයට 34ක් වාගේ ප්‍රමාණයක් තිබෙන්නේ. සමස්ත ජනගහනය ගත්තොත්, කාන්තා ශ්‍රම බලකාය මුළු ජනගහනයෙන් **සියය**ට 12.5ක් විතර තිබෙන්නේ.

කාන්තාවට විශේෂ වූ හැකියා, දක්ෂතා තිබෙනවා. ඔවුන්ට වැඩ කිරීමේ පරිසරය අපි නිර්මාණය කරලා දෙන්න ඕනෑ, ආරක්ෂාව නිර්මාණය කරලා දෙන්න ඕනෑ. සමාජීය වශයෙන් ඔවුන්ට ඒ අවස්ථා නිර්මාණය කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම සඳහා වූ වැඩකටයුතු අපි කරමින් ඉන්නවා. එපමණක් නොවෙයි, ඔවුන්ට රැකියාවට යෑමට අවස්ථාව නිර්මාණය කරලා දෙන්න ඕනෑ. අපි සුරැකුම් ආර්ථිකයක් පිළිබඳ සාකච්ඡා කරන්නේ ඒ නිසායි. ඔවුන්ගේ ගෙදර තිබෙන වැඩකටයුතු පහසු කර ගන්නේ කොහොමද, දරුවන්, දෙමව්පියන් රැක බලා ගැනීමේ ක්‍රම පිළිබඳව අපි ඉදිරියේදී යෝජනා ඉදිරිපත් කරනවා. ඒ වාගේම අපි දන්නවා කාන්තාවන් සේවයේ නියුක්ත වනකොට ගර්භිණී අවස්ථා වනකොට සමහර අය ඒගොල්ලන් වැඩට යොදවා ගන්න අකමැති වෙනවා කියලා. අපි කම්කරු අමාත්‍යාංශය විධියට සාකච්ඡා පවත්වමින් ඉන්නවා, සමාජ සුරක්ෂිතභාවය ආරක්ෂා කරලා ඒ වෙනුවෙන් මැදිහත් වීමක් කරන්නේ කොහොමද කියලා. කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම පිළිබඳ දැනට සමාජයේ බයක් නිර්මාණය කරනවා, කාන්තාවක් රාත්‍රියේදී රැකියාවේ යොදවන්න පුළුවන්ද කියලා. එයින් ගම්‍ය වන කාරණය තමයි රාත්‍රියේදී රැකියාවේ යෙදවීමෙන් ඒ අය අනතුරට පත් වෙනවා, තර්ජනයට ලක් වෙනවා, හිංසනයට පත් වෙනවා කියන කාරණය. එම නිසා අපි බලාපොරොත්තු වෙන්නේ එවැනි පරිසරයක් නිර්මාණය කරලා හිංසනයට පත් වෙන නීතිරීති ගෙන එනවාට වඩා, ඉදිරියේදී වඩාත් යහපත් විධියට කාන්තාවට

ගරු කරන, ආරක්ෂාව සහතික වෙච්ච සමාජයක් නිර්මාණය කරන්නයි. ඒ සඳහා මූලික පියවරක් විධියට අද ගෙනෙන ලද සංශෝධනය දායක වෙයි කියලා බලාපොරොත්තු වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
න්‍යාය පත්‍රයේ විෂය අංක 80 ඉදිරිපත් කිරීම, ගරු අමාත්‍යතුමා.

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 01 දිනැති අංක 2465/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.12.19 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විවාදය ආරම්භ කිරීම, ගරු කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

[අ.භා. 3.13]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගැන කෙටි හැඳින්වීමක් කරන්න මම කැමැතියි. "දිට්වා" සුළි කුණාටුවත් එක්ක ඇතිවෙච්ච ආපදා තත්ත්වය හමුවේ විපතට පත්වෙච්ච අයට විවිධ පරිත්‍යාගශීලීන් විසින් භාණ්ඩ ලබා දුන්නා. භාණ්ඩ කන්ටේනර් විශාල ප්‍රමාණයක් ආවා. ඒ භාණ්ඩ ලබා දීමේදී අතිවිශාල ප්‍රමාණයෙන් ලැබුණු ආධාරත් සමඟ යම් ආකාරයකින් ඒවා නිදහස් කර ගැනීමට ගත වන කාලයත් සමඟ ජනතාවට සහන සැලසීමේදී ඇති විය හැකි ප්‍රමාදය වැළැක්වීම සඳහා තමයි මෙම රෙගුලාසි ඉදිරිපත් කරනු ලැබුවේ. ජනාධිපති ලේකම් කාර්යාලයේදී මේ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න තීරණයක් ගත්තා. ඒ අනුව කාරණා දෙකක් ඉදිරිපත් කරනවා, මේ රෙගුලාසි තුළින්.

එකක් තමයි, විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයෙන් ප්‍රකාශයට පත් කර ඇති මාර්ගෝපදේශ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නමින් හෝ ඕනෑම රජයේ ආයතනයක් නමින් ලැබෙන භාණ්ඩමය පරිත්‍යාග නිදහස් කර ගැනීම පිළිබඳ රෙගුලාසි. එහිදී ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා තිබෙන භාණ්ඩ හැර අනෙකුත් පාලන බලපත්‍රවලට යටත් වන භාණ්ඩ ශ්‍රී ලංකා රේගුව සමඟ සෘජුවම සම්බන්ධ වී හෝ, එහෙම නැත්නම් ආනයන හා අපනයන පාලක ජනරාල්තුමාගේ විමසීමෙන් නිදහස් කර ගැනීමේ අවස්ථාව ලබා දී තිබෙනවා.

ඒ වාගේම 2023 සිට තහනම් කර ඇති සහල්, දම්වැල් කියත් - chainsaws - සහ එක්වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් - single-use plastics - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හෝ රජයේ ආයතනයක් නමින් සහනාධාරයක් ලෙස ලැබෙන විට නිදහස් කිරීමට මේ රෙගුලාසිවලින් ඉඩ ලබා දී තිබෙනවා.

තුන්වැනි කාරණය තමයි, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේ අනුමැතියට යටත්ව තිබුණු සමහර ආහාර ද්‍රව්‍ය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නැතිව ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේ අනුමැතියෙන් නිකුත් කිරීමට අවස්ථාව ලබා දී තිබීම. මේකත් එක්කම තවත් විශේෂ රෙගුලාසියක් ආවා. අපි දන්නවා, "සුව සැරිය" ගිලන් රථ සේවාව පිළිබඳව. එය පසුගිය කාලයේ සැහෙන්න කථා බහට ලක් වුණා; සුව සැරිය වහන්න යනවාද, සුව සැරියේ නම වෙනස් කරනවාද කියලා ලොකු ප්‍රශ්න ආවා. අපි එහිදී පැහැදිලිව ප්‍රකාශ කළා, අපට එහෙම අරමුණක් නැහැ, ඒ වෙනුවට සුව සැරිය තවත් පුළුල් කරමින් වඩා පහසුකම් සහිතව ජාත්‍යන්තර මට්ටමෙන් ක්‍රියාත්මක

[ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය]

කිරීම තමයි කරන්නේ කියලා. සුව සැරිය පදනමට ප්‍රදාන වශයෙන් නොමිලයේ ගිලන් රථ ලබා ගැනීම සඳහා 2024දී අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලැබුණා. ඉන්දියාවෙන් නොමිලයේ ලැබෙන සුව සැරිය ගිලන් රථ එන්නේ, airbags නැතිවයි. ඒ වාගේ වාහන ලංකාවේ ආනයනය කිරීමට විශේෂ අනුමැතියක් කැබිනට් මණ්ඩලයෙන් ලබා දී තිබුණා. වායු බැලුන නොමැති, ලියාපදිංචි නොකළ නවතම ගිලන් රථ 150ක් මෙවර අපට ලැබෙනවා. ඒ ගිලන් රථ රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා රෙගුලාසි සකස් කර තිබෙනවා.

අපි දන්නවා, මේ අවස්ථාවේ -මේ මොහොතේ- මේ වාගේ රෙගුලාසි අපට වැදගත් වෙන්නේ ඇයි කියලා. මොකද, අපට පසුගිය කාලයේ විශාල ප්‍රමාණයක් ආධාර ආවා, භාණ්ඩ සහ මුදල් වශයෙන්. ආධාර වශයෙන් ගත්තොත්, අපි පැහැදිලිවම කියන්න කැමතියි, විදේශවල සිටින ලංකාවේ ජනතාවගෙන් වාගේම විදේශ රටවලිනුත් ආධාර වශයෙන් අපට භාණ්ඩ විශාල ප්‍රමාණයක් ලැබුණු බව. ආපදා ගැන විශේෂයෙන් කථා කරන නිසා මම කියන්න කැමතියි, "Rebuilding Sri Lanka" කියන අපි හදපු අලුත්ම අරමුදලට දෙස් විදෙස් ජනතාවගෙන් මුදල්මය වශයෙන් විශාල ආධාර ප්‍රමාණයක් ලැබුණු බව. අන්තිමට ගත්ත දත්ත අනුව මේ වන විට රුපියල් බිලියන 4.1ක් මුදල්මය වශයෙන් එක් රැස් වී තිබෙනවා, දේශීය සහ විදේශීය ආධාර ඇතිව. මේවා ලැබුණේ එක් එක් රටවලින් ලබා දීපු විශේෂ ආධාර සහ උපකාරවලට අමතරවයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතින් අපි දන්නවා, විශාල මුදල් ප්‍රමාණයක් අපට ගලාගෙන එන්න එක ප්‍රධාන හේතුවක් තමයි රජය කෙරෙහි ප්‍රධාන වශයෙන්ම විදේශයන්හි ඇති වී තිබෙන විශ්වාසය. ඒ කියන්නේ අර ඉස්සර කාලයේ Helping Hambantota අරමුදලට එකතු වුණා වාගේ යම් ආකාරයකට එන මුදල් කොහේ යයිද කියන විශ්වාසය මිනිස්සු අතර නැතිව තිබුණු යුගයක් තිබුණා. නමුත් මහජන විශ්වාසය, අන්තර් ජාතිකව අපට ලැබී ඇති විශ්වාසය තහවුරු කරගෙන රජයක් ලෙස විනිවිදභාවයකින් යුතුව මෙම අරමුදල් රැක්කිරීමට අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අරමුදල් යම් ආකාරයකට පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට යටත් වෙන්න ඕනෑ. මොකද, මහජන මුදල්වල අධීක්ෂණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි මේ වන විට නීති කෙටුම්පත් සම්පාදනය කරනවා. ඒ අනුව ඉදිරියේදී එම අරමුදල් කළමනාකරණය කිරීම සඳහා පාර්ලිමේන්තුවට නීතිමය කෙටුම්පතක් ගෙන එන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඒ මුදල් පැහැදිලිවම දැනට විගණනයට යටත්ව මහා භාණ්ඩාගාරයේ වෙනම ගිණුමක තැන්පත් වෙනවා. ඒ වාගේම තමන් මේ ගිණුමට මුදල් දීලා තිබෙනවා නම්, ඒ පිළිබඳව ජනතාවට දැනගත හැකි ආකාරයේ සහ Rebuilding Sri Lanka, ඒ කියන්නේ යළි ගොඩනැගීම පිළිබඳව නවතම යාවත්කාලීන තොරතුරු සහිත website එකක් ලබන සතියේ අපි ජනතාවට විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා.

ඉතින් ඒකත් එක්ක කියන්න ඕනෑ, අපි බලාපොරොත්තු වුණාට වඩා මේ රට ඉතා ඉක්මනින් ගොඩනැගෙමින් පවතින බව. ලංකා ඉතිහාසයේ ස්වාභාවික ආපදා ගොඩාක් සිදු වුණා. සුනාමි ආවා; නාය ගියා; යුද්ධ තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හැම එකකදීම මේ තරම් ඉක්මනින්, ඒ කියන්නේ සති හයක් වාගේ කාලයකදී නිවාස ව්‍යාපෘතියක් පටන් ගන්න කිසිම රජයක් සමත් වෙලා නැහැ. අද දිනයේ ගරු ජනාධිපතිතුමා අනුරාධපුර සහ කුරුණෑගල ප්‍රදේශවලදී මේ "Rebuilding Sri Lanka" යටතේ නව නිවාස ගොඩනැගීමේ ව්‍යාපෘතිවලට උත්සවාකාරයෙන් මුල්ගල් තැබුවා. ඒ වාගේම රුපියල් ලක්ෂ 50 චෙක්පත් බෙදාදීම සිදු කළා. ඒකත් එක්ක අපි කියන්න ඕනෑ, ඉතිහාසයේ සුනාමි ආපදාව ආපු වෙලාවේ ඉතාම මන්දගාමී ස්වරූපයෙන් තමයි නැවත නිවාස ලබාදීම ක්‍රියාත්මක වුණේ කියන කාරණය. මට මතකයි, එවකට විපක්ෂයේ හිටපු ජවිපෙ හම්බන්තොට ගිහිල්ලා, "රළ ජයපුර" කියලා වෙනම ගෙයක් හැදුවා. මොකද එදා පැවැති රජයෙන් මේක ක්‍රියාත්මක වීම ප්‍රමාදවීම නිසා. එතකොට යුද්ධයෙන් අවතැන් වෙලා සිටි 2,000කට ආසන්න පිරිසකට ඇත්තටම නිවාස ලබාදීමට පසුගිය රජයන් දක්වපු අසමත්කම නිසා අපේ ගරු ජනාධිපතිතුමා ඉතා ඉක්මනින් යාපනය ප්‍රදේශයට ගිහිල්ලා, නව නිවාස ව්‍යාපෘතියකට මුල් ගල් තියනවා කියලත් දැන ගන්නට ලැබෙනවා. ඒ වාගේම අපි දන්නවා, 2014 මීරියබැද්ද නාය ගිය බව. තවමත් නිවාස නැති පවුල් 135ක් ඉන්නවා. කබරගල කන්ද නාය ගියා. පවුල් 52ක් තේ කර්මාන්තශාලාවක හිටියා. ගිය අවුරුද්දේ අන්තිම කාලයේ අපි තමයි මුල්ගල් තියලා නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තරම් ඉක්මනට මේ තරම් සහන ගොඩක් ලබාදීපු රජයක් නැහැ කියන එක මම කියන්න කැමැතියි. හැමදාමත් පැවති රජයන් ක්‍රියාත්මක වුණේ තමන්ගේ අතේ හැන්ද තිබෙනකොට තමන් ලොකු හැන්දෙන් බෙදාගෙන, ජනතාවට කන් හැන්දෙන් බෙදන ප්‍රතිපත්තියක. අපි ඒක වෙනස් කළා. ඔබ දන්නවා, දැන් දවස් දෙකකට කලින් අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත. එය මැතිවරණයට කලින් අපි ජනතාවට දීපු පොරොන්දුවක්. මොකද, ඒ අය තමන්ට බෙදා ගත්තේ කොහොමද කියලා අපි දන්නවා. මෙහි හිටපු මන්ත්‍රීවරු වියත්පුරෙන් ගෙවල් ගත්තා. ඒ වාගේම අරගළය වේලාවේ තමන්ගේ ගෙවල්වලට ප්‍රහාර එල්ල වුණා කියලා කෝටි ගණන් සල්ලි ගත්තා. මේ මොහොතේ ඒ අය මේ සභාවේ නැහැ. නමුත් ජනාධිපති අරමුදලෙන් සල්ලි ගත්ත මන්ත්‍රීවරු මේ විපක්ෂයේ දැනට ඉන්නවා අපි දන්නවා. ඉතින් ලජ්ජා නැතුව ගත්තා. එහෙම ගත්ත මන්ත්‍රීවරු, ජනාධිපති අරමුදලෙන් සල්ලි ගත්ත මන්ත්‍රීවරු IMF එකට කථා කරනවා, ලංකාවට සල්ලි දෙන්න එපා; විගණකාධිපති කෙනෙක් පත් කිරීම ප්‍රමාදයි කියලා. ඉතින් මේ අය කරන්නේ මොන තරම් අශිෂ්ට පහත් බංකොලොත් දේශපාලනයක්ද කියලා මම අහන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙන්න මේ අදහස් ටිකක් ප්‍රකාශ කරලා මම කථාව අවසාන කරන්න කැමැතියි. අද උදෑසන සිටම මේ පාර්ලිමේන්තුව දිහා බලාගෙන ඉන්නකොට බොහොම කනගාටුවක් ඇති වෙනවා, ඇත්තටම ශිෂ්ටත්වය, සදාචාරය, සභ්‍යත්වය වාගේ වචන පාවිච්චි කළා. එහි විද්‍යාත්මක පදනමක් හෝ දැනුමක් නැතිව Facebook එකෙන් මොනවා හෝ හොයා ගෙන ඇවිල්ලා කථා කරනවා. අහසේ දේදුන්නක් පෑවුවත් ඊළඟ දවසේ කියයි, "මේක ළමයින්ට බලන්න සුදුසු දෙයක් නොවෙයි" කියලා. පසුගිය දවස්වල - මීට දවසකට පෙර - රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ඉතා කැත පහත් වචනයෙන් ගරු අගමැතිතුමියට කථා කළා. මම කියන්නේ ඒක ගරු අගමැතිතුමියට කරපු පෞද්ගලික අපහාසයකට වඩා එහි තිබෙන ගුණාත්මකභාවය පිළිබඳව අපි ගන්න කැමතියි. මේ පාර්ලිමේන්තුවේ ගුණාත්මකභාවය තිබෙන්නේ කොහේද? මම ඇත්තටම ගරු විපක්ෂ නායකතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමා ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කථාවේ තිබුණු ඒ භාෂා විලාසය, අසභ්‍ය වචන අනුමත කරනවාද කියලා. ඒ ගැන විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත් මම අහන්න කැමැතියි. ගරු මන්ත්‍රීවරියන් දෙන්නෙක් - ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියත්, ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමියත් - මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. මම අහන්න කැමතියි එතුමියන්ලා මේ වාගේ කථාවන් අනුමත කරනවාද? මහජනතාව අපි දිහා බලාගෙන ඉන්නවා. මේක පාර්ලිමේන්තුව.

ඒ වාගේම දැන් ටිකකට කලින් ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා මෙතැන අපේ තුෂාරි මන්ත්‍රීතුමිය කථා කරද්දී මුළු කථාවටම බාධා කළා. කථා කරන්න දුන්නේම නැහැ. මුළු වෙලාවේම කෑ ගැහුවා, බාධා කළා. එතුමා හිතනවා නම් මේ රෝස පාට පොත තමයි පාර්ලිමේන්තුව කියලා, ඒක වැරැදියි. පාර්ලිමේන්තුව කියන්නේ ඊට වඩා වැදගත්, ඊට වඩා විශාල වැඩ කොටසක් කරන තැනක්. උදේට ඇවිල්ලා මේක කියලා කෑ ගහලා කන්න ගියාට පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු එච්චරයි කියලා හිතන්න එපා කියලා මම එතුමාට කියනවා. I think people from Jaffna deserve better Representatives. මෙතුමා ඇවිල්ලා කරන්නේ මොකක්ද? යාපනයේ ජනතාව; දෙමළ ජනතාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. එතුමන්ලා කොයිතරම් හොඳට මේ පාර්ලිමේන්තුවේ තමන්ගේ මහජන නියෝජිත භූමිකාව කරනවාද කියලා එතුමාට උතුරු පළාතෙන් ආපු එම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉගෙන ගන්න කියලා මම එතුමාට කියනවා.

ඉතින් අපි මෙතැන දී කියන්න ඕනෑ 2024දී මිනිස්සු ඡන්දය දුන්නා, පාර්ලිමේන්තුව සුද්ධ කරන්න. හැබැයි, විපක්ෂයේ සම්පූර්ණයෙන්ම සුද්ද කර ගන්න බැරි වෙලා තිබෙනවා. විපක්ෂයේ ඉන්නවා හොඳ සංවාද කරන්න පුළුවන් තාර්කික අදහස් දරන මන්ත්‍රීවරු. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කියන්නේ මොකක්ද කියලාවත් දන්නේ නැති මන්ත්‍රීවරු ඉන්නවා. මම ඒක හොඳටම දන්නවා. ඉතින් අපි කියන්නේ අපිට මහජනයා පිළිබඳ වගකීමක් තිබෙනවා කියන එකයි. අපිට මේ පාර්ලිමේන්තුවේ ඉදිරි අවුරුදු ටිකත් ගත කරන්න වෙන්නේ මේ වාගේ විපක්ෂයක් එක්ක නම්, ඒක හරිම අභාග්‍යයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ මහජන වගකීම ඉටු කරන්න බැඳී ඉන්නවා.

මට කථා කරන්න වෙලාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සංවාදයට ලක් වෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අනුමත කිරීම යටතේ සංවාදයට ලක් විය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. මම එය සමස්තයේ අර්ථයෙන් කථා කරන්නට කැමතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පාර්ලිමේන්තුවේ විවිධ අවස්ථාවල විවිධ හේතු නිසා විවිධ සංවාද ගොඩනහනවා; ගොඩනැඟෙනවා, කථා කරනවා. විපක්ෂය හා ආණ්ඩු පක්ෂය හැටියට අපි දෙකට බෙදිලා අදහස් දක්වනවා. නමුත්, අවසානයේ දී මේ රටේ මහජනතාවට තමයි යථාර්ථයට මුහුණ දෙන්නට සිද්ධ වෙලා තිබෙන්නේ. මම කලින් සඳහන් කළ පරිදිම අපි මේ සියලු සංවාදයන් එක්තරා සාධනීය තලයකට ගෙන ඒමේ වගකීමක් අපට තිබෙනවා කියලා මම හිතනවා. විශේෂයෙන්ම මම නියෝජනය කරන සර්වජන බලය පක්ෂයට -අපේ පදක්කමට- එම වගකීම දැඩිව තිබෙන බව මම විශ්වාස කරනවා. විපක්ෂය විවේචනය කරනවා වාගේම, මේ කරුණු දත්ත සහිතව මේ ආර්ථික කාරණා ගැනත් කථා කිරීම ඉතා වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නා යථාර්ථය තමයි මේ රටේ මහජනතාව එලෙසම වටහා නොගන්නා මහ විශාල අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. අපේ රටේ අපේ ආණ්ඩුව කියන විධියට ඩොලර් බිලියන 17ක, ඩොලර් බිලියන 18ක ප්‍රමාණයක් අපි අපනයනයෙන් ආදායම ලබනවා. එතකොට සංචාරක කර්මාන්තය හා විදේශ ප්‍රේෂණ එකතු කළාම තවත් ඩොලර් බිලියන 11ක් තිබෙනවා. මේ දෙක එකතු කරලා ගත්තාම අපට ඩොලර් බිලියන 28ක්, 29ක් විතර තිබෙනවා. එතකොට මේකෙන් ඩොලර් බිලියන 22ක්, 23ක් වියදම් කළාම අපට ඩොලර් බිලියන 6ක් විතර එකතු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, ඒක අපේ ඩොලර් සංචිතයට එකතු වෙලා නැහැ, නමුත් එය වාණිජ බැංකු හරහා තිබෙනවා කියලා. නමුත්, මෙයින් කියවෙන යථාර්ථය මොකක්ද? අපි ඉතාම දුෂ්කර ආර්ථික අර්බුදයක් අභිමුව සිටින බවයි මේ කියන්නේ. මේ ආණ්ඩු පක්ෂය දැන් මේක මොන විධියට උත්කර්ෂයට නංවන්න හැදුවත්, මෙහි යථාර්ථය මොකක්ද? මොවුන්ට කලින් තිබුණු ආණ්ඩුවේ හිටපු රනිල් වික්‍රමසිංහ මහතා ආණ්ඩුවෙන් ඉවත්ව යනකොට ඩොලරය තිබුණේ රුපියල් 285ක මට්ටමක. දැන් ඩොලරයේ අගය රුපියල් 313 දක්වා වැඩිවෙලා තිබෙනවා. මෙයින් වැඩිවෙලා තිබෙන වගකීම රුපියල් බිලියන 1,140කට ආසන්නයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා, ඒ කියන්නේ මේ ආණ්ඩුවේ දැනටත් නායකතුමා යනකොට මොනවා වුණත් රුපියල් බිලියන අටසිය ගණනක Reserves තිබුණා. මේ ආණ්ඩුව කියන විධියට එම මුදල රුපියල් ට්‍රිලියන 1.2 දක්වා වැඩිවෙලා තිබුණා. දැන් රුපියල පහත වැටීම නිසා ඇති වුණු තත්ත්වයත් එක්ක අපි නැවතත් අර හිටපු තැනටත් වඩා පහළට ගිහිල්ලා තිබෙනවා.

ඊට අමතරව දැන් මේ ආණ්ඩුව කිව්වා, මේ ආපදාවෙන් ගොඩ එන්න රුපියල් බිලියන 500ක් වියදම් කරන්න බලාපොරොත්තු වනවා කියලා. එතකොට මොකක්ද වෙලා තිබෙන්නේ? සම්පූර්ණයෙන්ම අනෙක් පැත්ත ගහලා තිබෙනවා. දැන් මේ ආර්ථිකයේ යථාර්ථය සාකච්ඡා කරන්නේ නැතිව වෙන මොනවා කථා කළත්, අපි මිනිස්සු රවටන එක තමයි කරන්නේ. ඒ නිසා අපි මේ යථාර්ථය සංවාදයට ලක් කරන්නේ නැතිව, ඒක ආර්ථික විශේෂඥයින්ට පමණක් භාර දීලා මේ නොම්මර එහාට මෙහාට දාලා ගැලවිජ්ජා කිරීම නොවෙයි අපි කරන්න ඕනෑ. ජනතාවට ආමන්ත්‍රණය කරලා, මේකේ යථාර්ථය පැහැදිලි කර දීලා, ජනතාවත් එක්ක එකට නැඟිටින එක තමයි අපි කරන්න ඕනෑ. ඒක නොවෙයි මේ කරන්නේ. පරණ වැඩේම ඒ විධියටම කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප සියලුදෙනා දන්නවා, අප වාගේ රටකට වඩාත් වැදගත් වන්නේ අපේ බාහිර ශේෂ පත්‍රය - external balance sheet එක - කියලා. මේකේ තිබෙනවා, international investment position කියලා එකක්. ඒ කියන්නේ, අපගේ බාහිර වත්කම් සහ බාහිර වගකීම් අතර වෙනස. බාහිර වත්කම් හා බාහිර වගකීම් අතර වෙනස ඩොලර් බිලියන 53 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා.

Actually, we are in a net minus position of US Dollars 53 billion. So, under any standard, from whichever point you look at it, it tells us that we are in serious trouble; even the IMF says that. So, if we are in serious trouble, we have to take serious action and that has to be by us as a team, as a nation. We have to rise up with the people. There is no point in just engaging in traditional rhetoric, criticizing people, talking about the past and doing silly things. That is not how we can move forward.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පවතින මෙම ආණ්ඩුව මගේ විග්‍රහයට අනුව, අපේ පක්ෂයේ දෘෂ්ටිකෝණයට අනුව

[ගරු දිලිත් ජයවීර මහතා]

2015දී පැවති යහ පාලන ආණ්ඩුවේ දිගුවක්. මේ ජනතාව හිතාගෙන ඉන්නවා, ජනතාව හිතාගෙන හිටියා, අලුත් ආණ්ඩුවක් ආවා කියලා. එහෙම එකක් වෙලා නැහැ. මේ තිබෙන්නේ ඒ ආණ්ඩුවමයි. මේ හිරේට යන්නේ ඒ ආණ්ඩුවෙන් මේ ජනාධිපතිතුමාත් පවත්වාගෙන ගිය අර කැලෑ පොලීසියේ ඒ අයමයි. මේ ගෙන එන්නේ ඒ ආණ්ඩුවේ එතුමන්ගේ නාායාචාර්ය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වැඩ පිළිවෙළමයි. ඒකේ කිසි වෙනසක් වෙලා නැහැ. ඒ විධියටම ඒක යනවා. මේ රටේ අහිංසක මිනිස්සුත්, ආණ්ඩු පක්ෂයත් හිතාගෙන ඉන්නවා, ඔවුන් අලුත් ආණ්ඩුවක් හැදුවා කියලා.

මේක හිතාගන්න බැරි තරමේ කොච්චර විශාල ආශ්චර්යයක්ද කිව්වොත්, අද මේ ආණ්ඩුව පිටුපස ඉන්න අභ්‍යන්තර හා බාහිර බලවේග දිහා බැලුවාම මේ රටේ නිර්ධන පාන්තිකයාට වෙන්න යන දේ ඉතාම පැහැදිලියි. අපි අද විශාල අවදානමක් අරගෙනයි කටයුතු කරන්නේ. මේ ආණ්ඩුව භූ දේශපාලනික වශයෙන් අපේ රටේ ස්වෛරීභාවයට පවා, අපේ රටේ පැවැත්මට පවා බලපාන තීන්දු-තීරණ, එකඟතාවන්ට වෙනත් රටවල් එක්ක ගිවිසුම්ගත වෙලා තිබෙනවා. අපි මෙතැනට ගෙනාපු මේ රටේ අහිංසක දුප්පත් මිනිහාගේ ඒ නිදහස් අධ්‍යාපනය වළලන්න ඔන්න මෙන්න ලැහැස්ති කරලා තිබෙනවා. මේ රටේ සභ්‍යත්වය, සංස්කෘතිය සම්පූර්ණයෙන්ම වෙනස් වෙන තැනකට ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම විනාශ වෙන වැඩ පිළිවෙළක දිගටම ගමන් කරනවා. මේ රටේ ධන නිර්මාණයක් වීම සඳහා අවශ්‍ය එකම එක දෙයක්වත් මෙහිදී සිදුවන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රවී කරුණානායක මැතිතුමාගේ කාලයත් එකතු කළාම මට තව විනාඩි කීයක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සම්පූර්ණ කාලය විනාඩි 10ක් තිබෙනවා. ඒක බලන්නම්, ඔබතුමා කථා කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මම ආණ්ඩු පක්ෂයෙන් බොහොම ආයාචනාත්මකව ඉල්ලා සිටින්නේ මෙයයි. කරුණාකරලා කල්පනා කරලා බලන්න, මේ රටේ ජනතාව අහිංසක විධියට අපේක්ෂා කරපු දේද දැන් සිද්ධ වෙන්නේ කියලා. එහෙම නැත්නම් ඔබත් නොදන්නා අඳුරු බලවේගයකින් ඔබව පාලනය වෙමින් මේ රටේ දුර්දාන්ත ඒකාධිපති පාලනයක් ඔබ ලවා යම් කෙනෙක් කරගන්න හදනවාද? ඒක කල්පනා කරලා බලන්න. ඔබත් මමත් විශ්වාස කරලා, අපි ඔබත් එක්ක දේශපාලනය හදාරපු කාලයේ ඔබ හිතුවාද, ඔබේ අතින් මෙවැනි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා පාර්ලිමේන්තුවේදී එය සාධාරණීකරණය කරන්න වෙන තත්ත්වයකට පත් වෙයි කියලා? "කොළඹට කිරි-ගමට කැකිරි" කියලා විශ්වවිද්‍යාල සමයේදී අපිත් එක්ක පෙළපාළි යනකොට ඔබ හිතුවාද, කවදා හරි දවසක මේ අධ්‍යාපන ඇමතිතුමිය මෙහෙම කටයුතු කරාවි කියලා? නිදහස් අධ්‍යාපනය ගැන අවම අවබෝධයක්වත් නැති එතුමිය ඉතාම ආත්මාර්ථකාමී විධියට, අත්තනෝමතික විධියට ගෙන එන, කිසිම නියාමන වැඩසටහනක් නැතුව ගෙන එන මේ වැඩ පිළිවෙළ ගමෙන් ඇවිල්ලා, අදටත් බස් එකෙන් ඇවිල්ලා ඉන්න ඔබට මේ පාර්ලිමේන්තුවේදී සාධාරණීකරණය කරන්න සිද්ධ වෙයි කියලා ඔබට හිතුණාද? ඔබට හිතුණාද, ඔබේ ගමේ මිනිහා එක්ක පාප්ප අරගෙන තාප්පවල පෝස්ටර් ගහලා, ගල්කටස් අරගෙන ගිහිල්ලා පොලීසිවලට ගහලා, අපේ තරුණ-තරුණියෝ ඝාතනය වෙලා, අපේ ආදරණීය මිත්‍රයෝ ඝාතනය වෙලා ඔබගේ වචනයෙන් කියනවා නම්, ඒ කාලයේ වැලි තලාවට යට වුණු ඒ අඳුරු යුගයේදී අපේ ඒ සහෝදරවරුන්ට දස වද දුන් ඒ පාලකයින් අද ඔබගේ පිටුපස ඉඳගෙන ඔබව පාලනය කරන යුගයක් ඇරඹෙයි කියලා. ඔබ කවදා හරි එහෙම හිතුවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට තව මොහොතක් දෙන්න.

ඔබ හිතුවාද, අපේ අහිංසක මිනිසුන්ට මෙවැනි දුර්දාන්ත යුගයක් නිර්මාණය කරන්න ඔවුන් ඔබව අතකොළුවක් කර ගනීවි කියලා? මෙන්න මේ ආයාචනාත්මක ඉල්ලීම ඔබටයි ආදරණීය හිතවත් අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනි.

මම අවසාන වශයෙන් ඔබෙන් ඉල්ලා සිටිනවා, ඔබට යම්කිසි හෘදය සාක්ෂියක් තිබෙනවා නම්, මේ හදිසියේ ගෙනැල්ලා විනාශ කරන්න හදන නිදහස් අධ්‍යාපනය අඩු ගණනේ රැකගන්න අපිත් එක්ක හෙට මතුගමට එන්න කියලා. නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් පෙනී හිටපු අපේ මතුගම කන්නන්ගර වීරවරයාගේ පිළිරුව ඉදිරියට එන්න කියලා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වෙලාවේ විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් වෙන්නේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි පළිබඳවයි. විශේෂයෙන්ම පසුගිය කාල වකවානුව තුළදී

අපේ ශ්‍රී ලංකාවට බලපෑ මහා ව්‍යසන තත්ත්වය මධ්‍යයේ නොයෙකුත් විදේශීය රටවල ලෝක ප්‍රජාව විවිධාකාර භාණ්ඩ, සහනාධාර විශාල ප්‍රමාණයක් ලංකාවට එවලා පීඩාවට පත් ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්න ඉදිරිපත් වුණා. මේ තත්ත්වය මත විවිධ විදේශීය පරිත්‍යාගශීලීන් ලබා දෙන භාණ්ඩ රේගුවෙන් නිදහස් කර ගන්න අවසර ලබා දීමත්, ප්‍රමුඛතාව මත, පීඩාවට පත් ජනතාවගේ දෑත්වලට ඉතා ඉක්මනින් ඒවා ලබා දීමත් රාජ්‍ය පරිපාලනයේ තිබෙන ක්‍රමවේදය යටතේ කරන්න තමයි මේ පනත යටතේ වන රෙගුලාසි අනුමත කිරීම සඳහා අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

පසුගිය කාල වකවානුව තුළ රටවල් 22කින් සහ ලෝක ආහාර වැඩසටහන මඟිනුත් විවිධාකාරයේ භාණ්ඩ රාශියක් අපේ රටට ලැබුණා. ඒවා නොයෙක් භාණ්ඩ, සහනාධාර, උපකරණ සහ වෛද්‍යාධාර යනාදී වශයෙන් තමයි අපට ලැබුණේ. ඒ නිසා පරිත්‍යාග ලෙස අපට ලබා දෙන භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ විශේෂ මාර්ගෝපදේශයක් අනුව, ඒ ලේකම්වරුන්ගේ අත්සනින් සහ ඒ අවසරය යටතේ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නැත්නම් රජයේ ආයතනයක් නමින් ලබා දෙන භාණ්ඩමය පරිත්‍යාග ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගන්න අවසර ලබා දීම සඳහා මේ රෙගුලාසි ප්‍රකාශයට පත් කරන්න තීරණය කර තිබෙනවා. ඒ අවශ්‍යතාව මුදුන්පත් කරගෙන තමයි මේ පනත යටතේ රෙගුලාසි ඉදිරිපත් කරන්නේ.

මේ පනත යටතේ වන රෙගුලාසිවල වටිනාකම, වැදගත්කම මොකක්ද කියන එක අපි සාකච්ඡා කළ යුතුම දෙයක්. පසුගිය වකවානුවේ රටවල් 22කින් පමණ ලැබුණු විදේශ ආධාර, සහනාධාර, භාණ්ඩ කළමනාකරණය කිරීම, ඒ කටයුතු විධිමත් කිරීම, ඒවායේ විනිවිදභාවයක් ඇති කිරීම සහ මනා ගිණුම්කරණයක් තබා ගැනීම සඳහා උසස් මට්ටමේ කමිටුවකුත් පත් කළා. එම කමිටුවේ වගකීම තමයි, ලංකාවේ ඕනෑම ගුවන් තොටුපොළකට, ඕනෑම වරායකට ලැබෙන භාණ්ඩ නිසි ක්‍රමවේදයක් තුළ රේගුවෙන් නිදහස් කරගෙන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යටතේ නඩත්තු වන ඔරුගොඩවත්ත ගබඩා සංකීර්ණයේ ගබඩා කිරීම. ඒ වාගේම වගකීම් සහිතව ඒවා කළමනාකරණය කරලා, විනිවිදභාවයක් ඇතුව ගිණුම්කරණය කරලා, නිසි ක්‍රමවේදයක් යටතේ ප්‍රවාහනය කරලා, ඒ ඒ දිස්ත්‍රික්කවල ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් වෙච්ච ජනතාවගේ අවශ්‍යතා අනුව සහ ඔවුන්ගේ ඉල්ලීම පරිදි ඒවා නාස්ති නොකර, අවභාවිතාවක් නොකර, කැඩීමක් බිඳීමක් නොකර අත්‍යවශ්‍ය භාණ්ඩ හැටියට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ඔවුන් වෙත යැවීමේ අරමුණ තමයි ඒ කමිටුවෙන් සිද්ධ වෙන්නේ. ඒ අනුව කොටස් වශයෙන් ලැබෙන භාණ්ඩ වර්ග 9ක් දැනට අපි හඳුනාගෙන තිබෙනවා. විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය, ප්‍රධාන උපකරණ, විශේෂයෙන්ම සිවිල් ඉංජිනේරු කටයුතු සඳහා අවශ්‍ය වන උපකරණ තිබෙනවා. ඒ වාගේම පාලම්, වාහන, යන්ත්‍රෝපකරණ ලැබුණා. එමෙන්ම විදුලි ජනක යන්ත්‍ර වාගේම ඖෂධ ද්‍රව්‍යයත් ලැබුණා. කූඩාරම්, නිවාස සඳහා අවශ්‍ය කරන උපකරණ - household items, රෙදි පිළි සහ වෙනත් භාණ්ඩ හැටියට අපි ඒවා හඳුනාගෙන තිබෙනවා. මේ වෙනකොට ටොන් බර ගණනක භාණ්ඩ අපේ රටට ඇවිල්ලා තිබෙනවා. ඒවායේ වටිනාකම මුදලින් ගත්තොත් සෑහෙන්න ප්‍රමාණයක්. අපි තක්සේරු කරලා තිබෙන විධියට ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.57ක් පමණ වටිනා භාණ්ඩ ප්‍රමාණයක් තමයි දැනට අපේ රටට ඇවිල්ලා තිබෙන්නේ. එම නිසා ඒවා නිසි ක්‍රමවේදයකට අනුව කළමනාකරණය කරලා, ශ්‍රී ලංකා රේගුවේ රෙගුලාසිවලින් නිදහස් කරගෙන පීඩාවට පත් ජනතාවට සහනදායී භාණ්ඩ හැටියට යැවීම ඉක්මන් කිරීම තමයි මේ පනත යටතේ ගෙනෙන රෙගුලාසිවල මූලික අරමුණ වන්නේ.

පසුගිය දිනවල ඇති වූ ආපදා තත්ත්වය නිසා ජනතාව පීඩාවට පත් වුණා වාගේම ඔවුන්ගේ ජීවනෝපායන්ටත්, අත්‍යවශ්‍ය සේවාවන්ටත් සැලකිය යුතු බාධාවක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම හදිසි තත්ත්වයකදී ඇති වන බලපෑම අවම කිරීම සඳහා මූලික සහන ලෙස මානුෂීය ආධාර ලබා දීමේ වේගය, එහෙම නැත්නම් මානුෂීය සහන සේවා වැඩසටහන්, සහන භාණ්ඩ ලබා දීමේ වේගය සහ එම ක්‍රියාවලියේ ඵලදායීතාව තීරණාත්මක කාරණයක් වෙනවා. ඒක නිසා අපි දන්නවා, ආපදා ප්‍රතිචාර, එහෙම නැත්නම් ආපදාවක් වුණාට පසුව මේ සඳහා ඉදිරිපත් වෙනකොට බොහෝ විට නොසලකා හරින දෙයක් තිබෙන බව. ඒ තමයි, අතිශයින්ම වැදගත් අංගයක් වූ අපි මෙතෙක් කල් සැලකීමට භාජන කරලා නැති දෙයක් තිබෙනවා. ඒ තමයි, මානුෂීය ක්‍රියාමාර්ග සක්‍රිය කරන නෛතික සහ නියාමන රාමුව. ඒක තමයි දැන් මේ පනත යටතේ ගෙනෙන රෙගුලාසි මඟින් අපි අරමුණු කරන්නේ. නෛතික සහ නියාමන රාමුවක් ඇති කළාම එමඟින් ඵලදායීතාව වැඩි වෙනවා වාගේම ඉක්මනින් ක්‍රියා කිරීමට හැකියාවත් ලැබෙනවා. විදේශ රටවල සිටින ජනතාවගේ මුදල් තමයි විදේශ ආධාර විධියට එවන්නේ. ඔවුන්ටත් මේ මඟින් හොඳ ප්‍රතිචාරයක්, පණිවුඩයක් ලබා දීමේ අරමුණ ඉෂ්ට වෙනවා, පීඩාවට පත් ජනතාවගේ අතට අත්‍යවශ්‍ය සේවාවන් හැටියට මේ භාණ්ඩ ගියාම. මේ අනුව ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉෂ්ට කරන අංගයක් හැටියට අපි සලකනවා. මේ සමඟින් විදේශීය පරිත්‍යාග හා සැපයුම් ආනයනික බදුවලින් තොරව ලබා ගැනීමට හැකි වෙනවා.

පාර්ශ්ව විධියට ගත්තාම, මේ සම්බන්ධයෙන් මම විවිධ පාර්ශ්ව දැනුවත් කළා. ඒ වාගේම විදේශීය සංවිධාන, විදේශීය රටවල් නියෝජනය කරන ජාත්‍යන්තර ආයතන තිබෙනවා. එමෙන්ම, විදේශීය සාමූහික ප්‍රජාවක් ඉන්නවා. විදේශයන්හි සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව ඉන්නවා. විශේෂයෙන්ම විදේශයන්හි තනි පුද්ගලයින් වශයෙනුත් සිටිනවා. ඔවුන් තමයි ඒ භාණ්ඩ එවන්නේ. ඒ නිසා ඔවුන්ටත් හොඳ ප්‍රතිචාරයක් දක්වන්න ඕනෑ, ඔවුන් විසින් අමාරුවෙන් එකතු කරලා එවන භාණ්ඩ කිසි ප්‍රමාදයකින් තොරව ජනතාවට ලබා දෙනවා කියලා. නැත්නම් කියන්නේ, ඒ භාණ්ඩ Sri Lanka Customs එකේ හිර වෙලා තිබෙනවා, එහෙම නැත්නම් වරායේ හිර වෙලා තිබෙනවා, ඒවා ගොඩ ගසාගෙන ඉන්නවා, තවම clear කරලා නැහැ කියායි. මේ පනත යටතේ වන රෙගුලාසි මඟින් ඒ සඳහා ඉතා හොඳ ප්‍රවේශයක් ලබා දෙනවාය කියන එක අපට පැහැදිලිව කියන්න පුළුවන්. එම නිසා මේ රෙගුලාසි හරහා විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් විදේශීය සැපයුම් ලබා දිය හැකි ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයක් එම මධ්‍යස්ථානය මූලික වෙලා, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය එක්කත් එකතු වෙලා බොහොම පැහැදිලිව නිකුත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවන භාණ්ඩ මෙන්න මේ ආකාරයට එවන්න කියලා සියලුම තානාපති කාර්යාලවලට සහ ලෝක සංවිධානවලට දන්වා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා බොහොම පැහැදිලි හා සරල මාර්ගෝපදේශයකුත් නිකුත් කරලා තිබෙනවා. එම නිසා ඒ භාණ්ඩ එවන විදේශීය රටවලටත් ඒක පහසු වෙනවා. ඔවුන් භාණ්ඩ එකතු කරලා එවනකොට රජය හැටියට අපි ඒ සම්බන්ධව විශේෂ වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි, ඒවා ඉක්මනින් සහ පහසුවෙන් නිදහස් කරලා අපේ අවශ්‍යතා අනුව ලබා ගන්න. ඒක තමයි මේ පනත යටතේ රෙගුලාසිවලට මූලික වන කාරණය සහ මේ මඟින් අපට ලබා ගන්න පුළුවන් වාසිය. එම නිසා සියලුම පරිත්‍යාග සහ සැපයුම් මාර්ග නිෂ්කාසනය කර ගැනීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මූලික වෙලා ජාත්‍යන්තරයෙන් භාණ්ඩ එන සෑම ගුවන් තොටුපොළකම සහ සෑම වරායකම නියෝජිතයින්, වගකිව

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

යුතු නිලධාරින් අපි රඳවා තිබෙනවා. ඔවුන් රේගු නිලධාරින් සමඟ සම්බන්ධ වෙලා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නමින් එන භාණ්ඩ වෙන් කරගෙන, ලේකම්වරුන්ගෙන් නිසි අවසරය ලබාගෙන එම භාණ්ඩ නිදහස් කර ගන්න මෙතෙක් කටයුතු කරලා තිබෙනවා. අදාළ නියෝජිතයින් හරහා එම භාණ්ඩ ඉක්මනින් ලබාගෙන අවශ්‍යතා අනුව ඒවා ජනතාව වෙත යොමු කිරීමේ කටයුත්ත මේ පනත යටතේ ගෙනෙන රෙගුලාසි මඟින් තවත් විධිමත් වෙනවා. එතකොට මේ පනත මඟින් රජයට බලයක් ලබා දෙනවා, ජාතික අවශ්‍යතාව සඳහා ආනයන සහ අපනයන ක්‍රියා පටිපාටිය නියාමනය කිරීමට, පාලනය කිරීමට එහෙම නැත්නම් ලිහිල් කිරීමට.

මේකේ වැදගත්ම කාරණය වෙන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩ අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ලබා දීමයි. ගොඩක් පැමිණිලි තිබෙනවා, බිමේ එහෙම නැත්නම් භූමියේ ප්‍රාදේශීයව පීඩාවට පත් වෙලා ඉන්න ජනතාවට භාණ්ඩ ලැබීම ප්‍රමාදයි කියලා. ඊට හේතුව සොයා බැලුවාම ගබඩාවේ භාණ්ඩ ගොඩ ගැහිලා තිබෙනවා. නමුත් ඒවා නිදහස් කරගන්න බැහැ, රේගුවෙන් නිෂ්කාශන සහතික දීලා නැති නිසා. මේකෙන් අපට විශේෂත්වයක් ලැබෙනවා, රට තුළට ගෙන ඒමට හැකි වන සහතිකය ලබා ගන්න. එහෙම නැත්නම් හදිසි සහ ආපදා අවස්ථාවකදී ඉතාම නම්‍යශීලිව ප්‍රතිචාර දැක්වීමට රජයට ඉඩ කඩ සැලසෙනවා. රජයේ වගකීම තමයි පීඩාවට පත් ජනතාව දැත් දිගු කරනකොට ඒ ජනතාව හමුවට ගිහිල්ලා සහන ලබා දීලා ඔවුන්ගේ ජීවිතය ගොඩනඟා ගන්න, ඒ දුවා දරුවන්ගේ ජීවිතය ගොඩ නඟාගන්න සහයෝගය ලබා දීම. ඒ දුවා දරුවන්ට ආරක්ෂාව, විශේෂයෙන් සෞඛ්‍යාරක්ෂාව සපයන්න ඕනෑ. ඒවාට අවශ්‍ය අනෙකුත් ආම්පන්න, සහනාධාර භාණ්ඩ ලබා දෙන්න ඕනෑ. ඒ ටික ගැන තමයි මේකෙදි සැලකිලිමත් වෙන්නේ.

ජනතාව ආපදාවකට ලක් වුණාම මානසිකවත් වැටෙනවා. ඒ වාගේම "දිට්වා" වැනි හදිසි අවස්ථාවලදී විශේෂ රෙගුලාසි සහ ගැසට් නිවේදන නිකුත් කරන්නත් මේකෙන් අවකාශ ලැබෙනවා. රේගු බදු සහ බදු අත්හැරීමට හෝ අඩු කිරීමටත් සරල කළ ලියකියවිලි අපට මේකෙන් පැහැදිලිව ලබාගන්න පුළුවන්. වරාය සහ ගුවන් තොටුපළවල කඩිනම් නිෂ්කාශන ක්‍රියාවලිය ඇතුළු සම්මත ක්‍රියාපටිපාටිය තාවකාලිකව ලිහිල් කරගැනීමටත් අපට මේකෙන් ප්‍රවේශය ලබා දෙනවා. මෙම හදිසි රෙගුලාසි මඟින් මානුෂීය තොග සම්බන්ධව ප්‍රමුඛත්වයක් අරගෙන වේගවත්ව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලැබෙනවා. ජාත්‍යන්තර සහ ජාතික හවුල්කරුවන්ට ඉක්මනින් සහ කාර්යක්ෂමව සහයෝගය ලබා දීම පහසු කරන්න මේකෙන් හැකියාව ලැබෙනවා.

අපේ රජය විසින් මුල ඉඳලාම වැඩකටයුතු කරලා නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරපු නිසා තමයි ආර්ථික වාසි, ආර්ථික ජයග්‍රහණ රාශියක් ලැබුවේ. ඒ නිසා නීතිය සහ නියාමන ක්‍රියාවලිය ඉතාම විධිමත්ව කිරීමේ අවශ්‍යතාව තමයි මේ සංශෝධන මඟින් අපි පිළිබිඹු කරන්නේ. මොකද, සහනයක් කියන දේ ලැබෙන්න ඕනෑ වෙලාවට ලැබිය යුතුයි සහ ලැබෙන්න ඕනෑ තැනට ලබා දිය යුතුයි. ඒක තමයි මේකේ තිබෙන වටිනාකම. කොච්චර සහන ආවත් වැඩක් නැහැ, ඒක අවශ්‍යතාව අනුව ලබා දෙන්න බැරි නම්, ලබා දෙන්න ප්‍රමාද වෙනවා නම් සහ පාලන ලියකියවිලිවල ප්‍රමාදයක් වෙනවා නම්. ඒ කාරණා ගැන තමයි මේකෙදි අවධානය යොමු කරන්නේ. සියලුම ආර්ථික ජයග්‍රහණ වාගේම පරිපාලන ජයග්‍රහණ අපට ලැබුණේ අපේ රජයේ වැඩ පිළිවෙළේ තිබෙන විශ්වසනීයත්වය නිසායි. ඒ අනුව තමයි අපි මේ කටයුතු කරලා තිබෙන්නේ. අපි මේ සඳහා මධ්‍යම දත්ත පද්ධතියකුත් හදලා තිබෙනවා. ඒ දත්ත පද්ධතිය අනුව එම වැඩසටහනට විශේෂ හැකියාවක් ලැබෙනවාය කියන කාරණය මතක් කරමින්, මේ පනත යටතේ ගෙනෙන රෙගුලාසි ඉතාම අත්‍යවශ්‍ය ඒවා හැටියට ඉදිරිපත් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.52]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
**(மாண்புமிகு அஜித் பீ. பெரேரா)**
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ අඳුරුම දවසක්. මේ පාර්ලිමේන්තුවේ අයිතිය, පුරවැසි අයිතිය ආරක්ෂා කරමින් අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමා 2001 වසරේදී ලබා දීපු නියෝගය හරහා නැවත නැවත තහවුරු කරපු, ඉන් පසුව හිටපු කථානායකවරුත් නැවත නැවත තහවුරු කරපු මේ පාර්ලිමේන්තුව සතු අධිකරණ මඟින් ක්‍රියාත්මක කරන ජනතාවගේ අධිකරණ බලය, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය හෑල්ලු කරපු දවසක් තමයි අද. 2025 නොවැම්බර් මාසයේ 21වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරුන් විසින් ඉල්ලා සිටියා, මේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ උසස්වීම් සහ මාරුකිරීම් ලබා දීමේදී ඇති වෙලා තිබෙන ගැටලු, දුෂ්කරතා පිළිබඳව සොයා බලා අනාගතයේ එවැනි දේ සිදු නොවන්නට අවශ්‍ය කරන නිර්දේශ ලබා දීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අධිකරණ කටයුතුවලට ඇඟිලි ගහන්න, සිදුවෙච්ච මාරුවීම් අවලංගු කරන්න, සිදුකරපු උසස්වීම් අවලංගු කරන්න කරපු ඉල්ලීමක් නොවෙයි. නඩු තීන්දු පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, යම් විනිශ්චයකාරවරයෙකු පිළිබඳ පෞද්ගලික කාරණයක් නොවෙයි, මේක. මේ රටේ පුරවැසියන්ගේ අයිතියේ, ජනතාවගේ අධිකරණ බලයේ කොටසක් තමයි මේ පාර්ලිමේන්තුව හරහා අධිකරණය වෙත ලැබිලා තිබෙන්නේ. ඒ බලය තමයි අධිකරණ සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක කරන්නේ. ඒ බලය තමයි අපි; මේ පාර්ලිමේන්තුව මුදල් සපයලා ආරක්ෂා කරන්නේ.

මෙවැනි යෝජනාවක් භාර දුන්නාම මේ පාර්ලිමේන්තුවේ ක්‍රමවේදයක් තිබෙනවා. පළමුව එය පක්ෂ නායකයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සලකා බලනවා, ඒ ගැන වාද කරනවා, තර්ක කරනවා. නමුත් 2025.11.21වැනි දා ඉඳලා අද වෙනකම් මේ යෝජනාව පිළිබඳව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී කිසි විටෙක සලකා බැලුවේ නැහැ. මේ ප්‍රශ්නය මතක් කරන හැම වෙලාවේම "පසුව බලන්නම්, නියෝගයක් දෙන්නම්" කියන කාරණය කියමින් මේ වර්තමාන කථානායකවරයා ඒක මඟහැරියා. මේක රහසිගතව තියාගත්තා. ඒ වාගේම, මේ පිළිබඳ ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ වගකිව යුතු ධුර දරන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු එක්ක කථා කළේත් නැහැ, ගැටලුවක් තිබෙන බව කිව්වේත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, ඊයේ දිනයේ මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, විශේෂ කාරක සභාවක් පිළිබඳ මේ යෝජනාව න්‍යාය පුස්තකයට ඇතුළත් කරන්නේත් නැතුව ප්‍රතික්ෂේප කරන්න යනවා කියලා. ඒකට හේතුවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියෝගය ලිව්වේ මේ පාර්ලිමේන්තුවේ නිලධාරින් නොවෙයි. මේ නියෝගය සකස්

කරන්න උපදෙස් දුන්නේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න නීති උපදේශකයෝ නොවෙයි. මේ සඳහා උපදෙස් දුන්නේ, මේ නියෝගය ලිව්වේ, මේක යතුරුලියනය කළේ මේ පාර්ලිමේන්තුවේ නොවෙයි. මේ කථානායකවරයා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ඉතා විශාල පරිචයක් තිබෙන මේ පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලය ඇතුළු නිලධාරීන් කිසිවෙකුට කිසිදු ගෞරවයක් නැතුව, සැලකිල්ලට ලක් කරන්නේ නැතුව පිටස්තර යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කණ්ඩායමකගේ වුවමනාවට තමයි මේ නියෝගය ලිව්වේ. මීට කලින් එතුමා අර විශ්වාස භංගය ප්‍රතික්ෂේප කරන වෙලාවේ එතුමාව හැල්ලුවට ලක් වුණා. එතුමා නොසැලකිල්ලෙනුයි ඒ ප්‍රතික්ෂේප කිරීම කළේ. මෙවර එය විස්තරාත්මකව ලියාගෙන ආවා. විනාඩි 2න් කිව්වත්, පැය භාගයෙන් කිව්වත් වැරදි නම් වැරදියි. සභානායක බිමල් රත්නායක අද උත්සාහ කළා, මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් නොමඟ යවන්න. අපේ යෝජනාව ගැන වචනයක්වත් කථා නොකර සම්පූර්ණයෙන් වැරදි අදහස් දැක්වූවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු යෝජනාව හා සම්පූර්ණයෙන් සමාන යෝජනාවක් ශ්‍රී ලංකා නීතිඥ සංගමය -මේ රටේ සියලු නීතිඥවරුන්ගේ සංගමය. අපිට තිබෙන්නේ එක නීතිඥ සංගමයයි- 2025 දෙසැම්බර් මාසයේ 29වැනි දා ඉදිරිපත් කළා. ජනාධිපතිතුමා තමයි පත්කිරීම් බලධාරියා, මහාධිකරණයට පත් කළත්, අභියාචනාධිකරණයට පත් කළත්, ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කළත්. ජ්‍යෙෂ්ඨත්වය නොසලකා පත් කිරීම් ගණනාවක් සිද්ධ වුණා. ඒකෙන් විනිශ්චයකාරතුමන්ලා තුළ ලොකු අසහනයක් ඇති වුණා. තමන්ගේ වෘත්තිය තුළ සාධාරණව කටයුතු කරද්දි තමන්ගේ අනාගත සුරක්ෂිතතාව පිළිබඳ ගැටලුවක්, ප්‍රශ්නයක් ආවා. ඒ ගැන සංවේදී වෙලා තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කළේ.

ඒ ගැන ශ්‍රී ලංකා නීතිඥ සංගමය මෙහෙම කියනවා, “Traditionally, promotions within the Judiciary have been granted on the basis of seniority. In the recent past however, there had been occasions where this principle had been departed from. If seniority has been overlooked on the basis of merit, it is observed that presently there are no clear or established guidelines governing the assessment of merit in granting such promotions in the Judiciary. This absence of transparent criteria risks undermining the fairness and consistency of the process.” විනිශ්චයකාරවරුන්ගේ උසස්වීම් ලබා දීමේදී ප්‍රතිපත්තියක් නැතිකම ගැන, ජ්‍යෙෂ්ඨත්වය නොතකා කටයුතු කරනවා නම් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ විනිවිදභාවයක් නැතිකම ගැන ශ්‍රී ලංකා නීතිඥ සංගමය කටයුතු කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඉදිරිපත් කළේත් මේ අදහසමයි.

අධිකරණයට ඇඟිලි ගහන්න අපිට වුවමනාවක් නැහැ. අපිට අධිකරණය ගැන විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා මේ රටේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබුණු බලය සම්පූර්ණයෙන් නොතකා හැරලා ඉතාම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ පාර්ලිමේන්තුවෙන් පිට බලවේගවලට යට වෙලා ආණ්ඩුවේ දේශපාලනික වුවමනා වෙනුවෙන් මේ රටේ විනිශ්චයකාරවරුන්ට, විශේෂයෙන්ම මහේස්ත්‍රාත්වරුන්ට, දිසා අධිකරණ සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට සාධාරණ උසස්වීම් සඳහා තිබෙන අවස්ථාව අහිමි කරලා තිබෙනවා. මේ පිළිබඳ අපේ බලවත් වූ විරෝධය ප්‍රකාශ කරනවා. අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් අපි පෙනී සිටිනවා, විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය වෙනුවෙන් සහ සාධාරණත්වය වෙනුවෙන් අපි පෙනී සිටිනවා කියන කාරණය අපි කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ වෙනුවෙන් ඉදිරියටත් පෙනී ඉන්නවා කියන කාරණයත් කියන්න කැමැතියි.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පාර්ලිමේන්තුවේදී අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මටත් අදහස් දැක්වීමට වෙලාව වෙන් කර දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුව නිසා අපේ රටේ දිස්ත්‍රික්ක කිහිපයකටම සිදු වුණු විනාශය ගැන. එම සිදුවීමෙන් මහනුවර දිස්ත්‍රික්කයටත් විශාල වශයෙන් හානි වුණා. ඒ ආපදාවෙන් පස්සේ එම දිස්ත්‍රික්ක නැවත ගොඩ නැඟීමට අපි වැඩ කටයුතු කරගෙන යමින් ඉන්නවා. අපිට පිට රටවලින් -විදේශ රටවලින්- සල්ලි හම්බ වුණා; ඒ වාගේම භාණ්ඩ හම්බ වුණා. එම භාණ්ඩ රේගුවෙන් නිදහස් කර ගන්න අපට ඉක්මනින්ම රෙගුලාසි වෙනස් කර ගන්න සිදු වුණා. ඒ අනුව එම රෙගුලාසි අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

මේ ව්‍යසනය නිසා මහනුවර දිස්ත්‍රික්කය තුළ විතරක් නිවාස 1,903ක් පූර්ණ හානියට පත් වී තිබෙනවා; ඒ වාගේම නිවාස 16,514කට අර්ධ හානි සිදු වෙලා තිබෙනවා. අපි ඉක්මනින්ම පටන් අරගෙන තිබෙනවා එම නිවාස හදලා දීමේ කටයුතු. අද ගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් එම වැඩසටහන අනුරාධපුරයෙන් සහ කුරුණෑගලින් ආරම්භ කළා. අපි මහනුවර දිස්ත්‍රික්කයේත් විනාශ වුණු ගෙවල් වෙනුවට අලුතින් ගෙවල් හදලා දෙන්න ඉඩම් සොයමින් ඉන්නවා. අපි වහාම ඉඩම් සොයාගෙන එම ගෙවල් ටික හදලා දීමේ වැඩ පිළිවෙළ ඉක්මනටම පටන් ගන්නවා.

මීට දවස් කිහිපයකට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කළා දෙල්තොට ගැන. තමා සහ සජබ පක්ෂයෙන් පත් වෙලා ඉන්න සභාපතිතුමා ඇතුළු කණ්ඩායම දෙල්තොට ජනතාව විපතට පත් වුණු වෙලාවේ වැඩ කටයුතු කළා, එම ප්‍රදේශය යථා තත්ත්වයට පත් කළා කියලා එතුමා කිව්වා. මම කියන්න කැමැතියි, එම ව්‍යසනය සිදු වුණු වහාම අපේ පක්ෂයේ මන්ත්‍රීවරුත් කැප වෙලා කටයුතු කළ බව. ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමාත්, තනුර දිසානායක මන්ත්‍රීතුමාත් මහනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා සහ දිසාපතිතුමා එක්ක ඒ තැන්වලම ඉඳගෙන රෑ දවල් නොබලා ඒ වැඩ ටික මෙහෙයවූවා. ඒ වාගේම ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා

[ගරු රියාස් ෆාරුක් මහතා]

ගලහ සහ දෙල්තොට ඉදිමින් ඒ වැඩ කටයුතු ආරම්භ කළා. ඒ වාගේම ෆස්මින් මන්ත්‍රීතුමා ගම්පොළ සහ ගෙලිඔය වැඩ කළා. මම පූජාපිටිය සහ අකුරණ ඉඳන් වැඩ කළා. ඇත්තටම ඒ ආපදා සිදුවීම වුණාට පස්සේ ඒ ප්‍රදේශවලට වාහනවලින් තියා පයින්වත් යන්න බැරි තත්ත්වයක් තිබුණේ. උදාහරණයක් විධියට දෙල්තොට ගත්තොත්, එම ප්‍රදේශයට යෑමට කිසිම මාර්ගයක් තිබුණේ නැහැ.

මම හිතන විධියට, ඒ වෙලාවේ ජගත් මන්ත්‍රීතුමා පයින් තමයි ගියේ. සමහර තැන්වල ස්කූටර් බයික්වල යන්න ඇති. රෑ දවල් පයින් ගිහිල්ලා ඒ මිනිසුන්ට ආහාර දෙන එක සහ අඩු ගානේ ආටෝ එකකට හරි - ත්‍රීවීලර් එකකට හරි - යන්න පුළුවන් මට්ටමට ඒ පාර ටිකක් හදා ගන්න එක තමයි කළේ. අපි ඒ ඔක්කෝම හදලා ඉවර කරන වෙලාවේදී මා අර කියපු විපක්ෂයේ මන්ත්‍රීතුමා මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවට ඇවිල්ලා කිව්වා, දෙල්තොටට යන්න මාර්ගයක් නැහැ, මාර්ගය හදලා දෙන්න කියලා. අපි එතකොට කිව්වා, පේරාදෙණිය- *[බාධා කිරීමක්]* එතුමා මතක් කළා ඒකත්. පේරාදෙණියේ ඉඳලා දෙල්තොටට යන මාර්ගයේ යන්න බැහැ, ඒකත් හදන්න ඕනෑ කියලා කිව්වා. අපි කිව්වා, දැන් හදලා තිබෙන්නේ, ඔබතුමාට යන්න පුළුවන් කියලා. එතුමා සතියකට පස්සේයි ඒ ආවේ. ඒ වාගේම අකුරණටත් ආවා. මේ ආපදාව සිදු වුණේ 27වැනි දා. 03වැනි දා ආවා අකුරණට. අකුරණත් එහෙම තමයි.

රඹුකේඇල පාර, මමයි ප්‍රාදේශීය ලේකම්තුමායි පළමුවැනි දවසේ කිලෝමීටර හයක් පයින් ගියේ. එහේදීත් එහෙම තමයි. එහේත් සජබයේ ප්‍රාදේශීය සභාව තමයි තිබෙන්නේ. ඒ ප්‍රාදේශීය සභාව වහලායි තිබුණේ. ඒ ප්‍රාදේශීය සභාවට support කරන ස්වාධීන මන්ත්‍රීවරුන් දෙදෙනෙක් එතැන වැඩ ටික කරගෙන හිටියා. ඒගොල්ලනුත් ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා බලලා, "මේ බැකෝ එකට ගිනි තියන්න ඕනෑ" කියලා ගියේ. මොකද, ඒ බැකෝ එකවත් ගන්න බැරුවයි තිබුණේ. එතකොට අපි ඒ පාරවල් ටිකත් ඇරලා දුන්නාට පස්සේ රඹුකේඇලට ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ආවා, 03වැනි දා. ඇවිල්ලා එක එක චෝදනා කළා. එතකොට අපි ඔක්කෝම පැහැදිලි කරලා කිව්වා, මෙහෙමයි වෙලා තිබෙන්නේ, මෙහෙමයි සිදු වුණේ කියලා. ඊට පස්සේ මම ඇහුවා එතුමාගෙන් ප්‍රශ්නයක්. එතුමා අපට චෝදනා කළා, අපි එතුමාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට කැඳවන්නේ නැහැ කියලා; ආපදා කළමනාකරණ කමිටුවට කැඳවන්නේ නැහැ කියලා. මම තමයි ඒකේ සභාපති. එතකොට මම කිව්වා, ඒ හැම වෙලාවේම ඔබතුමාට invitation letter එක යවනවා, ඒ වාගේම වාර්තාවත් අපි යවනවා කියලා. එතකොට මම ඇහුවා, හෙට මම ආපදා කළමනාකරණ කමිටුව කැඳවන්නම්, ඔබතුමාට එන්න පුළුවන්ද කියලා. "හා" කිව්වා. මම සාමාන්‍යයෙන් 8.30ට, 9.00ට කැඳවන ආපදා කළමනාකරණ කමිටු රැස්වීම එදා 10.00ට දමන්නම්, එන්න කියලා කිව්වා. එතුමා ගියා ගියාමයි. ඒ වාගේම තමයි දෙල්තොටත්. අපි පාර හදලා දුන්නාට පස්සේ එතැනට ගිහිල්ලා සජබයෙන් පත් වෙච්ච සභාපතිතුමා එතැන වැඩ කළා කියලා එතුමා කිව්වා. එතුමා ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එතුමා දැන ගන්න ඕනෑ, ඒ පාරවල් හැදුවේ පොලීසිය, හමුදාව ආදි අය මැදිහත් වෙලා කියලා. ඒ වාගේම ගොඩක් පිරිසක්, ගොඩක් ආයතන එකතු වෙලා තමයි ඒ වැඩ කළේ. එතුමා ඇවිල්ලා එතුමාගේ සජබයේ සභාපති ඒ වැඩ කළා කියලා ගියා. ඒ වාගේ තමයි හැම තැනම.

අපි මේවා කියන්න ඕනෑ හින්දයි කියන්නේ. "දිට්වා" සුළි කුණාටුවේදී විපතට පත් වුණු ජනතාව ගැන දැන් හැමෝම කථා කරනවා. හැබැයි අපි ඒ ජනතාව සාමාන්‍ය ජීවිතය ගත කරන මට්ටමට දැන් ගෙනැල්ලා තිබෙනවා. ඊට පස්සේ අපට rebuilding වැඩ ටික කරන්න තිබෙනවා. ඒ සඳහා අපට වාහන සහ උපකරණ ආදිය අවශ්‍ය වෙනවා; JCB, dump trucks, water bowsers, gully bowsers, chainsaws ආදිය අවශ්‍ය වෙනවා. මොකද, අපට කරන්න තවත් වැඩ තිබෙනවා. මේ කියපු පනත යටතේ වන රෙගුලාසි වෙනස් කළාට පස්සේ අපට ඒ ටිකත් ඉක්මනටම ගෙනැල්ලා, ඒ නිවාස ටිකත් ඉක්මනටම හදලා දීලා, ඒ මිනිසුන් පරණ තත්ත්වයට වඩා හොඳ තත්ත්වයට පත් කරන්න අපිට පුළුවන් වෙනවා. ගරු ජනාධිපතිතුමා නිතරම කියන විධියට අපි ඒ ජනතාව පරණ තත්ත්වයට වඩා හොඳ තත්ත්වයට පත් කරනවා. ඒ අය නැවත පදිංචි කරවලා, ඒ අයගේ ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට ගෙන එන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, කෞශල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය ගරු සභාවේ ඉන්නවාද දන්නේ නැහැ. එතුමිය මගේ නම සඳහන් කරලා කථාවක් කියලා තිබුණා. මට එයට උත්තර දෙන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියකින්, කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම උතුර නියෝජනය කරනවා. හැබැයි, මට දකුණේ එතුමියගේ ගෙදරට ඇවිල්ලාත් ඡන්ද ගන්න පුළුවන්. මගේ හැසිරීම ගැන එතුමිය කථා කළා. මම කලින් point of Order එකක් ඉල්ලුවේ ඒ වෙලාවේ සභාවේ Quorum එක තිබුණේ නැති නිසා. මන්ත්‍රීවරු 20දෙනෙක් හිටියේ නැහැ. අඩුම ගණනේ 20දෙනෙක් ඉන්න ඕනෑ. ඒ අවස්ථාවේ 14දෙනායි හිටියේ.

අනෙක් එක, අපි තෝසේ කන්න නොවෙයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ. අපි තෝසේ කන්නෙත් නැහැ. අපි පොත්වල buddy.net දාන්නෙත් නැහැ. කුණු හරුප කථා කරන සුද්දා බේර ගන්න පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරන්නෙත් නැහැ. අපි කථා කරන්නේ මේ රටේ ඉන්න දෙමළ, සිංහල හා මුස්ලිම් හැම පුරවැසියෙකු වෙනුවෙන්. මෙතැන ඉන්න කවුරු හරි කෞශල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමියගේ number එක තිබෙනවා නම්, කථා කරලා කියන්න.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා; you have six minutes.

[பி.ப. 4.09]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு 8 நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருந்தது. அது 7 நிமிடங்களாகக் குறைந்து, இப்போது 6 நிமிடங்களாகக் குறைவடைந்து விட்டது. அந்த 6 நிமிடங்களையும் எனக்கு முழுமையாகப் பெற்றுத்தர தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்றைக்கு இந்தச் சபையில் இரண்டு சட்டங்களுக்குக்கீழ் உருவாக்கப்பட்ட ஒழுங்குவிதிகளில் திருத்தம் கொண்டு வரப்பட்டு இருக்கின்றது. இப்பொழுது நாங்கள் விவாதித்துக் கொண்டு இருக்கின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றி பார்ப்போம். கடந்த காலங்களில் எங்களுடைய நாட்டில் மிகவும் பாரதூரமான பல சட்டங்கள் இருந்திருக்கின்றன. அது மாத்திரமன்றி, நாட்டு மக்களை அடக்கி ஒடுக்கக்கூடிய சட்டங்களும் இருந்திருக்கின்றன. இன்றைய கால சூழ்நிலைக்கு ஏற்ப அந்தச் சட்டங்களை மாற்றம் செய்ய வேண்டிய தேவை இருக்கின்றது. அதேபோன்று, அந்தச் சட்டங்களுக்குக் கீழான ஒழுங்குவிதிகளையும் மாற்றம் செய்யவேண்டிய தேவை இருக்கின்றது. அந்த வகையில், இன்றைக்கு இங்கு விவாதிக்கப்படுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளில் மாற்றஞ்செய்யப்பட்டிருப்பது காலத்தின் தேவையாக இருக்கின்றது. எனினும், இந்த ஒழுங்குவிதிகளில் செய்யப் படுகின்ற முக்கியமான சில மாற்றங்களை நான் இங்கு எச்சரிக்கையாகச் சொல்லிவைக்க விரும்புகின்றேன்.

உதாரணத்துக்கு, அண்மையில் ஏற்பட்ட 'தித்வா' சூறாவளிக்குப் பின்னர், வெளிநாட்டு நிறுவனங்கள், வெளிநாட்டு அரசாங்கங்கள், வெளிநாட்டைச் சேர்ந்த தனி நபர்கள் எங்களுடைய நாட்டிலுள்ள Disaster Management Centreக்கு - DMC - வழங்குகின்ற நன்கொடைகளை எந்தவிதமான இறக்குமதிக் கட்டுப்பாட்டு உரிமமும் இல்லாமல் எங்களுடைய நாட்டுக்குள் வரவழைப்பதற்கான அனுமதி இந்தச் சட்ட ஏற்பாட்டின் ஊடாக வழங்கப்படுகின்றது. மிகவும் emergencyஆன ஒரு சூழல் இருக்கும்போது, இவ் வாறானதோர் அனுமதியை வழங்குவதில் பிழையில்லை. இருந்தாலும், இந்த அனுமதியைத் தவறாகப் பயன்படுத்தாமல் இருப்பதை இந்த அரசாங்கம் உறுதிசெய்ய வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி இந்த நாட்டுக்குள் பலர் தங்களுக்குத் தேவையான, இந்த நாட்டின் சட்ட திட்டங்களுக்குப் புறம்பான விடயங்களைச் செய்வதற்கு முற்படலாம். எனவே, இதனை நான் இந்த அரசாங்கத்துக்கு ஓர் எச்சரிக்கையாகச் சொல்லிவைக்க விரும்புகின்றேன்.

நன்கொடையாகக் கிடைக்கும் இறக்குமதிக் கட்டுப்பாட்டு உரிமம் இல்லாத பொருட்களைக் கொண்டுவருவதற்குக்கூட இந்தச் சட்ட ஏற்பாட்டின்மூலம் அனுமதி வழங்கப்படுவதற் குரிய சந்தர்ப்பம் இருக்கிறது. உதாரணத்துக்கு பிளாஸ்ரிக் பொருட்களைக் குறிப்பிடலாம். 2004ஆம் ஆண்டு இந்த நாடு சுனாமியால் மிக மோசமாகப் பாதிக்கப்பட்டபோது, நான் முல்லைத்தீவு மாவட்டத்தில் வைத்தியராகக் கடமையாற்றிக் கொண்டு இருந்தேன். உணவுப் பொருளாக இருக்கலாம், மருந்துப் பொருளாக இருக்கலாம், உடு புடவைகளாக இருக்கலாம், அப்போது அங்கு கிடைக்கப்பெற்ற சில நிவாரணப் பொருட்கள் எங்களுடைய நாட்டுக்குப் பொருத்த மற்றவையாக இருந்தன. அதாவது, எங்களுடைய நாட்டின் காலநிலைக்கு ஒவ்வாத பொருட்கள், - உடுப்புகள், உணவுப் பதார்த்தங்கள் - எங்களுடைய மக்கள் பயன்படுத்திப் பழகாத அல்லது பயன்படுத்தாக பிளாஸ்ரிக் பொருட்கள் என்பன நிவாரணமாக வந்து சேர்ந்தன. இறுதியில், எங்களுடைய அரச நிருவாகத்துக்கு குறிப்பாக, சுகாதாரத்துறை நிருவாகத்துக்கு இந்தப் பொருட்களைக் கையாள்வது எப்படி என்று தெரியவில்லை. அவை storesஇல் நிரம்பி, மக்களுக்குப் பயனில்லாமல் போனது. இந்தப் பொருட்களை inventoryஇலிருந்து வெளியில் எடுப்பதற்கு பட்டபாடு அந்தக் காலத்தில் வேலைசெய்த அரசாங்க உத்தியோகத்தர்களுக்குத் தெரியும். இந்தச் சட்ட ஏற்பாட்டைப் பயன்படுத்தி எங்களுக்குக் கிடைக்கக்கூடிய பொருட்கள் எல்லாவற்றையும் கையேந்தி வாங்காமல் இருப்பதற்கும் ஒரு கட்டுப்பாடு இருக்க வேண்டும். இப்பொழுது வெளிநாடுகளிலிருந்து மிகவும் இலவுவாகப் பொருட்களைக் கொண்டுவரக்கூடிய சூழ்நிலை ஏற்பட்டிருக்கிறது.

இன்னுமொரு முக்கியமான விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இலங்கைத் தர நிலைகள் நிறுவனத்தின் அனுமதியைப் பெறாமல் பொருட்களை நாட்டுக்குள் கொண்டுவரலாமா, கொண்டுவர முடியாதா? என்ற தீர்மானத்தை இறுதியாக எடுக்கக்கூடியவர் ஒரு தனிநபர். அதாவது, இந்தப் பொருட்களைச் சுங்கத் தீர்வை இல்லாமலும் சுங்கத்தில் தடைப்படாமலும் கொண்டுவருவதற்குரிய முழு அதிகாரமும் இறக்குமதி, ஏற்றுமதிக் கட்டுப்பாட்டாளருக்கு வழங்கப்பட்டு இருக்கின்றது. இவ்வாறு தனிநபர் ஒருவருக்கு இவ்வளவு பெரிய அதிகாரத்தைக் கொடுப்பது பாரதூரமான விளைவுகளை ஏற்படுத்தலாம்.

நான் ஏற்கனவே கூறியதுபோன்று, எங்களுடைய நாட்டிலுள்ள பல சட்டங்களை மாற்ற வேண்டிய தேவையிருக்கின்றது. எங்களுடைய நாட்டில் மிக மோசமான சட்டங்கள் இருக்கின்றன. இலங்கையில் காணப்படுகின்ற மிக மோசமான சட்டம் எதுவென்றால், மகாவலி அதிகாரசபையை உருவாக்கிய சட்டம்தான். எங்களுடைய காணிகளை ஆக்கிரமிப்பதற்கு அதற்கு எல்லையற்ற சுதந்திரம் கொடுக்கப் பட்டு இருக்கின்றது. அதேபோல, வனவளத் திணைக்களமும் வனசீவராசிகள் திணைக்களமும் எங்களுடைய காணிகளை ஆக்கிரமிக்கின்றன. இந்தத் திணைக்களங்களை எவராலும் கட்டுப்படுத்த முடியாமல் இருக்கின்றது. இத்திணைக்களங்கள் எங்களுக்குத் துன்பங்களை ஏற்படுத்திக்கொண்டு இருக்கின்றன. இவ்வாறான சட்டங்களிலும் மாற்றங்களைக் கொண்டுவர வேண்டும்.

அதேபோல, எங்களுக்குப் பிரயோசனமான சில சட்டங்களிலும் மாற்றங்களைக் கொண்டுவர வேண்டும். எமது நாட்டிலுள்ள பெரும்பாலான உள்ளூராட்சிச் சபைகள் மிகவும் குறைந்த வருமானம் கொண்டவை. நாங்கள் சிறுவர்களாக இருந்த காலத்தில், உள்ளூராட்சி மன்றங்கள் மிதிவண்டி களுக்கு licences கொடுப்பதைக் கண்டிருக்கிறோம். இப்பொழுது அவற்றால் அந்த licencesஐக் கொடுக்க முடியாமல் இருக்கின்றது. ஏனென்றால், அந்த licencesக்காக அவை அறவிடுகின்ற கட்டணம் 5 ரூபாய். அதேநேரம், அந்த இலக்கத் தகட்டைச் செய்வதற்கு 25 ரூபாய் வேண்டும். ஒவ்வோர் உள்ளூராட்சி மன்றமும் இந்தச் சட்டத்தை நடைமுறைப்படுத்துவதென்றால், ஒவ்வோர் இலக்கத்

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

தகட்டுக்கும் 20 ரூபாயை மேலதிகமாகச் செலவு செய்ய வேண்டும். எனவே, நாங்கள் இந்தச் சட்டத்தை உடனடியாக மாற்ற வேண்டும்.

நாங்கள் இந்த உயரிய சபையில், மனித உயிர்களை விபத்துக்களில் இருந்து பாதுகாப்பதற்கான சட்டத்தில் திருத்தங்களைக் கொண்டுவந்து விவாதித்தோம். இன்றைக்கு எங்களுடைய வடக்கு, கிழக்கில் ஏற்படுகின்ற பெரும்பாலான வீதி விபத்துகளுக்கு முக்கிய காரணமாக இருப்பது விலங்குகள்! இதனை நான் பல இடங்களில் சொல்லி இருக்கிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் முடிவடைந்து விட்டது.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
எனக்கு ஒரு நிமிடம் தாருங்கள்! மிகவும் முக்கியமான விடயம் பற்றி சொல்கின்றேன்.

விலங்குகள் இரவு நேரத்தில் Roadஇல் படுத்திருப்பதனால் விபத்துகள் நிகழ்கின்றன. விபத்துக்குள்ளாகி பலர் இறக்கின் றார்கள். எங்களுடைய நாட்டில் யுத்தத்தால் இறந்தவர்களிலும் பார்க்க அதிகமானவர்கள் விபத்துகளால் இறக்கிறார்கள். அதாவது, ஒரு வருடத்துக்கு 2,500 பேர் விபத்துகளால் இறக்கின்றார்கள். நான் சொல்கின்ற சிறியதொரு விடயத்தைச் செய்தால், விபத்துகளைத் தடுக்கலாம். கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களமானது, ஒவ்வொரு கால்நடையினதும் காதில் ear studs - plastic தோடு - ஒன்றைப் போடுகின்றது. இரவில் வெளிச்சத்தில் மினுங்கக்கூடிய தோடாக அதனைப் போட்டால், இரவு நேரங்களில் வீதிகளில் ஏற்படுகின்ற விபத்துக்களைத் தடுக்கலாம். நான் சொல்லவருகின்ற விடயம் என்னவென்றால், எங்களுடைய நாட்டில் இருக்கின்ற பல சட்டங்கள் மாற்றியமைக்கப்பட வேண்டும் என்பதைத்தான். மக்களுக்குப் பிரயோசனமான திருத்தங்கள் வரும்போது, அதற்கு எமது ஆதரவு நிச்சயமாக இருக்குமெனக் கூறி, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
Sir, I propose that the Hon. Sanjeewa Ranasingha do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 4.17]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ අපි කථා කරන්නේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පිළිබඳවයි. අපට මෙම රෙගුලාසි අනුමත කර ගන්න සිදු වෙලා තිබෙන්නේ, විදේශ රටවලින් පරිත්‍යාග කරන ලද භාණ්ඩ නිෂ්කාශනය කඩිනම් කිරීම සඳහායි.

"දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වුණු ආපදා තත්ත්වය තුළ අපේ රටට නොයෙකුත් ආකාරයේ පරිත්‍යාග ලැබුණා. සමහර පරිත්‍යාග මුදල් විධියට, සමහර පරිත්‍යාග භාණ්ඩ විධියට සහ විශේෂඥ දැනුම විධියටත් ලැබුණා. විශේෂයෙන්ම භාණ්ඩ විධියට ලැබුණු පරිත්‍යාග රට තුළට රැගෙන ඒමේ යම් ශීඝ්‍රගාමී ක්‍රමයක් අවශ්‍ය වුණා. ඒ සඳහා තමයි අදාළ අංශ විසින් ඒ පිළිබඳව සාකච්ඡා කරලා ඒ භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා මේ විධියට නිගමනයකට එන්නේ. අපේ රටට ලැබෙන පරිත්‍යාග සම්බන්ධයෙන් ගත්තාම, විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශ විධියට අපි එම පරිත්‍යාග සම්බන්ධව ගොඩක් සැලකිලිමත් වනවා. ඒකට හේතුව තමයි, අපට තිබෙන අත්දැකීම් අනුව ගත්තොත්, සමහර පරිත්‍යාග අවශ්‍ය නොවීම. විශේෂයෙන් සුනාමි කාලයේ ලැබුණු අත්දැකීම තමයි, ඒ ලැබුණු බොහෝ භාණ්ඩ කිසිදු වැදගත්කමකින් යුක්ත ඒවා නොවීම. එම නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපට මොන වාගේ දේවල්ද අවශ්‍ය වෙන්නේ කියලා ලේඛනයක් සකස් කළා. එහෙම ලේඛනයක් සකස් කරලා, අදාළ පාර්ශ්ව විසින් අපෙන් විමසුවාම අපි ඔවුන්ට අපේ ප්‍රමුඛතා ලබා දුන්නා. මොකද, යම් යම් ඉලෙක්ට්‍රොනික් යන්ත්‍ර වාගේ දේවල් ලංකාවට ගෙනාවම ඒ තාක්ෂණය දන්න, අපට ඒ service එක ගන්න පුළුවන් companies ලංකාවේ නැහැ. එතකොට තවදුරටත් අපට ඒවා පාවිච්චි කරන්න බැරි වෙනවා. ඒ වාගේම, සමහර උපකරණ තිබෙනවා, ඒවාට යොදවන reagents, ඒ සඳහා යොදවන රසායන ද්‍රව්‍යවලට වැය වන මුදල ඉතාම ඉහළයි. සමහර වෙලාවට අපට ද්‍රව්‍ය පරිත්‍යාග කරන අය කියනවා, අපි hospitalsවලට මේ මේ විධියට මැෂින් දෙන්නම් කියලා. නමුත්, ඒවා පාවිච්චි කරන්න යන වියදම බැලුවාම ඒ මැෂින් එකේ මුදල වාගේ දෙතුන් ගුණයක වියදමක් අපට වාර්ෂිකව වියදම් වෙනවා. අපි සාමාන්‍යයෙන් මැෂින් එකක් ගන්නකොට ඒ වියදම පිළිබඳව සොයා බලා තමයි ගන්නේ. ඒ නිසා සමහර පරිත්‍යාග අපි ඉතාම කල්පනාකාරීව භාරගත යුතුව තිබෙනවා. මොකද, පරිත්‍යාග මුවාවෙන් යම් යම් දේවල් සිද්ධ වෙන්න පුළුවන් නිසා. නමුත්, විදේශ රාජ්‍යයන්ගෙන් අපට ලැබුණු පරිත්‍යාග, ඒ වාගේම අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබුණු පරිත්‍යාග ඉතාම ඵලදායීව යොදාගන්න පුළුවන් විධියට මෙවර ලබා ගන්න පුළුවන්කමක් ලැබුණා. ඒ වාගේම, සමහර දේවල් අපට ලැබෙමින් පවතිනවා. අපි ඒ පරිත්‍යාග විධියට ලැබෙන භාණ්ඩවලට පනවන tax එක අඩු කර තිබෙනවා. ඒ වාගේම tax එක ඉවත් කරලාත් තිබෙනවා. අපි දන්නවා, යම් උපකරණයක්

අරගෙන එනකොට ඒ පිළිබඳ quality එක සොයා බලන ආයතන තිබෙන බව. උදාහරණයක් ගත්තොත්, වෛද්‍ය උපකරණ සම්බන්ධව අපේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ - NMRA එකේ - අවසරය ලබා ගත යුතුයි. අපි ඒකට WR දීලා, එහෙම නැත්නම් ඒ මොහොතට registration එක දීලා ඉවර වෙලා තිබුණත්, අපි මේ රටේ රෝගීන් සඳහා ඒ ඖෂධ හෝ උපකරණ ලබා ගන්නකොට නැවත ඒ පිළිබඳව සොයා බැලීමක් කරලා තමයි රෝහල් පද්ධතියට හෝ community එකට ඒ බඩු යවන්නේ. මේ පනතින් අපි යම් ශීඝ්‍රගාමී ප්‍රවේශයක් ලබා ගත්තත්, ඒවා නැවත check කරලා තමයි අපි ජනතාවට යවන්නේ. අපි ඒවායේ quality එක පිළිබඳව සැහෙන සැලකිලිමත් වෙනවා. ඒ සම්බන්ධව බලන අතරම, අපි සැලකිලිමත් වෙනවා අනවශ්‍ය පරිදි ඒ සඳහා ගතවන කාලය දිගු නොකරගන්න. නැත්නම් අන්තිමට වෙන්නේ ඒ ගෙනාපු බඩු කල් ඉකුත් වූ භාණ්ඩ බවට පත් වෙන එක. මෙවර වුණත් අපි ඒ කටයුතු කොයිතරම් වේගයෙන් කළත් සමහර ඖෂධ සම්බන්ධයෙන් ගත්තාම කල් ඉකුත් වූ ඖෂධ බවට පත් වෙලා තිබුණා. මොකද, සමහර වෙලාවට අපට එවා තිබුණේ කල් ඉකුත් වීමට ආසන්න අන්තිම මාස තුනේ තිබෙන ඖෂධ. අපි සාමාන්‍යයෙන් ලංකාවට එහෙම ගෙන්වන්න දෙන්නේ නැහැ. නමුත්, මේ ක්‍රමය ඇතුළේ අපට එහෙම ඇවිල්ලා තිබුණා. කොහොම වුණත්, මේ පනත අපට ඉතාම වැදගත් වෙනවා.

අපට තවත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපේ 1990 "සුවසැරිය" ambulances ගත්තොත්, ඒවා පැරණි තත්ත්වයේ තමයි තිබෙන්නේ. අපි මේ අවුරුද්දේ යම්කිසි ambulances ප්‍රමාණයක් ගෙන්වන්න බලාපොරොත්තු වෙනකොට ඉන්දියානු රජයෙන් අපට ආරාධනයක් ලැබුණා, ඔවුන් ambulances විශාල ප්‍රමාණයක් පරිත්‍යාග කරන්න සූදානමින් සිටින බවට. ඒ වාගේම, ආසියානු සංවර්ධන බැංකුවෙන් තවත් ambulances ප්‍රමාණයක් අපට ලබා දෙන්න පොරොන්දු වුණා. ඒ වාගේම, පෞද්ගලික පරිත්‍යාගශීලීන් තවත් ambulances ප්‍රමාණයක් ලබා දෙන්න පොරොන්දු වුණා. ඒ නිසා තව ambulances 153ක් "සුවසැරිය" ambulancesවලට ඇතුළත් වීමට නියමිත වෙලා තිබෙනවා. අපි මේ අවස්ථාවේ තීරණය කළා, අපේ තිබෙන අවශ්‍යතාව සලකා බලා මේ වැඩ පිළිවෙළ යටතේම ඒ ambulances ගෙන්වා ගන්න. ඒ නිසා ඒකත් මේ පනත යටතේම ගෙන්වා ගන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, මම පොඩ්ඩක් අද දිනට අදාළ මාතෘකාවෙන් බාහිර කාරණයක් කියන්න කැමැතියි. පසුගිය දවස් පිළිබඳව සලකා බැලුවාම, මේ පාර්ලිමේන්තුවේ quality එක සම්බන්ධව සැහෙන ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුව කියන්නේ අණ පනත් සම්මත කරන ස්ථානය. මෙතැන තමයි මේ රටේ යම් යම් දේවල්වල දිශානතිය තීරණය කරන්නේ. ජනතාව - ඡන්ද දායකයන් - ඉතාම වගකීමෙන් යුතුව මන්ත්‍රීවරුන් තෝරා පත් කර එව්වා නම් මේ ප්‍රශ්න ඇති වන්නේ නැහැ. එහෙම ආපු සමහර ජනතා නියෝජිතයන් ඔවුන් දන්නා දේවල් ගැන තමයි කථා කරන්නේ. ඉතින් ඒක ඔවුන්ගේ වරදකුත් නොවෙයි. කොහොම වුණත්, සමහර අය හොඳට දන්නා මාතෘකා, subjectsවලට බැස්සාම හොඳින් ඒ ගැන කථා කරනවා. මොකද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වාගේ ඒවා ගත්තාම ගොඩක් දිග, ගැඹුරු මාතෘකා. නමුත් ඒවායේ ඒගොල්ලන්ට ජේන පොඩි කෑලි තිබෙනවා. ඉතින් ඒ කෑල්ලක එල්ලිලා, ඒකේ රස විඳිමින් ඉන්නවා.

මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මට ඊට අමතරව කියන්න තිබෙන කාරණය මේකයි. අපි මහනුවර මහ නගර සභා ප්‍රදේශය තුළ පදික වෙළෙඳාම් ඉවත් කරලා තිබෙනවා. ඒ ඉවත් කළේ එක සැරේට හිතිලා නොවෙයි, ඒක අවුරුද්දක ක්‍රියාදාමයක්. මාස 6ක ඉඳලා ඔවුන්ට විකල්ප ස්ථාන දීලා තමයි ජනවාරි 01වෙනි දා ඉඳලා ඒ ඉවත් කිරීම කළේ. මහනුවර ජනතාවට විශාල සහනයක් වාගේම ඒ වෙළෙන්දන්ටත් ඒකෙන් විශාල සහනයක් වුණා කියලා අපි හිතනවා. අපේ මන්ත්‍රීවරියක් කිව්වා ඔවුන් අසාධාරණ ලෙස ඉවත් කළ කථාවක්. ඇත්තටම එහෙම වුණේ නැහැ. සමහර පදික වෙළෙඳුන් කියනවා ඔවුන්ට පදික වෙළෙඳාමට අඩියක්, දෙකක් දෙන්න කියලා. එහෙම අඩියක්, දෙකක් කියලා එකක් නැහැ, පදික වෙළෙඳාම නම් පදික වෙළෙඳාම, නැත්නම් නැහැ තමයි.

මහනුවර මහ නගර සභාවේ වරිපනම් සියයට 400කින්, සියයට 500කින් විතර වැඩි කරලා කියලා චෝදනාවක් ආවා. ඇත්තටම එහෙම වෙලා නැහැ. 2012 තක්සේරු වාර්තා අනුව තමයි මෙච්චර කල් වරිපනම් ගෙවලා තිබෙන්නේ. නමුත් 2024 අවුරුද්දේ ආපු audit report එකකින් කියලා තිබෙනවා, තක්සේරු වාර්තා යාවත්කාලීන කරන්න කියලා. තක්සේරු වාර්තා යාවත්කාලීන කළාම සමහර බිල්ඩින්වලට ආපු තක්සේරුව අනුව තමයි ඒ ගාණ වැඩි වෙලා තිබෙන්නේ, එහෙම නැතිව අය කරන සියයට ගාණ වැඩි වෙලා නොවෙයි. ඒ අනුව ඒවා නිවැරදි විය යුතුව තිබෙනවා.

කොහොම වුණත්, රටක් විධියට අපි පශ්චාත් ආපදා තත්ත්වය ඉතාම හොඳින් කළමනාකරණය කර ගත්තා කියලා අපට සතුටු වෙන්න පුළුවන්. නමුත් අපි ඉන්නේ සමහර තැන්වල තවමත් ආපදාව සිදු වෙමින් පවතින මොහොතක. මොකද, මේක අපි මුහුණ දීපු අනෙක් ආපදාවලට වඩා වෙනස් තත්ත්වයක්. ඒක නිසා අපි හැමෝම මුලින්ම මුහුණ දුන්නාට වඩා සංවිධානාත්මකව මේ සඳහා මුහුණ දිය යුතුව තිබෙනවා. ඒ වාගේම මේ සහන ක්‍රියාවලිය අපි තව ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා. නිවාස සාදා දීම, ඉඩම් තෝරා ගැනීම වාගේ ක්‍රියා අපි මේ දිනවල කරමින් සිටිනවා. ඒ ක්‍රියාවලියට අද අනුමත කර ගන්නා නියෝග ඉතාම වැදගත් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබාදීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන රෙගුලාසි ගැන කථා කරනකොට "දිට්වා" සුළි කුණාටුව පිළිබඳවත්, ඒ වෙච්ච හානි පිළිබඳවත් අදහස් දක්වනවා අපි දැක්කා. ඒ වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනත් අදහස් දැක්වූවා. අපි විපක්ෂයක් හැටියට විශේෂයෙන්ම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන අධ්‍යාපන ඇමතිතුමිය සහ අග්‍රාමාත්‍ය ගරු හරිනි අමරසූරිය මැතිනියට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගේන්න කටයුතු කරලා තිබෙනවා. අපි ඒ විශ්වාස භංග යෝජනාව ගේන්නේ ඇයි? මොකක්ද එහි අරමුණ? ඒ අරමුණ ඇති වුණේ එක්තරා මොඩියුලයක තිබුණු QR code එකක් නිසාද කියන එක පිළිබඳ අපි අවධානය යොමු කරන්න ඕනැ. මට කලින් කථා කළ අපේ නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යතුමාත් කිව්වා, සමහර මන්ත්‍රීවරුන්ට මේ පිළිබඳව පූර්ව දැනුවත්වීමක් නැහැ කියලා. ඔව්,

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

අපි පිළිගන්නවා. ගරු ඇමතිතුමනි, පූර්ව දැනුවත්කමක් තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ විශ්වාස භංග යෝජනාවට NPP එකේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සහයෝගය දෙනවා. එහෙම නැත්නම් ගෞරවනීය විධියට ගරු අධ්‍යාපන ඇමතිතුමියට ඉවත් වෙන්න කියන ඉල්ලීම කරනවා. අපි එහෙම කියන්නේ ඇයි? මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ගැන අපි දිගින් දිගටම ඇහුවා. නමුත් ආණ්ඩුව හංගාගෙන තමයි ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය කළේ.

හැබැයි, ඒ පිළිබඳව කරළියට ඇවිල්ලා දැවැන්ත ලෙස කථා කළේ 6 ශ්‍රේණියේ එක මොඩියුලයක website එකක් දාලා තිබුණු නිසායි. ඒක සමලිංගිකත්වය ප්‍රවර්ධනය කිරීමේ website එකක්. දැන් ඒකේ තිබෙන ප්‍රශ්නය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, YouTube වෙන්න පුළුවන්, Facebook වෙන්න පුළුවන්, Instagram වෙන්න පුළුවන්, ඒවාට ගියාම ඒවායේ අයිතිකරුවන්ට කෝටි ගණනක් මුදල් ලැබෙන බව. ඒවායේ advertisements ද යනවා. මේ පොත අච්චු ගහලා, බෙදන්න ඔන්න මෙන්න තිබියදී තමයි මේ දේ හෙළිදරව් වුණේ. එතකොට හතළිස් පන්ලක්ෂයක් වෙච්ච පාසල් දරුවන්ගේ අතට මේ පොත ගියා නම්, මේ website එක කීදෙනෙක් බලයිද, වැඩිහිටියෝ කී දෙනෙක් බලයිද? අපි මාධ්‍යයෙන් දැකලා තිබෙනවා, අපේ රට Google searchවලින් කොතැනද තිබෙන්නේ, වැඩිපුරම search කරලා තිබෙන්නේ මොකක්ද කියලා. එවැනි තත්ත්වයක් තිබියදී තමයි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේදී LGBTQ ප්‍රවර්ධනය සඳහා මේ විධියේ දෙයක් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙනවා, Comprehensive Sexuality Education කියලා. Comprehensive Sexuality Education කියන්නේ sex education නොවෙයි, ඒක sexuality. Sexuality කියන්නේ, ලිංගිකත්වය.

ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කාරණය ඔබතුමාටත් අදාළයි. 2020.10.10වැනි දා Health Promotion Bureau එකේ Director අත්සන් කරලා ලිපියක් යවනවා. ඒ ලිපියේ මෙසේ සඳහන් වනවා:

> "Workshop to Validate the Curriculum and Educational Materials on Comprehensive Sexuality Education (CSE) for School Adolescents in Sri Lanka"

මම ඒ ලිපිය **සභාගත*** කරනවා.

මේ ලිපියෙන් මොකක්ද කියන්නේ? Workshop එකක් තිබෙනවා, අපේ රටේ පාසල් යන දරුවන්ට comprehensive sexuality, එහෙම නැත්නම් ලිංගිකත්වය පිළිබඳව උගන්වන වැඩ පිළිවෙළ ස්ථිර කරන්න. It further states, I quote:

> "Further, following a recent discussion with the Ministry of Education, it has been proposed to develop and conduct a nationwide Training of Trainers (TOT). Programme for teachers, focusing on effective communication of CSE for students in Grades 6 and 7."

මේ CSE කියන්නේ, Comprehensive Sexuality Education.

මේ මොකක්ද කියන්නේ? 6 ශ්‍රේණියේ සහ 7 ශ්‍රේණියේ පාසල් දරුවන්ට ලිංගිකත්වය පිළිබඳව උගන්වන්න, ගුරුවරුන්ට උගන්වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තිබෙනවා. අපි බැලුවා, මේ Comprehensive Sexuality Education කියන්නේ මොකක්ද කියලා.

මා ළඟ ලියවිල්ලක් තිබෙනවා. මෙහි තිබෙනවා, "Technical Guidance of Sexuality Education" කියලා. මෙහි තිබෙන කාරණා කිහිපයක් මම කියන්නම්. "The integration of a gender perspective throughout CSE curricula..." CSE කියන්නේ, Comprehensive Sexuality Education. මේ කියන්නේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුවන්ට sex, gender කියලා දෙකක් නැහැ. අර ඩොනල්ඩ් ට්‍රම්ප් කියනවා වාගේ දෙකයි තිබෙන්නේ. ඒ තමයි, කාන්තා හා පිරිමි. මේගොල්ලන් ඒකට දමන්න හදන්නේ මොකක්ද? "…empowers young people to take responsibility for their own decisions and behaviours,..." පාසල් යන දරුවන්ට අවස්ථාව දෙනවා, තමන්ගේ ලිංගිකත්වය පිළිබඳව තීරණ ගන්න. තමන්ට ඒ හැකියාව තිබෙනවා කියලා මේකෙන් කියනවා. ඒක තමයි බිමල් රත්නායක මහත්මයා කිව්වේ රුපියල් 5,000ක් දීලා room එකකට යන්න කියලා. "..to build skills, attitudes, enable inclusive recognition for sexual orientation". Sexual orientation කියන්නේ මොකක්ද? එක එක්කෙනාට වෙන වෙන ලිංගික ආශාවන් තිබෙනවා. අන්න ඒක තමයි මේ කියන්නේ. ඊට පස්සේ gender identity කියන්නේ මොකක්ද? ගැහැනු නම් ගැහැනු, පිරිමි නම් පිරිමි. LGBTQ, bisexual, transgender, homosexual කියන ඒ වැඩ පිළිවෙළ තමයි මේ දාලා තිබෙන්නේ. ඊට පස්සේ තිබෙනවා, "... young people form respectful and healthy relationships with romantic sexual partners" කියලා. මොකක්ද ඒ කියන්නේ? 6 ශ්‍රේණියේ දරුවන්ට romance කොහේද තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි පැහැදිලිව තිබෙනවා, "CSE can address the relationship between sexuality, gender and power, and its political and social dimensions" කියලා. මේ කරන්න හදන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියලා මේ රටේ හයක් හතරක් නොතේරෙන දරුවන්ට මේ ටික ඇතුළත් කරන එක._

ඒ වාගේම, "Certain behaviours are seen as acceptable and desirable, while others are considered unacceptable. This does not mean that these behaviours do not occur, or that they should be excluded from discussion within the context of sexuality education. Children must train, allow and explore their sexuality" මේ මොකක්ද කියන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ කියන්නේ, මේ රටේ දරුවන්ට තමන් කැමැති ලිංගික දිශානතියකට ගිහිල්ලා කටයුතු කරන්න අවකාශය, අවස්ථාව දෙන්න කියන එකයි. මේක කියපු අපේ ප්‍රසාද් සිරිවර්ධන මන්ත්‍රීතුමාව අද CID එකට ගෙන්වා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය, මේ විධියට නම් මේ රටේ දරුවන්ගේ අනාගතය සම්බන්ධයෙන් කටයුතු කරන්නේ, අපි ඒ ගැන කනගාටු වනවා.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම තව පොඩි කාරණයක් කියලා කථාව අවසන් කරන්නම්. සැප්තැම්බර් 12වැනි දා Waters Edge එකේදී මේ රටේ ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතනයක, අපේ හිතවතෙකුගේ දරුවෝ පස් දෙනෙකුට ගහලා තිබෙනවා. Waters Edge කියන්නේ රජයේ ආයතනයක්. මේ පිළිබඳවත් රජයේ අවධානය යොමු කරලා මේ රටේ අහිංසක දරුවන්ගේ අධ්‍යාපනය ආරක්ෂා කරන්න කටයුතු කරන්න, ඒ වාගේම මේ රටට ආදරය කරන NPP එකේ මන්ත්‍රීවරුන් මේ පිළිබඳව අධ්‍යයනය කරලා කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.35]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் மீதான விவாதம் நடைபெறுக்கொண்டு இருக்கின்றது. அந்த வகையில், 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்குத் தேவையான பொருட்களைக் கொண்டுவருவதில் இந்த ஒழுங்குவிதிகள் சம்பந்தப்படுகின்றது. அந்த வகையில், இவ்வாறானதொரு திருத்தம் கொண்டுவந்ததையிட்டு நாங்கள் மகிழ்வுறுகின்றோம்; அதை வரவேற்கின்றோம்.

இந்த நாட்டில் முன்னர் இருந்த அரசாங்கமும் சரி, இந்த அரசாங்கமும் சரி, முஸ்லிம்களுடைய புனித அல்-குர்ஆனை இன்னும் சுங்கத்தில் தடுத்துவைக்கின்ற நிலைமையை நாங்கள் பார்க்கின்றோம். கடந்த அனர்த்தத்தால் இந்த நாட்டின் பல பாகங்கள் பாதிக்கப்பட்டு இருந்தன. அதன்போது வீடுகளுக்குள் வெள்ளநீர் சென்று, மக்களுடைய உடைமைகள் உட்பட இன்னோரன்ன விடயங்களும் பாதிக்கப்பட்டிருந்தன. புனித அல்-குர்ஆன் பிரதிகளும் வெள்ளநீரில் மூழ்கி, எமது மக்கள் பயன்படுத்த முடியாத அளவுக்கு நிலைமைகள் இருந்தன. அல்-குர்ஆனை ஓதுவதன் மூலம் நன்மையைப் பெற்றுக்கொள்ளக்கூடிய புனித காலமாக எதிர்வருகின்ற ரமழான் மாதம் இருக்கின்றது. வீடுகளில் இருக்கின்ற எங்களுடைய பெண்கள் அப்போது அதிகமாகக் குர்ஆனை ஓதுவார்கள். மேற்குறித்த ஒழுங்குவிதிகளை அமைச்சரவையில் சமர்ப்பித்து அங்கீகாரத்தைப் பெறுகின்ற சந்தர்ப்பத்தில், ஏன் எங்களுடைய அல்-குர்ஆன் சம்பந்தமான விடயத்தைச் சமர்ப்பித்து அதற்கான அங்கீகாரத்தைப் பெறவில்லை என்பதை நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இவ்வாறு பல விடயங்களில் முஸ்லிம்களுக்கு எதிரான கருத்துகளையும் வன்மங்களையும் இந்த அரசாங்கம் தொடர்ச்சியாகக் கொண்டுவருகின்றது. முஸ்லிம்கள் சார்பாக Cabinet அமைச்சர் ஒருவரை நியமிக்குமாறு சொன்னபோது, இங்கு இருக்கின்ற பலரும் முன்னர் இருந்த அமைச்சர்களை விரல்நீட்டுகின்ற, அவர்களைக் கேவலப்படுத்துகின்ற, கொச்சைப்படுத்துகின்ற நிலை இருந்தது. எதிர்க்கட்சியில் இருப்பவர்களுக்கு அல்லது சிறுபான்மைக் கட்சிகளுடைய - முஸ்லிம் கட்சிகளுடைய - தலைவர்களுக்கு அமைச்சுப் பதவியைக் கொடுக்குமாறு சொல்லவில்லை. இந்த நாட்டில் நடைபெற்ற 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் உட்பட முஸ்லிம்கள் சம்பந்தப்பட்ட விடயங்களில் நீங்கள் நியாயமாக நடந்துகொள்வீர்களென்ற நம்பிக்கையில்தான் ஒட்டுமொத்த முஸ்லிம்களும் உங்களுக்கு வாக்களித்தார்கள். அந்த வாக்குகள் ஊடாகத் தெரிவுசெய்யப்பட்ட எங்களுடைய முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களில் எவருக்காவது அந்த அமைச்சுப் பதவியைக் கொடுங்கள்! ஆனால், அதற்குத் தகுதியானவர்கள் - பொருத்தமானவர்கள் - இல்லை என்று நீங்கள் கூறுகின்றீர்கள்.

அண்மையில் சவூதி அரேபியாவின் ஜித்தாவுக்கான தூதுவரை நியமிக்கும் விடயத்திலும்கூட, அதற்குத் தகுதி யானவர்கள் இந்த நாட்டில் இல்லையென்கின்று எங்களுடைய பிரதி அமைச்சர் ஒருவரின் வாய்மூலமாகச் சொல்லுகின்ற அளவுக்கு உங்களுடைய அரசாங்கம் நடந்துகொண்டு இருக்கின்றது. இதனை நாங்கள் முஸ்லிம்களுக்கு எதிரான விடயமாகவே பார்க்கின்றோம். இந்தப் பாராளுமன்றத்தில் தேசியப்பட்டியல் மூலமான நியமனங்கள் 29 இருக்கின்றன. அது எதற்காகவென்று சொன்னால், நீங்கள் தகுதியில்லா தவர்கள் என்று கூறுகின்றவர்களுடைய இடத்துக்குப் பொருத்தமானவர்களை நியமிப்பதற்குத்தான். அதாவது, கல்வியியலாளர்களை, துறைசார்ந்தவர்களை உள்வாங்குவதற் காகத்தான் தேசியப்பட்டியல் வழங்கப்பட்டு இருக்கின்றது. முஸ்லிம்களில் துறைசார்ந்தவர்கள், கல்வியியலாளர்கள் இருக்கத்தக்கதாக, அவர்களுக்கு அதை வழங்காமல், நீங்கள் வழங்கியிருப்பது பொருத்தமற்ற ஒருவருக்கா? என்ற கேள்வியை நாங்கள் இந்தச் சந்தர்ப்பத்தில் முன்வைக்க விரும்புகின்றோம்.

உங்களுக்குத் தெரியுமோ, தெரியாதோ, அல்-குர்ஆனுக்கு எதிராகச் சதித்திட்டம் தீட்டியவர்கள் இன்று அழிந்துகொண்டு இருக்கின்றார்கள். அது போன்றுதான் கடந்த அரசாங்கமும் அழிந்தது; அதில் இருந்தவர்கள் மக்களால் மிகக் கேவலமான முறையில் விரட்டப்பட்டார்கள். அதற்குக் காரணம், அவர்கள் புனித அல்-குர்ஆன்மீது கைவைத்ததுதான். முஸ்லிம்களாகிய நாங்கள் பிரார்த்தித்தோம். அதுதான் நடந்தது. நீங்கள் ஆட்சிக்கு வந்த பிறகு அதனை விடுவிப்பீர்களென எதிர்பார்த்தோம். ஆனாலும், நீங்கள் அதனைச் செய்யவில்லை. உங்களுக்கோ, உங்களுடைய கட்சிக்கோ, அரசாங்கத்துக்கோ அதன் சாபம் வராது. இந்த நாட்டினது ஒட்டுமொத்த மக்களுக்கும் அது வரும். மக்களைப் பாதுகாப்பதற்காக வேண்டியாவது அந்த அல்-குர்ஆன் பிரதிகளை நீங்கள் விடுவிக்க வேண்டுமென இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

அரச, தனியார் துறையிலுள்ள தொழிலாளர்கள் சம்பந்தமான விடயங்களில் மாற்றங்களைக் கொண்டுவர வேண்டுமென்ற தீர்மானம் நிறைவேற்றப்பட்டது எமக்குத் தெரியும். குறிப்பாக, கடந்த இரண்டு, மூன்று நாட்களாக அக்கரைப்பற்று வைத்தியருக்கு எதிரான சர்ச்சையொன்று இடம்பெற்று வருகின்றது. அந்தப் பிராந்தியம் பூராவும் உள்ள ஏழை எளிய மக்களை - நோயாளர்களை - பார்வை யிடுவதற்கான சந்தர்ப்பம் இல்லாமல் போயிருக்கிறது. அந்த நிலைமை மூன்று நாட்களுக்கும் மேலாக நீடித்துக்கொண்டு இருக்கின்றது. இந்த விடயத்தை மிக அவசரமாகக் கவனத்தில் எடுத்து, ஏழை மக்களுடைய கவலைகளைத் தீர்க்க வேண்டும். இந்த வியடம் தொடர்பில் குறித்த வைத்தியருக்கு எதிராகப் பொதுமக்கள் நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்வதற்கான ஏற்பாடுகளையும் மேற்கொண்டு வருகின்றார்கள். எனவே, இன்று கொண்டுவரப்பட்ட இரண்டு ஒழுங்குவிதிகளும் மிகவும்

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

முக்கியமானவை என்று கூறிக்கொள்கின்றேன். இந்த அரசாங்கமானது, மக்களிடமிருந்து பெற்ற ஆணைக்கு எதிராகத் தொடர்ச்சியாகச் செயற்பட்டுக்கொண்டு இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
ஒரு நிமிடம் தாருங்கள்!

'பிரஜாசக்தி' என்ற ஒரு குழுவை அமைத்தன்மூலம், வென்றாலும், தோற்றாலும் இந்த அரசாங்கத்தில் பதவி என்ற ஒரு செயற்பாட்டைக் கொண்டுவந்து இருக்கிறார்கள். படித்தவர்கள், கிராம உத்தியோகத்தர்கள், பிரதேச செயலகங்களில் பணி புரிகின்றவர்கள் இந்த 'பிரஜாசக்தி'யின் தலைவர்களுக்குக்கீழ் இருந்து செயற்படுகின்ற நிலைமையை நாங்கள் பார்க்கின்றோம். பாராளுமன்ற உறுப்பினராக இருந்தாலும் சரி, பிரதேச சபையின் தவிசாளராக இருந்தாலும் சரி, அதன் உறுப்பினர்களாக இருந்தாலும் சரி, அதன் தலைவர்களின் அனுமதியின் பேரிலேயே தமது பிரதேசத்துக்கான வேலைத் திட்டங்களை முன்னெடுக்க வேண்டும். இவ்வாறானதொரு துர்ப்பாக்கிய நிலையை இந்த அரசாங்கம் ஏற்படுத்தியுள்ளது. இதனை நாங்கள் கேவலமான ஒரு விடயமாகவே பார்க்கின்றோம். சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.42]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு)ச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்து கொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். இலங்கையில் பல்வேறு அமைச்சுக்களிலும், பல்வேறு துறைகளிலும் பல்வேறு சட்டங்கள் காணப்படுகின்றன. நீண்டகாலமாக இலங்கையில் காணப்படுகின்ற சட்டங்கள் மாற்றத்துக்கு உட்படாமல் இருக்கின்ற விடயம் பாரிய பிரச்சினையாக உருவெடுத்து வருகின்றது. ஒரு பிரச்சினை ஏற்படுகின்றபொழுதுதான் அந்தச் சட்டத்தில் காணப்படுகின்ற குறைபாடுகளும் அதனுடைய போக்குகளும் வெளிப்படுகின்றன. அந்த வகையில், இறக்குமதி மற்றும் ஏற்றுமதிச் சட்டத்தின் கீழ் கொண்டு வரப்படுகின்ற விதிமுறை மாற்றங்கள் மட்டுமல்லாது, நாட்டினுடைய பாதுகாப்பு, பொருளாதார ஸ்திரத்தன்மை, பேரிடர் முகாமைத்துவம் மற்றும் தேசிய மீள் கட்டமைப்புத் தொடர்பாகவும் நாங்கள் பேச வேண்டியிருக்கின்றது. அண்மைக் காலத்தில் இலங்கை வரலாற்றில் ஒருபோதும் இல்லாதளவுக்கு பேரிடர் ஒன்று ஏற்பட்டது. அது பல அழிவுகதளை ஏற்படுத்தியிருக்கின்றது. அந்த அழிவின்பொழுது உலகநாடுகள் எல்லாம் ஒன்று திரண்டு இலங்கைக்கு பண ரீதியாகவும், பொருட்கள் ரீதியாகவும் பல்வேறு உதவிகளை வழங்கியிருந்தன. தற்பொழுதும் வழங்கி வருகின்றன. அவ்வாறு அனுப்பப்படுகின்ற பணம் மற்றும் பொருட்களைச் சரியான முறையில் முகாமை செய்ய வேண்டிய நிலைப்பாடு காணப்படுகின்றது.

கடந்த காலத்தில் National Disaster Relief Services Centre உருவாக்கப்பட்டது. தற்போதும் அதனூடாகத்தான் நிவாரணப் பணிகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. என்னைப் பொறுத்தவரை அந்த அமைப்பினூடாக மேற்கொள்ளும் பணியானது ஆரம்பக் கட்டம் மட்டுமே. அதில் பல முக்கிய திருத்தங்களைச் செய்ய வேண்டி இருக்கின்றது. அதனை முழுமையான மாற்றத்துக்கு உட்படுத்த வேண்டி இருக்கின்றது. ஏனென்றால், ஏற்றுமதி மற்றும் இறக்குமதி செய்யப்படும் பண்டங்கள் தொடர்பாக முழுமையான ஆற்றலை வெளிப்படுத்தாத அமைப்பாக அது காணப்படுகின்றது. எனவேதான், நாங்கள் தேவையான மாற்றங்களைக் கொண்டு வருகின்றோம்.

இன்று இலங்கையில் எங்கு பார்த்தாலும் வெள்ளம், வறட்சி, சூறாவளி மற்றும் காலநிலை மாற்றத்தால் உருவாகின்ற பேரிடர்களென தொடர்ச்சியான சவால்களை நாங்கள் எதிர்நோக்கி வருகின்றோம். அந்தச் சவால்களைக் கையாள வேண்டுமென்றால், மக்களுக்குச் சரியான முறையில் உதவிகளையும் பொருட்களையும் கொண்டு சேர்க்க வேண்டும். பொறுப்பான அரசாங்கம் என்ற வகையிலே மக்கள் அதைத்தான் எங்களிடமிருந்து எதிர்பார்க்கின்றார்கள். அந்த வகையிலே, நாங்கள் இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தை மறுசீரமைப்புச் செய்கின்றபொழுது, முழுமையான உதவிகள் மக்களைச் சென்றடையும். இன்றைய சூழலில், இதன் கட்டமைப்பை சட்ட ரீதியாகப் பலப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. குறிப்பாகச் சொல்லப் போனால், National Disaster Relief Services Centre எனப்படும் தேசிய அனர்த்த நிவாரண சேவை நிலையத்தை நாங்கள் பலப்படுத்த வேண்டி இருக்கின்றது. இதன்மூலம் அமைச்சுகள், துறைகள் மற்றும் அரச நிறுவனங்கள் என்பவற்றை தேசிய ரீதியிலே ஒருங்கிணைத்து, இலங்கையிலே வாழ்கின்ற அனைத்து மக்களுக்கும் அரசாங்கத்தின் சேவைகளைச் சரியான முறையிலே கொண்டு செல்ல வேண்டி இருக்கின்றது.

தற்போது நடைமுறையிலுள்ள சட்டங்களுக்குப் போதிய அதிகாரங்கள் காணப்படாதிருக்கின்றன. அதேபோன்று, தீர்மானங்கள் எடுப்பதிலே பல தாமதங்கள் காணப்படுகின்றன. பல இடங்களிலே நிர்வாகச் சிக்கல்களையும் நாங்கள் எதிர்நோக்கியிருக்கின்றோம். வருகின்ற பொருட்களைச் சரியான முறையிலே விநியோகிக்க முடியாத நிலை காணப்படுகின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பேரிடர் காலங்களிலே உணவு, மருந்துப் பொருட்கள், மருத்துவ உபகரணங்கள், கட்டுமானப் பொருட்கள், எரிபொருள் போன்ற அத்தியாவசியப் பொருட்களை நாங்கள் இந்த நாட்டுக்கு இறக்குமதி செய்ய வேண்டிய தேவை காணப்படுகின்றது. இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின்கீழ் பேரிடர் காலத்திலே விரைவான அனுமதிகளை நாங்கள் பெற்றுக்கொள்ள வேண்டும்.

அடுத்து, பதுக்கல் மற்றும் இலாப நோக்கத்துக்காக மக்களின் பணத்தைக் கொள்ளையடிக்கின்ற சில சுயநலக் கூட்டங்களைத் தடுத்து நிறுத்த வேண்டிய தேவை இருக்கின்றது. அத்துடன், நாங்கள் நிவாரணப் பொருட்களுக்கு முன்னுரிமை வழங்க வேண்டியது அவசியமாகும்.

அதற்காகத்தான் இந்தச் சட்டங்களிலே நாங்கள் திருத்தங்களைக் கொண்டு வருகின்றோம். எதிர்காலத்திலே இச்சட்டங்களை மேலும் விரிவாக்கிக் கொண்டு, மக்களுக்கு சிறந்த சேவையை நாங்கள் வழங்க இருக்கின்றோம். நாம் இங்கே "Rebuilding Sri Lanka" பற்றி உரையாற்றிக் கொண்டிருக்கின்ற இந்த நேரத்திலும்கூட, இலங்கையின் பல பாகங்கள் இயற்கை பேரிடரால் பாதிக்கப்பட்டுக் கொண்டிருக் கின்றன. குறிப்பாக, கிழக்கு மாகாணம் வெள்ளப்பெருக்கால் கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. அதேபோன்று, வடக்கு மாகாணத்திலும் வரலாற்றில் காணாதவாறு மழைவீழ்ச்சி ஏற்படக்கூடும் என எதிர்வுகூறப்பட்டு இருக்கின்றது. அது இன்றைய தினம் அல்லது நாளை நடக்கும் என்று சொல்கிறார்கள். அவ்வாறு பேரிடர் நிகழும்போது மக்கள் சொல்லொணாத் துன்பங்களை அனுபவிக்கின்றார்கள். குறிப்பாக, வடிகாலமைப்பு முறையான வகையிலே அமைக்கப் படாமை, வீடுகள் உரிய முறையிலே அமைக்கப்படாமை போன்ற காரணங்களால் நாட்டின் பல இடங்களிலே பேரிடர்கள் நிகழ்கின்றன.

"Rebuilding Sri Lanka" என்று சொல்கின்றபொழுது, நாங்கள் கட்டடங்களை மட்டும் மீளக் கட்டுவதாகக் கருத முடியாது. மாறாக, மக்களுக்கு உதவுகின்ற அரச மற்றும் தனியார் நிறுவனங்களை நாங்கள் பலப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. அதேபோன்று, சட்டக் கட்டமைப்புகளை நாங்கள் வலுவாக மேம்படுத்தி, எங்களுடைய சேவைகளை மக்களுக்குக் கொண்டு செல்ல வேண்டிய தேவை இருக்கின்றது. அத்துடன், பொருளாதாரக் கொள்கைகளைப் பேரிடர் முகாமைத்துவத்தோடு இணைத்து, இந்த நாட்டைச் சரியான முறையிலே கொண்டு செல்ல வேண்டிய தேவை இருக்கின்றது. பேரிடர் காலங்களிலே இறக்குமதி, ஏற்றுமதி முறைகள் சரியாக நடைபெறாது விடுகின்றபோது அல்லது அவை பாதிப்படைகின்றபோது, அந்தப் பாதிப்பு மக்களையே சென்றடைகின்றது. அவ்வாறு பாதிப்பு ஏற்படும்போது, அவர்கள் அரசாங்கத்தின்மீது விமர்சனங்களை முன்வைப்பார்கள். பொறுப்புள்ள அரசாங்கம் என்ற வகையில், அதை எம்மால் ஏற்றுக்கொள்ள முடியாது.

இன்றைய தினம் சபையில் பேசிய எங்களுடைய சகோதரி Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne அவர்கள் சில விடயங்களைத் தெளிவுபடுத்தியிருந்தார். நான் யாழ்ப்பாணத் தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற பாராளுமன்ற உறுப்பினர் என்றவகையில், சில கருத்துகளை முன்வைக்க விரும்பு கின்றேன். அண்மைக் காலங்களில் பாராளுமன்றத்துள்ளும் சரி, DCC கூட்டமாக இருந்தாலும் சரி, ஏனைய கூட்டங்களாக இருந்தாலும் சரி, சில அரசியல் தலைவர்கள் தங்கள் சுயநினைவை இழந்து பேசுகின்றார்கள். தாங்கள் எங்கே பேசுகின்றோம் என்ற நினைவை இழந்து, மக்கள் மத்தியில் தூஷண வார்த்தைகளைப் பேசுவதானது தமிழ் இனத்துக்கு இழுக்காக இருக்கின்றது. யாழ்ப்பாணம் மண்ணில் உள்ளவர்கள் படித்தவர்கள்; பண்பானவர்கள். நாகரீகமான மக்கள் வாழுகின்ற அந்த இடத்தினைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற எங்களாலும் அவ்வாறான வார்த்தைகளைப் பேசமுடியாது என்று இல்லை.

நேற்றைய தினம், எனக்கு கோபம் ஏற்பட்டதால், சிறியதொரு வார்த்தையைப் பேசிவிட்டேன். பாடசாலை அதிபர் ஒருவர் எனக்கு call பண்ணிச் சொன்னார், "றஜீவன், நீங்கள் அப்படியான நபர் இல்லையே! நீங்கள் நாகரீகமானவர்; பண்பானவர். அவ்வாறு கதைக்க வேண்டாம்; எனக்கு மனவருத்தமாக இருக்கின்றது" என்று. அந்தச் சிறிய வார்த்தையைப் பிரயோகித்ததற்கே மக்கள் கவலைப் படுகின்றார்கள் என்றால், நாங்கள் பொது இடங்களில், பாராளுமன்றத்துள் அல்லது வேறு இடங்களில் அவதூறான வார்த்தைகளை அல்லது தூஷண வார்த்தைகளைப் பேசுகின்ற பொழுது எங்களைப் பின்பற்றுகின்ற மாணவர்களாக இருந்தாலும் சரி, எதிர்கால சந்ததினராக இருந்தாலும் சரி, அவர்கள் எவ்வாறான கண்ணோட்டத்தை எங்கள்மீது வைத்திருப்பார்கள்? என்பதை நான் இந்த இடத்திலொரு கேள்வியாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
Give me one more minute, please.

யாழ்ப்பாண மாவட்டத்தை அல்லது வடக்கை பிரதிநிதித்துவப்படுத்துகின்றவர்கள் படித்தவர்கள், பண்பானவர்கள் என்பதை நான் இந்த இடத்தில் உறுதி கூறிக்கொள்கின்றேன். தற்போதைய சூழ்நிலையில், எதனைக் கதைத்தால் ஊடகங்களில் தங்களுடைய பெயர் வரும் என்ற நிலைப்பாடுதான் காணப்படுகின்றது. நல்ல விடயத்தைக் கதைக்கின்றபொழுது அது ஊடகங்களில் வெளிவராமல் இருக்கின்றது. தூஷண வார்த்தைகளைக் கதைக்கின்றபோது அது ஊடகங்களில் தலைப்புச் செய்தியாக வெளிவருகின்றது. அதற்குக் காரணம் அதிலே வருவாய் இருக்கின்றது; அதிலே ஒரு படபடப்பு இருக்கின்றது; அதிலே கிளுகிளுப்பு இருக்கின்றது. நாங்கள் அவ்வாறான செய்திகளை வழங்காமல். மக்களுக்கு ஆரோக்கியமான, பண்பான செய்திகளை வழங்குகின்ற தலைவர்களாக இருக்க வேண்டுமென்பதை இந்த இடத்தில் கேட்டுக்கொண்டு, வாய்ப்பினை வழங்கிய உங்களுக்கு நன்றிகூறி விடை பெற்றுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වෛද්‍ය රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.50]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
විනාඩි හතක් තිබිලා විනාඩි හය කළා. ඒ විනාඩි හය, විනාඩි පහ කළා.

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

முஸ்லிம் சகோதரர்களுக்கு வணக்கம். இன்றைய தினம் புத்தளத்தைச் சேர்ந்த முஸ்லிம் நண்பர்கள் தொடர்பாகக் கதைக்க வேண்டும். ஐயா, நான் மதில் பாய்ந்து கள்ளத் தோசை சாப்பிடப்போய் பிடிபட்டு, ஓடிய ஆள் இல்லை. படிப்பிப்பதாகச் சொல்லி, கூட்டிக்கொண்டுபோன பிள்ளையைக் கலியாணம் கட்டிய ஆள் நான் இல்லை.

முஸ்லிம் சகோதரர்கள் தொடர்பாகக் கதைப்பதற்கு வருகின்றேன். இன்று வரைக்கும் நான் சொல்லிக் கொண்டிருக்கின்றேன் நான் ஒரு தமிழன் என்று. 1976ஆம்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

ஆண்டு இந்தப் பாராளுமன்றத்தில் முஸ்லிம் மக்கள் தொடர்பாக தமிழ்த் தலைவர் ஒருவர் கதைத்ததற்குப் பின்னர் மறுபடியும் வரலாற்றிலே ஒரு தமிழ்த் தலைவன் இடம்பெறும் தருணம் இதுவென நினைக்கின்றேன். 1991ஆம் ஆண்டு வடக்கு மாகாணத்திலிருந்து முஸ்லிம் மக்களை வெளியேற்றியது பிழை என்று சொல்கின்ற தமிழன் நான். 'பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்' என்று சொல்வதால் என்னுடைய ஆகமம் பாதிக்கப்படாது. நான் ஒரு தமிழன்; இந்து சமயத்தவன். ஆனால், நான் சகல மதங்களையும் சமமாகப் பார்ப்பதற்கு ஆசைப்படுகின்றேன்.

புத்தளத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, வெட்கம்! உங்களுடைய இனத்தவரான முஸ்லிம் மக்கள் இன்னமும் வெள்ளத்தில் இருக்கின்றார்கள். கடந்த 06ஆம் திகதி அவர்கள் எனக்கு அனுப்பிய video என்னிடம் இருக்கிறது. சுமார் 319 குடும்பங்களுக்கு வீடுகளைத் துப்புரவு செய்வதற்கான காசு வழங்கப்படவில்லை. ஐயா, அந்த 25,000 ரூபாய் என்பது பிச்சைக் காசு! அவர்கள் முழங்கால் அளவு தண்ணீரில் நின்று video போடுகின்றார்கள் என்று புத்தளத்தைச் சேர்ந்த கௌரவ பாராளுமன்ற உறுப்பினர் சொல்லியிருக்கிறார். ஏனென்றால், அந்தப் பிச்சைக் காசு கிடைத்துவிடக்கூடாது என்பதற்காக.

தன்னுடைய முஸ்லிம் சமூகத்துக்கு அந்த 25,000 ரூபாயை இவர்களால் பெற்றுக்கொடுக்க முடியவில்லை. வெட்கம்! இங்கு வந்து தோசை சாப்பிடுவதற்காகவேண்டி, NPPக்கு வக்காலத்து வாங்குவதற்காகவேண்டி தன்னுடைய முஸ்லிம் சமூகத்தைக் கண்டுகொள்ளாமல் விடுவதா? பாராளுமன்றத்தில் இன்று மதிய உணவு தோசை! NPPமார் எல்லோரும் சாப்பிட்டது தோசை! ஆனால், நாங்கள் தோசை சாப்பிட மாட்டோம். வடையும் வாழைப்பழமும்தான் சாப்பிடுவோம். அந்த 319 குடும்பத்தவர்களும் கடிதம் எழுதி அனுப்பியிருக்கின்றார்கள். இன்றும் தலைக்கு மேல் தண்ணீர் நிற்கின்றது. அந்த இடம் எதுவென்று நான் சொல்கின்றேன். விருதோடை, புலுதிவயல் வட்டாரம், 601/A, கிராம சேவையாளர் பிரிவு. அப்பிரிவுக்குரிய GS - கிராம சேவகர் - முஸாபிர். அவர் ஒரு முஸ்லிம். முந்தல் பிரதேச செயலாளர் - DS - இமேஷா பெரேரா. வெட்கம் ஐயா! 200,000, 300,000, 1,000,000, 1,500,000 பெறுமதியான சொத்துக்களை இழந்திருக்கும் நேரத்தில், அந்த முஸ்லிம் மக்கள் NPP பிச்சைக்கார அரசாங்கத்திடம் கேட்பது 25,000 ரூபாய் காசு! தெற்கில் 50,000 - 75,000 ரூபாய் கொடுக்கின்றீர்கள்! தன்னுடைய சொந்த இனத்துக்கு அதனைக் கொடுக்க இவர்களால் முடியவில்லை. எனக்கு விளங்கவில்லை இவர் ஐந்து வேளை தொழுகின்றாரா? 'தம்பி, நீ ஒரு தமிழன்' என்றாலும் தங்களைப் பற்றி கதையுங்கள் என்று முஸ்லிம் நண்பர்கள் என்னைத் தொடர்புகொண்டு கவலைப்பட்டு அழுகின்றார்கள். முகப்புத்தகத்தில் கூடுதலாக என்னை விமர்சிப்பவர்கள் முஸ்லிம்கள்.

இன்றைக்கும் காலையில் பேசுவதற்குக் கிடைத்த நிமிடத்தில் முல்லைதீவு தொடர்பாகக் கதைத்தேன். இப்போது எனக்கு பேசுவதற்குக் கிடைத்திருப்பது 5 நிமிடங்கள். இந்தச் சந்தர்ப்பத்தில் வடக்கு மாகாணம் தொடர்பாக எத்தனையோ விடயங்கள் கதைப்பதற்கு இருந்தும், முஸ்லிம்களைப் பற்றி கதைப்பதற்குக் காரணம் இருக்கிறது. நாங்கள் முஸ்லிம் சமூகத்துக்குத் துரோகம் செய்திருக்கின்றோம், பிழை செய்திருக்கின்றோம் என்று இராமநாதன் அர்ச்சுனாவினுடைய மனச்சாட்சி சொல்கின்றது. அதனால்தான் நான் அவர்கள் தொடர்பாகக் கதைக்கின்றேன்.

ෆයිසාල් மன்த்‍ரීතුමා இருக்கின்றாரோ தெரியவில்லை. கொழும்பில் சேகரிக்கின்ற குப்பையைக் கொண்டுபோய், தன்னுடைய இனம் வாழுகின்ற அறுவைக்காட்டில் கொட்டு கின்றார்கள். வெட்கமாக இல்லையா? அந்த மக்களுக்கு எவ்வளவு பெரிய பொய்யைச் சொல்லியுள்ளார்கள். உங்களுக்கு இருப்பது ஐந்து வருடங்கள்தான். அதில் எந்தவித சந்தேகமும் இல்லை. இனிமேல் அந்த முஸ்லிம் சமூகம் உங்களுக்கு ஒரு வாக்கைக்கூட போடாது.

எனக்குச் சிலர் வீடியோக்களை அனுப்பியிருக்கின்றார்கள். அந்த உறுப்பினர் என்ன செய்திருக்கின்றார் என்றால், தன்னுடைய பிரதேச சபை உறுப்பினர் பெரோஸ்கானை அனுப்பி NPPஇற்கு support பண்ணுகின்ற குடும்பங்களுக்கு மட்டும் 25,000 ரூபாய் கொடுத்திருக்கின்றார். வெட்கமாக இல்லையா? உங்களை நினைக்கவே வெட்கமாக இருக்கின்றது. அதைவிட, எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி போன்றவர்கள் இனத்துரோகிகள் அல்லர்! கோடாலிக் காம்புகளும் அல்ல! இவர் எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ சிவஞானம் சிறீதரன் அவர்களுடன் எடுத்த படம் இது! இவர் சுமந்திரனுடன் எடுத்த படம் இது! அரசியலுக்காக நக்குகின்ற ஆட்கள் நாங்கள் இல்லை! நான் தமிழன்! நான் சுயாதீனமாகப் போட்டியிட்டு இந்தப் பாராளுமன்றத்துக்கு வந்தேன். கௌரவ றஜீவன் போன்ற ஆட்கள் வெட்கப்பட வேண்டும். மதில் பாய்ந்து போய் தோசை சாப்பிட்டவர்! அதேபோல, telephone களவெடுத்த கள்வனும் இருக்கின்றார். அதாவது, உங்களுடைய NPPஇல் இருக்கின்ற ஒரு பாராளுமன்ற உறுப்பினருக்கு telephone களவெடுத்ததாக வழக்குத் தாக்கல்செய்யப்பட்டிருக்கின்றது. இப்படியான வர்களைத்தான் வடக்கு மாகாணம் சார்ந்து நீங்கள் வைத்திருக்கின்றீர்கள். நான் DCC meetingஇல் எந்தவிதமான தூஷண வார்த்தைகளும் கதைக்கவில்லை. நான் இந்தப் பாராளுமன்றத்தில் வந்து தூஷண வார்த்தை கதைத்தது பற்றி முறைப்பாடு செய்திருக்கின்றேன். ஆனால், எங்களால் அதைப் பற்றி கதைக்க முடியும். வெட்கம் என்னவென்றால், வலி. வடக்கு காணி விடுவிப்புப் பற்றி ஒரு வசனம் கதைக்க இவர்களால் இயலாது!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර 20ක් දෙන්න. කථාව අවසන් කරන්නම්. செம்மறிக்கு என்று சொல்கின்றபோது, உண்மையான செம்மறி ஆடு வாய் திறந்து கதைக்கும் என்றால், அது சொல்லும், "அர்ச்சுனா! அர்ச்சுனா! என்னை செம்மறி என்று சொல்லாதே! இந்த செம்மறியோடு என்னை ஒப்பிடாதே! ஏனென்றால், original செம்மறியான எனக்கு வலிக்கிறது" என்று. இவர்கள் செம்மறிகளைவிடவும் கேவலமான ஒரு கூட்டம்! வலி. வடக்கு காணி விடுவிப்புப் பற்றி கதைக்க இயலாது! தையிட்டி පන්සල පற்றி கதைக்க இயலாது. மக்களுடைய காணிகளை Army பிடித்து வைத்திருக்கிறது. அதைப் பற்றி கதைக்க இயலாது! 169 மில்லியன் பெறுமதியான indoor stadium விவகாரத்தைப் பற்றி கதைக்க இயலாது!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඉක්මනින් අවසන් කරන්නම්. இவர் பெரிய gentleman மாதிரி கதைக்கிறார்; தூஷண வார்த்தைகளைப் பிரயோகிக்க வேண்டாம் என்று சொல்கின்றார். வெட்கம்! பிரதமருக்கு ஆதரவளிப்பதாகச் சொல்லிக்கொள்கிறார். இந்தப் பாராளு மன்றத்துக்கு நான் வந்தது தோசை சாப்பிட அல்ல என்று கூறி, நிறைவு செய்கின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.56]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்களுக்குப் பூரணமான சேவைகளை வழங்கிவருகின்ற-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින සභාවේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்களுக்குப் பூரணமான சேவைகளை வழங்கி வருகின்ற அரச நிறுவனங்களில் அம்பாறை மாவட்டத்திலே இயங்கிவருகின்ற பொத்துவில் பிரதேச செயலகமும் ஒன்றாகும். அது 269 சதுரகிலோமீற்றர் பரப்பளவும், 27 கிராம சேவகர் பிரிவுகளையும் கொண்ட மூவின மக்கள் வாழும் பிரதேசமாகும். இங்கு பாரிய ஆளணிப் பற்றாக்குறை நிலவுவதன் காரண மாகப் பொதுமக்கள் பூரணமான சேவைகளைப் பெற்றுக் கொள்ள முடியாமல் உள்ளனர். குறிப்பாக, ADS இல்லை! ADP இல்லை! ADR இல்லை! SSO இல்லை! AO/GN Acting கடமைபுரிவதுடன், 09 MSO, 05 GN, ICT - 01, Driver - 02 என வெற்றிடங்கள் உள்ளதுடன், 20இற்கும் அதிகமான ஏனைய திணைக்கள ஆளணி வெற்றிடங்களும் காணப்படுகின்றன.

அம்பாறை மாவட்டத்தில் 340 அபிவிருத்தி உத்தியோகத் தர்கள் அதிகமாக இருக்கின்றார்கள். ஆனால், இந்தப் பிரதேச செயலகத்தில் அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கான 20 வெற்றிடங்கள் உள்ளதாக அறிய முடிகின்றது. அது மட்டுமன்றி முஸ்லிம் சமய விவகார கலாச்சார உத்தியோகத்தர் அஸ்வர் மௌலவி, உளவளத்துணை உத்தியோகத்தர் A. சுக்கூர்உம் பதில் கடமை அடிப்படையில் கடமை புரிவது குறிப்பிடத் தக்கது.

கிழக்கு மாகாண காணி நிர்வாகத் திணைக்களத்தினது காணி உத்தியோகத்தரும் இங்கு நியமனம் செய்யப்படாமல் மிக நீண்ட நாட்களாக வெற்றிடமாக உள்ளது. எனவே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் பிரதேசம் உல்லாசப் பிரயாணத்துறைக்குப் பெயர்போன பிரதேசம் என்பதால் விரைவாக இந்த வெற்றிடங்களை நிரப்ப நடவடிக்கை எடுத்து எமது பிரதேச மக்கள் பூரணமான சேவைகளைப் பெறுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இங்கு கடமை புரிந்த காணி உத்தியோகத்தர் பஜீர் அகமட் அவர்கள் எந்தவிதமான காரணமும் இல்லாமல் 58வது வயதில் இடமாற்றம் செய்யப்பட்டதன் காரணமாகத்தான் இந்த பதவி வெற்றிடமாக இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்தில் இயங்குகின்ற லாகுகல பிரதேச செயலகமானது மிகவும் பின்தங்கிய நிலையில், அதிகமான ஆளணிப் பற்றாக்குறையுடன் இயங்கி வருவது மிகவும் வேதனையளிக்கின்றது. சுமார் 20 இற்கும் அதிகமான ஆளணிப் பற்றாக்குறையுடன் இச்செயலகம் மக்களுக்குச் சேவை வழங்கி வருகிறது. மேலதிக மாவட்ட பதிவாளரும் இதில் அடங்குகின்றார். ஆளணியினராக அருகில் உள்ள பொத்துவிலில் இருந்து இடமாற்றம் செய்யப்பட்டவர்கள் 6-8 வருட காலமாகச் சேவை செய்தும் மீண்டும் இடமாற்றம் பெற்று பொத்துவிலுக்குச் செல்ல முடியாமல் கஷ்டப் படுகின்றார்கள். எனவே, அரசாங்கமானது விரைவாக இந்த ஆளணிப் பற்றாக்குறையை நிவர்த்திப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், பூரணமாகக் குடிநீரை அம்மக்கள் பெறுவதற்கும் 'ஹெடா ஓயா' திட்டம் முக்கியம் என்பதுடன், அம்மக்கள் நீதியான முறையிலே ஆற்று மண்ணை ஏற்றி தங்களது வீடமைப்பு நிர்மாண வேலைகளை மேற்கொள்ளவும் நடவடிக்கை எடுக்கப்பட வேண்டும் எனவும் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

பல்வேறு சிரமங்களுக்கு மத்தியில் கடமை புரிகின்ற பிரதேச செயலாளர் என்.நவநீதராஜா, உதவி பிரதேச செயலாளர் சதீஸ்சேகரன் ஆகியோருக்கும் இந்தச் சபையில் நன்றி கூறுகிறேன். நான் இங்கு கடமை புரிந்தபோது உத்தியோகத்தர்கள் விடயத்தில் செய்து முடித்த சேவைகளை இன்று செய்து கொள்ள முடியாத அளவிற்கு ஆளணிப் பற்றாக்குறை உள்ளது. விரைவாக முகாமைத்துவ சேவை உத்தியோகத்தர்களையாவது முதலில் நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இனரீதியாகப் பிரிக்கப்பட்டுள்ள பொத்துவில் பிரதேச செயலகப் பாடசாலைகளை ஒன்றிணைத்ததான பொத்துவிலிற் கான தனியான வலயக் கல்வி அலுவலகம் ஒன்று ஆரம்பிக்கப்படல் வேண்டும் என்பதை மீண்டும் இந்தச் சபையில் ஞாபகப்படுத்தி வைப்பதுடன், பொத்துவில் பிரதேச செயலகப் பிரிவில் ஆசிரியர் வாண்மை விருத்தி நிலையம் ஒன்றை அமைப்பதன் ஊடாக அப்பிரிவில் கற்பிக்கும் ஆசிரியர்களுக்கான வசதிகளை மேம்படுத்துவதுடன், விரும்பிய அளவில் கற்பித்தலை ஊக்குவிக்கலாம் என்றும் குறிப்பிட விரும்புகின்றேன்.

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

நாடளாவிய ரீதியில் ஆசிரியர் பற்றாக்குறை காணப்பட்டாலும் குறிப்பாக, கிழக்கு மாகாணத்தில் 5,000 இற்கும் அதிகமான வெற்றிடங்கள் உள்ளதாக அறிய முடிகின்றது. விரைவாக இந்த வெற்றிடங்களை நிரப்ப நடவடிக்கை எடுப்பதுடன், ஆசிரியர்களை இடமாற்றம் செய்யும்போது தூர இடங்களுக்கு இடமாற்றம் செய்யாமல் அருகில் உள்ள பிரதேசங்களுக்கு மாற்றம் செய்தால், விரும்பிக் கற்பிக்கச் சந்தர்ப்பம் கிடைக்கும். குறிப்பாக, பொத்துவிலுக்கு மருதமுனையில் இருந்து கோமாரி வரையான பகுதிகளுக்கு ஆசிரியர்கள் நியமிக்கப்பட்டிருப்பதால், போக்குவரத்து உட்பட சோர்வு அடையும் நிலைமையும் ஏற்படுகிறது. அதிகளவான வெற்றிடங்கள் காணப்படும் பிரதேச பாடசாலைகளுக்கு அப்பிரிவின் விண்ணப்பதாரிகளை அடிப்படையாகக் கொண்டு ஆசிரியர் நியமனம் செய்வதன் மூலம் எதிர்காலத்தில் பிரச்சினைகள் ஏற்படாதவாறு பார்த்துக்கொள்ள முடியும் என்பதையும் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டு வர விரும்புகின்றேன். சித்த, ஆயுள்வேத, யுனானி மருத்துவப் பட்டதாரிகளுக்கு இனி அரச நியமனம் இல்லை அல்லது தாமதமாகலாம் என்று கூறுவதை அறிய முடிகின்றது. இதன்மூலம் அப்பீடங்களை அரசு மூடப்போகின்றதா? என்ற அச்சம் நிலவுகின்றது. இந்த நிலைமையை அரசு சாதகமாகப் பரிசீலிக்க வேண்டும்.

மாளிகைக்காடு மையவாடி கடல் அரிப்புக்குள்ளாகி இருப்பதை கடந்த மாதம் இந்தா; சபைக்குத் தெரியப் படுத்தினேன். மீண்டும் அந்த நிலைமை தொடர்கிறது. மரணித்தவர்களது ஜனாஸாக்கள் வெளியே தெரியும் நிலைமையும் ஏற்பட்டுள்ளது. கடலானது தொடர்ந்து நிலப்பரப்பில் ஊடுருவுவதால், இந்த மையவாடியானது கடலால் ஆக்கிரமிக்கப்படலாம் என்று எண்ண வேண்டி யுள்ளது. எனவே, கரையோரப் பாதுகாப்பு மற்றும் கரையோர வளங்கள் முகாமைத்துவத் திணைக்களமானது உடனடியாக இதனைப் பார்வையிட்டு, தடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென இச்சபையைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அண்மையில் வெளியிடப்பட்ட சுகாதார முகாமைத்துவ சேவை உத்தியோகத்தர்களைத் தெரிவு செய்வதற்கான வெட்டுப்புள்ளியானது 150 ஆகக் கணக்கிடப்பட்டுள்ளது. இதன் காரணமாக நியமனம் பெற எதிர்பார்த்திருந்த பலர் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஆகவே, கௌரவ சுகாதார அமைச்சர் அவர்கள், இந்த விடயத்தைக் கவனத்தில் கொண்டு, அந்த வெட்டுப்புள்ளிகளை 01 அல்லது 02ஆல் குறைப்பதன் மூலமாக பாதிக்கப்பட்ட விண்ணப்பதாரிகளைக் கவனத்தில் கொள்ள முடியும் என்பதையும் இந்தச் சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொத்துவில் தொல்பொருள் ஆராய்ச்சி நிலைய நிலங்களைப் பாதுகாக்க வேண்டிய பொறுப்பு பெரும்பான்மை இனத்தைச் சேர்ந்தவர்களுக்கு மட்டுமன்றி, மூவின மக்களுக்கும் உரியது என்பதை நாட்டில் உள்ள அனைவரும் உணர வேண்டும். அது மட்டுமன்றி, அதனது அடையாளம் சம்பந்தமான விடயங்களை மேற்கொள்ளும்போது அப்பகுதியின் கிராம உத்தியோகத்தர், பிரதேச செயலாளர், தவிசாளர் போன்றோருக்குத் தெரியப் படுத்த வேண்டும். அவ்வாறு செய்வதனால் வீண் பிரச்சினைகள் எற்படாமல் தடுக்க முடியும் என்று நம்புகின்றேன்.

கடந்த மாதம் பொத்துவில் P/05 பிரிவில் “கிளியார் மலை” எனும் இடத்தில் தொல்பொருள் ஆராய்ச்சி நிலைய எல்லைக் கற்கள் இடப்பட்டுள்ளதாக அறிகின்றேன். யாருக்கும் தெரியாமல் இவ்வாறு எல்லைக் கற்கள் இடப்படுவதன் மூலம் அப்பகுதி மக்கள் மத்தியில் அச்சமான நிலை ஏற்படுகிறது. இது சம்பந்தமாகத் தெளிவான ஒரு முடிவு எடுக்கப்பட வேண்டும். அவ்வாறு வைத்துவிட்டு அடுத்த கட்டமாகத் தமது கலாச்சார நிலையங்களை அமைப்பார்கள் என்ற அச்சம் மக்கள் மத்தியில் இருக்கின்றது. கடந்த காலங்களில் எமது பிரிவின் மூன்றாம் கட்டை என்னும் இடத்தில் இவ்வாறு ஏற்படுத்தப்பட்டுள்ளது என்பதைக் குறிப்பிட விரும்புகிறேன். தற்போது, அங்கே கடை வியாபாரமும் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது.

நாட்டில் வாழ்கின்ற எல்லா இனங்களுக்கும் தான் சார்ந்துள்ள மதக் கடமைகளை நிறைவேற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்குவதற்காக மதஸ்தலங்கள் அமைக்கப் பட்டுள்ளன. அவை அரச நிலத்தில் அமைக்கப்பட்டிருந்தால் பெரும்பான்மையினத்தைச் சேர்ந்த பௌத்த ஆலயங்களுக்கு மட்டும் நில உரிமைக்காக பூஜா ஓப்பு வழங்கப்படுகின்றது. ஏனைய தமிழ், முஸ்லிம் மக்களது மத ஸ்தாபன நிலங்களுக்கு 'லீசிங்' பெற வேண்டும் என்று கூறப்படுவதனை எந்த வகையில் ஏற்றுக்கொள்ள முடியும் என்பதை இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
තව තත්පර 30ක් දෙන්න.

இது விடயமாக கௌரவ அமைச்சர் அவர்கள் நல்ல தீர்மானத்தை எடுத்து, அனைத்து மத ஸ்தாபனத்துக்கும் பூஜா ஓப்பு வழங்க நடவடிக்கை எடுக்குமாறு கேட்டுக் கொள்கிறேன்.

பொத்துவில் பிரதேச செயலக பிரிவிலேயே முகுதுமஹா விகாரை மற்றும் தொல்பொருள் காணியில் புனித பூமியாகப் பிரகடனப்படுத்த வர்த்தமானி அறிவித்தல் வெளியிடு ஊடாக ‘38அ’ பிரிவின்கீழ் ஆட்சியை மீளப்பெற்று 2023.05.19ஆம் திகதி 2332/40ஆம் இலக்க, வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டு காணி கொள்ளளவு பற்றி அறிவித்தல் செய்யப்பட்ட ஏ.ஜீ.ஏ. வஹாப், ஆர்.ஜே. மடவள உபாலி, ஐயூப்கான், நுஜைலா, சுபைதா, அப்துல் வாசித் பாத்திமா ஸய்னுஸ் ஸமானா, பெரோஸ் அஹமட் ஆகியோருக்கான 0.9263 ஹெக்டெயர் காணிகளுக்கான நட்டஈட்டுக் கொடுப்பனவுகள் இன்றுவரை வழங்கப்படவில்லை. பிரதேசத்தில் ஏற்படவிருந்த ஒரு யுத்த களத்தை தடுக்கும் காலப்பகுதியிலே சமாதானத்தை ஏற்படுத்த வேண்டும் என்று விட்டுக் கொடுப்பு அடிப்படையில் மேற்கொள்ளப்பட்ட இந்தக் காணி விடயம் தொடர்பில் விரைவாக நட்டஈட்டை அரசு வழங்க வேண்டும் என்று கேட்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මම ඉක්මනින් ඉවර කරන්නම්.

மேலும் இலங்கையிலுள்ள முஸ்லிம் பாடசாலைகளில் பல பாடசாலைகளில் இஸ்லாம் பாட ஆசிரியர்கள் இல்லாமல் இருப்பதை குறிப்பிடவும் விரும்புகிறேன். சுமார் 30 ஆண்டுகளுக்கு மேலாக இந்த நியமனம் செய்யப்படவில்லை என்று கூறலாம். இது மார்க்க ரீதியிலான அறிவைப் பெருக்குவதில் பெரும் தடையாக இருக்கிறது. எனவே, அரசு விரைவாக மௌலவி ஆசிரியர் நியமனத்தைச் செய்வதற்கு முன்வந்து இஸ்லாமியக் கல்விக்கு முக்கியம் கொடுக்க வேண்டும் என்று கேட்டு விடை பெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දිනයේ දෙවැනි අවස්ථාවේදී විවාදයට බඳුන් කරන 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මෙහි විශේෂත්වය මේකයි. ආනයන සහ අපනයන පාලනයේදී, විශේෂයෙන්ම භාණ්ඩ ආනයනයේදී බලපත්‍ර නිකුත් කරලා ආනයනය කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ තමයි, ආනයනය සඳහා පුළුල් ඉඩ කඩක් විවෘත කරන ගමන්ම බලපත්‍ර ක්‍රමයකට යන එක. නමුත්, අපට මුහුණ දෙන්න සිදු වුණු අනපේක්ෂිත ආපදා තත්ත්වයේදී විවිධ පාර්ශ්ව විසින් සහයෝගය දැක්වීමට කරන ලද ආධාර, මුදල්, පරිත්‍යාග අතරේ පුද්ගලයන්ගෙන්, සංවිධානවලින් හා රාජ්‍යයන්ගෙන් විශේෂ ඉල්ලීම් ආවා, භාණ්ඩ පරිත්‍යාග කිරීම සඳහාත්. ඒ නිසා ඒ මොහොතේ අපට අවශ්‍ය වුණා, ඉක්මනින්ම ඒ සඳහා මැදිහත් වෙන්න; අවශ්‍යතාව මත ක්‍රියාත්මක වෙන්න, to act on necessity සහ වේගයෙන් ක්‍රියාත්මක වෙන්න. ඒ නිසා ඒ ආනයන කටයුතු පහසු කර ගන්නා ක්‍රමවේදයක් වෙනුවෙන් තමයි ආනයන හා අපනයන (පාලන) පනතට මේ රෙගුලාසි ටික ඉදිරිපත් කර තිබෙන්නේ.

මම මේ රෙගුලාසි සාරාංශගත කරලා කියන්නම්. අපට විවිධ පාර්ශ්වයන්ගෙන් භාණ්ඩ ලැබෙන්න පුළුවන්; විවිධ වූ භාණ්ඩ ලැබෙන්න පුළුවන්. ඒ නිසා අපි ඒක පහසු කර ගන්න එක ස්ථානයකට, -රජය විසින් හඳුනා ගන්නා, වග කියන, වග වන ස්ථානයකට- ගෙන ඒම සඳහා මෙහි රෙගුලාසියක් පනවනවා. අතීතයේ මෙවැනි ආපදා අවස්ථාවලදී ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වූ රෙගුලාසි මත භාණ්ඩ එවලා, ඒවා සමහර පෞද්ගලික අවශ්‍යතා සහ වෙනත් අවශ්‍යතා මත වෙළඳාම් කිරීම ආදී අකටයුතුකම් සිද්ධ කරලා තිබුණා කියලා රේගු දෙපාර්තමේන්තුවෙන් අපට වාර්තා වුණා. එය වළක්වා ගැනීම සඳහා භාණ්ඩ එවන්න බලාපොරොත්තු වන පාර්ශ්වය විසින් ප්‍රධාන වශයෙන්ම භාණ්ඩ එවිය යුතු වන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙතයි. ඒ තමයි, තොග ලබන්නා. තවදුරටත් එවනවා නම් ඒ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හෝ රාජ්‍ය ආයතනයකට තමයි එවිය යුතු වන්නේ.

ඊළඟ කාරණය මෙයයි. ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගන්න කොට කාණ්ඩ කිහිපයක් තිබෙනවා. දැනටමත් සමහර බලපත්‍ර ලබාගෙන, එහෙත් ආනයනය තාවකාලිකව අත්හිටවූ ඒවා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, HS Codes කිහිපයක් යටතේ වූ සහල්, chainsaws, ප්ලාස්ටික් බෝතල් යන දෑ ආනයන බලපත්‍ර යටතේ ගෙනෙන්න ඕනෑ. නමුත්, එය තාවකාලිකව අත්හිටුවලායි තිබෙන්නේ. අන්න ඒ තාවකාලිකව අත්හිටුවා තිබෙන ඒවාට අපි අවසර ලබා දෙනවා, විශේෂයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය සහ අනුමැතිය යටතේ. ඊට අමතරව, ආනයන බලපත්‍ර ලබාගෙන ආනයනය කරන්න ඕනෑ ඒවා ප්‍රධාන වශයෙන් එනවා, යම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල රෙකමදාරුවක් හරහා. උදාහරණයක් විධියට ගත්තොත්, බෙහෙත් ද්‍රව්‍ය, රූපලාවණ්‍ය ද්‍රව්‍ය, පාරිභෝගික භාණ්ඩ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ වෙළඳ අමාත්‍යාංශය යටතේ එන්න පුළුවන්. එවැනි තත්ත්වයකදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට ඒ භාණ්ඩ එනවා නම් අදාළ අමාත්‍යාංශයේ රෙකමදාරුවක් මත - ඒ අමාත්‍යාංශයකින් රෙකමදාරු කරන්න ඕනෑ භාණ්ඩයක් නම් ඒ මත - ඒවා ලබා ගන්න පුළුවන්. එවැනි නිශ්චිත අමාත්‍යාංශයක්, ආයතනයක් නැත්නම් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව ගෙන්වා ගන්න පුළුවන්.

ඒ වාගේම ප්‍රමිතකරණයට, පරීක්ෂණයට ලක් කරලා ගෙනෙන භාණ්ඩ සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලතල පැවරෙන රෙගුලාසි මේකට ඇතුළත් කර තිබෙනවා. සෞඛ්‍ය සම්බන්ධව ගත්තාම, 1990 සුවසැරිය පදනමේ භාවිතය සඳහා වායු බැලූන් රහිත, නව ගිලන් රථ 150ක් ලබා ගන්නත් අවසර ලබා දී තිබෙනවා. මෙය, නැවත දැනුම් දෙනතුරු ක්‍රියාත්මක වෙනවා. මේ නිදහස් කිරීම හරහා කොච්චර භාණ්ඩ ප්‍රමාණයක් ලැබුණත් මොන වාගේ ප්‍රගතියක් ද තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් සරල සාරාංශයක් ගෙන බලමු. 2026 ජනවාරි 06වැනි දා වනකොට ලැබුණු සමස්ත consignments ප්‍රමාණය 505යි. ඒ අනුව ලැබිච්ච භාණ්ඩවල CIF value එක රුපියල්වලට පරිවර්තනය කළොත්, රුපියල් මිලියන 2,473ක් වටිනා භාණ්ඩ අපට ලැබිලා තිබෙනවා. විවිධ වූ කාණ්ඩ යටතේ භාණ්ඩ ලැබිලා තිබෙනවා. ඇඳුම්, බ්ලැන්කට්, විදුලි උපකරණ, මෙට්ට, ජීවිතාරක්ෂක කබා, සනීපාරක්ෂක උපකරණ, tents, විදුලි පන්දම්, මෝටර් රථ, ambulances, වියළි ආහාර ද්‍රව්‍ය, කිරිපිටි, බෙහෙත් ද්‍රව්‍ය, සහල්, ළදරු අයිතම -පාවිච්චි කරන ඒවා-, පාසල් උපකරණ, බෑග් යනාදී වශයෙන් ලැබුණු භාණ්ඩවල විශාල ලැයිස්තුවක් තිබෙනවා. ආපදාවේදී භාණ්ඩ ලබා ගැනීමට රාජ්‍යය මැදිහත් වීමේ යුහුසුළුතාව, කාර්යක්ෂමතාව මේ රෙගුලාසිවලින් පෙන්නුම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊළඟට අවස්ථාව යොදා ගන්නවා, මේ විවාදයේදීත්, විශේෂයෙන්ම සමාජයේදීත් කථා බහට ලක් වන කාරණාවක් පිළිබඳව කථා කරන්න. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව විශාල බියක්, සැකයක්, ගැටලුවක් හදලා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් මහා විනාශයක් කරන්නයි යන්නේ කියන කාරණය සමාජගත කරලා තිබෙනවා. ඒක නිවැරදි කරන්න අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනෑ. අධ්‍යාපනය කියන්නේ, ඉතා පුළුල් කාරණයක්. එය විශාල ක්ෂේත්‍රයක පැතිරෙනවා. සමස්තයක් වශයෙන් ගත්තාම, indoctrination to enlightenment කියන අරමුණ සඳහාත්, විධානයක් දුන්නාම වැඩ කටයුතු කරන්න පුරුදු පුහුණු කිරීමේ සිට ලෝකය දකින, ලෝකය ප්‍රශ්න කරන, නිරන්තරයෙන් ඒ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කරුණු මත තීන්දු තීරණ ගන්නා මානවයෙකු බිහි කිරීමේ අරමුණ දක්වාත් අධ්‍යාපනය විකාශනය වෙලා තිබෙනවා. අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණයක්, අධ්‍යාපනයේ සංවර්ධනයක් කියන්නේ පුළුල් කාර්යයක්. අවාසනාවකට, බොහෝ අය එහි එක් කොටසක්, එක් කෑල්ලක් විතරක් දැකලා තිබෙනවා. ඒක දැකීම ඔවුන්ට අයිති කාරණයක්. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. අධ්‍යාපනය කියන්නේ, පොතක්, විභාගයක්, දැනුම ටිකක් එකතු කර ගන්නා තැනක්, මොඩියුලයක්, එහි තිබෙන website එකක් ආදි වශයෙන් මොකක් හෝ සරල කාරණයක් ලෙස අරගෙන සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හෑල්ලුවට ලක් කිරීම ඉතාම වැරැදි සහගතයි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ අපි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්න ඕනෑ, අපි ඉගෙන ගන්නේ මොනවාද කියන කාරණයට. ඉගෙන ගන්නා content එක පිළිබඳව විශාල වශයෙන් ප්‍රශ්න කිරීම් තිබෙනවා. අපි අවුරුදු ගණනාවක් ඇවිල්ලාත්, බොහෝදුරට ඉගෙන ගැනීම කියන්නේ කට පාඩම් කිරීම, නැත්නම් cognitive skills දියුණු කිරීම සඳහා වූ විභාග ක්‍රමයක් ඔස්සේ පත පොත සහ දැනුම විතරක් තවම ඉලක්ක කර ගෙන තිබෙනවා. නමුත්, අධ්‍යාපනය කියන්නේ ඒක නොවෙයි. අධ්‍යාපනය කියන්නේ දැනුමෙන් එහාට ගිහිල්ලා කුසලතා, දක්ෂතා, ආකල්ප, මේ සමාජය දිහා දකින හැටි, සංවේදිතාව ඇති පුළුල් මානවයෙක් ගොඩ නැඟීම සඳහා වූ කාර්යය ගණනාවකට යැමයි. එම නිසා අපි ක්‍රමයෙන් cognitive skillsවල ඉඳලා analytical skills, judgement skills දක්වා එන තත්ත්වයට පරිවර්තනය කිරීමේ දිශාවකට තමයි අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ටික හදලා තිබෙන්නේ. ඒ අතර ඒ ඉගැන්වීමේ ක්‍රම තුළ තිබෙන modules කියන්නේ එක කාරණයක් විතරයි. ගුරුවරු පුහුණු කිරීම තව කාරණයක්. අධ්‍යාපන ක්‍රමය තුළ උපකරණ තිබුණාට වැඩක් නැහැ. කොහොමද උගන්වන්නේ කියන එකත් වැදගත්. උගන්වන සාම්ප්‍රදායික ක්‍රම ටික ටික විකාශනය වෙලා දරුවා දරුවා විසින්ම ඉගෙන ගන්න, ඒ කියන්නේ teacher-centred learning වෙනුවට දැන් student-centred learning බවට පරිවර්තනය වෙනවා. එතකොට අපි දරුවාට පහසුකම් සපයන්න ඕනෑ ඉගෙන ගන්න. ඉගෙනුම් ඉගැනීමේ ක්‍රමය තුළින් ඉගෙනුම් ඉගැනීමේ පරිසරයක් තමයි අපි මේක ඇතුළේ නිර්මාණය කරන්නේ. ඒ අනුව ගුරුවරයා පුහුණු කිරීම, ඒ අනුව පන්ති කාමරය වෙනස් කර ගැනීම, ඒ සඳහා අවශ්‍ය පහසුකම් නිර්මාණය කිරීම කියන කාරණා මේක ඇතුළේ අන්තර්ගත වෙනවා. එවැනි පුළුල් සමාජ කාරණයක් ගැන සාකච්ඡා කිරීමේදී, එක කාරණයක් දෙකක් ගැන විතරක් කථා කරලා ඒ ප්‍රතිසංස්කරණයට බාධා කිරීම සමාජ ප්‍රගතියට කරන විශාල අතුල් පහරක්ය, එය නොකළ යුතු එකක් කියලායි මම විශ්වාස කරන්නේ.

ඒ වාගේම අධ්‍යාපනය හරහා දියුණු මානවයෙක් හැදෙන ගමන්ම ඒ මිනිහාගේ නිෂ්පාදන ධාරිතාවත් පුළුල් වෙනවා. මොකද, අපි මේ ආර්ථික අර්බුදය ජය ගන්න ඉදිරියට යන ගමනේදී අපේ මානව සම්පත දියුණු කිරීම එක් පුළුල් කාර්යයක්, එක් ප්‍රධාන බලවේගයක්. ඒ අනුව නිෂ්පාදන ධාරිතාවත් අපට වැඩි කර ගන්න පුළුවන්. මොකද, අපේ රටේ තිබෙන සම්පත් සීමා සහිතයි. මානව සම්පත දියුණු කිරීම හරහා නිෂ්පාදනයේ ඵලදායිතාව වැඩි කිරීමටත්, ලෝක ශ්‍රම වෙළඳ පොළෙහි තිබෙන උසස් ගණයේ රැකීරක්ෂාවලට යැම තුළින් ආර්ථික අර්බුදයෙන් රට නැවත ගොඩ නැඟීමේ කාර්යය වේගවත් කිරීමටත් අපට හැකියාව ලැබෙනවා. ඒ අනුව තමයි මේ ප්‍රතිසංස්කරණ ටික ඉදිරියට ක්‍රියාත්මක කරන්නේ. එහි සාධනීය පැත්ත දකින්න කියලා මම යෝජනා කරනවා.

ඒ වාගේම අපේ ක්‍රියාකාරකම් ඇතුළේ 2025 වර්ෂයේදී ලබා ගත් ප්‍රගතිය අනුව, 2026 වර්ෂයේදී විශේෂයෙන්ම ආපදා තත්ත්වයටත් මුහුණ දෙමින්, රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවකින් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගත්තා. අපට චෝදනා එල්ල කරමින් එක් පැත්තකින් අවිශ්වාසය ඇති කිරීම නිර්මාණය වෙනවා. අපි නොකියපු දේවල්, වැරැදි ප්‍රවෘත්ති වාගේම වැරැදි අර්ථ කථන තුළින් ව්‍යාකූලත්වයක් පුවත්පත් හරහා නිර්මාණය කරනවා. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි, අවිශ්වාසය ගොඩ නැඟීම සඳහායි. අපි අපට විරුද්ධ පාර්ශ්වවල පවා -හැම කෙනෙකුගේම- ආයෝජකයන්ගේ, විශේෂයෙන්ම රාජ්‍ය තාන්ත්‍රිකව, සියලු සංවිධානවල විශ්වාසය ක්‍රමිකව ගොඩ නඟා ගෙන ඉදිරියට එනකොට යම් දුෂ්ට බලවේග විසින් අවිශ්වාසය ගොඩ නඟනවා. අවිශ්වාසය ගොඩ නඟන්න කරුණු කාරණා ඉදිරිපත් කරද්දී දේශපාලන, ආර්ථික කරුණු අරගෙන විවේචනය කරනවා නම්, සාකච්ඡා කරනවා නම් අපට උත්තරයක් දෙන්න පුළුවන්. විශේෂයෙන්ම ඉදිරිපත් වූ කාරණාවලදී එකකට එකක් පටහැනි සංඛ්‍යා දත්ත, ලේඛන තමයි ඉදිරිපත් කළේ.

මම විශේෂයෙන් කියන්න ඕනෑ, අපි මේ ස්ථාවරත්වය අත්පත් කර ගැනීමේදී ආණ්ඩුවේ ආදායම් ස්ථාවර කර ගැනීමට ගත් ක්‍රියාමාර්ගය ඉතා විශේෂ ආකාරයට සිද්ධ කළ බව. ඒ වාගේම අපේ ආර්ථික ප්‍රගතිය අපි සැලකිය යුතු මට්ටමකට ඉහළට ගෙනැල්ලා තිබෙනවා. ඒ තත්ත්වය අපි ඉදිරියටත් වර්ධනය කරමින් යනවා. විශේෂයෙන් අද සමාජයේ බයක් හදනවා, විදේශීය අංශයේ සංචිත ප්‍රමාණය මදි වේවි, අපනයන ඉපැයීම් මදි වේවි කියලා. ඒ කිසිදු සැකයක්, බයක් ඇති කර ගත යුතු වෙන්නේ නැහැ. අපි සැලසුම් කළ පරිදිම ඒ ඉලක්ක ළඟා කර ගෙන තිබෙනවා. අපට ශක්තිමත් විදේශ අංශයක් තිබෙනවා. අපනයන ආදායම, ප්‍රේෂණ, සංචාරක කර්මාන්තයේ ලැබීම් ලබා ගෙන ඉදිරියේදී ශක්තිමත්ව මේ අර්බුදවලට මුහුණ දෙන්න අපි සූදානම් වෙමින් ඉන්නවා.

ඒ වාගේම ගෙවුම් ශේෂ තුලනය පිළිබඳ වැරැදි අදහසක් මතු කළා. ගෙවුම් ශේෂ තුලනය කියන්නේ ජංගම ගිණුමේ ශේෂයත්, සේවා ගිණුමේ ශේෂයත්, ප්‍රාථමික ආදායම්වලත්, ද්විතීයික ආදායම්වලත් ශේෂයයි. මේ තුළින් තමයි අපි විදේශීය අංශයේ ශක්තිය තිබෙනවාද, නැද්ද කියලා බලන්නේ. දැන් අවුරුද්ද අවසන් වෙලා තිබෙනවා. නොවැම්බර් මාසයේදී ජංගම ගිණුමේ ශේෂය ධන ඩොලර් බිලියන 1.8 මට්ටමට ළඟා වෙලා තිබෙනවා. එවැනි ඩොලර් ප්‍රමාණයක් අතිරික්තව අපි උපයලා තිබෙනවා. ඒ ඩොලර් ආයෝජනය කරන්නේ කොහෙද කියන එකෙන් තමයි විදේශ සංචිත ප්‍රමාණය නිර්මාණය වෙන්නේ.

ඒ වාගේම රටේ විදේශ සංචිත ප්‍රමාණය, දළ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.8කට ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව ගත්තාම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2025දී මේ ස්ථාවරත්වය පමණක් නොවෙයි, ඒ ආර්ථික ප්‍රගතිය, ඒ කාර්ය සාධනය ඉහළම මට්ටමට ගෙනැල්ලා තිබෙනවා. අනිවාර්යයෙන්ම මේ "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වූ තත්ත්වයට මුහුණ දෙමින් 2026දීත් ආර්ථික ප්‍රගතියත්, අපේ මැදි කාලීන ඉලක්කය වෙච්ච සියයට 7 ඉක්මවන ආර්ථික වර්ධනයත් ලබා ගැනීමේ දිශාවට ගමන් කරනවාය කියන කාරණය සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මම මේ ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනවා.

රෝගීන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ප්‍රමිතිසහගත ඖෂධ ලබා දීමත්, හිඟයකින් තොරව රජයේ රෝහල්වල ඖෂධ පවත්වාගෙන යැම සඳහාත් රජය කටයුතු කිරීම රජයේ වගකීමයි.

01. ප්‍රමිතිසහගත ඖෂධ මේ රටට ලබා දීම සඳහා රජය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

02. ජාත්‍යන්තර ඖෂධ තත්ත්ව පරීක්ෂණාගාරයක් ස්ථාපනය කිරීමට රජය කටයුතු කරන්නේද?

03. හිඟයකින් තොරව ඖෂධ සැපයීම සඳහා රජය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්න අපි අහන්නේ මේ නිසායි. ඔබතුමාත් දන්නවා, මේ රටේ මේ වනකොට ප්‍රධාන කාරණා දෙකක් මතු වෙලා තිබෙන බව. එකක් තමයි ඖෂධ හිඟය. අනික් කාරණාව තමයි අපේ රටට ගෙනෙන ඖෂධවල ප්‍රමිතිය පිළිබඳව තිබෙන ප්‍රශ්නය. මේ දෙවැනි ප්‍රශ්නය ගැන කථා කරනකොට, දෙවැනි ප්‍රශ්නයේ තවත් අතුරු ප්‍රශ්න දෙකක් තිබෙනවා. එක පැත්තකින් NMRA එකේ ලියාපදිංචි - registered - ඖෂධ ගෙන එනවා. ඒ යම් ඖෂධවලින් රෝගීන්ට සංකූලතා ඇති වෙනවා හෝ නැත්නම් මරණයට පත් වෙනවා. අපි ඉතිහාසයේ දැකලා තිබෙනවා, අන්ධභාවයටත් පත් වෙලා තිබෙනවා. ඒක එක ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ලංකාවට ඖෂධ ගේනවා, hand-carry කරලා. මේ hand-carry කරලා ගේන ඖෂධ NMRA එකේ register වෙලා නැහැ. මේ ඖෂධ රෝගීන්ට ලබා දීම තුළ එක්කෝ රෝගීන් මරණයට පත් වෙනවා; නැත්නම් නොයෙක් නොයෙක් සංකූලතා ඇති වෙනවා. හරි ප්‍රතිකාරය නොලැබෙන නිසා ඒ රෝගියා මරණයට පවා ලක් වෙන්න පුළුවන්. ඒකට හොඳම උදාහරණය මේකයි. අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා සහ මම CID එකට ගිහිල්ලා සඳුදා පැමිණිල්ලක් කරනවා, මේ රටට ගෙනාපු cancer ඖෂධයක්, පිළිකා නසන ඖෂධයක් සම්බන්ධයෙන්. මොකද, ඒක ලංකාවේ NMRA එකේ register වෙලා නැහැ. හැබැයි, ෆාමසිවලින් ඒක ගන්න පුළුවන්. මේවා hand-carry කරන ඖෂධ. මේක ලබා දුන්න එක්තරා රෝගියෙකුගේ සෞඛ්‍ය තත්ත්වය බැලුවාම, ඒ රෝගියාට ප්‍රගතියක්, එහෙම නැත්නම් සුගතියක් වෙලා නැහැ. ඒකට හේතුව ඔබ දන්නවා. විශේෂයෙන්ම මේ ඖෂධ ගෙන ඒමේදී යම් ක්‍රමයක් අනුගමනය කරන්න තිබෙනවා. සමහර ඖෂධ ඒ නියමිත උෂ්ණත්වයෙන්, නියමිත තත්ත්වයෙන් රටට ගේන්නට ඕනෑ. මේ hand-carry කරන ඖෂධවල, විශේෂයෙන්ම NMRA එකේ register වෙලා නැති ඖෂධවල එවැනි ප්‍රශ්න තිබෙනවා.

ඊළඟට බලන්න, අපේ බෙල්ලන වෛද්‍යතුමා කරපු ඒ පැමිණිල්ල. Troponin-I කියන පරීක්ෂණය - ජාතික රෝහලේ ඒ කරපු පරීක්ෂණවල - යම් දෝෂ තිබෙනවා කියලා එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරලා තිබෙනවා. එතකොට පැහැදිලිව මේ රෝගීන්ගේ රෝග ලක්ෂණ හඳුනාගෙන රෝගය නිශ්චය කර ගන්න බැරි නම්, diagnose කර ගන්න බැරි නම්, රෝගියාට ප්‍රතිකාර කරන්න විධියක් නැහැ.

ඒ නිසා, රෝගියාගේ රෝග නිශ්චය කර ගන්න කරන පරීක්ෂණ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රමිතියක් තිබිය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රමිතිය පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා.

විශේෂයෙන්ම අපි දැන් ඩොලර් ගැන කථා කරනවා. අපේ රටේ ආයෝජන ගැන කථා කරනවා. අපේ රටේ සිදු කරන ඖෂධ නිෂ්පාදන ගැනත් අපි බලන්න ඕනෑ. අපි කොහොමද, අපේ රටේ ඖෂධ නිෂ්පාදකයන්ට සහයෝගය ලබා දෙන්නේ? විශේෂයෙන්ම ඖෂධ අපනයනය කිරීම හරහා අපට ලාභ ලබන්න පුළුවන්ද කියන එක පිළිබඳවත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. උදාහරණයක් විධියට අපිට අල්ලපු රට වන ඉන්දියාව දෙස බලන්න. 2026 වසරේදී ඒ අය බලාපොරොත්තු වෙනවා, ඖෂධ අපනයනය කිරීමෙන් ඩොලර් බිලියන 60ක ආදායමක් උපයන්න. 2030 වර්ෂය වන විට මේ ඖෂධ අපනයනය කිරීමෙන් ඩොලර් බිලියන 450ක ආදායමක් උපයන්න ඒ අය බලාපොරොත්තු වෙනවා. අපි රටක් හැටියට ප්‍රමිතිසහගත ඖෂධ නිෂ්පාදනය කරලා, එම ඖෂධ අපේ රටේ රෝගීන්ට ලබා දෙනවා. එම ඖෂධ අපේ සෞඛ්‍ය පද්ධතියට මුදා හරිනවා වාගේම, අනෙක් පැත්තෙන් මේවා අපනයනය කරන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. ඒ හරහා ඩොලර් ඉපයීමේ හැකියාව අපට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කරන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි නිසි මිල නියාමනයක් තිබිය යුතු වීම. ඉන්දියාව ගත්තොත්, නිසි මිල නියාමනයක් තිබෙනවා. ලෝකයේ අනෙක් රටවල එවැනි මිල නියාමනයක් තිබෙනවා. එම නිසා ඒ පිළිබඳවත් සෞඛ්‍ය අමාත්‍යාංශය අවධානය යොමු කරන්න ඕනෑ.

මෙහිදී විශේෂයෙන්ම පළමුවැනි කාරණය හැටියට අපේ රටට ප්‍රමිතිසහගත ඖෂධ ගේන්න ඕනෑ. ඒ ඖෂධ ගෙන ඒමේදී නිසි තත්ත්වයකින්, නිසි ක්‍රමවේදයකින්, නිසි පටිපාටියකින් ඖෂධ ගේන්න ඕනෑ. ඒ ආකාරයට මේ රටේ ඖෂධ ලබා දෙනවා වාගේම, විශේෂයෙන්ම රෝගීන් සඳහා කරන යම් යම් පරීක්ෂණ ප්‍රමිතිසහගත විය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම අපි පැහැදිලිව දකින දෙයක් තමයි, මේ

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

වෙනකොටත් ඖෂධ හිඟය නිසා දැවැන්ත ලෙස රෝගීන් අසරණභාවයට පත් වෙන ආකාරය. අපේ රටේ තිබෙන ජාතික රෝහලකට, ඕනෑම රජයේ රෝහලකට රෝගියෙක් ගියාම, ඔවුන්ට අවශ්‍ය ඖෂධ පිටින් ගේන්න කියනවා. එහෙම නැත්නම්, යම් ආකාරයේ සැත්කමකට ඒ රෝගියා භාජන වෙනවා නම් surgical items, surgical instruments, එහෙම නැත්නම් implants, suture materials යනාදිය පිටින් ගේන්න ඒ රෝගියාට සිදු වෙනවා. මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරන්න ඕනෑ. පසුගිය කාලයේ සිදු වෙච්ච එක්තරා සිදුවීමක් මට මතකයි. ඒ තමයි, එක්තරා ව්‍යාපාරිකයෙක් එක්තරා පෞද්ගලික රෝහලක හදිසි ප්‍රතිකාර අංශයට ගියා. ඒ රෝහලේ covered stent එකක් තිබුණේ නැහැ. Rupture එකක් වෙලා, angioplasty එක කරන අතරතුරදී ඒ ව්‍යාපාරිකයා මරණයට පත් වුණා. මේ පිළිබඳව අපි අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ රෝහල් කොයි ආකාරයෙන්ද කටයුතු කරන්නේ; ඒ රෝහල්වලට අවශ්‍ය කරන උපකරණ තිබෙනවා ද කියන එක පිළිබඳව පසු විපරමක් තිබිය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව රජයේ අවධානය යොමු කරන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, පිළිතුර ලබා දීම සඳහා නියෝජ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඖෂධ ගැන කථා කරන්න ඉස්සෙල්ලා මම එක කාරණයකට පිළිතුරු දෙන්න ඕනෑ. දැන් sex ගැන කථාවක් කිව්වා නේ. මම ඒකට උත්තරයක් දෙනම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ඒ programme එක ගැන කිව්වොත්, ඔව්, අපි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒක කරනවා. ඒක කරන්නේ අවුරුදු 20ක විතර ඉඳන්. ඒක විධිමත්ව කරන්න පටන් ගත්තේ 2018 මාර්තු මාසයේ. ඒ කියන්නේ ඔබතුමන්ලාගේ පාලන කාලයේ ඉඳන්. ඒ සම්බන්ධයෙන් Analysis of Knowledge and Attitudes of School Children's Sexual and Reproductive Health Education and Its Causes කියලා එකක් තිබෙනවා. School Health and Nutrition Unit, Ministry of Education of Sri Lanka and UNFPA of Sri Lanka සමඟ එකතු වෙලා තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය මේක කරලා තිබෙන්නේ. විස්තරාත්මකව මම ඒකේ සම්පූර්ණ පොතම ඡායා පිටපත් ගැහුවා. මොකද, පොතම කියවා ගන්න. ඒ වාගේම "Comprehensive sexuality education in Sri Lanka" යන ශීර්ෂය යටතේ UNFPA නිකුත් කළ සම්පූර්ණ ලේඛනය ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස ඡායා පිටපත් කර තිබෙනවා. ඔව්, හයේ පන්තියේ ඉඳලා තමයි උගන්වන්න කියලා තිබෙන්නේ. මේකෙදි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? "Sex" කියන වචනය එවැනි නරක වචනයක් නොවෙයි. ඒක ඕනෑම meaning එකකට ගන්න පුළුවන්. Application එකක වුණත් "sex: " කියලා තිබෙනවා; බය නැතිව ඒක පුරවන්න. එහෙම ප්‍රශ්නයක් නැහැ. Sex කියලා කිව්වාම බය වෙන්න එපා. Sexවල එක එක කෑලි තිබෙනවා. එක එක වයසේදී තමයි අපි ඒවා ඉගෙන ගන්නේ. හයේ පන්තියේදී මේ සම්බන්ධයෙන් ඉගෙන ගත්තේ නැති වුණාම ඔය වාගේ ප්‍රශ්න ඇති වෙනවා.

හයේ පන්තියේ ඉගෙන ගන්න ඕනෑ දේවල් හයේ පන්තියේදී ඉගෙන ගන්න ඕනෑ. සමහර දේවල් අපට ඉගෙන ගන්න සිද්ධ වෙන්නේම නැහැ. අපි සමහර දේවල් ඉගෙන ගත්තේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා. සමහර sexual චර්යා ගැන ඔබතුමන්ලාගෙන් තමයි අපි ඉගෙන ගත්තේ. අනෙක් ඒවා ඒ ඒ පන්තිවලදී උගන්වනවා. අපි ඉගෙන ගන්නා විෂය ක්ෂේත්‍රය අනුව ඒවා තව තවත් ඉගෙන ගන්නවා. ඒ පුහුණුවීම් කරලා තිබෙන්නේ ගුරුවරුන්ට. ළමයින්ට කොහොමද sex පිළිබඳව කියලා දෙන්නේ කියලා ඒ ගුරුවරුන්ට පුහුණුවීම් ලබා දුන්නා. ඒක කරන්නේ විශේෂයෙන්ම ළමයින් අපයෝජනයට ලක්වීම වළක්වන්නයි. ඒක තමයි අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධානම අරමුණ. ඒක එක්සත් ජාතීන්ගේ සංවිධානයත් එක්ක එකතු වෙලා අවුරුදු 20ක් තිස්සේ කරගෙන එන එකක්. වෙලාව නැති නිසා මේ ලේඛන සියල්ල මම **සභාගත*** කරනවා.

ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම දැන් පිළිතුරු ලබා දෙන්නම්.

01. NMRA එක විධියට ප්‍රමිතියෙන් යුක්ත ඖෂධ නිපදවා ගැනීම සඳහා අපි අනුගමනය කරන ක්‍රමවේදයක් තිබෙනවා. යම් ඖෂධයක් අපේ registration එකට එනකොට ඉස්සෙල්ලාම ඖෂධය නිපදවන ස්ථානය register කරන්න ඕනෑ. ඒක ලංකාවේ වෙන්න පුළුවන්; පිට රටක වෙන්න පුළුවන්. NMRA එක ගිහිල්ලා ඒක බලලා ඒගොල්ලන්ගේ manufacturing techniques කොහොමද, ඒකට අදාළ වටපිටාව කොහොමද, අපේ තිබෙන good manufacturing practices අනුගමනය කරනවාද කියලා බලනවා. ඒ සඳහා WHO එකේ අනුමත ක්‍රමවේද තිබෙනවා. ඒවා අනුගමනය කරනවාද කියලා මුලින්ම බලනවා. ඒ වාගේම manufacturing site එක බලලා ඊට පසුව තමයි බෙහෙත අනුමත කරන්නේ. ඒ බෙහෙත ලියාපදිංචියට අදාළ දේ ඉදිරිපත් වුණාට පසුව ඖෂධයේ ගුණාත්මකභාවය, ආරක්ෂාව ඒ වාගේම ඖෂධයේ තිබෙන කාර්යක්ෂමතාව - efficacy - කියන තුන බලනවා. ඒක බලන්නත් යම් යම් ක්‍රමවේද තිබෙනවා.

    මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක බැලීම සඳහා ඉන්නේ මේ රටේ ඒ ක්ෂේත්‍රය ගැන ඉතාම පළපුරුද්ද තිබෙන, දක්ෂතා තිබෙන, සුදුසුකම් තිබෙන මණ්ඩලයක්. ඒ මණ්ඩලයෙන් අනුමත වුණාට පසුව තමයි බෙහෙතක registration එක පටන් ගන්නේ. ඒ ටික සම්පූර්ණ වුණාට පසුව අපි sampling test එකක් කරනවා. ඊට අමතරව WHO qualified lab එකකින්, ඒ කියන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමත කරපු තත්ත්වයේ ගුණාත්මක lab එකකිනුත් අපි පරීක්ෂණ වාර්තා ගෙන්වා ගන්නවා. මේක ඉතාම දීර්ඝ ක්‍රියාවලියක්. සාමාන්‍යයෙන් ඕනෑම රටකට වැඩ කරන දින 300ක විතර වාගේ කාලයක් ඒ සඳහා ගත වෙනවා. අපි මේ අමාත්‍යාංශය භාර ගන්න කොට ඒ සඳහා දවස් 400, 500 වාගේ දිගු කාලයක් තිබුණා. අපි ඒ දිගු කාලය අඩු කරලා දින 300ට මෙහායින් ඒක ලබා දෙනවා.

ඔබතුමා දෙවැනි ප්‍රශ්නය විධියට අහලා තිබුණේ, "ජාත්‍යන්තර ඖෂධ තත්ත්ව පරීක්ෂණාගාරයක් ස්ථාපනය කිරීමට රජය කටයුතු කරන්නේද?" කියන එක.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ ප්‍රශ්නයට එන්න කලින් මම කලින් ප්‍රශ්නයට අදාළව තව කරුණු ටිකක් කියන්න ඕනෑ. යම් කිසි බෙහෙතක් register කළාට පසුව ඒ බෙහෙත ලංකාවට ගෙනෙන්නේ පළමුවැනි වතාවට නම් අපි pre-shipment sample එකක් ගන්නවා. ඒ රටින් නැවට දාන්න කලින් අපට සාම්පලයක් එවිය යුතුයි. ඒක පරීක්ෂා කර බැලීමක් සිදු වෙනවා. ඒ වාගේම ඒක පළමුවැනි වතාවට නම් එන්නේ අපි ලංකාවේ මාර්කට් එකට දාන්න ඉස්සෙල්ලා, එහෙමත් නැත්නම් රෝහල්වලට යවන්න ඉස්සෙල්ලා sample එකක් බලනවා. ලංකාවේ තිබෙන දුර්වලතාව තමයි මේක මාර්කට් එකට දැම්මාට පසුව යම් යම් වෙනස් වීම් වෙනවාද කියලා බලන්න post-marketing surveillance එකක් නැති එක. ලංකාවේ ඒ පිළිබඳ පරීක්ෂණ කරන්න පුළුවන් labs එකතු කරගෙන post-marketing surveillance එකක් කරන්න පුළුවන් ද කියලා බලනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු මේ දිනවල සිදු කෙරෙමින් පවතිනවා.

02. මෙම රසායනාගාරවල තත්ත්වය සම්බන්ධයෙන් ISO ප්‍රමිතිය ලබා දීමට ඒ වාගේම accreditation ගන්න අවශ්‍ය ක්‍රියාවලිය සිදු කෙරෙමින් යනවා. අපි අමාත්‍යාංශය භාර ගන්න කොට තිබුණු ලොකුම ප්‍රශ්නය මෙයයි. NMRA එකේ තිබෙන පරීක්ෂණාගාරයේ හිටියේ, සිටිය යුතු සේවක සංඛ්‍යාවෙන් තුනෙන් එකක්. දැන් NMRA එකේ 230 ගණනක් සේවකයෝ ඉන්නවා. එයින් 110ක්ම අරගෙන තිබෙන්නේ, මේ අවුරුද්ද තුළදීයි.

මේ lab එක අපි ජාත්‍යන්තර ප්‍රමිති තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රමක්‍රමයෙන් ගන්නවා. ඒ වාගේම NMRA එකෙන් පිට lab එකක් පිහිටුවන්නත් අපි බලාපොරොත්තු වනවා. රජය මේ දවස්වල ඒ පිළිබඳව සාකච්ඡා කරමින් සිටිනවා. එය ස්වාධීන lab එකක්. එය අපේ රටේ විතරක් නොවෙයි, මේ කලාපයේම ඖෂධ සහ ආහාර කියන දෙකම පරීක්ෂා කරන්න පුළුවන් විධියේ lab එකක්. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරගෙන යනවා.

03. මම කියන්නම්, හිඟයකින් තොරව ඖෂධ සැපයීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳවත්. මේ අවුරුද්දේ අය වැයෙන් අපි රුපියල් බිලියන 185ක් ඖෂධ මිලදී ගැනීම සඳහා වෙන් කර තිබෙනවා. ඒක මේ ඉතිහාසයේ වෙන් කළ දැවැන්තම මුදල. ඊට පස්සේ අපි ඖෂධ ලියාපදිංචිය කාර්යක්ෂම කරන්න අවශ්‍ය කාර්ය මණ්ඩලය අරගෙන තිබෙනවා. ඒ වාගේම NMRA එක digitalize කර තිබුණත්, ඒක නිශ්චිත වැඩ පිළිවෙළක් අනුව කර තිබුණේ නැහැ. මේ දවස්වල අපි ඒ කටයුතුත් විධිමත්ව කරගෙන යනවා.

ඒ වාගේම හිඟයකින් තොරව ඖෂධ සැපයීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කටයුතු කරනවා. ඒ කියන්නේ, SPC සහ SPMC කියලා අපේ ආයතන දෙකක් තිබෙනවා. SPMC එකෙන් බෙහෙත් හදනවා. ඒ වාගේම දේශීය නිෂ්පාදකයින්ගෙනුත් තවත් ඖෂධ මිලදී ගන්නවා. ඊට අමතරව MSD එක තව බෙහෙත් ගන්නවා, දේශීය නිෂ්පාදකයින්ගෙන්. අපේ priority list එකෙන්, ඒ කියන්නේ drugs අටසිය හැට ගණනකින් තුනෙන් එකක් අපි දේශීය නිෂ්පාදකයින්ගෙන් ගන්නවා. ඒ ප්‍රමාණය තව තවත් වැඩි කිරීමට අපි ක්‍රියා කරගෙන යනවා. ඒ වාගේම අපට අවශ්‍ය drugsවලට ලංකාවේ agentsලා නැහැ. ඒගොල්ලන්ට අපි තවත් අවස්ථා ලබා දෙනවා. Monopolies ගොඩක් තිබුණා. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ප්‍රශ්නය ටිකක් දිග නිසා කියන්න විස්තර ගොඩක් තිබෙනවා. මිල නියාමනය සම්බන්ධයෙනුත් අපි ක්‍රියා කර තිබෙනවා.

Troponin I පරීක්ෂණය සම්බන්ධ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ මේ නිසායි. අදාළ වෛද්‍යවරයා කැමැති reagent එකක් තිබෙනවා. මොකද, ඒ hospital එකෙන් කොම්පැනි දෙකකින් reagents ගන්නවා. ඒ වෛද්‍යවරයා විසින් හොඳ නැහැ කියන්නේ ඔහු අකැමැති එක. ඒක ඔහු සහ ඒ කොම්පැනි එක අතර ප්‍රශ්නයක්. ඒක අධිකරණයට ඉදිරිපත් වෙලා තිබෙන නිසා මම හිතන විධියට ඒක අධිකරණයෙන් විසඳයි.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අතුරු ප්‍රශ්න ඉදිරිපත් කරන්න අවස්ථාවක් නැහැ. යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් ගරු මන්ත්‍රීතුමාට ඊට අවස්ථාව ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පැහැදිලි කිරීමක් කරන්නම්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම පැහැදිලිව මුලදී කරුණු කිව්වේ, "sexuality" කියන්නේ එකක්, "sex" කියන්නේ වෙනත් එකක් කියලායි. "Sex" කිව්වාම, male and female. "Sexuality" කිව්වාම ඒක ඊට වඩා diversify වෙනවා. ඒක තේරුම් ගන්න කියන ඉල්ලීම මා කරනවා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඔය පොත කියෙව්වා නම් සැහෙන අදහසක් ගන්න පුළුවන්. මම හිතන විධියට, ඔබතුමන්ලාගේ අනෙක් අයටත් ඒක පොඩ්ඩක් කියවන්න, අපි share කර ගනිමු.

ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.34ට, 2026 ජනවාරි 20වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.34க்கு, பாராளுமன்றம் 2026 சனவரி 20, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.34 p.m. until 9.30 a.m. on Tuesday, 20th January, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.